2011 වර්ෂය තුළ
අදියර තුනක් යටතේ පවත්වන ලද
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පිළිබඳ

මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව

වෙළුම I

පෙරවදන

2011 වර්ෂයේදී අදියර තුනකින් පවත්වනු ලැබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ප්‍රථම අදියර වනම් 2011.03.17 දින පවත්වන ලද ඡන්ද විමසීම පැවැත්වූයේ එවකට මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතාගේ මෙහෙයවීම යටතේ ය. ඒ මහතා 2011.03.25 දින තනතුරින් විශ්‍රාම ලබා ගැනීමෙන් අනතුරුව මැතිවරණ කොමසාරිස් ලෙස පත් වූ මා විසින් 2011.07.23 දින හා 2011.08.10 දින පැවැත් වූ දෙවන හා තුන්වන අදියර දෙක යටතේ ඡන්ද විමසීම් කාර්යයන් මෙහෙයවන ලදී. එම කාලයේදී අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන මැතිවරණ) වශයෙන් කටයුතු කළ ඩබ්ලිව්. පී සුමනසිරි මහතා මෙම අදියර තුනෙහිම ඡන්ද විමසීම්වලට අදාළ සියලු කාර්යයන් සම්බන්ධීකරණය කළ අතර මෙම වාර්තාව සැකසීමේ ප්‍රමුඛ කාර්යයන් ද ඔහු විසින් ඉටු කරන ලදී.

මේ ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ වාර්තා 2014 වර්ෂයේ මැද භාගය වන විට සකසා අවසන් කර තිබුණි. එසේ වුවද 2011.01.06 නාමයෝජනා කැඳවා තිබූ එහෙත් බිම් බෝම්බ ඉවත් කිරීම හා ජනතාව පදිංචි කිරීම යන කරුණු අවසන් නොවීම නිසා වරින්වර කල් දැමීමට සිදු වූ මුලතිව් දිස්ත්‍රික්කයේ පුතුකුඩ්ඉරිප්පු හා මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා දෙකෙහි ඡන්ද විමසීම, තරඟ කිරීමට අපේක්ෂිත සියලු දේශපාලන පක්ෂවල එකඟතාව මත 2012.03.10 දින පැවැත්වීමට තීරණය කරන ලදී. එසේ වුවද එදින එම ඡන්ද විමසීම පැවැත්වීමට එරෙහිව ගෙන තිබූ අධිකරණ ක්‍රියාමාර්ගවලට (CA writ 72/12 සහ CA writ 74/12) අදාළව නිකුත් කර තිබූ අතුරු තහනම් නියෝගය නිසා හා එකී පැමිණිල්ල විභාග කිරීම අවසන් නොවීම හේතුවෙන් 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ 4වන අදියර පැවැත්වීමට නොහැකිවීම නිසා සකස් කර තිබූ මෙම වාර්තාව 2014 වර්ෂය අවසානයේදී ද නිකුත් කිරීම අත්හිටුවීමට සිදු විය.

පෙර සඳහන් පැමිණිල්ල 2015.01.28 දින ඉල්ලා අස්කර ගැනීම නිසා එකී පළාත් පාලන ආයතන දෙකෙහි ඡන්ද විමසීම් 2015.02.28 දින පැවැත්වීමට දින නියම කර තිබිණි. එසේ නියම කරන ලද පරිදි ඡන්ද විමසීම පැවැත්වීමට එරෙහි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් කඩවීමේ පැමිණිලි දෙකකට (SC FR 31/2015 හා SC FR 29/2015) අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඡන්ද විමසීම එදින පැවැත්වීම වැළැක්වීමේ නියෝගයක් නිකුත් කරන ලදී. එම ඡන්ද විමසීම් පවත්වා අදාළ කරුණු ද මෙම වාර්තාවට ඇතුළත් කිරීමේ අවශ්‍යතාව නිසා 2015 මාර්තු/ අප්‍රේල් කාලසීමාවේ නිකුත් කිරීමට යෝජිතව තිබූ මෙය නිකුත් කිරීමේ දිනය කල් තැබීමට සිදු විය. දැන් එකී ඡන්ද විමසීම් දෙකට අදාළ නාමයෝජනා පත්‍ර අවලංගු කිරීමේ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ක්‍රියාකරන බව වාර්තා වී ඇති හෙයින්, පෙර සඳහන් 4වන අදියර නොපැවැත්වෙනු ඇති බැවින් 2011 පළාත් පාලන අයතන ඡන්ද විමසීම් පිළිබඳ මේ වාර්තාව බොහෝ ප්‍රමාද වී හෝ නිකුත් කිරීමට හැකියාව ලැබීම සතුටට හේතුවේ.

ඡන්ද විමසීම් ප්‍රතිඵල හා සංඛ්‍යා සටහන් කෙරෙහි උනන්දුවක් දක්වන සියලුදෙනාට සහ ඡන්ද විමසීමට අදාළ කාර්යයන් සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියලු දෙනාට මෙහි සඳහන් කරුණු බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇතැයි හඟිමි.

2017 අගෝස්තු 31
මැතිවරණ කොමිෂන් සභාව
රාජගිරිය

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්
(2011.03.25 සිට 2015.11.13 දක්වා)

පටුන

I වැනි කොටස

I වැනි කොටස 1
හැඳින්වීම 1
සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමයේ ආරම්භය 1
ප්‍රථම සමානුපාතික පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 1979 1
සංවර්ධන සභා ඡන්ද විමසීම 1981 1
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 1983 2
ප්‍රාදේශීය සභා සංස්ථාපනය 2
මනාප ඡන්ද ක්‍රමයේ ආරම්භය 3
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 1987 3
ප්‍රථම වක්ද්‍රින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 1991 4
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 1194 (නැගෙනහිර පළාත හා වවුනියාව නගර සභාව) 6
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 1997 6
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 1998 6
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2002 7
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2006 7
පළාත් පාලන ආයතන ඡන්ද වීමසීම් 2008 සහ 2009 8

II වැනි කොටස 10
පළාත් පාලන ආයතන සංයුතියෙහි ඇති වූ වෙනස්කම් 10

III වැනි කොටස 12
මූලික සංවිධාන කටයුතු 12
ඡන්දහිමි නාමලේඛනය 12
ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම 13
ඡන්ද මධ්‍යස්ථාන 14
කාර්ය මණ්ඩල හා වාහන සංගණනය 14
තේරීම්භාර නිලධරයන් සහ සහකාර තේරීම්භාර නිලධරයන් 15
දේශපාලන පක්ෂ 15

IV වැනි කොටස 17
නාමයෝජනා 17
මූලික පසුබිම 17
නාමයෝජනා භාර ගැනීම 18
නාමයෝජනා පරීක්ෂා කිරීම 19
තීරණ දැනුම් දීම 20
නාමයෝජනා පිළිබඳ සමාලෝචනය 20

V වැනි කොටස 22
හදිසි මුද්‍රණ කටයුතු 22
ඡන්ද පත්‍රිකා 22
ගෘහ දැන්වීම් 23
ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම 24
45(1) වගන්තිය යටතේ දැන්වීම 24

VI වැනි කොටස 26
අනෙකුත් පූර්ව අවශ්‍යතා 26
තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් 26
නිල ඡන්ද දැන්වීම්පත් 27
ඡන්දදායකයා විසින් සිය අනන්‍යතාව තහවුරු කිරීමේ අවශ්‍යතාව 29
උචිත ලකුණින් සලකුණු කිරීම 30
ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණය 30
ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතු 31
ඡන්ද පොළ නියෝජිතයින් හා සම්බන්ධිත කරුණු 32
ආරක්ෂක කටයුතු 33

VII වැනි කොටස 35
ඡන්දදායකයින් හා ඡන්ද විමසීමට සම්බන්ධ අනිකුත් පාර්ශ්ව දැනුවත් කිරීම 35
ව්‍යවස්ථාපිත දැන්වීම් 35
නාමයෝජනා දැන්වීම 35
ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම 35
නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව 36

තැපැල් ඡන්දහිමියන් වෙත කරනු ලබන දැනුම් දීම 36
තැපැල් ඡන්ද නිකුත් කරන බව දැන්වීම....36
ගණන් කිරීම පිළිබඳ දැන්වීම....36
ප්‍රතිඵල ප්‍රකාශ කිරීම පිළිබඳ දැන්වීම 36
ප්‍රතිඵල ගැසට් පත්‍රයේ පළ කිරීම් 37
ව්‍යවස්ථාපිත නොවන දැන්වීම් 37
ගෘහ දැන්වීම 37
මාධ්‍ය නිවේදන....37
වෙනත් දැන්වීම් 38

VIII වැනි කොටස....40
දේශපාලන පක්ෂ ලේකම්වරුන්, බලයලත් නියෝජිතයින්, කණ්ඩායම් නායකයින් හා අපේක්ෂකයින් දැනුවත් කිරීම .40
පක්ෂ ලේකම්වරුන් සමඟ පැවති සාකච්ඡා(උපදේශක කමිටු රැස්වීම්)....40

IX වැනි කොටස....42
කාර්ය මණ්ඩල සහ ප්‍රවාහන අවශ්‍යතා....42
කාර්ය මණ්ඩල අවශ්‍යතා....42
ප්‍රවාහන අවශ්‍යතා....43

X වැනි කොටස....45
ඡන්දහිමියන් වෙත විශේෂ සහන සැලසීම....45
කායික දුබලතාවයෙන් යුතු ඡන්දහිමියන් සඳහා පෞද්ගලික ප්‍රවාහන පහසුකම් යොදා ගැනීමට අවසර දීම 45
අශක්නුතාවට පත් ඡන්දහිමියන් වෙනුවෙන් ඡන්ද පත්‍රිකාව සළකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවසර දීම 45
සේවා නියුක්තිකයින්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබා දීම....46

XI වැනි කොටස....47
ඡන්ද විමසීම පැවැත්වීම 47
මූලික පසුබිම....47
ඡන්ද මධ්‍යස්ථාන පිළියෙල කිරීම 47
ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත බඩු බාහිර භාරදීම....47
ඡන්ද පොළ කාර්ය මණ්ඩලය....48
කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන්....48
ඡන්ද පොළ නියෝජිතයින් 48
ඡන්ද පොළ නිරීක්ෂකයින්....49
අනුගමනය කරන ලද විශේෂිත ක්‍රියාමාර්ග....49

XII වැනි කොටස....51
ඡන්ද හා මනාප ගණන් කිරීම 51
පසුබිම....51
ගණන් කිරීමේ මධ්‍යස්ථාන සකස් කිරීම....51
ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය 51
ගණන් කිරීමේ නියෝජිතයින්....52
ගණන් කිරීමේ දැන්වීම 52
ගණන් කිරීම ආරම්භ කිරීමේ පූර්ව අවශ්‍යතා 52
ගණන් කිරීම ආරම්භ කිරීම 53
පළමුවැනි අදියර 53
දෙවන අදියර 53
තුන්වන අදියර....53
ගණන් කිරීම පිළිබඳ සැක දුරු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග....54
නැවත ගණන් කිරීම සඳහා ඉල්ලුම් කිරීම 54

XIII කොටස....56
ප්‍රතිඵල සැකසීම හා ප්‍රතිඵල ප්‍රකාශය....56
ප්‍රතිඵල සකස් කිරීමේ ස්ථානය....56
ප්‍රතිඵල සකස් කිරීමේ නිශ්චිත කාර්යයන්....56
පළමු ප්‍රතිඵල ප්‍රකාශය....56
දෙවැනි ප්‍රතිඵල ප්‍රකාශය 56
නගරාධිපති/ නියෝජ්‍ය නගරාධිපති/ සභාපති/ උප සභාපති තෝරා පත්කර ගැනීම 57
එක් එක් පක්ෂය ස්වාධීන කණ්ඩායම විසින් පාලන බලය හිමිකර ගෙන ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා වශයෙන් 58
XIV වැනි කොටස....59

ඡන්ද විමසීමට අදාළව ගනු ලැබූ අධිකරණ ක්‍රියාමාර්ග 59
ප්‍රතික්ෂේප වූ නාමයෝජනා සම්බන්ධයෙන් ගොනු කරන ලද පෙත්සම්....59
ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරන ලද පෙත්සම්....60

ඡන්ද ප්‍රතිඵලයට විරෙහිව ගොනු කරන ලද පෙත්සම් 60
ඡන්ද විමසීම පැවැත්වීමට විරෙහිව ගොනු කරන ලද පෙත්සම් 60

XV වැනි කොටස 61
මැතිවරණ නීතිය බලාත්මක කිරීම සඳහා ගනු ලැබූ පියවර 61
මූලික පසුබිම 61
රාජ්‍ය දේපළ අනිසි ලෙස දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම වැළැක්වීම 62
නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු හා නීතිවිරෝධී පෙළපාලි වළකාලීම 63
මාධ්‍ය ආයතන වෙත උපමාන නිකුත් කිරීම 64
වත්කම් හා බැරකම් ප්‍රකාශය පිළිබඳ නියමය ක්‍රියාත්මක කිරීම 65
පැමිණිලි විමර්ශන මධ්‍යස්ථාන පිහිටුවීම 66
පසු විමර්ශන කටයුතු 67

XVI වැනි කොටස 69
ඡන්ද විමසීම වෙනුවෙන් දරන ලද වියදම 69

XVII වැනි කොටස 71
නිරීක්ෂණ හා නිර්දේශ 71
පළාත් පාලන ආයතන සංස්ථාපනය 71
නාමයෝජනා කාර්ය පරිපාටිය 73
තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් හා ඒ හා සබැඳි කරුණු 74
ඡන්ද විමසීමේ හා ගණන් කිරීමේ සංකීර්ණ ස්වභාවය 76
මනාප ගණන් කිරීමේදී එක් එක් පක්ෂය/ කණ්ඩායම වෙනුවෙන් පසු කළ යුතු අවස්ථා 77
පුරප්පාඩු පිරවීම හා සම්බන්ධ ගැටළු 77
මනාප සහිත සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමයට විරෙහිව ඉදිරිපත් කර ඇති කරුණු 78

XVIII වැනි කොටස 81
අගැයීම 81

XIX වැනි කොටස 83
සමාප්තිය 83

සංක්ෂිප්ත සටහන් 84
2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරිය) සංශෝධනය කිරීම 84
සංක්ෂිප්ත සටහන් 84
ඡන්දහිමි නාමලේඛනය 84
නාමයෝජනා 84
තරුණ අපේක්ෂක සංඛ්‍යාව 84
තැපැල් ඡන්ද 85
ඡන්ද ගණන් කිරීම 86
ප්‍රතිඵල ප්‍රකාශය 87
සමානුපාතිකව තෝරා පත් කර ගත යුතු සභිකයින් 87
පළමු පියවර 87
පරාජිත අපේක්ෂකයින් ලැබූ ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම 87
දෙවන පියවර 87
සමානුපාතිකව තෝරාපත් කරගත යුතු සභික සංඛ්‍යාව නිශ්චය කිරීම 87
තෙවන පියවර 88
අමතර තැනැත්තන් අතුරින් තෝරාපත් කරගත යුතු අපේක්ෂකයින් තීරණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම 88

පරිශිෂ්ඨ

1. පළාත් පාලන ආයතනවල ධුර කාලය 2011 මාර්තු 31 දින දක්වා වසරකින් දීර්ඝ කිරීම
අංක 1633/9 හා 2009/12/23 දින දරන අති විශේෂ ගැසට් පත්‍රය 87

2. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 4(1) වගන්තිය යටතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය තේරීම් සඳහා භාර නිලධාරීන් සහ සහකාර තේරීම් භාර නිලධාරීන් පත් කිරීම
අංක 1687/24 හා 2011/01/05 දින දරන අති විශේෂ ගැසට් පත්‍රය 91

3. පිළිගත් දේශපාලන පක්ෂ නාමාවලිය - 2011/01/27 93

4. (27/1) වගන්තිය අනුව නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත එක් එක් පළාත් පාලන ආයතනයේ තේරීම්භාර නිලධාරී වශයෙන් බලය පැවරීම
අංක 1687/25 හා 2011/01/05 දින දරන අති විශේෂ ගැසට් පත්‍රය 95
අංක 1711/03 හා 2011/06/20 දින දරන අති විශේෂ ගැසට් පත්‍රය 101
අංක 1717/19 හා 2011/08/03 දින දරන අති විශේෂ ගැසට් පත්‍රය 102

5. පළාත් පාලන ආයතන 23 ක (මහ නගර සභා 16, නගර සභා 02, ප්‍රාදේශීය සභා 05) ධුර කාලය 2011 ජුනි 30 දින දක්වා දීර්ඝ කිරීම
අංක 1689/12 හා 2011/01/18 දින දරන අති විශේෂ ගැසට් පත්‍රය 104

6. 2011 ජුනි 30 දක්වා ධුර කාලය දීර්ඝ කරන ලද පළාත් පාලන ආයතන 23 හි ධුර කාලය 2011 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කිරීම
අංක 1699/35 හා 2011/03/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය 105

7. 26 වන වගන්තිය යටතේ වූ දැන්වීම 106

8. එක් එක් පළාත් පාලන ආයතන සඳහා තරග කළ යුතු තරුණ අපේක්ෂක සංඛ්‍යාව දැක්වෙන ගැසට් නිවේදන
අංක 1687/31 හා 2011/01/06 දරන අති විශේෂ ගැසට් පත්‍රය 107

9. එක් එක් පළාත් පාලන ආයතනය සඳහා තරග කළ යුතු තරුණ, අනෙක් සහ මුළු අපේක්ෂක සංඛ්‍යාව හා තැන්පත් කළයුතු ඇප මුදල දැක්වෙන පුවත්පත් නිවේදන
පළවන අදියර 2011/01/06 113
තුන්වන අදියර 2011/08/08 121

10. ඡන්ද විමසීම පැවැත්වෙන සියලුම පළාත් පාලන ආයතනවල ධුරකාලය 2011/01/06 දිනෙන් අවසන් කරමින් විෂයභාර අමාත්‍යවරයා විසින් පළ කළ ගැසට් නිවේදනය
අංක 1687/40 හා 2011/01/06 දරන අති විශේෂ ගැසට් පත්‍රය 122

11. මාධ්‍ය නිවේදන අංක 01- 2011/01/10
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2011 නාමයෝජනා භාර ගැනීම 127

12. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ ඡන්ද ලකුණු අනුමත කරමින් පළ කරන ලද ගැසට් නිවේදනය
අංක 1686/46 හා 2010/12/31 දරන අති විශේෂ ගැසට් පත්‍රය 128

13. මාධ්‍ය නිවේදන අංක 01 - 2011/05/30
ඡන්ද විමසීම සඳහා දින නියම කිරීම 130

14. මාධ්‍ය නිවේදන අංක 06 - 2011/07/11
ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන 131

15. මුහුදුබඩ පත්තු ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම පැවැත්වීමට විරෙහිව නිකුත් කළ වාරණ නියෝගය
CA writ 72/12 - 2012/03/20 132

16. පුදුකුඩ්ඉරුප්පු ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම පැවැත්වීමට විරෙහිව නිකුත් කළ වාරණ නියෝගය
CA writ 74/12 - 2012/03/20 133

17. මාධ්‍ය නිවේදන අංක 01 - 2011/12/28
පුදුකුඩ්ඉරුප්පු සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාගෘහ දැන්වීමේ ආදර්ශය 134

18. මාධ්‍ය නිවේදන අංක 02 - 2012/02/08
පුදුකුඩ්ඉරුප්පු සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා 135

19. මාධ්‍ය නිවේදනය 2012/03/20
ජන්ද හිමියන් හා ජන්ද අපේක්ෂකයින් වෙත කෙරෙන විශේෂ නිවේදනය 136
20. ගෘහ දැන්වීම් ආදර්ශය 137
21. ජන්ද විමසීම් දැන්වීම
අංක 1691/43 හා 2011/02/01 දරන අති විශේෂ ගැසට් පත්‍රය 138
22. මාධ්‍ය නිවේදන අංක 01 - 2011/08/04
නාමයෝජනා භාරගැනීම 139
23. මාධ්‍ය නිවේදන අංක 02 -2011/01/10
තැපෑලෙන් ජන්දය දීමේ පහසුකම් 182
24. මාධ්‍ය නිවේදන අංක 04 - 2011/01/14
තැපැල් ජන්ද අයදුම්පත් භාර ගැනීමේ කාලය දීර්ඝ කිරීම 183
25. මාධ්‍ය නිවේදන අංක 05 - 2011/01/15
තැපැල් ජන්ද සහතික කිරීමේ නිලධාරීන් වෙත කෙරෙන විශේෂ නිවේදනය 184
26. මාධ්‍ය නිවේදන අංක 04 - 2011/07/08
තැපැල් ජන්ද සහතික කිරීමේ නිලධාරීන් සහ තැපැල් ජන්ද හිමියන් වෙත කරනු ලබන දැනුම්දීම 185
27. පුවත්පත් දැන්වීම - 2011/07/11
තැපැල් ජන්ද සහතික කිරීමේ නිලධාරීන් හා තැපැල් ජන්ද හිමියන් වෙත කරනු ලබන දැනුම්දීම 186
28. මාධ්‍ය නිවේදන අංක 07 - 2011/09/21
තැපැල් ජන්ද සහතික කිරීමේ නිලධාරීන් හා තැපැල් ජන්ද හිමියන් වෙත කරනු ලබන දැනුම් දීම 187
29. මාධ්‍ය නිවේදන අංක 06 - 2011/01/19
තැපෑලෙන් ජන්දය දීම 188
30. මාධ්‍ය නිවේදන අංක 17 - 2011/03/01
සියලුම සහතික කිරීමේ නිලධාරීන් හා සියලුම තැපැල් ජන්ද හිමියන් වෙත කරනු ලබන දැනුම් දීමයි 189
31. මාධ්‍ය නිවේදන අංක 02 - 2011/06/09
සියලුම සහතික කිරීමේ නිලධාරීන් සහ සියලුම තැපැල් ජන්ද හිමියන් වෙත කරනු ලබන දැනුම්දීම 190
32. මාධ්‍ය නිවේදන අංක 15 - 2011/02/19
ජන්ද පොළේදී අනන්‍යතාව සනාථ කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ජන්ද හිමියන් වෙත කෙරෙන විශේෂ දැනුම්දීම 191
33. මාධ්‍ය නිවේදන අංක 08 - 2011/07/22
නිල ජන්ද දැන්වීම්පත් සහ වලංගු හැඳුනුම්පත් 192
34. මාධ්‍ය නිවේදන අංක 11 - 2011/07/23
ජන්ද පොළේදී අනන්‍යතාව සනාථ කිරීම (කිළිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්ක) 193
35. මාධ්‍ය නිවේදන අංක 16 - 2011/02/26
පළාත් පාලන ආයතන 66 ක ජන්ද විමසීම කල් තැබීම ගැන මහජනතාවගේ දැන ගැනීම පිණිස කරනු ලබන නිවේදනයයි 194
36. මාධ්‍ය නිවේදන අංක 18 - 2011/03/01
ජන්ද විමසීම කල්තැබූ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් තැපැල් ජන්ද නිකුත් නොකළ බව දැනුම් දීම 195
37. මාධ්‍ය නිවේදන අංක 14 - 2011/02/18
සියලුම ජන්ද අපේක්ෂකයින් සහ සියලුම ජන්දදායකයින්ගේ දැන ගැනීම සඳහා කරනු ලබන විශේෂ දැනුම් දීම 196
38. මාධ්‍ය නිවේදන අංක 19 - 2011/03/04
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා තැපැල් ජන්ද සහතික කිරීමේ නිලධාරීන් වෙත දැනුම් දීම 197
39. මාධ්‍ය නිවේදන අංක 09 - 2011/07/21
අපේක්ෂකයින් වෙනත් පක්ෂවලට එකතුවීම හා අපේක්ෂකයින් අපේක්ෂකත්වයෙන් ඉල්ලා අස්වීම 198
40. මාධ්‍ය නිවේදන අංක 10 - 2011/09/26
සියලු ජන්ද අපේක්ෂකයින් සහ සියලුම ජන්ද දායකයින්ගේ දැන ගැනීම සඳහා කරනු ලබන විශේෂ දැනුම් දීම 199

41. පුවත්පත් දැන්වීම - 2011/03/04
ඡන්දය ප්‍රකාශ කිරීම සහ මනාප ලකුණු කිරීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් 200
42. පුවත්පත් දැන්වීම - 2011/09/26
ඡන්දය සලකුණු කිරීම හා මනාප සලකුණු කිරීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් 201
43. පුවත්පත් දැන්වීම - 2011/07/07
කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් විසින් විශේෂ ප්‍රවාහන පහසුකම් සඳහා ඉල්ලුම් කිරීම 202
44. මාධ්‍ය නිවේදන අංක 05 - 2011/07/09
අශක්නුතාවටපත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවශ්‍ය නීතීමය ප්‍රතිපාදන සැලසීම 203
45. මාධ්‍ය නිවේදන අංක 08 - 2011/09/21
අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම 204
46. පුවත්පත් දැන්වීම - 2011/07/11
සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු දීම 205
47. පුවත්පත් දැන්වීම - 2011/09/26
සේවා නියුක්තිකයින්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු දීම 206
48. පුවත්පත් දැන්වීම
ඡන්ද විමසීම් සඳහා අවසර දී ඇති නිරීක්ෂණ ආයතන 207
49. මාධ්‍ය නිවේදන අංක 20 - 2011/03/07
විශ්ව කාන්තා දින සැමරීමේ ජාතික උත්සවය 207
50. මාධ්‍ය නිවේදන අංක 12 - 2011/10/14
වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයින් දැනුවත් කිරීම 208
51. මාධ්‍ය නිවේදන අංක 22 - 2011/11/01
වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම 208
52. පුවත්පත් දැන්වීම - 2011/03/15
ඡන්ද විමසීම් දින පැමිණිලි 209
53. මාධ්‍ය නිවේදන අංක 03 - 2011/06/17
මැතිවරණ පැමිණිලි මධ්‍යස්ථානය 210

සටහන්

I. ඡන්ද විමසීමට අදාළව පළාත් පාලන ආයතන සංයුතිය 211
II. ඡන්දහිමි නාමලේඛන අලෙවිය පිළිබඳ තොරතුරු (පළාත් පාලන ආයතන අනුව) 212
III. ඡන්ද මධ්‍යස්ථාන පිළිබඳව තොරතුරු එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය අනුව 221
IV. ඡන්ද විමසීම, ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශ සඳහා සේවයේ යෙදුණු නිලධාරී සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව 222
V. එක් එක් පළාත් පාලන ආයතනය වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් යටතේ ලැබුණු, පිළිගත් සහ ප්‍රතික්ෂේපිත නාමයෝජනා පිළිබඳ සංඛ්‍යා සටහන 223
VI. නාමයෝජනා සංඛ්‍යාතීන් ලැබීම්, ප්‍රතික්ෂේප හා පිළිගත් වශයෙන් එක් එක් දිස්ත්‍රික්කය අනුව 231
VII. ප්‍රතික්ෂේපිත නාමයෝජනා වර්ග කිරීමේ සංඛ්‍යා සටහන (1 වැනි අදියර) 232
VIII. ප්‍රතික්ෂේපිත නාමයෝජනා වර්ග කිරීමේ සංඛ්‍යා සටහන (3 වැනි අදියර) 233
IX. මූලික තොරතුරු පරිපාලන දිස්ත්‍රික්ක අනුව 234
X. එක් එක් අදියර යටතේ තරග කළ පිළිගත් දේශපාලන පක්ෂ 235
XI. එක් එක් පළාත් පාලන ආයතන සඳහා තරග කරණ ලද පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් 236
XII. මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත ඡන්ද විමසීම් දිනට පෙර සහ ඡන්ද විමසීම් දින ලැබුණු පැමිණිලි 249

XIII. ඡන්ද විමසීම ගණන් කිරීම් හා ප්‍රතිඵල ප්‍රකාශය සඳහා සේවයේ යෙදුණු නිලධාරී සංඛ්‍යාව දිස්ත්‍රාක්ක අනුව..... 250
XIV. වක් වක් අදියර යටතේ ඡන්ද විමසීම් පවත්වන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව 251
XV. සාමාන්‍ය ඡන්ද සහ තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව 252
XVI. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2011.03.17(I අදියර) සංඛ්‍යාත්මක තොරතුරු 260
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2011.07.23(II අදියර) සංඛ්‍යාත්මක තොරතුරු 269
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2011.10.08(III අදියර) සංඛ්‍යාත්මක තොරතුරු..... 272
XVII. වක් වක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ තරඟ කළ පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව..... 273
වක් වක් පක්ෂය ස්වාධීන කණ්ඩායම පරිපාලන දිස්ත්‍රික්ක අනුව හිමිකරගත් සභිකධූර සංඛ්‍යාව..... 274
XVIII. වක් වක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ ඡන්දය ප්‍රකාශ කිරීමේ දක්වන ලද පළාත් පාලන ආයතන සහ අදාළ ප්‍රතිශතය 275
XIX. නාමයෝජනා සම්බන්ධයෙන් අධිකරණය වෙත ඉදිරිපත් වූ පෙත්සම් සහ දෙන ලද තීරණ 276
XX. ඡන්ද විමසීම් හා ගණන් කිරීම සම්බන්ධයෙන් අධිකරණය වෙත ඉදිරිපත් වූ පෙත්සම් 279
XXI. තැපෑලෙන් ඡන්දය දීම සම්බන්ධ මූලික තොරතුරු.....281

උපලේඛන

I. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත අවධාරණය කළ යුතු විශේෂ කරුණු..... 282
II. මැතිවරණ නිරීක්ෂණ ආයතන කාර්ය මණ්ඩල සහ නිරීක්ෂකයින් වෙත නිකුත් කෙරෙන ආචාර ධර්ම පද්ධතිය..... 286
III. රජයට සහ රාජ්‍ය සංස්ථාවලට අයත් දේපළ මැතිවරණ කාල සීමාව තුළදී භාවිතා කිරීම..... 287
IV. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සඳහා උපමාන 290
V. ඡන්ද විමසීම් පිළිබඳ වියදම් වාර්තාව..... 292
VI. මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ සංක්ෂිප්ත සටහනක්..... 293

I වැනි කොටස

හැඳින්වීම

01. 2011 වර්ෂයේ පවත්වන ලද මෙම ඡන්ද විමසීම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පිළිබඳ ඉතිහාසයෙහි වැදගත් සන්ධිස්ථානයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. ඊට ප්‍රධාන හේතුව වනුයේ සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය යටතේ පවත්වන ලද අවසාන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මෙය වීමට නියමිතව තිබීමයි. මින් ඉදිරියට 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත අනුව කොට්ඨාස පදනම මත සහ සමානුපාතික පදනම මත සහිකයින් තෝරා පත්කර ගැනීමේ ක්‍රමවේදය හඳුන්වා දී ඇත. එබැවින් සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමයේ ආරම්භය හා විකාශය පිළිබඳ සමාලෝචනයක් මෙම වාර්තාවට ඇතුළත් කිරීම උචිත බව පෙනී යන අතර ඒ පිළිබඳ සංක්ෂිප්ත සටහනක් මතු දැක්වේ.

සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමයේ ආරම්භය

02. 1978 වර්ෂයේදී හඳුන්වාදෙනු ලැබූ ශ්‍රී ලංකාවේ දෙවැනි ජනරජ ව්‍යවස්ථාව මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සම්බන්ධයෙන්ද විශාල පරිවර්තනයක් සිදුකරන ලදී. ප්‍රධාන වෙනස වශයෙන් දක්නට ලැබුණේ සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය මත සහිකයින් තෝරා පත්කර ගැනීමයි. පළාත් පාලන ආයතනවලට සහිකයන් තෝරා ගැනීමේදී එතෙක් පැවති ආසන ව්‍යුහය (කොට්ඨාස ක්‍රමය) සමානුපාතික ඡන්ද ක්‍රමයත් සමඟ අවලංගු කෙරිණ. පළාත් පාලන ආයතනය සංගෘහිත වන මුළු ප්‍රදේශය "ඡන්ද විමසීම් ප්‍රදේශය" වශයෙන් සළකන ලදී. කොට්ඨාස ක්‍රමය යටතේ පැවති තනි පුද්ගල නාමයෝජනා ක්‍රමය වෙනුවට නාමයෝජනා ලැයිස්තු ක්‍රමය හඳුන්වාදෙන ලදී.

03. මේ මගින් නිශ්චිත කාල සීමාවක් සඳහා සභාව පරිපාලනය කිරීම පිණිස අධිකාරී බලයක් ලබා ගැනීම සඳහා දේශපාලන පක්ෂවලින් හා ස්වාධීන කණ්ඩායම්වලින් අපේක්ෂක ලැයිස්තු ඉදිරිපත් කෙරිණ. තරග කරනු ලබන එක් එක් පක්ෂය හා ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරනු ලබන නාමයෝජනා පත්‍රයේ ඡන්ද අපේක්ෂක ප්‍රමුඛතාව අදාළ පක්ෂයේ හෝ කණ්ඩායමේ අභිමතය මත තීරණය කරන ලදී. ඒ අනුව මෙතෙක් සෘජුවම තමාගේ කොට්ඨාසය නියෝජනය කිරීම සඳහා සුදුසු යයි තීරණය කළ අපේක්ෂකයාට ඡන්දය ප්‍රකාශ කළ ඡන්දදායකයාට තමා කැමති පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ඡන්දය ප්‍රකාශ කිරීමට සිදුවිය.

ප්‍රථම සමානුපාතික පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 1979

04. 1979 වර්ෂයේදී මහ නගර සභා 12 ක් සහ නගර සභා 39 ක් වෙනුවෙන් පවත්වන ලද ඡන්ද විමසීම සමානුපාතික නියෝජන පදනම යටතේ පවත්වන ලද ප්‍රථම ඡන්ද විමසීම වේ. 1977 අංක 24 දරන (සංශෝධන) පනත මගින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ මේ සඳහා අවශ්‍ය නීතිමය පසුබිම සලසා ඇත. මෙතෙක් කොට්ඨාසයකට සීමාව තිබූ ඡන්ද විමසීම් ප්‍රදේශය, පළාත් පාලන ආයතන බල ප්‍රදේශය දක්වා ව්‍යාප්ත විය. පළාත් පාලන ආයතනය සඳහා තෝරා පත්කර ගත යුතු සහික සංඛ්‍යාව නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අනුපිළිවෙලින් තෝරා පත්කර ගන්නා ලදී. නාමයෝජනා ලැයිස්තුවෙහි අනුපිළිවෙල කලින් තීරණය කරන ලද්දක් විය. නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් කිරීමේදී පළමු හා දෙවැනි ස්ථාන නගරාධිපති/ සභාපති සහ උප නගරාධිපති/ උප සභාපති තනතුරු සඳහා පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් තීරණය කරනු ලැබූ අපේක්ෂකයින් දෙදෙනා වෙනුවෙන් වෙන් කෙරිණ. පළාත් පාලන ආයතනය සඳහා තරග කරන පක්ෂවල නම් සහ ලකුණු, ස්වාධීන කණ්ඩායම්වල හඳුනාගැනීමේ අංක සහ අදාළ ඡන්ද ලකුණු සහ ඒ එක් එක් ඡන්ද ලකුණ ඉදිරියේ ඡන්දදායකයාට තමාගේ ඡන්දය සලකුණු කිරීම සඳහා හිස් කොටුවක් ඡන්ද පත්‍රිකාවෙහි සඳහන් කෙරිණ. ගණන් කිරීම මධ්‍යගතව සිදුකරන ලද අතර එක් එක් පක්ෂය, ස්වාධීන කණ්ඩායම ලබාගත් ඡන්ද සංඛ්‍යාවට අනුව සමානුපාතිකව සහික සංඛ්‍යාව නාමයෝජනා පත්‍රයෙහි නම් සඳහන් අනුපිළිවෙලට තෝරා ගන්නා ලදී. මේ අනුව අපේක්ෂකයින්ගේ අරමුණ වූයේ තම පක්ෂයට/ කණ්ඩායමට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගැනීම හරහා ස්වකීය පක්ෂයෙන්/ කණ්ඩායමෙන් තේරී පත්වන නියෝජිතයන් සංඛ්‍යාව ඉහළ නංවා ගෙන එමඟින් තමන්ට මන්ත්‍රී/ සභි කධුරයක් හිමිකර ගැනීමයි.

සංවර්ධන සභා ඡන්ද විමසීම - 1981

05. මහ නගර සභා, නගර සභා, සුළු නගර සභා සහ ගම් සභා වශයෙන් සිව්වැදෑරුම් වූ පළාත් පාලන ආයතන ව්‍යුහය පූර්ණ පරිවර්තනයකට භාජනය කරමින් 1981 සංවර්ධන සභා පිහිටුවීම සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය පදනම් කරගෙන ඇති කරන ලද පළාත් පාලන පරිවර්තනයේ ප්‍රබල සංසිද්ධියක් විය. මේ වන විට මහ නගර සභා 12, නගර සභා 39, සුළු නගර සභා 82 සහ ගම් සභා 549 ක් වශයෙන් පැවති පළාත් පාලන ආයතන ව්‍යුහය 1980 අංක 35 දරන දිස්ත්‍රික් සංවර්ධන සභා පනත මගින් සුළු නගර සභා සහ ගම් සභා යටපත් කරමින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් වෙනුවෙන් සංවර්ධන සභාවක් පිහිටුවීමට පියවර ගන්නා ලදී. මේ අනුව පිහිටුවනු ලැබූ සංවර්ධන සභා සංඛ්‍යාව 24 ක් විය. මෙම සංවර්ධන සභාවල මූලික පරමාර්ථය වූයේ සංවර්ධන ක්‍රියාවලිය

නංවාලීම පිණිස මධ්‍යම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සහ අමාත්‍යාංශවල බලය දිස්ත්‍රික් මට්ටම දක්වා විමධ්‍යගත කිරීමය. මෙම කාර්යය සඳහා මහ නගර සභා සහ නගර සභා ප්‍රදේශ ද දිස්ත්‍රික් සංවර්ධන සභාවලට ඇතුළත් කරනු ලැබූ නමුත් ඒ ප්‍රදේශවල සේවා කාර්යයන් මහ නගර සභා සහ නගර සභාවලින් ඉටු වූ අතර අනෙකුත් ප්‍රදේශවල එම සේවා කාර්යයන් සංවර්ධන සභාව වෙත පැවරිණ. 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත යටතේ පවත්වන ලද පළමු හා එකම ඡන්ද විමසීම 1981 ජුනි මස 04 වැනි දින පවත්වන ලදී. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ මෙතෙක් මහ නගර සභා සහ නගර සභාවලට පමණක් සීමිතව පවත්වන ලද ඡන්ද විමසීම මේ මගින් දිස්ත්‍රික් මට්ටම දක්වා පුළුල්වීම පළාත් පාලන ඡන්ද විමසීම් ඉතිහාසයේ අළුත් අත්දැකීමක් විය. මෙහිදී ද දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වෙතින් අපේක්ෂක නාමයෝජනා ලැයිස්තු භාර ගැනීම සිදුකරන ලද අතර ලැයිස්තුවේ නම් ඇතුළත් කිරීමේදී ප්‍රමුඛතාව තීරණය කරන ලද්දේ අදාළ පක්ෂයේ හෝ කණ්ඩායමේ ප්‍රබලයන් විසිනි. ඒ අනුව එක් එක් පක්ෂය ලබාගත් ඡන්ද සංඛ්‍යාව අනුව සමානුපාතිකව හිමිවන සභිකධුර සංඛ්‍යාව සඳහා ඉහත කී නාමයෝජනාවේ ප්‍රමුඛතාව මත සභිකයන් තෝරා පත්කර ගන්නා ලදී. මහනුවර, නුවරඑළිය, මාතර, කුරුණෑගල, මොණරාගල, රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක සඳහා සභිකයන් නිතරගයෙන් තේරී පත්වූ අතර අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා ඡන්ද විමසීම් පවත්වන ලදී. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු දේශපාලන පක්ෂ කිහිපයක් මෙම ඡන්ද විමසීම වර්ජනය කිරීම දිස්ත්‍රික්ක කිහිපයක නියෝජිතයන් නිතරගයෙන් පත්වීමට හේතු විය.

06. මෙම ඡන්ද විමසීමට අදාළව යාපනය දිස්ත්‍රික්කයේ පැවති ඡන්ද විමසීම මැතිවරණ ඉතිහාසයේ කළුපැල්ලමක් සටහන් කළ ඡන්ද විමසීමක් වූ අතර, ඒ අමිහිරි අත්දැකීම් ඔස්සේ සංවර්ධන සභාවෙහි පැවැත්මද අස්ථාවර විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වැනි සංශෝධනයට අනුව සභිකධුරයට පත්වී එක් මසක් ඇතුළත භාර දියයුතු ප්‍රතිඥාව/ දිවුරුම දී අත්සන් නොකළ නිසා ධුරය අත්හරින ලද සභික සංඛ්‍යාව 39 ක් විය. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් උතුරු නැගෙනහිර පළාත්වල සංවර්ධන සභා සභිකයෝ වූහ. නාමයෝජනාවෙහි ඇති නම්වලින් අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ ද අදාළ ප්‍රතිඥාව/ දිවුරුම හේතුවෙන් එම සභිකයින් ද ධුරය අත්හැර යන ලදී. මෙම අර්බුදකාරී තත්ත්වය හමුවේ 1984 අංක 2 දරන හදිසි (සංවර්ධන සභා) නියෝගවල 2 වැනි නියෝගයෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් පිළිබඳ ඇමතිවරයා විසින් 1984.06.22 දින අංක 302/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නියමයකින් උතුරු හා නැගෙනහිර පළාත්වල සංවර්ධන සභා විසුරුවා හරින ලදී. යාපනය, මඩකළපුව, මන්නාරම, වවුනියාව, මුලතිව් හා ත්‍රිකුණාමලය යන සංවර්ධන සභා මෙසේ විසුරුවා හැරීමට ලක්වූ සංවර්ධන සභා වේ.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 1983

07. 1979 වර්ෂයේ පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අනුව තේරී පත්වූ සභිකයින්ගේ ධුර කාලය අවසන් වීම නිසා 1983 මැයි මස 18 වැනි දින මහ නගර සභා 12 ක් සහ නගර සභා 34 ක් ද මැයි මස 20 වැනි දින නගර සභා 4 ක් ද ඡන්ද විමසීම් පවත්වන ලදී. මැයි මස 20 වැනි දින නගර සභා 4 ක ඡන්ද විමසීම පැවැත්වීමට සිදුවූයේ එම නගර සභා බල ප්‍රදේශ ඇතුළත් වූ කළුතර, අම්බලන්ගොඩ, තංගල්ල සහ තිස්සමහාරාමය යන මැතිවරණ කොට්ඨාසවල අතුරු මැතිවරණ ද මැයි මස 18 වැනි දිනට යෙදී තිබුණු බැවිනි. මෙය සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය යටතේ පවත්වන ලද දෙවැනි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වේ. සෙසු ප්‍රදේශ මේ වන විට දිස්ත්‍රික් සංවර්ධන සභා යටතට පත්ව තිබිණි. මෙයට පෙර පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වල දී මෙන්ම 1983 මැයි 20 දින පැවැති නගර සභා ඡන්ද විමසීම්වලදී ඡන්ද ගණන් කිරීම ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානයේ දී සිදු කරනු ලැබූ අතර ඉන් පසු මේ වන තෙක් ශ්‍රී ලංකාවේ පැවති කිසිදු ඡන්ද විමසීමකදී ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානයේම ඡන්ද ගණන් කිරීම සිදු කර නොමැතිවීම විශේෂත්වයකි.

ප්‍රාදේශීය සභා සංස්ථාපනය

08. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ ඡන්ද විමසීම් නීති කිහිපයකට කළ යුතු සංශෝධන සම්බන්ධයෙන් සමාලෝචනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීමට 1983 දී ඡන්ද බලය හා මැතිවරණ පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත්කරනු ලැබ තිබුණු අතර මේ තේරීම්කාරක සභාවේ නිර්ණය විෂයන්ට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ඇතුළත් නොවූමුත් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් කෙරෙහිද මෙම තේරීම් කාරක සභාවෙහි සාකච්ඡාවල බලපෑම ඇතිවිය. ඒ වන විට සංවර්ධන සභා ක්‍රමය පිළිබඳ අපේක්ෂාවන් බිඳ වැටී තිබුණු හෙයින් පළාත් පාලන ආයතන වශයෙන් එවකට පැවති මහ නගර සභා, නගර සභා බල ප්‍රදේශවලට අමතරව සංවර්ධන සභා බල ප්‍රදේශ සඳහා සුදුසු නව පළාත් පාලන ආයතන ව්‍යුහයක් හඳුන්වා දීමේ අවශ්‍යතාවද පැන නැඟී තිබිණි.

09. දිස්ත්‍රික් සංවර්ධන සභා වෙනුවට සුදුසු නව පළාත් පාලන ආයතන ව්‍යුහයක් ඇති කළ යුතු යැයි ගෙනෙන ලද යෝජනාව අනුව 1987.04.16 දින 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත පනවන ලදී. යම්කිසි උප දිසාපති කොට්ඨාසයක් සම්පූර්ණයෙන්ම මහ නගර සභා බල ප්‍රදේශයකට අයත් වන අවස්ථාවේදී හැර සෙසු එක් එක් ප්‍රාදේශීය උප දිසාපති බල ප්‍රදේශයක් සඳහා ප්‍රාදේශීය සභාවක් බැගින් ප්‍රාදේශීය සභා සංස්ථාපනය කරන ලද අතර එක් එක් ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශය කුමක්ද යන්න ප්‍රාදේශීය මායිම් සහිතව පළාත් පාලන හා ඉදිරිකිරීම් ඇමතිවරයා විසින් අංක 435/5 - 435/29 දක්වා 1987.05.11 දිනැතිව අති විශේෂ ගැසට් පත්‍රවල පළකරන ලදී.

10. ඒ අනුව ප්‍රාදේශීය සභා පිහිටුවීමත් සමඟ දිවයින බෙදා වෙන් කෙරුණු පළාත් පාලන ආයතන සංඛ්‍යාව 308 ක් විය. එනම් මහ නගර සභා 12ක්, නගර සභා 39ක් සහ ප්‍රාදේශීය සභා 257ක් වශයෙනි.

මනාප ඡන්ද ක්‍රමයේ ආරම්භය

11. පළාත් පාලන ආයතන බල ප්‍රදේශය කොට්ඨාසවලට බෙදා එක් එක් කොට්ඨාසයක් වෙනුවෙන් තනි පුද්ගල නාමයෝජනා ලබා ගෙන පවත්වනු ලබන ඡන්ද විමසීමක් තුළින් කොට්ඨාසයේ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් අපේක්ෂකයා සභිකත්වය සඳහා තෝරාගනු ලැබූ පැරණි ක්‍රමයේදී ඡන්දය සලකුණු කිරීමෙන් තමාට කැමති පුද්ගලයා තමාගේ ගම් ප්‍රදේශයේ නියෝජිතයා වශයෙන් තෝරාගන්නා ලද්දේ ඡන්දහිමියා විසිනි. එහෙත් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ඡන්දහිමියාට තමා කැමති පක්ෂයට හෝ කණ්ඩායමට ඡන්දය දිය හැකි අතර අදාළ පක්ෂය හෝ කණ්ඩායම ලබාගත් ඡන්ද සංඛ්‍යාව අනුව සමානුපාතිකව හිමිකම් ලබන සභිකධුර සංඛ්‍යාව සඳහා අදාළ පක්ෂයේ හෝ කණ්ඩායමේ නායකත්වය විසින් කල් තබා තීරණය කරන ලද අනුපිළිවෙල අනුව නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අනුපිළිවෙලින් පුද්ගලයින් තෝරා ගන්නා ලදී. ඒ මගින් තේරී පත්වන නියෝජිතයා බොහෝවිට ඡන්දහිමියාගෙන් දුරස් පුද්ගලයකු විය. ඒ අනුව නාමයෝජනා ලැයිස්තුවක අපේක්ෂක නම් සඳහන් කිරීමේදී ප්‍රමුඛත්වය දීමේ අයිතිය පක්ෂයේ හෝ කණ්ඩායමේ ප්‍රධානීන් වෙත පැවරීම මත පක්ෂයේ අධිපතිභාවය වර්ධනය වන බවටත් ඒ තුළින් තමන්ට සුදුසු, තම ගම් ප්‍රදේශයේ සෘජුවම තමාගේ නියෝජිතයා වශයෙන් පත්කර ගැනීමට තිබූ අවස්ථාව අහිමිවීම මත ඡන්දහිමියා මේ පිළිබඳව දැඩි කලකිරීමකින් පසුවිය. එබැවින් ඡන්ද විමසීමකදී නියෝජිතයින් තෝරා ගැනීම සඳහා තමා කැමති අපේක්ෂකයාට මනාපය පළකිරීමේ අවස්ථාව ඡන්දහිමියාට ලබාදෙන ලෙස ඉල්ලිම් ඡන්ද බලය හා මැතිවරණ පිළිබඳ තේරීම් කාරක සභාව වෙත ඉදිරිපත් කෙරිණ.

12. ඡන්ද දායකයින්ගේ මෙම අපේක්ෂාවන් සපුරාලීම පිණිස තේරීම් කාරක සභාව විසින් විකල්ප යෝජනා කිහිපයක් සලකා බලන ලදී. ඒ යෝජනා අතර කලින් තිබුණු පරිදි කොට්ඨාස පදනම මත පවත්වනු ලබන ඡන්ද විමසීමකින් වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් අපේක්ෂකයා තෝරා ගැනීමේ ක්‍රමය සහ ජර්මනියේ තිබෙන පරිදි සමානුපාතික නියෝජනය සහ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයා තෝරා ගැනීම යන ක්‍රම දෙකෙහි සම්මිශ්‍රණය යන යෝජනා දෙක ඉදිරිපත් විය. මෙයින් දෙවැනි ක්‍රමය සුදුසු යයි කරන ලද තීරණය මත තේරීම් කාරක සභාවේ යෝජනා සම්මතයෙන් සමානුපාතිකව එක් එක් පක්ෂය කණ්ඩායම හිමිකර ගන්නා සභිකධුර සංඛ්‍යාව තීරණය කිරීම සඳහා ඡන්දහිමියා කැමති එක් පක්ෂයකට හෝ කණ්ඩායමකට එක් ඡන්දයකුත් එම පක්ෂය යටතේ තරග කරනු ලබන අපේක්ෂකයින් අතුරින් ඡන්දදායකයාට කැමති අපේක්ෂකයින් තිදෙනෙකුට එක් අපේක්ෂකයකුට එක බැගින් මනාප ඡන්ද තුනක් දීමටත් හැකිවන පරිදි ඡන්ද පත්‍රිකාව සකස් කෙරිණ.

13. ප්‍රාදේශීය සභා සංස්ථාපනය කරන ලද අවස්ථාව වන විට මෙවන් ඡන්ද පත්‍රිකාවක් පිළිබඳ යෝජනාව පරිපූර්ණ වී තිබුණු අතර ඒ යටතේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සැලසුම් කිරීම සිදු කෙරිණ. මේ වන විට එක් දින ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ඇති කළ යුතු විධිවිධාන පිළිබඳව ද සාකච්ඡා වෙමින් පැවතින. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසමින් 1987 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත සම්මත කෙරිණ. එමගින් එක් දින ඡන්ද විමසීමකදී ඇති කළ යුතු විධිවිධාන පිළිබඳව අවශ්‍ය ප්‍රතිපාදන සලසන ලදී. ඒ පිළිබඳව සටහනක් පහත දක්වා ඇත.

1987 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් ඇති කළ විධිවිධාන

අදාළ වගන්තිය

4 සහ 5	තේරීම්භාර/ සහකාර තේරීම්භාර නිලධාරීන්
9	සභිකත්වයට නුසුදුසුකම්
26	නාමයෝජනා කාලසීමාව
28	නාමයෝජනා කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව
29	ඇප තැන්පත්
36	තරග නොකරන ලද ඡන්ද විමසීම්
38	සිංහල අකාරාදිය අනුව අපේක්ෂක ලැයිස්තුව සහ ඡන්ද විමසීමේ දිනය
39	තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීම
45	ඡන්ද විමසීම් පෝස්ටර් දැන්වීම (අපේක්ෂකයින්ගේ නම් සහ අංක)
47	ඡන්ද පත්‍රිකාවෙහි අපේක්ෂක අනු අංක
59	ගණන් කිරීමේ නිලධාරීන්
61	ගණන් කිරීම පිළිබඳ දැන්වීම හා අදාළ ඡන්ද මධ්‍යස්ථාන ලැයිස්තුව
63	ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප කිරීම
64	ගණන් කිරීමෙන් පසු පැකට්ටු මුද්‍රා තැබීම
65	නගරාධිපති, උප නගරාධිපති, සභාපති, උප සභාපති ප්‍රකාශයට පත්කිරීම
65 අ	පුරප්පාඩු පිරවීම
75	ඡන්දයේ රහස්‍යභාවය
75 අ	ස්වාධීන කණ්ඩායමක කණ්ඩායම් නායකයා
89	අර්ථකථනය

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 1987

14. 1987 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම දීප ව්‍යාප්ත එක්දින ඡන්ද විමසීමක් වශයෙන්

පැවැත්වීමට ගනු ලැබූ ප්‍රයත්නය, ඊළඟ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 1987 වර්ෂයේ පැවැත්විය යුතු වුවත් ඒ වන විට දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය බිඳවැටීමත්, උතුරු නැගෙනහිර පළාත්වල පැන නැගී තිබුණු අර්බුදකාරී තත්ත්වය ක්‍රමයෙන් උග්‍ර අතට හැරීමත්, මේ නිසාම ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ඇතිවූ එකඟතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉන්දීය අගමැති රජීව් ගාන්ධි මැතිතුමා හා ශ්‍රී ලංකා ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා අතර ඇතිවූ ඉන්දු ලංකා ගිවිසුම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනෙන ලද 13 වැනි සංශෝධනයත්, ඒ අනුව පනවන ලද 1987 අංක 42 දරන පළාත් සභා පනත් ආදී කරුණු ගණනාවක් හේතුවෙන් රටේ ඇතිවූ අර්බුදකාරී වාතාවරණය හා බාහිර බලවේග මැදිහත්වීම මෙන්ම ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් හේතුවෙන් සාක්ෂාත් කර ගත නොහැකි විය. මහ නගර සභා 12, නගර සභා 39 සහ ප්‍රාදේශීය සභා 257 වෙනුවෙන් 1987 ජුනි මස 26 දින සිට ජුලි මස 03 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා නාමයෝජනා භාරගැනීමට සැලසුම් කර තිබූ නමුත් උතුරු සහ නැගෙනහිර පළාතේ මහ නගර සභා 2 කට නගර සභා 4 කට සහ ප්‍රාදේශීය සභා 36 කට නාමයෝජනා භාර දෙනු නොලැබිණි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉදිරිපත් වූ එකම නාමයෝජනාව ද ප්‍රතික්ෂේප විය. මහ නගර සභා 2 කට, නගර සභා 5 කට සහ ප්‍රාදේශීය සභා 68 කට සභිකයින් නිතරගයෙන් පත්විය. නාමයෝජනා කිසිවක් භාර දෙනු නොලැබූ උතුරු නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතන වෙනුවෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 35(1)(ආ) වගන්තිය යටතේ අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි දෙවැනි නාමයෝජනා කාල පරිච්ඡේදයක් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අවස්ථාවේදීද නාමයෝජනා කිසිවක් ඉදිරිපත් වූයේ නැත.

15. නාමයෝජනා එකකට වැඩි සංඛ්‍යාවක් පිළිගන්නා ලද මහ නගර සභා 8ක්, නගර සභා 30ක් සහ ප්‍රාදේශීය සභා 152 ක් වශයෙන් පළාත් පාලන ආයතන 190 ක් සම්බන්ධයෙන් 1987 අගෝස්තු මස 15 දිනට ඡන්ද විමසීම පැවැත්වීමට දින නියම කරන ලද නමුත් අනපේක්ෂිත පරිදි 1987 ජුලි මස පැවති මහජන කැළඹීම් හේතුවෙන් මෙම ඡන්ද විමසීම කල් තැබීමට සිදුවිය. කල්තබන අවස්ථාව වන විට ඡන්ද විමසීමේ පූර්ව කාර්යය වශයෙන් පැවතුනේ තැපැල් ඡන්දහිමියන්ට අදාළ ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පමණි. දිවයිනේ 308 ක් තරම්වූ පළාත් පාලන ආයතන සංඛ්‍යාවක් සඳහා ප්‍රථමවරට එක් දින ඡන්ද විමසීමක් පැවැත්වීමට දරන ලද ප්‍රයත්නය 1987 අගෝස්තු මස පැවැත්වීමට නියමිතව තිබූ ඡන්ද විමසීම කල් තැබීමත් සමඟ යටපත් විය.

16. මෙම කාල වකවානුව තුළ දිවයිනේ උතුරු නැගෙනහිර පළාත්වල මෙන්ම දකුණෙහිද දැඩි භීෂණකාරී වාතාවරණයක් පැවති අතර නිතරම මහජන කැළඹීම් ඇතිවන්නට විය. 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ පවත්වන ලද 1988 පළාත් සභා ඡන්ද විමසීම, මෙම භීෂණකාරී වාතාවරණය යටතේ පවත්වන ලද පළමු ඡන්ද විමසීම විය. මෙම ඡන්ද විමසීම 1988 අප්‍රේල් 28, ජුනි 02, ජුනි 09 සහ නොවැම්බර් 19 යන දිනවලදී පවත්වන ලදී. ජනාධිපතිවරයාගේ ධුර කාලය 1989 මුලදී අවසන් වීමට නියමිතව තිබූ බැවින් අළුතින් ජනාධිපතිවරයකු තෝරා පත්කර ගැනීම පිණිස 1988 ඔක්තෝම්බර් 21 වැනි දින නාමයෝජනා කැඳවන ලද අතර නැගෙනහිර පළාතේ පළාත් සභා ඡන්ද විමසීම අවසන්වී මසකට පසුව 1988 දෙසැම්බර් 19 වැනි දින ජනාධිපතිවරණය පවත්වන ලදී. තෝරාගනු ලබන ජනාධිපතිවරයා පිළිබඳ අවසාන ප්‍රතිඵලය ප්‍රකාශයට පත්කිරීමට පැය 6 කට ප්‍රථම එවකට පැවති පාර්ලිමේන්තුව විසිරුවා හරින ලදී. ඒ අනුව 1989 පෙබරවාරි 15 වැනි දින පාර්ලිමේන්තු මහ මැතිවරණය පවත්වන ලදී.

17. 1987 ජුලි මස ඇරඹුණු මහජන කැළඹීම් හා ප්‍රචණ්ඩකාරී වාතාවරණය මධ්‍යයේ ඉහත කී ඡන්ද විමසීම පවත්වන ලද අතර ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයේ කිසිදා නොවූ විරූ අන්ත බිහිසුණු හා ජීවිත පරිත්‍යාගයෙන් නිලධාරීන්ට රාජකාරියෙහි යෙදීමට සිදුවූ ඡන්ද විමසීම් තුනක් වශයෙන් මෙම ඡන්ද විමසීම් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත්කළ මැතිවරණ වාර්තාවල පැහැදිලිව දක්වා ඇත.

ප්‍රථම එක්දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 1991

18. 1987 වර්ෂයෙහි පැවැත්වීමට අදහස් කළ එක් දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අනපේක්ෂිත පරිදි කල් තැබීමට සිදුවීමත්, 1988 පළාත් සභා, 1988 ජනාධිපතිවරණ සහ 1989 පාර්ලිමේන්තු මහ මැතිවරණය පැවැත්වූ අතිශය භීෂණකාරී පසුබිමත් සැලකිල්ලට ගෙන තරුණ නැගිටීම් පිළිබඳවත් සුළු ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම් පිළිබඳවත් රජයේ සැලකිල්ල යොමුවී පැවති බැවින් ඒ පිළිබඳව සොයාබලා නිර්දේශ ඉදිරිපත් කිරීමට ජනාධිපති කොමිෂන් සභාවක් පත්කරන ලදී.

19. එම කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලදී නාමයෝජනා කරනු ලබන අපේක්ෂකයින්ගේ තරුණ නියෝජනයක් අනිවාර්ය කිරීමත්, සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය මඟින් සුළුජන අයිතිවාසිකම් වෙනුවෙන් වඩාත් ප්‍රශස්ත නියෝජනයක් ලබා දීමේ අරමුණ ඇතිව ඡන්දදායකයාට කැමති එක් අපේක්ෂකයකුට මනාප තුනම වුවද ලබා දීමට හැකිවන පරිදි ප්‍රතිපාදන සලසමින් 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත පනවන ලදී.

20. ඒ අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලදී නාමයෝජනා කළයුතු අපේක්ෂක සංඛ්‍යාවෙන් 40% ක් වයස අවුරුදු 18 - 35 අතර වයස් කාණ්ඩයේ තරුණ

අපේක්ෂකයින්ගෙන් සමන්විත වීම අනිවාර්ය අවශ්‍යතාවක් බවත් ඒ අනුව නාමයෝජනා කරනු ලබන තරුණ අපේක්ෂකයින් විසින් එම ඡන්ද විමසීම සඳහා යොදාගනු ලැබූ ක්‍රියාත්මක ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ආරම්භ වූ වර්ෂයේ ජූනි මස 01 වැනි දිනට වයස අවුරුදු 18 ට අඩු නොවූ ද නාමයෝජනා අවසන් දිනට වයස අවුරුදු 35 ට වැඩි නොවූ ද අයකු විය යුතු බවත් ඒ බව සනාථ කිරීම සඳහා උප්පැන්න සහතිකය හෝ උපන් දිනය සනාථ කිරීමේ දිවුරුම් ප්‍රකාශයක් අනිවාර්යයෙන් නාමයෝජනා පත්‍රය සමග භාරදිය යුතු බවත් එසේ නොවන නාමයෝජනා 31(1) වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කළ යුතු බවටත් නීති පනවන ලදී.

21. මෙම සංශෝධන පනත සමගම 1987 අගෝස්තු මස පැවැත්වීමට නියමිතව තිබී කල් තබන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව උතුරු නැගෙනහිර පළාත්වල කිසිදු නාමයෝජනාවක් ඉදිරිපත් නොවූ පළාත් පාලන ආයතන 42 සඳහා නාමයෝජනා කැඳවීමටත්, නිතරගයෙන් තේරී පත්වූ පළාත් පාලන ආයතන 75 හි නිලකාලය අවසන් කිරීමටත්, දින නියමයක් නොමැතිව ඡන්ද විමසීම කල්තැබූ පළාත් පාලන ආයතන 190 හි නාමයෝජනා බලරහිත කිරීමේත් අරමුණු ඇතිව 1990 අංක 24 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත පනවන ලදී. මෙම පනත් දෙකම 1990 ජූනි මස 19 වැනි දින සම්මත කර ගැනීමෙන් අපේක්ෂා කරන ලද්දේ ඡන්ද විමසීම් පැවැත්වීමට එරෙහිව පැනනැඟී තිබුණ තරුණ නැගිටීම් හා මහජන කැළඹිලි යම් දුරකට හෝ සමථයකට පත්කර ගැනීම බව පැහැදිලිය.

22. 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් අපේක්ෂා කරන ලද ඡන්ද විමසීම් නීතියෙහි සංශෝධන සැකෙවින් වගුව 1.1 මඟින් දක්වා ඇත.

2 ඡේදය	පළාත් පාලන ආයතනයක සභිකත්වය දැරීමට නුසුදුසු පුද්ගලයින් වශයෙන් සංවර්ධන සභාවක සභිකයින් යන්න ඉවත්කොට පාර්ලිමේන්තු, පළාත් සභා මන්ත්‍රීන් සහ වෙනත් පළාත් පාලන ආයතනයක සභිකයින් ඇතුළත් කිරීම
3(1) අනු ඡේදය	නාමයෝජනා කරනු ලබන මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් 40%ක් වයස 18 - 35 වයස් කාණ්ඩයේ තරුණ අපේක්ෂකයින් විය යුතු බව
3(2) අනු ඡේදය	නාමයෝජනා පත්‍රයට ඇතුළත් කළයුතු අපේක්ෂක සංඛ්‍යාව ගණන් බැලීම
3(3) අනු ඡේදය	තරුණ අපේක්ෂකයකු බව සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි
4 ඡේදය	ස්වාධීන කණ්ඩායම් ඇප මුදල් රාජසන්තක වීමේ අවස්ථා
5(1) ඡේදය	නාමයෝජනා ප්‍රතික්ෂේපවීමට හේතු අතරට තරුණ අපේක්ෂක සංඛ්‍යාව ඇතුළත් නොවීම සහ තරුණ අපේක්ෂකයකු බව සනාථ නොකිරීම ඇතුළත් කිරීම
5(2) ඡේදය	නාමයෝජනා කාලසීමාව අවසානයේ මධ්‍යාහ්න 12.00 සිට ප.ව.1.00 දක්වා විරෝධතා කාලයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම
6 ඡේදය	දෙවැනි නාමයෝජනා අවස්ථාවේදී නාමයෝජනා කිසිවක් නොලැබුනු විට සභිකධුර සඳහා ඇමතිවරයා විසින් නම්කරනු ලබන අය අතර වුවද 40% තරුණ නියෝජනය අනිවාර්යයෙන් තිබියයුතු බව
7(1) අනු ඡේදය	නිතරගයෙන් තේරී පත්වන අවස්ථාවක පක්ෂ ලේකම්වරයා විසින් සභාපති, උප සභාපති හා සභිකයින් නාමයෝජනා නොකළ හොත් සභිකධුර සඳහා තෝරා ගැනීමේදී තේරීම්භාර නිලධාරී විසින් අදාළ නාමයෝජනා පත්‍රයේ නම් සිංහල අකාරාදිය අනුව පෙළගැස්වීමේ අවශ්‍යතාව
7(2) අනු ඡේදය	නාමයෝජනා පත්‍රයේ පළමු හා දෙවැනි නම් දැක්වෙන යන්න වීම ලැයිස්තුව පළමුව හා දෙවැනිව නම් දැක්වෙන යනුවෙන් සංශෝධනය විය යුතුය.
7(3) අනු ඡේදය	නිතරගයෙන් තේරීපත්වන අවස්ථාවක නාමයෝජනා පත්‍රයේ නම් දැක්වෙන ආකාරයට නොව තනි ලැයිස්තුවේ නම් දැක්වෙන ආකාරයට තෝරාගත යුතු බව
8 ඡේදය	එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයින්ගේ නම් ඔහු විසින් දක්වා ඇති පරිදි එහෙත් සිංහල අකාරාදී පිලිවෙළ අනුව තනි ලැයිස්තුවක් වශයෙන් සකස් කිරීම
9 වැනි ඡේදය	ඡන්ද පත්‍රිකාව සකස්විය යුතු ආකාරය පැහැදිලි කිරීම
10 ඡේදය	මනාප එකකට වඩා ලකුණු කළ හැකි බව
11(2)අනු ඡේදය	ගණන් කිරීමේදී නුසුදුසු දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් වශයෙන් ඉවත් නොකරන බව
14 ඡේදය	තරුණ අපේක්ෂකයා යනු කිනම් වයස් කාණ්ඩයේ අයකුද යන බව
15 ඡේදය	නාමයෝජනා පත්‍රයේ ආදර්ශය
17 ඡේදය	ඡන්ද පත්‍රිකාවේ ආදර්ශය

23. 1990 අංක 24 දරන (විශේෂ විධිවිධාන) පනත මඟින් නැවත නාමයෝජනා කැඳවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමත් 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මඟින් එවකට පැවති මහජන මතවාදයන් හා කැළඹීම් සමථයකට පත්කර ගැනීමත් අපේක්ෂා කරන ලද අතර ඒ අනුව 1990 අගෝස්තු මස දිවයින පුරා එක්දින ඡන්ද විමසීමක් පැවැත්වීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් 1990 ඔක්තෝම්බර් මසදී අළුතින් නාමයෝජනා කැඳවීමට තීරණය කළත් රජය හා විපක්ෂය සාමූහිකව සාකච්ඡා කර එවැනි ඡන්ද විමසීමකට මෙම අවස්ථාව සුදුසු නොවන බව 1990 ඔක්තෝම්බර් මස 17 වැනි දින තීරණය කරන ලදී. මෙම පසුබිම යටතේ උතුරු නැගෙනහිර පැවති භීෂණකාරී වාතාවරණය සැලකිල්ලට ගෙන උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක 8 හි හැර සෙසු දිස්ත්‍රික්ක 17 ක පිහිටි පළාත් පාලන ආයතන 237 ක් වෙනුවෙන් ප්‍රථම වක් දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 1991 මැයි මස 11 වැනි දින පැවැත්වීමට ගත් තීරණය සාක්ෂාත් කරගත හැකිවිය.

24. ප්‍රථම වරට පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක් සඳහා තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සැලසීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමත්, තරුණ නියෝජනයට විශේෂයෙන්

අවකාශ සැලසීමත්, ඡන්ද පත්‍රිකා සලකුණු කිරීමේදී මනාප තුනම එක් අපේක්ෂකයකුට වුවද ලබා දීමට හැකි වීමත්, පළමුවරට පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක ඡන්ද පත්‍රිකා ගණන් කිරීම මධ්‍යගතව සිදුකර මධ්‍යගතව ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලැබීමත් හේතුවෙන් 1991 මැයි මස 11 වැනි දින පැවති ප්‍රථම එක් දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මැතිවරණ ඉතිහාසයෙහි විශේෂත්වයක් ගනී. එමෙන්ම අපේක්ෂකයින්ට ඡන්දදායකයාට මෙන්ම දේශපාලන බලධාරීන්ටද මෙම ඡන්ද විමසීම අළුත් අත්දැකීමක් විය. එක් අපේක්ෂකයකුට මනාප තුනම වුවද සලකුණු කිරීමට සලසා දී ඇති ප්‍රතිපාදන හැරෙන්නට අනෙකුත් කරුණු සමානුපාතික පදනම මත පැවති 1988 පළාත් සභා සහ 1989 පාර්ලිමේන්තු මැතිවරණ වලින් ලැබූ අත්දැකීම් මත සියලුම අංශ දැනුවත්ව තිබීම ඡන්ද විමසීමේ කටයුතු ගැටළුවකින් තොරව අවසන් කර ගැනීමට මහත් පිටුබලයක් විය.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 1994 (නැගෙනහිර පළාත හා වවුනියාව නගර සභාව)

25. 1991 වර්ෂයේදි පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී උතුරු නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම පැවැත්වීමට නොහැකි විය. ඒ අතරින් උතුරු පළාතේ වවුනියාව නගර සභාව සහ නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන සඳහා නාමයෝජනා කැඳවීමට ගත් තීරණය අවස්ථා කිහිපයකදී නාමයෝජනා කැඳවීමේ දැන්වීම පළ කිරීමට පමණක් සීමා විය. එම නාමයෝජනා කැදවීම් නිශ්ප්‍රභා කිරීමට සිදුවිය. අවසානයේදි 1993 දෙසැම්බර් මස 22 දින වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව නගර සභාව සහ නැගෙනහිර පළාතේ සියලුම පළාත් පාලන ආයතන සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම පළ කරන ලදී. ඒ අනුව මහ නගර සභා 1ක්, නගර සභා 3ක, ප්‍රාදේශීය සභා 36 ක් සමඟ පළාත් පාලන ආයතන 40 ක් සඳහා 1994/03/01 දින ඡන්ද විමසීම පවත්වන ලදී.

මෙම ඡන්ද විමසීමේ දී නැගෙනහිර පළාතේ ස්ථාන කිහිපයක ඡන්ද විමසීමට බාධා ඇතිවීම පිළිබඳව පරීක්ෂා කිරීමට ජනාධිපති කොමිෂන් සභාවක් පිහිටුවන ලද අතර එකී වාර්තාවෙන් සමහර සිද්ධීන් සිදුවූ බවට සනාථ වීම නිසා ඒ සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තන්ට එරෙහිව ක්‍රියා කළ යුතු බව නිර්දේශ කර තිබේ. මෙම පළාත් පාලන ආයතනවල නිල කාලය 1998/04/03 දින අවසන්වූ බැවින් පළාත් පාලන හා පළාත් සභා විෂය භාර ඇමතිවරයා විසින් වසරකින් නිල කාලය දීර්ඝ කරන ලද අතර එම වසරක කාලය ඉක්මයාමෙන් අනතුරුව එම ප්‍රදේශවල පැවති භීෂණකාරී වාතාවරණය මත 1999/04/04 දිනැතිව අංක 1073/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මෙම පළාත් පාලන ආයතනවල කාර්යය ඉටු කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පවරන ලදී.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 1997

26. සමුපකාර, පළාත් සභා, පළාත් පාලන සහ දේශීය වෛද්‍ය ඇමතිවරයා විසින් 1997.01.27 වැනි දින අංක 960/01 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1996 අංක 2 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ධුර කාලය) නියෝග අනුව ධුර කාලය 1997 ජනවාරි මස 27 වැනි දිනට අවසන් වූ මහ නගර සභා 12, නගර සභා 31 සහ ප්‍රාදේශීය සභා 195 ක් වෙනුවෙන් 1997 ජනවාරි මස 22 දින නාමයෝජනා දැන්වීම් පළකරන ලදී. ඒ අනුව පළාත් පාලන ආයතන 238ක් වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථාන 8248 කදී 1997 මාර්තු මස 21 වැනි දින ඡන්ද විමසීම පවත්වන ලදී. මෙම පළාත් පාලන ආයතන 238 හි නිලකාලය 2001 අප්‍රේල් මස 14 වැනි දිනට අවසන් වීමට නියමිත විය. මෙම ඡන්ද විමසීම් අවස්ථාව වන විට නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 40 ක ධුර කාලය අවසන් වී නොතිබීමත් උතුරු පළාතෙහි පැවති කලබලකාරී වතාවරණයත් මත උතුරු නැගෙනහිර පළාත් මෙම ඡන්ද විමසීම සඳහා ද ඇතුළත් නොවූ බව සඳහන් කළ යුතුව ඇත. තවද ගම්පහ ඇතුළු දිස්ත්‍රික්ක කිහිපයක ඡන්ද මධ්‍යස්ථානවලදී බලහත්කාරයෙන් ඡන්ද පාවිච්චි කිරීම ඇතුළු අකටයුතු සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ඡන්ද විමසීමේදී වාර්තා වී තිබිණි. වැඩිම සිද්ධීන් සංඛ්‍යාවක් වාර්තා වී තිබුණේ ගම්පහ දිස්ත්‍රික්කයේය.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 1998

27. යාපනය, කිළිනොච්චිය, මන්නාරම, වවුනියාව සහ මුලතිවු යන පරිපාලන දිස්ත්‍රික්කවලින් සමන්විත ප්‍රදේශය තුළ පිහිටි මහ නගර සභා 01, නගර සභා 03, ප්‍රාදේශීය සභා 27 ක් වෙනුවෙන් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා 1987 ජුනි මස 12 වන දින නාමයෝජනා දැන්වීම් පළ කරනු ලැබූ මුත් කිසිම නාමයෝජනාවක් නොලැබීමත් දෙවැනි නාමයෝජනා කාලසීමාව තුළද වලංගු නාමයෝජනා කිසිවක් ඉදිරිපත් නොවීමත් හේතුවෙන් මෙම පළාත් පාලන ආයතනවල ධුරකාලය ඇරඹීම වසරින් වසර මහජන ආරක්ෂක පනතේ විධිවිධාන යටතේ කල් තබනු ලැබිණ. එම පළාත් පාලන ආයතන 31 අතරින් කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාව සහ යාපනය දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 16 ක් වෙනුවෙන් 1997.12.02 දින නාමයෝජනා කැඳවන ලද අතර ඉදිරිපත්වූ නාමයෝජනා ගණන 72 කි. එමෙන්ම නාමයෝජනා 12ක් ප්‍රතික්ෂේප විය. ඒ අනුව 1998 ජනවාරි මස 29 වැනි දින නියමිත පරිදි ඡන්ද විමසීම් පැවැත්විය හැකි විය. එම පළාත් පාලන ආයතනවල නිල කාලය 2002/02/17 දිනට අවසන් වීමට නියමිත විය. කිළිනොච්චි, මන්නාරම, වවුනියා සහ මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්කවල පිහිටි පළාත් පාලන ආයතන 14 හි නිල කාලය 2002/02/18 දින ආරම්භ විය යුතු බවට මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ නිවේදනය 1999/02/18 දින අංක 1067/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

යාපනය දිස්ත්‍රික්කයේ දීර්ඝ කලක සිට සිවිල් පරිපාලන කටයුතු අඩාලව පැවති බැවින් ඡන්ද විමසීම සඳහා දැන්වීම් පළකිරීමත් සමඟ දේශපාලන පක්ෂ මෙන්ම විවිධ අංශ මහත් විමසිල්ලෙන් බලා සිටින්නට විය. මේ සඳහා විශේෂ ආරක්ෂාවක් ආරක්ෂක අංශ වෙතින් ලබා ගත යුතුවූ අතර පිටස්තර දිස්ත්‍රික්ක වෙතින් රාජකාරියේ නිරත වීමට ගිය නිලධාරීන්ට මෙන්ම දිස්ත්‍රික්කය තුළ නිලධාරීන්ට ද විවිධ අපහසුතාවලට මුහුණපෑමට සිදුවිය. මෙහිදී මූලික සංවිධාන කටයුතු හැර නාමයෝජනා භාර ගැනීම හා ඡන්ද විමසීම් මෙහෙයවීම යාපනයට බැහැරින් යවනු ලැබූ නිලධාරීන්ට ඉටුකිරීමට සිදුවීම විශේෂත්වයකි.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2002

28. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 25 වැනි වගන්තිය අනුව පළාත් පාලන ආයතනයක් සඳහා තෝරාපත් කර ගැනීමට නියමිත සභිකයින්ගේ නිල කාලය ආරම්භ වීමට නියමිත දිනයට ඉහතින්මවූ මාස 6 ක කාලසීමාවක් තුළ ඡන්ද විමසීම පැවැත්වීමට ප්‍රතිපාදන ඇති බැවින් ඉහතකී සියලුම පළාත් පාලන ආයතන සඳහා 2002 වර්ෂයේ ඡන්ද විමසීම පැවැත්වීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන ලදී.

29. ඒ අනුව, මහ නගර සභා 18ක්, නගර සභා 37ක් සහ ප්‍රාදේශීය සභා 256 ක් වශයෙන් පළාත් පාලන ආයතන 311 ක් සඳහා 2002 පෙබරවාරි මස 01 දින සිට 08 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලදී දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් අදාළ දිස්ත්‍රික්කයට අයත් එක් එක් පළාත් පාලන ආයතනයකට අදාළව නාමයෝජනා භාර ගන්නා ලදී.

30. මඩකළපුව දිස්ත්‍රික්කයේ එරාවුර්පත්තු, පෝරතිව්පත්තු යන ප්‍රාදේශීය සභා දෙක සහ අම්පාර දිස්ත්‍රික්කයේ ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව වෙනුවෙන් නිතරගයෙන් තේරී පත්වූ අතර කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා 3 ක් හා මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා 4 ක් වෙනුවෙන් කිසිදු නාමයෝජනාවක් නොලැබිණ. දෙවැනි වරටද නාමයෝජනා කැඳවූ නමුත් කිසිදු නාමයෝජනාවක් නොලැබුණු බැවින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 35 වැනි වගන්තිය යටතේ මෙම තත්ත්වය ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් අමාත්‍යවරයා වෙත දැනුම් දෙනු ලැබිණ.

31. යාපනය, වවුනියාව, මන්නාරම, මඩකළපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර යන දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතන 53 ක් සඳහා නියමිත පරිදි නාමයෝජනා ලැබුණු නමුත් වී වන විට එම ප්‍රදේශවල පැවති යුධමය වාතාවරණය හේතුවෙන් 2002 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38(3) වගන්තිය යටතේ අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද විමසීම් කල්තබන ලදී.

32. නියමිත පරිදි 2002 මාර්තු 20 වැනි දින පළාත් පාලන ආයතන 222 වෙනුවෙන් ඡන්ද විමසීම් පවත්වන ලද අතර ප්‍රතික්ෂේප වූ නාමයෝජනා සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගවලට එළඹීම හේතුවෙන් 2002 මාර්තු මස 25 වැනි දින පළාත් පාලන ආයතන 8 ක් සම්බන්ධයෙන්ද 2002 මැයි මස 20 වැනි දින පළාත් පාලන ආයතන 12 ක් සම්බන්ධයෙන් ද 2003 මාර්තු මස 8 වැනි දින අකුරැස්ස ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන්ද ඡන්ද විමසීම් පවත්වන ලදී. අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉදිරිපත් වූ නාමයෝජනාවක් ප්‍රතික්ෂේප වීම සම්බන්ධයෙන් පැවති නඩු විභාගයේදී දෙන ලද තීරණයට එරෙහිව මැතිවරණ කොමසාරිස්වරයා විසින් අභියාචනයක් ඉදිරිපත් කිරීම නිසා අකුරැස්ස ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම එතෙක් පමාවිය.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2006

33. මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අනුව සභාවේ නිල කාලය ආරම්භ වූ දින සිට වසර හතරක් ඉක්මවීමෙන් සභාවේ ධුර කාලය අවසන් වේ. එහෙත් ඉහත කී ආඥාපනත් සහ ප්‍රාදේශීය සභා පනත අනුව විෂයභාර අමාත්‍යවරයාට සභාවක නිල කාලය වසරකින් වැඩි කිරීම හෝ වසරකින් කෙටි කිරීම සම්බන්ධයෙන්ද අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

34. ඒ අනුව 2006 වර්ෂයෙහි පැවැත්වීමට නියමිත වූ ඡන්ද විමසීම සියලුම පළාත් පාලන ආයතන වෙනුවෙන් එක් දිනකදී පැවැත්විය හැකි වන පරිදි පහත සඳහන් පියවර ගන්නා ලදී.

අ.	උතුරු නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතන වෙනුවෙන් 2002 වර්ෂයේ ඉදිරිපත් වූ නාමයෝජනා සියල්ල විශේෂ විධිවිධාන පනතක් මගින් බල රහිත කිරීම. ඒ සඳහා 2006 අංක 02 දරන පළාත් පාලන ආයතන විශේෂ (විධිවිධාන) පනත 2006.01.19 දින සම්මත කිරීම.
ආ.	සියලුම පළාත් පාලන ආයතනවල නිල කාලය අවසන් කිරීමේ දිනය වශයෙන් 2006.04.14 දිනය ප්‍රකාශයට පත්කිරීමේ ගැසට් නිවේදනය පළකිරීම.
ඇ.	පළාත් පාලන ආයතන 21 ක් අළුතින් සංස්ථාපනය කිරීම.
ඈ.	විසුරුවා හරින ලද නාත්තන්ඩිය, හොරොව්පොතාන සහ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා නැවත සංස්ථාපනය කිරීම.

35. මේ අනුව 2006 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අනුව සියලුම පළාත් පාලන ආයතන වෙනුවෙන් ඡන්ද විමසීම් පවත්වා 2006.04.15 වැනි දිනට පෙර සභිකයින් තෝරා පත්කිරීම අවශ්‍ය විය. නියමිත පළාත් පාලන ආයතන

සංඛ්‍යාව මහ නගර සභා 18ක්, නගර සභා 42ක් සහ ප්‍රාදේශීය සභා 270 ක් වශයෙන් පළාත් පාලන ආයතන 330 කි. 2002 වන විට මහ නගර සභා 18ක්, නගර සභා 37 ක් සහ ප්‍රාදේශීය සභා 256 ක් වශයෙන් පළාත් පාලන ආයතන 311 ක් පැවති අතර එය 2006 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී අළුතින් නගර සභා 5 ක් සහ ප්‍රාදේශීය සභා 16 ක් සංස්ථාපනය කරනු ලැබූ බැවින් හා ඒ වන විට පැවති කැස්බෑව සහ අටකලන්පන්න යන ප්‍රාදේශීය සභා දෙක පරිච්ඡින්න කරනු ලැබූ බැවින් මුළු පළාත් පාලන ආයතන සංඛ්‍යාව 330 ක් විය.

36. දීප ව්‍යාප්ත එක් දින ඡන්ද විමසීමක් වශයෙන් 2006 වර්ෂයේදී මහ නගර සභා 18ක් නගර සභා 42ක් ප්‍රාදේශීය සභා 270 ක් වශයෙන් පළාත් පාලන ආයතන 330 ක් සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමේ අරමුණ ඇතිව නාමයෝජනා භාර ගනු ලැබූ නමුත් ඡන්ද විමසීම පැවැත්විය හැකි වූයේ පළාත් පාලන ආයතන 286 ක් සම්බන්ධයෙන් පමණි. වලංගු නාමයෝජනා පත්‍ර එකක් පමණක් ලැබීම හේතු කොට ගෙන මුලතිවු දිස්ත්‍රික්කයේ පුතුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරුගල් ප්‍රාදේශීය සභාව සඳහා සභිකයින් නිතරගයෙන් තේරී පත් විය.

37. අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38(3) වගන්තිය යටතේ ආරක්ෂක හේතූන් මත යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, වවුනියාව සහ මඩකලපුව යන පරිපාලන දිස්ත්‍රික්කවල මහ නගර සභා 2ක්, නගර සභා 6ක් හා ප්‍රාදේශීය සභා 37 ක් වශයෙන් පළාත් පාලන ආයතන 45 ක ඡන්ද විමසීම කල් තබන ලදී. මේ අතුරින් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාන්තන්කුඩි නගර සභාව, කෝරලේපත්තු බටහිර ප්‍රාදේශීය සභාව සහ චිරාවුර් නගර ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන තුනෙහිද ඡන්ද විමසීම් පවත්වන ලෙස ඇතැම් පාර්ශව විසින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් මත අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද විමසීම් පැවැත්වීමට තීරණය කරන ලදී.

38. මහ නගර සභා 12ක්, නගර සභා 34ක් සහ ප්‍රාදේශීය සභා 220 ක් වෙනුවෙන් 2006.03.30 දින ඡන්ද විමසීම් පවත්වන ලද අතර ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ නාමයෝජනා 1883 න් 217 ක් පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනතේ 31 (1) වගන්තියට අනුකූල නොවූ බැවින් ප්‍රතික්ෂේප විය. ඒ අතරින් මුස්ලිම් කොංග්‍රසය මගින් ඉදිරිපත් වූ නාමයෝජනා 11ක් සම්බන්ධයෙන් දී තිබුණු අතුරු තහනම් නියෝගය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉවත් කිරීම නිසා එම නාමයෝජනා නැවත පිළිගනු ලැබූ අතර මඩකලපුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 03ක් ඇතුළුව මහ නගර සභා 04ක්, නගර සභා 03ක් සහ ප්‍රාදේශීය සභා 13ක් වශයෙන් පළාත් පාලන ආයතන 20 ක ඡන්ද විමසීම 2006.05.20 දින පවත්වන ලදී.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් 2008 සහ 2009

39. උතුරු නැගෙනහිර පැවති යුධමය වාතාවරණය හේතු කොට ගෙන ආරක්ෂක හේතූන් මත 2006.09.30 දින දක්වා ඡන්ද විමසීම කල් තැබූ පළාත් පාලන ආයතන 42 (මහ නගර සභා 2ක්, නගර සභා 5ක් සහ ප්‍රාදේශීය සභා 35ක්) සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් සඳහා සුදුසු වාතාවරණයක් නොවූ බැවින් වරින්වර අවස්ථා කීපයකදීම ඡන්ද විමසීම කල්තැබීමට සිදු විය. ඡන්ද විමසීම් කල් තැබීමේ අවසන් ගැසට් නිවේදනය අංක 1502/21 හා 2007.06.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කෙරිණ. එමගින් ඡන්ද විමසීම 2008.02.29 වැනි දින දක්වා කල් තබන ලදී.

40. ඒ අතරතුර මඩකලපුව දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම කල් තබා තිබූ පළාත් පාලන ආයතන 09 සඳහා අළුතින් නාමයෝජනා කැඳවා ඡන්ද විමසීමක් පැවැත්වීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සලසමින් 2007 අංක 30 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත 2007 අගෝස්තු මස 08 වැනි දින ද යාපනය, කිලිනොච්චි, මුලතිව්, වවුනියා සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි පළාත් පාලන ආයතන 33 වෙනුවෙන් අළුතින් නාමයෝජනා කැඳවා ඡන්ද විමසීමක් පැවැත්වීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සලසමින් 2007 අංක 55 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත 2007 නොවැම්බර් මස 16 වැනි දින ද 2009 අංක 30 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත 2009 මැයි 18 වැනි දින ද සම්මත කරන ලදී. එම විශේෂ විධිවිධාන පනත් මගින් මෙතෙක් ඡන්ද විමසීම් පැවැත්විය නොහැකි වූ පළාත් පාලන ආයතනවලට අදාළව 2006 වර්ෂයේදී භාර ගනු ලැබූ නාමයෝජනා බල රහිත කරන ලදී. මෙම විශේෂ විධිවිධාන පනත්වල විශේෂත්වය වූයේ අවතැන් වූ ඡන්දභිමියන්ට තමාගේ ඡන්දය ලියාපදිංචි ඡන්ද පොළේදී ප්‍රකාශ කිරීමට යාමට ඇති බිය හේතුවෙන් වෙනත් ඡන්ද පොළකදී තම ඡන්දය පාවිච්චි කිරීමට හැකිවන පරිදි අවශ්‍ය නීති සම්පාදනය කිරීමයි. ඒ අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම කල් තබන ලද පළාත් පාලන ආයතන 09 වෙනුවෙන් 2008 මාර්තු මස 10 වැනි දින ද යාපනය මහ නගර සභාව සහ වවුනියා නගර සභාව වෙනුවෙන් 2009 අගෝස්තු මස 08 වැනි දින ද ඡන්ද විමසීම් පවත්වන ලදී. මෙම යාපනය මහ නගර සභා ඡන්ද විමසීම පැවැත්වූයේ උතුරු පළාතේ සියලුම ප්‍රදේශවල පාලනය සම්පූර්ණයෙන් රජය යටතට ගැනීමෙන් පසුව වුවද එවකටත් A-9 මාර්ගයේ ගමනාගමනයට ඉඩ දෙනු ලැබුවේ අතිශයින්ම සීමිත ප්‍රමාණයකට විශේෂ ආරක්ෂක විධිවිධාන යටතේ හෙයින් මෙම ඡන්ද විමසීමේ සංවිධාන කටයුතු සඳහා පිටතින් යවනු ලැබූ නිලධාරීන්ට විවිධ අපහසුතාවලට මුහුණදීමට සිදුවිය. 2008 සහ 2009 වර්ෂවල පවත්වන ලද මෙම ඡන්ද විමසීම්වලදී 2007 අංක 55 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත මගින් සලසන ලද විධිවිධාන පරිදි අවතැන් ඡන්දභිමියන්ට ඡන්ද භිමියකු වශයෙන් තමාගේ නම ලියාපදිංචිව ඇති

ඡන්ද පොළ වෙත යාමට ඇති බිය නිසා තමා තාවකාලිකව පදිංචිව සිටින ස්ථානයට ආසන්න ඡන්ද පොළකදී ඡන්දය ප්‍රකාශ කිරීමට අවකාශ සලසන ලදී.

41. 2006 වර්ෂයෙහි ඡන්ද විමසීම් පවත්වනු ලැබූ පළාත් පාලන ආයතන 286 සහ නිතරගයෙන් සහිකයින් තේරීපත්වූ පළාත් පාලන ආයතන දෙක සමඟ පළාත් පාලන ආයතන 288 ක නිල කාලය (වසර හතර සම්පූර්ණවීම මත) 2010 වසරේ මාර්තු මස අවසන් වීමට නියමිතවුවත් පළාත් සභා සහ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත මහ නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් පැවරී ඇති බලතල යටතේ අංක 1633/9 හා 2009.12.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයක් මගින් 2011 මාර්තු මස 31 වැනි දින දක්වා ධුරකාලය වසරකින් දීර්ඝ කරන ලදී. ඊට විශේෂයෙන් හේතු වූයේ 2010.01.26 සහ 2010.04.08 යන දිනයන්හි පිළිවෙලින් ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සඳහා දින නියම වීමයි.
(පරිශිෂ්ඨ 1)

II වැනි කොටස

පළාත් පාලන ආයතන සංයුතියෙහි ඇති වූ වෙනස්කම්

42. 2011 වර්ෂයේදී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සමානුපාතික නියෝජන ක්‍රමයෙන් බැහැරව කොට්ඨාස පදනම මත කේවල ක්‍රමය හා සමානුපාතික ක්‍රමය යන දෙකෙහි සම්මිශ්‍රණයක් සහිතව පැවැත්විය යුතු බවට රජය විසින් ගෙන තිබූ තීරණය මත පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කළ යුතු ආකාරය පිළිබඳව තේරීම් කාරක සභා අවස්ථා ගණනාවකදී සාකච්ඡා විය. අවසන් වශයෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් පිළියෙළ කළ සංශෝධන පනත් කෙටුම්පත 2010 ඔක්තෝම්බර් මස 04 වැනි දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින්ද සිය නිරීක්ෂණයන් ඉදිරිපත් කරමින් පනත් කෙටුම්පත නැවත සකස් කිරීමේ අවශ්‍යතාව දැඩි ලෙස පෙන්වා දෙන ලදී. කෙසේ වෙතත් විවිධ පාර්ශවවලින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වූ අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙන 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ද සමානුපාතික පදනම මත පැවැත්විය යුතු යැයි තීරණය කරන ලදී. 2011 අප්‍රේල් මස 01 වැනි දිනට පෙර සහිකයින් තෝරා පත්කර ගැනීමේ අවශ්‍යතාව සහ කොට්ඨාස බෙදා වෙන්කිරීමේ ක්‍රියාවලිය සඳහා ගත වන කාලය මෙහිදී සැලකිල්ලට ගැණුනු මූලික කරුණු විය. කෙසේ වෙතත් ඡන්ද විමසීම සමානුපාතික පදනම මත පැවැත්විය යුතුය යන තීරණයත් සමඟ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් අළුතින් පළාත් පාලන ආයතන සංස්ථාපනය, පළාත් පාලන ආයතනවල තත්ත්වය ඉහළ දැමීම, විසුරුවා හැර තිබුණු පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීමක් පැවැත්විය හැකි පරිදි නැවත සංස්ථාපනය කිරීම සහ ඇතැම් පළාත් පාලන ආයතනවල සභිකධුර සංඛ්‍යාව ඉහළ දැමීම ආදී වශයෙන් පළාත් පාලන ආයතන සංයුතියේ වෙනස්කම් රාශියක් සිදු කරන ලදී.

43. කඩිනමින් සිදුකරන ලද මෙම වෙනස්කම් අතුරින් ඇතැම් පළාත් පාලන ආයතන තත්ත්වයෙන් ඉහළ දැමීම හා අළුතින් සංස්ථාපනය කිරීම් බොහොමයක් පිළිබඳව සලකා බැලීමේදී හුදෙක් මහජන අවශ්‍යතාව හෝ එම පළාත් පාලන ආයතනවල සංවර්ධන තත්ත්වයන් සැලකිල්ලට ගෙන සිදුකළ බවක් නොපෙනේ. දේශපාලන අවශ්‍යතාව ප්‍රමුඛ සාධකය වී ඇති බව පැහැදිලිය. මීට හොඳම නිදර්ශන වශයෙන් කඩුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සම්පූර්ණයෙන් කඩුවෙල මහ නගර සභාව වශයෙන් සංස්ථාපනය කිරීම හා අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ කොටසක් අක්කරෙයිපත්තු මහ නගර සභාව ලෙස සංස්ථාපනය කිරීම දැක්විය හැකිය. පළාත් පාලන ආයතන සීමා නිර්ණය කිරීමේදී පවා නිශ්චිත සීමා හඳුනා ගැනීමකින් තොරව භූමි ප්‍රදේශ විවිධ අයුරින් ඒකරාශී වන පරිදි සීමා මායිම් සකස් කර ගෙන ඇති බවක් නිරීක්ෂණය වූ අතර මේ නිසා වලංගු පාර්ලිමේන්තු ඡන්දහිමි නාමලේඛනය, පළාත් පාලන ආයතන අනුව බෙදා වෙන් කිරීමේදී ගැටළු රැසකට මුහුණ දීමට සිදු වූ බව ඇතැම් දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් දැනුම් දෙන ලදී. කෙසේ වුවද අදාළ ගැසට් නිවේදන අනුව ක්‍රියා කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව බැඳී සිටින බැවින් අපහසුතා මධ්‍යයේ වුවද නාමලේඛනය සැකසීම සිදු කරන ලදී.

44. ඉහත කී පළාත් පාලන ආයතන සංයුතියෙහි වෙනස්කම් සිදු කරන ලද පළාත් පාලන ආයතන පිළිබඳ විස්තරාත්මක තොරතුරු පහත දක්වා ඇත. ඒ හේතුවෙන් ඇතැම් පළාත් පාලන ආයතන පරිච්ඡින්න කිරීමද සිදු කෙරිණ.

පරිපාලන දිස්ත්‍රික්කය	සංස්ථාපනයට පෙර පැවති පළාත් පාලන ආයතනය	සංස්ථාපනයෙන් පසු පළාත් පාලන ආයතන තත්ත්වය	පරිච්ඡින්න කරන ලද පළාත් පාලන ආයතන
කොළඹ	කඩුවෙල ප්‍රාදේශීය සභාව	කඩුවෙල මහ නගර සභාව - 1639/11 2010.02.02	කඩුවෙල ප්‍රාදේශීය සභාව
මාතලේ	දඹුල්ල ප්‍රාදේශීය සභාව	දඹුල්ල මහ නගර සභාව - 1639/13 2010.02.02	
		දඹුල්ල ප්‍රාදේශීය සභාව - 1639/13 2010.02.02	
හම්බන්තොට	හම්බන්තොට ප්‍රාදේශීය සභාව	හම්බන්තොට ප්‍රාදේශීය සභාව - 1639/12 2010.02.02	
		හම්බන්තොට මහ නගර සභාව	
	හම්බන්තොට නගර සභාව	හම්බන්තොට මහ නගර සභාව	හම්බන්තොට නගර සභාව
මඩකළපුව	චිරාවුර් නගර ප්‍රාදේශීය සභාව	චිරාවුර් නගර සභාව - 1687/23 2011.01.05	චිරාවුර් නගර ප්‍රාදේශීය සභාව
අම්පාර	අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව	අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව - 1687/30 2011.01.06	
		අක්කරෙයිපත්තු මහ නගර සභාව - 1687/30 2011.01.06	
	සම්මන්තුරෙයි ප්‍රාදේශීය සභාව	සම්මන්තුරෙයි ප්‍රාදේශීය සභාව - 1675/47 2010.10.12	
		ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව - 1605/48 2009.06.12	
කුරුණෑගල	අලව්ව ප්‍රාදේශීය සභාව	අලව්ව ප්‍රාදේශීය සභාව - 1675/3 2010.10.12	
		නාරම්මල ප්‍රාදේශීය සභාව - 1675/3 2010.10.12	

පරිපාලන දිස්ත්‍රික්කය	සංස්ථාපනයට පෙර පැවති පළාත් පාලන ආයතනය	සංස්ථාපනයෙන් පසු පළාත් පාලන ආයතන තත්ත්වය	පරිච්ඡින්න කරන ලද පළාත් පාලන ආයතන
බදුල්ල	බණ්ඩාරවෙල නගර සභාව	බණ්ඩාරවෙල මහ නගර සභාව - 1687/13 2011.01.04	බණ්ඩාරවෙල නගර සභාව
	බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව	බණ්ඩාරවෙල මහ නගර සභාව	
		බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව - 1687/13 2011.01.04	
	ඇල්ල ප්‍රාදේශීය සභාව	බණ්ඩාරවෙල මහ නගර සභාව	
		ඇල්ල ප්‍රාදේශීය සභාව - 1687/13 2011.01.04	
	පස්සර ප්‍රාදේශීය සභාව	පස්සර ප්‍රාදේශීය සභාව	
		ලුණුගල ප්‍රාදේශීය සභාව - 1672/8 2010.09.21	

45. ඒ සමඟම පළාත් පාලන ආයතන අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය මත ඒ ඒ පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන් විසින් විසුරුවා හැර තිබුණු පහත සඳහන් පළාත් පාලන ආයතන නැවත සංස්ථාපනය කරන ලදී.

පරිපාලන දිස්ත්‍රික්කය	විසුරුවා හරිනු ලැබූ පළාත් පාලන ආයතන සහ ගැසට් පත්‍ර අංකය	නැවත සංස්ථාපනය කිරීම ගැසට් පත්‍රයේ අංකය හා දිනය
කොළඹ	කොළඹ මහ නගර සභාව 1573/10 2008.10.23	1717/13 2011.08.02
කළුතර	පානදුර නගර සභාව 1532/10 2008.01.16	1687/50 2011.01.08
මහනුවර	උඩපළාත ප්‍රාදේශීය සභාව 1637/24 2010.01.22	1687/50 2011.01.08

46. ඊට අමතරව සංයුතියෙහි වෙනස්කම් වශයෙන් ජන්ද සංඛ්‍යාවන්ට සමානුපාතිකව සභික සංඛ්‍යාවේ පැහැදිලි විෂමතාවක් ඇති බව හෙලි වූ පළාත් පාලන ආයතන කිහිපයක සභිකධුර සංඛ්‍යාව ඉහළ දැමීම අරමුණු කර ගෙන ද පළාත් පාලන හා පළාත් සභා විෂය භාර අමාත්‍යවරයා විසින් පහත සඳහන් පළාත් පාලන ආයතන නැවත සංස්ථාපනය කරන ලදී.

පරිපාලන දිස්ත්‍රික්කය	පළාත් පාලන ආයතනය	වැඩි කරන ලද සභික සංඛ්‍යාව
මහනුවර	හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව	සභික සංඛ්‍යාව 12 සිට 19 දක්වා වැඩි කෙරිණ.
අම්පාර	සම්මන්තුර ප්‍රාදේශීය සභාව	සභික සංඛ්‍යාව 07 සිට 09 දක්වා වැඩි කෙරිණ.

47. ඉහත සඳහන් සංස්ථාපනය කිරීම් අනුව කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය සභාව සම්පූර්ණයෙන් කඩුවෙල මහ නගර සභාවක තත්ත්වයට උසස් කිරීමත්, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් දඹුල්ල මහ නගර සභාව වශයෙන් බෙදා වෙන් කිරීමත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ හම්බන්තොට නගර සභාව සම්පූර්ණයෙන් එකතු කර හම්බන්තොට මහ නගර සභාව සංස්ථාපනය කිරීමත්, මඩකළපුව දිස්ත්‍රික්කයේ චිරාවුර් නගර ප්‍රාදේශීය සභාව චිරාවුර් නගර සභාව වශයෙන් උසස් කිරීමත්, අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ කොටසක් අක්කරෙයිපත්තු මහ නගර සභාව වශයෙන් උසස් කිරීමත්, සම්මන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ කොටසක් ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව වශයෙන් සංස්ථාපනය කිරීමත්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව ප්‍රාදේශීය සභාවෙන් කොටසක් නාරම්මල ප්‍රාදේශීය සභාව වශයෙන් සංස්ථාපනය කිරීමත් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල නගර සභාව සම්පූර්ණයෙන් සහ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ කොටසක් සහ ඇල්ල ප්‍රාදේශීය සභාවේ කොටසක් එකතු කර බණ්ඩාරවෙල මහ නගර සභාව සංස්ථාපනය කිරීමත් පස්සර ප්‍රාදේශීය සභාවේ කොටසක් ලුණුගල ප්‍රාදේශීය සභාව වශයෙන් සංස්ථාපනය කිරීමත් සිදු කෙරිණ. මේ අනුව අළුතින් පළාත් පාලන ආයතන 09ක් සංස්ථාපනය කරන ලද අතර ඒ හේතුව නිසා කඩුවෙල ප්‍රාදේශීය සභාව, හම්බන්තොට නගර සභාව, චිරාවුර් නගර ප්‍රාදේශීය සභාව සහ බණ්ඩාරවෙල නගර සභාව යන පළාත් පාලන ආයතන හතරක් පරිච්ඡින්න විය. ඒ අනුව 2006 වර්ෂයේදී 330 ක්ව පැවති පළාත් පාලන ආයතන සංඛ්‍යාව 2011 වර්ෂයට අදාළ වන පරිදි 335 ක් දක්වා වර්ධනය විය. එම පළාත් පාලන ආයතන 335 මහ නගර සභා 23 කින් නගර සභා 41 කින් සහ ප්‍රාදේශීය සභා 271 කින් සමන්විත විය.
(සටහන 1)

III වැනි කොටස

මූලික සංවිධාන කටයුතු

48. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 25 වැනි වගන්තිය අනුව ධුරකාලය ආරම්භ වීමට නියමිතව ඇති දිනට ඉහතින් වූ මාස හයක කාලය ඇතුළත ඡන්ද විමසීම පැවැත්විය යුතුය යන නියමය මත ඡන්ද විමසීමක් සඳහා නාමයෝජනා දැන්වීම් පළ කිරීමට පෙර මූලික සංවිධාන කටයුතු ගණනාවක් ආරම්භ කිරීමේ හැකියාව ඇත.

49. ඒ අනුව ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම, ඡන්ද මධ්‍යස්ථාන පිළිබඳ අවසන් තීරණ ගැනීම, කාර්ය මණ්ඩල හා වාහන සංගණනය, මූලික මුද්‍රණ කටයුතු, තේරීම්භාර නිලධාරීන්, සහකාර තේරීම්භාර නිලධාරීන් නම් කිරීම, තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් නම් කිරීම ආදී මූලික කටයුතු මේ අතරට ගත හැකිය.

ඡන්දහිමි නාමලේඛනය

50. යම් පළාත් පාලන ආයතනයක සභිකයින් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමක කාර්යය සඳහා ඡන්ද විමසීම් නිලධරයා විසින් ඡන්දහිමි නාමලේඛනය සිංහලෙන් සහ දෙමළෙන් පිළියෙල කර සහතික කළ යුතු අතර එම නාමලේඛන එම පළාත් පාලන ආයතනයේ ඡන්ද විමසීම් ප්‍රදේශයට අනුරූප වන බලාත්මකව පවත්නා පාර්ලිමේන්තු මැතිවරණ නාමලේඛනයෙන් හෝ ලේඛනවලින් හෝ නාමලේඛනයක කොටසකින් හෝ නාමලේඛනයක කොටස්වලින් හෝ ඒවායේ යම් සංකලනයකින් සමන්විත විය යුතු යයි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 12 ආ වගන්තියෙහි දක්වා ඇත.

51. යම් පළාත් පාලන ආයතන ප්‍රදේශයක තත් කාලයෙහි වලංගුව පවත්නා එක් එක් පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාසය එම පළාත් පාලන ආයතනයේ ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලැබිය යුතුය. එසේ වුවද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 12(1) වගන්තිය අනුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින් පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාසයේ අවශ්‍ය වෙනස් කිරීම් කළ හැකිය. පළාත් පාලන ආයතනයක මායිම් අනුව එක් ඡන්ද කොට්ඨාසයක් පළාත් පාලන ආයතන දෙකකට බෙදන අවස්ථාවලදී එම කොටස් දෙක ඡන්ද කොට්ඨාස 2 ක් වශයෙන් සලකා කටයුතු කළ යුතුය. 12(3) වගන්තිය යටතේ කාන්තාවන් සඳහා වෙනම මධ්‍යස්ථානයක් පිහිටුවීම අවශ්‍යවන්නේ නම් මිස එක් ඡන්ද කොට්ඨාසයක් සඳහා එක් ඡන්ද පොළක් විනා ඊට වැඩි ගණනක් නොතිබිය යුතුය.

52. 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා දැන්වීම පළ කිරීම 2011.01.06 දින සිදුකරන ලද අතර ඒ වනවිට බලාත්මකව පැවති 2009 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය මෙම ඡන්ද විමසීම සඳහා පදනම් කර ගන්නා ලදී. ඒ අනුව 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා ඡන්දහිමි නාමලේඛනය සකස් කර 2011.01.07 වැනි දින සහතික කරන ලෙසත් සහතික කරන ලද නාමලේඛනය පිටපත් 60 බැගින් සකස් කරන ලෙසත් එහි එක් පිටපතක් බැගින් ඒ ඒ පළාත් පාලන ආයතන කාර්යාලයෙහි ප්‍රදර්ශනය කරන ලෙසත් තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදී.

53. ඊට අමතරව සියලුම පරිපාලන දිස්ත්‍රික්කවලට අයත් ඡන්දහිමි නාමලේඛන පළාත් පාලන ආයතන අනුව කට්ටල වශයෙන් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගෙන සියලුම දිස්ත්‍රික් කාර්යාල සමඟ හුවමාරු කර ගැනීමේ එක් දින වැඩසටහනක් මැතිවරණ මහලේකම් කාර්යාලයේදී 2011.01.09 වැනි දින ක්‍රියාත්මක කෙරිණ. ඒ අනුව සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල මුළු දිවයිනේම ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතනවල ඡන්දහිමි නාමලේඛන කට්ටලයක් බැගින් 2011.01.10 වැනි දින සිට ප්‍රදර්ශනය කරන ලදී. ඊට අමතරව තෝරා ගත් නාමලේඛන ප්‍රදර්ශන ස්ථාන ගණනාවක මෙම ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනය සිදු කරන ලදී.

54. මෙම නාමලේඛන ප්‍රදර්ශනයේ මූලික අරමුණ වනුයේ නාමයෝජනා දැන්වීම් පළ කළ දින සිට දින 10 කට සීමාවන තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාල සීමාව තුළ අදාළ තැපැල් ඡන්දහිමියන්ට තම ලියාපදිංචි තොරතුරු ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම වේ. ප්‍රදර්ශන කටයුතු සඳහා සහ ඡන්ද විමසීම් කටයුතු සඳහා අවම වශයෙන් එක් නාමලේඛනයකින් පිටපත් 60 ක් පමණ පොත් වශයෙන් බැඳ සකස් කිරීම අවශ්‍ය වේ. මීට අමතරව නාමලේඛන ප්‍රදර්ශන කටයුතු සඳහා සංයුක්ත තැටි සැපයීමද සිදු කරන ලදී. තැපැල් ඡන්ද සඳහා නාමලේඛන ප්‍රදර්ශනයෙන් පසු මෙම නාමලේඛන ඉතා සාධාරණ මිල ගණන් යටතේ දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වෙත අලෙවි කරන ලදී. එක් එක් පළාත් පාලන ආයතනයක් යටතේ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවේ විශාල වෙනසක් දක්නට ලැබුණු බැවින් ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාවට අනුරූප වන පරිදි නාමලේඛනයේ මිල ගණන් තීරණය කරන ලදී. නාමලේඛනය අලෙවිය පිළිබඳව විස්තරාත්මක සටහනක් යා කර ඇත.
(සටහන 2)

55. මෙම ඡන්ද විමසීමේ දී පළාත් පාලන ආයතන 301 ක් සඳහා නාමයෝජනා කැඳවීම හා තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම 2009 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පදනම් කර ගෙන සිදු කරන ලද අතර නාමයෝජනා කැඳවූ එම පළාත් පාලන ආයතන අතුරින් 234 ක් සඳහා 2009 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පදනම්

කරගෙන ඡන්ද විමසීම් සිදු කිරීමත්, අධිකරණ හේතුමත කල් තබන ලද පළාත් පාලන ආයතන 65 ක් සඳහා 2010 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය පදනම් කර ගෙන ඡන්ද විමසීම පැවැත්වීමත්, විශේෂ සිද්ධියක් වශයෙන් පෙන්වා දිය හැකිය. ඊට හේතු වූයේ ඡන්ද විමසීම කල් තබන ලද කාල පරිච්ඡේදය තුළ ඊළඟ වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය ද සහතික කිරීමයි. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 12 ආ වගන්තිය සහ 43 වගන්තිය අනුව ඡන්ද විමසීම සිදු කළ යුත්තේ තත් කාලයෙහි වලංගුව පවත්නා ඡන්දහිමි නාමලේඛනය අනුව බව නිශ්චිතව දක්වා තිබීම මෙයට හේතු වී ඇත. එහෙත් පළාත් සභා ඡන්ද විමසීම් පනත සහ පාර්ලිමේන්තු මැතිවරණ පනත අනුව නාමයෝජනා දැන්වීම් පළ කරනු ලබන අවස්ථාවේ වලංගුව පැවති ඡන්දහිමි නාමලේඛනය ඡන්ද විමසීම සඳහා ද භාවිතයට ගත යුතු බව නිශ්චිතව දක්වා ඇත. ඒ අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සඳහා ද මෙම සංශෝධනය අවශ්‍යයෙන්ම සිදු කළ යුත්තකි.

56. අම්පාර දිස්ත්‍රික් පළාත් පාලන ආයතන 7 ක් සඳහා 2004.02.21 වැනි දින පැවැත්වීමට නියමිත වූ ඡන්ද විමසීමට අදාළව ගොනු කළ ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් අංක 86/2004 අනුව මෙය ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මගින්ද තහවුරු කර ඇත. ඒ අනුව 2011.07.23 වැනි දින ඡන්ද විමසීම පවත්වන ලද දෙවැනි අදියර වෙනුවෙන් 2010 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය අදාළ පළාත් පාලන ආයතන අනුව වෙන් කර 2011.06.03 වැනි දිනැතිව ද 2011.10.08 වැනි දින පැවති තුන්වැනි අදියර වෙනුවෙන් පළාත් පාලන ආයතන අනුව සකස් කළ 2010 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය 2011.08.03 වැනි දින ද සහතික කරන ලදී.

57. ඒ අනුව පළාත් පාලන ආයතන 234 ක් සම්බන්ධයෙන් 2009 පාර්ලිමේන්තු ඡන්දහිමි නාමලේඛනය පදනම් කර ගෙන ඡන්ද විමසීමට අදාළ සියලු කටයුතු ඉටු කළ අතර පළාත් පාලන ආයතන 65 ක් සම්බන්ධයෙන් නාමයෝජනා භාර ගැනීමට අදාළව අපේක්ෂක සුදුසුකම් තීරණය කිරීම 2009 ඡන්දහිමි නාමලේඛනය පදනම් කරගෙන සිදු කරන ලද අතර තැපැල් ඡන්දහිමියන්ගේ අයදුම්පත් පරීක්ෂා කිරීම සහ ඡන්ද පොළේ දී ඡන්දහිමියා හඳුනා ගැනීම 2010 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පදනම් කරගෙන සිදු කරන ලදී. තුන් වැනි අදියර යටතේ ඡන්ද විමසීම පැවැත්වූ පළාත් පාලන ආයතන 23 සම්බන්ධයෙන් නාමයෝජනා කැඳවීම, තැපැල් ඡන්ද භාර ගැනීම සහ ඡන්ද විමසීම පැවැත්වීම යන සියලු කටයුතු 2010 ඡන්දහිමි නාමලේඛනය පදනම් කරගෙන සිදු කරන ලදී.

ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම

58. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව ඡන්දහිමි නාමලේඛනය මැතිවරණ දිස්ත්‍රික්කයකට එකක් වශයෙන් මැතිවරණ දිස්ත්‍රික්ක 22ක් සඳහා සකස් කරනු ලබන අතර එය භාවිතය පහසු වනු පිණිස පැරණි මැතිවරණ කොට්ඨාස පදනමෙන් කාණ්ඩවලට වෙන් කරනු ලැබේ. ඒ එක් එක් කාණ්ඩයක් ඡන්ද ප්‍රදේශයක් වශයෙන් හඳුන්වන අතර එක් එක් ඡන්ද ප්‍රදේශය සඳහා සිංහල අකාරාදිය අනුව නියමිත අක්ෂරයකින් පැරණි මැතිවරණ කොට්ඨාසයේ නම යටතේ හඳුන්වනු ලැබේ. එක් එක් ඡන්ද ප්‍රදේශයක් ඡන්ද කොට්ඨාසවලට බෙදා වෙන් කරනු ලබන අතර එක් එක් ඡන්ද කොට්ඨාසය අනුක්‍රමිකව අංක කරනු ලැබේ. උදාහරණ වශයෙන් ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය (අංක 02 ගම්පහ මැතිවරණ දිස්ත්‍රික්කය) අ, සිට ක, දක්වා වත්තල, මීගමුව, කටාන ආදී වශයෙන් කැළණිය දක්වා ඡන්ද ප්‍රදේශ 13 කට බෙදා වෙන් කර ඇති අතර එක් එක් ඡන්ද ප්‍රදේශයක් අංක 01 සිට අනුක්‍රමිකව ඡන්ද කොට්ඨාස සංඛ්‍යාවකට බෙදා වෙන් කර ඇත. ඒ අනුව ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය බෙදා වෙන් කර ඇති මුළු ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව 942 කි. ඡන්ද කොට්ඨාසයක් වශයෙන් හඳුන්වන්නේ කිසියම් ඡන්ද පොළකට අයත් වන ඡන්දහිමියන් පදිංචි භූමි ප්‍රදේශය වේ. එය එක ගමකින්, ගම් කිහිපයකින් හෝ ගම් කිහිපයක කොටස්වලින් හෝ නැතහොත් නාගරික ප්‍රදේශවලදී ගම් සහ වීදි වශයෙන් හෝ සංයුක්ත වන ප්‍රදේශයකි.

59. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 9(3) වගන්තිය යටතේ දැන්වීම අනුව එක් එක් ප්‍රතිශෝධනයකදී අළුතින් ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම් සලකා බලනු ලැබේ. ඡන්ද සංඛ්‍යාව 1500 කට වැඩි නම් හා ඡන්ද දායකයින්ට ඡන්ද පොළට යාම සඳහා සැතපුම් 02 කට වැඩියෙන් ගමන් කිරීමට ඇත්නම් එබඳු අවස්ථාවල එම ඡන්ද කොට්ඨාසය දෙකට බෙදා වෙන් කිරීම හෝ ඡන්ද කොට්ඨාස දෙකක් තුනකට බෙදා වෙන් කිරීම හෝ ඡන්ද කොට්ඨාසයෙහි ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව, භෞතික පිහිටීම, සමාජයීය කරුණු හා ඡන්ද පොළ ගොඩනැගිල්ල වශයෙන් යොදා ගන්නා ස්ථානය ආදී කරුණු සැලකිල්ලට ගනු ලැබේ.

60. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක් සඳහා නාමලේඛන සකස් කිරීමේදී එම ආඥාපනතේ 12(ආ) වගන්තිය අනුව පළාත් පාලන ආයතනයක් ඡන්ද විමසීම් ප්‍රදේශයට අනුරූප වන බලාත්මකව පවත්නා පාර්ලිමේන්තු ඡන්දහිමි නාමලේඛනයෙන් හෝ ලේඛනවලින් හෝ නාමලේඛනයක කොටසකින් හෝ කොටස්වලින් හෝ ඒවායේ යම් සංකලනයකින් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් විය යුතු භූමි ප්‍රදේශය තෝරා ගනු ලැබේ.

61. උදාහරණ වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයම ගතහොත් ඡන්ද ප්‍රදේශ සංඛ්‍යාව 13 කි. එහෙත් පළාත් පාලන ආයතන සංඛ්‍යාව 19කි. ඒ අනුව ඡන්ද ප්‍රදේශ 13 පළාත් පාලන ආයතන 19 කට බෙදා වෙන් කළ යුතු වනු ඇත. මෙසේ බෙදා වෙන් කිරීමේදී ඇතැම් අවස්ථාවල එක්

ඡන්ද කොට්ඨාසයක් පළාත් පාලන ආයතන දෙකකට හෝ කිහිපයකට අයත්වන අවස්ථා දක්නට ලැබේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 12(ආ) වගන්තිය යටතේ එබඳු අවස්ථාවල ඒ් එක් එක් කොටසක් ඡන්ද කොට්ඨාසයක් වශයෙන් සලකා කටයුතු කළ යුතු වනු ඇත. ඒ් අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක් සඳහා නාමලේඛන සකස් කිරීම සංකීර්ණ ක්‍රියාවලියකි.

ඡන්ද මධ්‍යස්ථාන

62. ඡන්ද මධ්‍යස්ථානයක් යනු එක් එක් ඡන්ද කොට්ඨාස බල ප්‍රදේශයක් තුළ පදිංචි ඡන්දදහිමියන්ට ඡන්දය ප්‍රකාශ කිරීම පහසු වනු පිණිස ස්ථානීය වශයෙන් අදාළ ඡන්ද කොට්ඨාසයට මධ්‍යගතව හඳුනා ගනු ලබන ස්ථානයකි. බොහෝ විට ඡන්ද මධ්‍යස්ථාන වශයෙන් යොදා ගනු ලබන්නේ රජයේ හෝ පොදු ගොඩනැගිලියි. ඡන්ද මධ්‍යස්ථාන අතුරින් විශාල සංඛ්‍යාවක් රජයේ පාසල් වන අතර ඊට අමතරව ඡන්ද මධ්‍යස්ථාන වශයෙන් ධර්ම ශාලා, ග්‍රාම සංවර්ධන සමිති ශාලා, පේෂකර්ම මධ්‍යස්ථාන ආදී පොදු ගොඩනැගිලි යොදා ගනු ලැබේ. ඡන්ද කොට්ඨාසය තුළ සුදුසු කිසිදු ගොඩනැගිල්ලක් නොමැති අවස්ථාවල තාවකාලික ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ හෝ දේශපාලන සම්බන්ධතා නොමැති පුද්ගලයෙකුගේ හෝ ඉඩමක් තෝරා ගනු ලැබේ.

63. ඡන්ද කොට්ඨාසයේ ඡන්ද සංඛ්‍යාව 1200 ට අඩු නම් තනි පෝළිමේ ඡන්ද පොළක් වශයෙන්ද, 1201 හා ඊට වැඩි නම් පෝළිම් දෙකේ ඡන්ද පොළක් වශයෙන්ද, 1500 ට වැඩි නම් ඡන්ද කොට්ඨාස දෙකක් වශයෙන්ද බෙදා වෙන් කරනු ලැබේ. එක් ඡන්ද කොට්ඨාසයක් වෙනුවෙන් ඡන්ද පොළවල් දෙකක් පිහිටුවීමට නීතියෙන් අවසර ඇත්තේ කාන්තාවන් සඳහා වෙනම ඡන්ද පොළක් පිහිටුවීම අත්‍යවශ්‍ය නම් පමණි.

64. ඡන්ද සංඛ්‍යාව 1200ක් හෝ ඊට අඩු වන ඡන්ද පොළෙහි එක පෝළිමකින් ඡන්ද දායක, දායිකාවන් මිශ්‍රව ඡන්ද පොළට ඇතුළු විය යුතු අතර පෝළිම් දෙකේ ඡන්ද පොළකදී එක් පෝළිමකින් ඡන්ද දායකයින්ද අනිත් පෝළිමෙන් ඡන්ද දායිකාවන්ද ඇතුළු විය යුතුය. ඡන්ද කොට්ඨාසයේ ඡන්ද සංඛ්‍යාව 2500 ට වැඩි අවස්ථාවලදී කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙනම ඡන්ද මධ්‍යස්ථාන දෙකක් පිහිටුවනු ලැබේ. එබඳු අවස්ථාවල කාන්තාවන් සඳහා වූ ඡන්ද පොළෙහි ඡන්ද සංඛ්‍යාව 1200 ට වැඩි නම් ගැහැණු පෝළිම් දෙකක් වශයෙන් අනු අංක 1-1000 දක්වා සහ 1001-2000 දක්වා වශයෙන් පෝළිම් දෙකෙන්ම ඡන්ද දායිකාවන් ඇතුළු කර ගනු ලැබේ. පිරිමි ඡන්ද පොළෙහිද ඡන්ද සංඛ්‍යාව අනුව තනි පෝළිමද පෝළිම් දෙකද යන්න තීරණය කරනු ලැබේ.

65. 2011 වර්ෂයේ පවත්වන ලද ඡන්ද විමසීමට අදාළව අදියර තුන යටතේ ඡන්ද මධ්‍යස්ථාන 10,789 කදී ඡන්ද විමසීම පවත්වන ලද අතර ඡන්ද විමසීම පවත්වන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව 322 ක් විය. එම පළාත් පාලන ආයතන 322 ඡන්ද කොට්ඨාස 10,382 කට බෙදා වෙන් කර තිබිණ. කාන්තාවන් සඳහා පිහිටුවන ලද ඡන්ද මධ්‍යස්ථාන 407 ද සමඟ මුළු මධ්‍යස්ථාන සංඛ්‍යාව 10,789 ක් විය. මෙම මධ්‍යස්ථාන සංඛ්‍යාව රජයේ පාසල් 8344 කින්ද රජයේ වෙනත් ගොඩනැගිලි 586 කින්ද පොදු ගොඩනැගිලි 1,382 කින්ද තාවකාලික ගොඩනැගිලි 151 කින්ද වෙනත් ගොඩනැගිලි 332 කින්ද සමන්විත විය. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය අනුව ඡන්ද මධ්‍යස්ථාන තොරතුරු සඳහන් සංඛ්‍යා සටහනක් යා කර ඇත.
(සටහන 3)

කාර්ය මණ්ඩල හා වාහන සංගණනය

66. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්ද දීප ව්‍යාප්ත ජාතික මැතිවරණයක ස්වරූපය ගන්නා බැවින් ඡන්ද විමසීමේ හා ගණන් කිරීමේ රාජකාරී සඳහා විශාල නිලධාරී හා වාහන සංඛ්‍යාවක් අවශ්‍ය වේ.

67. ඡන්ද විමසීමට අදාළ මූලික සංවිධාන කටයුතු ඡන්ද විමසීම් රාජකාරී, ගණන් කිරීමේ රාජකාරී, ප්‍රතිඵල සකස් කිරීමට අදාළ රාජකාරී සහ අවශ්‍යතා සේවා සැපයීම් රාජකාරී වශයෙන් විවිධ රාජකාරී සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ. මේ සඳහා සාමාන්‍යයෙන් දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය නිලධාරීන් සහ ගුරු භවතුන් පිළිබඳ පූර්ණ සංගණනයක් සිදු කරනු ලැබේ.

68. එහෙත් මෙම ඡන්ද විමසීම සඳහා පූර්ණ සංගණනයක් කිරීමේ අවශ්‍යතාවයන් පැන නොනැගිණි. ඊට හේතු වූයේ 2010 වර්ෂයේ පැවති ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් රැස් කරන ලද කාර්ය මණ්ඩල සංගණන තොරතුරු යථාවත් කර ගැනීම මෙහිදී ප්‍රමාණවත් වූ බැවිනි.

69. ඡන්ද විමසීමක් සඳහා එක් එක් දිස්ත්‍රික්කයට අවශ්‍ය කාර්ය මණ්ඩලය දිස්ත්‍රික්කය තුළින් හා කොළඹ සංචිතයෙන් සපයා ගන්නා ලදී. මෙම ඡන්ද විමසීම අදියර තුනක් යටතේ පවත්වනු ලැබූ බැවින් දෙවැනි හා තුන්වැනි අදියරවලදී දිස්ත්‍රික්කය තුළින් එම දිස්ත්‍රික්කයට අවශ්‍ය කාර්ය මණ්ඩලය හා වාහන සපයා ගත හැකි විය. එහෙත් එම අදියර දෙකේදීද ඡන්ද පොළ කාර්ය මණ්ඩල සඳහා කොළඹ සංචිතයෙන් සහ යාබද දිස්ත්‍රික්කවලින් යම් නිලධාරී සංඛ්‍යාවක් සියලුම දිස්ත්‍රික්ක වෙත යවන ලදී. මෙසේ සිදු කරන ලද්දේ මිශ්‍ර කාර්ය මණ්ඩලයක් යටතේ ඡන්ද විමසීම පැවැත්වීම අරමුණු කර ගෙනය.

70. ඡන්ද විමසීම් පවත්වන ලද පළාත් පාලන ආයතන 322 සඳහා අවශ්‍ය වූ මුළු නිලධාරී සංඛ්‍යාව 175,501 ක් වූ අතර දිස්ත්‍රික්කය තුළින්, යාබද දිස්ත්‍රික්කවලින් හා කොළඹ සංචිතයෙන් සපයා ගත් එක් එක් ගණයේ නිලධාරී සංඛ්‍යාව පිළිබඳව සහ වාහන සංඛ්‍යාව පිළිබඳව විස්තර දැක්වෙන සටහන් යා කර ඇත.
(සටහන් 4,5)

තේරීම්භාර නිලධරයන් සහ සහකාර තේරීම්භාර නිලධරයන්

71. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 4(1)වගන්තිය අනුව එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තේරීම්භාර නිලධාරීවරයෙකු සහ සහකාර තේරීම්භාර නිලධාරීවරයෙකු හෝ සහකාර තේරීම්භාර නිලධාරීන් යම් සංඛ්‍යාවක් නමින් හෝ නිල නාමයෙන් පත් කළ යුතුය. ඒ අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වශයෙන්ද එක් එක් සහකාර, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා වශයෙන් සේවයේ නිරත නිලධරයා අදාළ දිස්ත්‍රික්කයේ සහකාර තේරීම්භාර නිලධාරී වශයෙන්ද පත් කරන ලදී.

72. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27(1) වගන්තිය මඟින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල අනුව 4(1) වැනි වගන්තිය යටතේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙත පැවරී ඇති කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම අදාළ සහකාර තේරීම්භාර නිලධාරී වෙත පැවරීමේ ගැසට් නිවේදනය 1687/24 හා 2011 ජනවාරි 05 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී.
(පරිශිෂ්ඨ 2)

73. ඡන්ද විමසීමට අදාළව ඉටු කළ යුතු මූලික කටයුතු වනාම් නාමයෝජනා සහ තැපැල් ඡන්ද කටයුතු පැවරීම සඳහා එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා යාබද කාර්යාලවලින් තේරීම්භාර නිලධාරී විසින් නිර්දේශ කරනු ලබන මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාවක් සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් තනතුරු නාමයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම පළමුවැනි සහ තෙවැනි අදියරවලදී මූලික වශයෙන් සිදු කෙරිණ. ඡන්ද විමසීමේ හා ගණන් කිරීමේ රාජකාරී සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන් අවශ්‍යතාව සංගණන දත්ත යථාවත් කර ගැනීමෙන් අනතුරුව නම හා තනතුරු නාමය සහිතව ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

දේශපාලන පක්ෂ

74. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පිළිගත් දේශපාලන පක්ෂ වශයෙන් පක්ෂ 67 ක් මේ වන විට ලියාපදිංචිව පැවතිණ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27අ(1) වගන්තිය අනුව පාර්ලිමේන්තු මැතිවරණ රාජ සභා ආඥාව යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලබන සෑම දේශපාලන පක්ෂයක්ම එම දේශපාලන පක්ෂය එම ආඥාව යටතේ එසේ සලකනු ලබන තාක් කල් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් කාර්ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබිය යුතුය. පිළිගත් දේශපාලන පක්ෂ නාමාවලියේ පිටපතක් යා කර ඇත.
(පරිශිෂ්ඨ 3)

75. ඊට අමතරව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27අ(3)(4) සහ (5) වගන්තිවලින් පළාත් පාලන ආයතන කාර්ය සඳහා පමණක් සීමිත වන පරිදි පක්ෂ ලියාපදිංචියක් හඳුන්වා දී ඇතත්, එම තත්ත්වය ප්‍රායෝගික නොවන බැවින් සමානුපාතික පදනම යටතේ සිදු කරන ලද කිසිදු පළාත් පාලන ආයතන ඡන්ද විමසීමකදී මෙය ක්‍රියාත්මක නොවීය. 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් එම වගන්තිය ඉවත් කර ඇත. කෙසේ වෙතත් ලේඛනගත පිළිගත් දේශපාලන පක්ෂ 67 අතුරින් අදාළ පක්ෂයේ ලේකම්වරයා පුරප්පාඩු වීම සහ ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් හිමිකම් ඉල්ලා සිටීම හේතුවෙන් ගැටළු පැන නැඟී ඇති පහත සඳහන් පක්ෂ මෙම ඡන්ද විමසීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂ වශයෙන් පිළිනොගතයුතු බවත් ඉදිරියේදී කිසියම් වෙනසක් සිදුවුවහොත් ෆැක්ස් මගින් අවශ්‍ය තොරතුරු දැනුම් දෙනු ලබන බවත් 2011.01.17 දිනෙන් යුතුව සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත සහ නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර, සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් දැනුම් දෙන ලදී.

01.	ඊලාම් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ	(9)
02.	ජාතික සංවර්ධන පෙරමුණ	(28)
03.	මුස්ලිම් විමුක්ති පෙරමුණ	(49)
04.	ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ	(60)

76. 2011.01.06 වැනි දින පළ කරන ලද නාමයෝජනා දැන්වීම අනුව පිළිගත් දේශපාලන පක්ෂ වලින් නාමයෝජනා 1282 ක් සහ ස්වාධීන කණ්ඩායම්වලින් නාමයෝජනා 765 ක් ඉදිරිපත් විය. එයින් ප්‍රතික්ෂේප වූ නාමයෝජනා හැර පිළිගත් පක්ෂවලින් ඉදිරිපත් වූ නාමයෝජනා 1133 ක් වෙනුවෙන් සහ ස්වාධීනව ඉදිරිපත් වූ නාමයෝජනා 462 ක් වෙනුවෙන් 2011.03.17 දින ඡන්ද විමසීම පවත්වන ලදී. ප්‍රතික්ෂේප වූ නාමයෝජනා අතුරින් අධිකරණය විසින් නැවත පිළිගත් නාමයෝජනා සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ 20 ක් සහ ස්වාධීන කණ්ඩායම් 72 ක් යටතේ පළාත් පාලන ආයතන 65 කට අදාළ ඡන්ද විමසීම 2011.07.23 වැනි දින පවත්වන ලදී. 2011.12.31 දින දක්වා ඡන්ද විමසීම කල් තබා තිබූ පළාත් පාලන ආයතන 23 ට අදාළව පිළිගත් දේශපාලන පක්ෂ වලින් නාමයෝජනා 169ක් ද ස්වාධීන කණ්ඩායම් 132

කින් නාමයෝජනා 132ක් ද ඉදිරිපත් වූ අතර එයින් පිළිගත් පක්ෂවලින් ඉදිරිපත් වූ නාමයෝජනා 160 ක් සහ ස්වාධීන කණ්ඩායම්වලින් ඉදිරිපත් වූ නාම යෝජනා 104 වශයෙන් නාමයෝජනා 264 වෙනුවෙන් 2011.10.08 වැනි දින ඡන්ද විමසීම් පවත්වන ලදී.
(සටහන 6)

IV වැනි කොටස

නාමයෝජනා

මූලික පසුබිම

77. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 25 වැනි වගන්තිය අනුව පළාත් පාලන ආයතනයක සභිකයින් තෝරාපත් කර ගැනීම සම්බන්ධයෙන් වූ සෑම ඡන්ද විමසීමක්ම, තෝරාපත් කර ගනු ලැබිය යුතු සභිකයින්ගේ ධුර කාලය ආරම්භවීමට නියමිතව ඇත්තේ යම් දිනයක ද ඒ දිනයට ඉහතින්ම වූ මාස 6 ක කාලසීමාව ඇතුළත පවත්වනු ලැබිය යුතුය. එහෙත් විෂය භාර අමාත්‍යවරයා වෙත අදාළ මහ නගර සභා, නගර සභා ආඥාපනත් සහ ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල අනුව 2010 මාර්තු මස අවසන්වීමට නියමිතව පැවති ධුර කාලය 2011 මාර්තු මස 31 වැනි දින දක්වා වසරකින් දීර්ඝ කරන ලදී.

78. ඒ අනුව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් විසින් ඔහුගේ අංක පී/ඒල්/7/1/05/46 හා 2011.01.05 සහ 2011.01.06 දිනැති ලිපිවලින් දැනුම්දී ඇති පරිදි ඡන්ද විමසීම තවදුරටත් කල් තැබීමට රජය විසින් තීරණය කර ඇති මහ නගර සභා 16ක්, නගර සභා 02ක් සහ ප්‍රාදේශීය සභා 05ක් ඇතුළු පළාත් පාලන ආයතන 23ක් ද තවදුරටත් ධුර කාලය ඉදිරියට පැවති මඩකළපුව මහ නගර සභාව ඇතුළුව මඩකළපුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 09ක්, යාපනය මහ නගර සභාව සහ වවුනියා නගර සභාව ද ඇතුළුව පළාත් පාලන ආයතන 11ක් සමඟ පළාත් පාලන ආයතන 34 ක හැර සෙසු පළාත් පාලන ආයතන 301 වෙනුවෙන් මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් 2011.01.06 දිනෙන් යුතුව නාමයෝජනා දැන්වීම පළ කරන ලදී. මේ පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 04 වැනි වගන්තිය අනුව එක් එක් පළාත් පාලන ආයතනය සඳහා තේරීම්භාර නිලධාරීන් වශයෙන් පත් කර ඇති අදාළ දිස්ත්‍රික් භාර සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්/ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරුන් දැනුවත් කරන ලදී. නාමයෝජනා දැන්වීම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වගන්තිය අනුව අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් ප්‍රාදේශීය වශයෙන් එකී පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීමකි. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 27 (1) වැනි වගන්තිය මඟින් පැවරී ඇති බලතල අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් අංක 1687/25 හා 2011 ජනවාරි 05 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මඟින් එම කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම අදාළ ආඥාපනතේ 4 (1) වැනි වගන්තිය යටතේ දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර සහ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත පවරන ලදී.
(පරිශිෂ්ඨ 4)

79. අතිගරු ජනාධිපතිතුමා විසින් (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ 2011 ජනවාරි මස 18 දිනෙන් යුතුව 2011 අංක 2 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලනය කිරීමේ) නියෝගය යටතේ ඡන්ද විමසීම කල් තබන ලද මහ නගර සභා 16 නගර සභා 2 සහ ප්‍රාදේශීය සභා 5 හි සභිකයින්ගේ ධුර කාලය 2011 ජුනි මස 30 වැනි දින දක්වා දීර්ඝ කිරීමේ ගැසට් නිවේදනය අංක 1689/12 හා 2011 ජනවාරි 18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී. අනතුරුව අතිගරු ජනාධිපතිතුමා විසින් ඉහත කී ගැසට් නිවේදනය පරිච්ඡින්න කරමින් 2011 අංක 3 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලනය කිරීමේ) නියෝගය යටතේ ධුර කාලය අවසන් වන දිනය 2011 දෙසැම්බර් 31 දිනය බව සඳහන් ගැසට් නිවේදනය අංක 1699/35 හා 2011 මාර්තු මස 30 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී.
(පරිශිෂ්ඨ 5,6)

80. මේ අනුව එම පළාත් පාලන ආයතන 23 සඳහා 2011.12.31 දිනට පෙර ඡන්ද විමසීම පැවැත්විය යුතු බැවින් මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් අනුව 2011.08.04 දිනැතිව අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් එකී පළාත් පාලන ආයතන 23 සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම් පළ කරන ලදී.
(පරිශිෂ්ඨ 7)

81. නාමයෝජනා දැන්වීම මඟින් අදාළ පළාත් පාලන ආයතන සඳහා නාමයෝජනා භාර ගන්නා ස්ථානය, නාමයෝජනා කාලපරිච්ඡේදය, නාමයෝජනා කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව වියින් 40% හෙවත් නාමයෝජනා කළ යුතු තරුණ අපේක්ෂක සංඛ්‍යාව, ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල හා එක් එක් ස්වාධීන කණ්ඩායම සඳහා අංක සහ ලකුණු වෙන් කර දෙනු ලබන දිනය, වේලාව හා ස්ථානය යන තොරතුරු සියල්ලක් ප්‍රසිද්ධ කරනු ලැබේ. මෙම දැන්වීම භාෂාත්‍රයෙන්ම සකසා ප්‍රසිද්ධ කිරීමට පියවර ගනු ලැබේ. ඒ සමඟම මැතිවරණ කොමසාරිස්වරයා විසින් එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා තරග කළ යුතු තරුණ අපේක්ෂක සංඛ්‍යාව දැක්වෙන 28(1)(ආ) වගන්තිය යටතේ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කළ යුතුවේ. ඒ අනුව එම දැන්වීම 1687/31 හා 2011 ජනවාරි 06 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 89 වැනි වගන්තිය අනුව තරුණ අපේක්ෂකයා

යනු ක්‍රියාත්මකව පවත්නා ඡන්දලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ වූ වර්ෂයේ ජුනි මස 01 වැනි දිනට වයස 18 ට අඩු නොවූද නාමයෝජනා අවසන් දිනට වයස අවුරුදු 35 ට නොවැඩිවූද තැනැත්තන් බව දක්වා ඇත. (පරිශිෂ්ඨ 8)

82. ඊට අමතරව එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා තෝරා ගැනීමට නියමිත සභික සංඛ්‍යාව, තරග කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව (තරුණ, වෙනත් සහ මුළු අපේක්ෂක සංඛ්‍යාව වශයෙන්) හා ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල යන තොරතුරු ඇතුළත් පුවත්පත් දැන්වීමක් භාෂාත්‍රයෙන් යුතුව පළ කළ යුතුවේ. 2011.01.06 වැනි දින පළාත් පාලන ආයතන 301 වෙනුවෙන් නාමයෝජනා දැන්වීම පළ කිරීමත් සමඟ නගර සභා ආඥාපනතේ 10(2)(අ) වගන්තිය හා ප්‍රාදේශීය සභා පනතේ 5(2)(අ) වගන්තිය යටතේ විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව එකී සියලුම සභාවල සභිකයින්ගේ ධුර කාලය 2011.01.06 දිනෙන් අවසන් කිරීමේ ගැසට් නිවේදනය 2011 ජනවාරි 06 දිනැතිව අංක 1687/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී. ඊට අමතරව අතිගරු ජනාධිපතිතුමා විසින් 40 අධිකාරය වූ මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ 2011.01.06 දින සිට එකී නගර සභා සහ ප්‍රාදේශීය සභාවලට නියෝජිතයින් පත්කර සභාවේ කටයුතු ආරම්භ කරන තෙක් එකී නගර සභාවල සහ ප්‍රාදේශීය සභාවල පරිපාලන කටයුතු ප්‍රාදේශීය ලේකම්වරුන් හා පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත පැවරීම 2011.01.06 දිනැතිව අංක 1687/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මඟින් ප්‍රකාශයට පත් කර ඇත.
(පරිශිෂ්ඨ 9,10)

83. එමෙන්ම මහ නගර සභා 16ක්, නගර සභා 02ක් සහ ප්‍රාදේශීය සභා 05 ක් වෙනුවෙන් නාමයෝජනා දැන්වීම 2011.08.04 වැනි දින පළ කරනු ලැබීමත් සමඟ එම සභාවල ධුර කාලය 2011.12.31 වැනි දින දක්වා දීර්ඝ කරමින් අංක 1699/35 හා 2011 මාර්තු 30 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ගැසට් නිවේදනය පරිච්ඡින්න කරමින් 40 වැනි අධිකාරය වූ මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2011 අංක 6 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලනය කිරීමේ) නියෝගය මඟින් අදාළ මහ නගර සභා 16 නගර සභා 02 ප්‍රාදේශීය සභා 05 හි සභිකයින්ගේ ධුර කාලය 2011 අගෝස්තු මස 10 වැනි දිනෙන් අවසන් විය යුතු යැයි නියෝග කරන ලදී. මෙම නියෝගය අංක 1718/6 හා 2011 අගෝස්තු 08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී. ඒ සමඟම (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2011 අංක 7දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලනය කිරීමේ) නියෝග යටතේ 2011 අගෝස්තු 10 දින සිට අදාළ පළාත් පාලන ආයතන වෙනුවෙන් ඡන්ද විමසීම් පවත්වා එකී සභාවලට නියෝජිතයින් පත්කර එකී සභාවන්හි කටයුතු ආරම්භ කරනු ලබන දිනය තෙක් එකී මහ නගර සභාවල, නගර සභාවල සහ ප්‍රාදේශීය සභාවල පරිපාලන කටයුතු කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් හෝ පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත පැවරීමේ ගැසට් නිවේදනය අංක 1718/7 හා 2011 අගෝස්තු 08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී.

නාමයෝජනා භාර ගැනීම

84. නාමයෝජනා දැන්වීම් පළ කළ දිනට පසුව එළඹෙන 14 වැනි දිනයෙන් නාමයෝජනා භාර ගැනීම ආරම්භ විය යුතු අතර 21 වැනි දින මධ්‍යහ්න 12.00 ට නාමයෝජනා භාර ගැනීම අවසන් විය යුතුය (26 වගන්තිය). ඒ අනුව 2011.01.06 වැනි දින පළ කරන ලද නාමයෝජනා දැන්වීමට අනුව 2011.01.20 දින සිට 2011.01.27 දින මධ්‍යහ්න 12.00 දක්වා කාලසීමාව ඇතුළත කාර්යාල වේලාවන් තුළ නාමයෝජනා භාර ගැනීම සිදු කරන ලදී. නාමයෝජනා භාර ගැනීම සහ නාමයෝජනා භාර ගැනීමෙන් පසු විරෝධතා භාර ගැනීම, නාමයෝජනා පරීක්ෂා කර තීරණ දැනුම් දීම, ස්වාධීන කණ්ඩායම් සඳහා අංක සහ ලකුණු වෙන් කර දීම ආදී විශාල වැඩ කොටසක් නාමයෝජනා අවසන් දින මධ්‍යහ්න 12 න් පසු ඉතා කෙටි කාලසීමාවක් තුළ ඉටු කළ යුතු බැවින් හා එම අවස්ථාවට පක්ෂ ලේකම්, බලයලත් නියෝජිත, කණ්ඩායම් නායක හා බලයලත් නියෝජිත/ කණ්ඩායම් නායක විසින් බලය පැවරූ අයකුට සහභාගිවීමට අවස්ථාව දිය යුතු බැවින් ඉඩකඩ සහිත ස්ථානයක් නාමයෝජනා කටයුතු සඳහා තෝරා ගත යුතු බවත්, තේරීම්භාර නිලධාරීගේ නිල කාමරය හෝ මැතිවරණ කාර්යාලය මේ සඳහා සුදුසු නොවන බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය සම්මන්ත්‍රණ ශාලාව මේ සඳහා යොදා ගැනීම සුදුසු බවත්, කල්තබා තේරීම්භාර නිලධාරීන් වෙත දැනුම් දෙන ලදී.
(පරිශිෂ්ඨ 11)

85. ඡන්ද විමසීම සඳහා තරග කරන සෑම ස්වාධීන කණ්ඩායමක් විසින්ම නාමයෝජනා පත්‍රයෙහි නම් සඳහන් එක් එක් අපේක්ෂකයෙකු වෙනුවෙන් රු.250/= බැගින් වූ ඇප මුදලක් නාමයෝජනා දැන්වීම් පළ කළ දින සිට නාමයෝජනා භාර ගැනීම අවසන් වන දිනට පෙර දින මධ්‍යහ්න 12.00 දක්වා කාර්යාල වේලාවන් තුළ අදාළ තේරීම්භාර නිලධාරී වෙත භාර දිය යුතුය. තේරීම්භාර නිලධාරී විසින් මෙම ඇප මුදල තැන්පත් ගිණුමකට බැර කරනු ලබන අතර ඇප තැන්පත් කළ අය වෙත රිසිට් පතක් භාර දෙනු ලැබේ. ඇප මුදල් තැන්පත් කළ මුත් නාමයෝජනා භාර නොදීම, නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප වීම සහ අදාළ ස්වාධීන කණ්ඩායම යටතේ තරග කළ අපේක්ෂකයින් අතරින් අවම වශයෙන් එක් අපේක්ෂකයකු හෝ සභිකධුරයකට පත්වීම යන අවස්ථාවලදී

අදාළ ඇප මුදල ආපසු ලබා ගැනීම සඳහා ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව අදාළ තේරීම්භාර නිලධාරී වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ හැකිය.

86. 2011.01.06 වැනි දින පළ කළ නාමයෝජනා දැන්වීම අනුව පිළිගත් දේශපාලන පක්ෂවලින් නාමයෝජනා 1,282 ක්ද ස්වාධීන කණ්ඩායම්වලින් නාමයෝජනා 765ක්ද වශයෙන් නාමයෝජනා 2,047 ක් ඉදිරිපත් විය.

87. අංක 1699/35 හා 2011 මාර්තු මස 30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ධුර කාලය 2011 දෙසැම්බර් 31 වැනි දින දක්වා දීර්ඝ කරන ලද පළාත් පාලන ආයතන 23 සම්බන්ධයෙන් ද ධුර කාලය ආරම්භවීමට මාස 06 කට පෙර ඡන්ද විමසීම පැවැත්විය යුතුය යන නීතිමය නියමය මත 2011.08.04 වැනි දින නාමයෝජනා දැන්වීම පළ කරන ලෙස අදාළ තේරීම්භාර නිලධාරීන් දැනුවත් කරන ලදී. ඒ අනුව නාමයෝජනා කාලපරිච්ඡේදය 2011 අගෝස්තු මස 18 දින සිට 2011 අගෝස්තු මස 25 දින මධ්‍යාහ්න 12.00 දක්වා විය. මෙම ඡන්ද විමසීමට අදාළව පිළිගත් දේශපාලන පක්ෂ යටතේ නාමයෝජනා 169 ක්ද ස්වාධීන කණ්ඩායම් යටතේ නාමයෝජනා 132 ක්ද අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් භාර ගනු ලැබූ අතර ඉදිරිපත් වූ මුළු නාමයෝජනා සංඛ්‍යාව 301 කි.
(සටහන 5)

නාමයෝජනා පරීක්ෂා කිරීම

88. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 28 වැනි වගන්තිය අනුව පිළියෙල කරන ලද නාමයෝජනා පත්‍රයක් වම පළාත් පාලන ආයතන සඳහා තරග කිරීමට අපේක්ෂා කරන පිළිගත් දේශපාලන පක්ෂයක් නම් පක්ෂයේ ලේකම්වරයා හෝ බලයලත් නියෝජිතයා විසින්ද, ස්වාධීන කණ්ඩායමක් නම් කණ්ඩායම් නායක විසින්ද නාමයෝජනා කාලපරිච්ඡේදය තුළ අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත භාර දිය යුතු අතර නාමයෝජනා කාල පරිච්ඡේදය අවසන් වූ වහාම තේරීම්භාර නිලධාරී විසින් තමා වෙත ලැබුණු එක් එක් නාමයෝජනා පත්‍රයක් 28 වැනි වගන්තියට අනුකූලව ලැබී ඇත්ද යන්න පිළිබඳව 31(1) වගන්තිය යටතේ පරීක්ෂා කළ යුතු වේ.

89. එහිදී පහත සඳහන් කරුණු සපුරා තිබේද යන්න පිළිබඳව තේරීම්භාර නිලධාරී විසින් පරීක්ෂා කරනු ලැබේ.

I. නියමිත අපේක්ෂක සංඛ්‍යාව නාමයෝජනා පත්‍රයට ඇතුළත් කර තිබේද (28 (2) වගන්තිය)

II. නියමිත තරුණ අපේක්ෂක සංඛ්‍යාවේ නම් නාමයෝජනා පත්‍රයට ඇතුළත් කර තිබේද (28 (1 අ) වගන්තිය)

III. එක් එක් තරුණ අපේක්ෂකයා වෙනුවෙන් වම අපේක්ෂකයාගේ උපන් දිනය සනාථ කිරීම සඳහා උප්පැන්න සහතිකය හෝ දිවුරුම් ප්‍රකාශයක් අමුණා තිබේද (28 (4 අ) වගන්තිය)

IV. සියලුම අපේක්ෂකයින් නාමයෝජනා පත්‍රයේ නියමිත ස්ථානයේ අත්සන් තැබීමෙන් ස්වකීය කැමැත්ත පළ කර තිබේද (28 (4) වගන්තිය)

V. නාමයෝජනා පත්‍රයෙහි නම් සඳහන් සියලුම අපේක්ෂකයින් විසින් ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි හත්වැනි උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව අවස්ථාවෝචිත පරිදි දිවුරුම්දී අත්සන් කරන ලද හෝ ප්‍රතිඥාදී අත්සන් කරන ලද දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් නාමයෝජනා පත්‍රයට යා කර තිබේද (28 (4) වගන්තිය)

VI. පිළිගත් දේශපාලන පක්ෂයක් වෙනුවෙන් ඉදිරිපත් වන නාමයෝජනා පත්‍රයෙහි පක්ෂ ලේකම්වරයා විසින් ද ස්වාධීන කණ්ඩායමකින් ඉදිරිපත් වන නාමයෝජනා පත්‍රයෙහි කණ්ඩායම් නායක විසින්ද අත්සන් කර තිබිය යුතුය. (28 (5) වගන්තිය)

VII. වම අත්සන සාමදාන විනිශ්චයකරුවකු විසින් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහතික කර තිබිය යුතුය. (28(5) වගන්තිය)

VIII. නාමයෝජනා පත්‍රය භාර දෙන තැනැත්තා නීතියෙන් බලය ඇති පුද්ගලයෙකු විය යුතුය. (28 (5) වගන්තිය) (නාමයෝජනා පත්‍රයක් භාර දීම සඳහා නීතියෙන් බලය ඇත්තේ පිළිගත් දේශපාලන පක්ෂයක් නම් පක්ෂ ලේකම්වරයාට හෝ නාමයෝජනා කාලපරිච්ඡේදය ආරම්භවීමට පැය 72 කට පෙර පක්ෂ ලේකම්වරයා විසින් බලයලත් නියෝජිත යනුවෙන් නම් කර තේරීම්භාර නිලධාරී වෙත දැනුම් දෙන පුද්ගලයාට සහ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් නම් කණ්ඩායම් නායකයාට පමණි)

IX. නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන කණ්ඩායමේ නායක විසින් හෝ බලය පැවරූ අයකු විසින් නියමිත කාල සීමාව තුළ නියමිත ඇප මුදල තැන්පත් කර තිබිය යුතුය. (29 වගන්තිය)

90. 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 5(2) වැනි වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 31(1අ) වැනි වගන්තිය අනුව නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනයේ මධ්‍යාහ්න 12.00 සිට ප.ව.1.30 දක්වා කාලය තුළ කිසියම් නාමයෝජනාවක් සම්බන්ධයෙන් විරෝධතාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත. විරෝධතා ඉදිරිපත් කිරීම්වලදී බෙහෙවින් දක්නට ලැබුනේ යම් යම් අපේක්ෂකයින් විසින් සිදු කරන ලද නීති විරෝධී හෝ වංචනික ක්‍රියා මත අපේක්ෂකත්වයට නුසුදුසු බව පෙන්වා දීමකි. එහෙත් එබඳු විරෝධතාවක් මත නාමයෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමට ප්‍රතිපාදන නොමැත.
(සටහන 6)

තීරණ දැනුම් දීම

91. ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පිළිබඳ සලකා බැලීමේදී නොසැලකිල්ල හා අනවධානය නාමයෝජනා ප්‍රතික්ෂේප වීමට බෙහෙවින් බලපා ඇති බව දක්නට ලැබිණ. ප්‍රතික්ෂේප වීමට හේතු වශයෙන් තරග කරන පක්ෂයේ නම නිවැරදිව සඳහන් නොවීම, නියමිත තරුණ අපේක්ෂක සංඛ්‍යාව ඇතුළත් නොවීම, උප්පැන්න සහතික හෝ දිවුරුම් ප්‍රකාශ මගින් තරුණ අපේක්ෂකත්වය තහවුරු නොකිරීම, කිසියම් තැනැත්තකු තම කැමැත්ත පිටසන් නොකිරීම, නාමයෝජනා පත්‍රය භාර දීමට නීත්‍යානුකූලව හිමිකම ඇති අයකු විසින් නාමයෝජනා පත්‍රය භාර නොදීම, නියමිත කාල සීමාව තුළ භාර නොදීම, පක්ෂ ලේකම්වරයා හෝ කණ්ඩායම් නායක විසින් නාමයෝජනා පත්‍රය අත්සන් නොකිරීම, සාමදාන විනිශ්චයකරුවකු විසින් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් හෝ එම ලේකම්වරයාගේ හෝ කණ්ඩායම් නායකගේ අත්සන සහතික නොකිරීම අපේක්ෂකයින් විසින් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම, නියමිත ඇප මුදල් භාර නොදීම ආදී විවිධ හේතු දැක්විය හැකිය. ජන්ද විමසීමේ පළමු වැනි සහ තෙවැනි අදියරවලදී සිදු කරන ලද නාමයෝජනා පරීක්ෂා කිරීම් අනුව ප්‍රතික්ෂේප වූ නාමයෝජනා සංඛ්‍යාව එසේ ප්‍රතික්ෂේප වීමට හේතු වූ කරුණු අනුව වෙන් කර දක්වා ඇත.
(සටහන 7,8)

92. නාමයෝජනා පරීක්ෂා කිරීම සහ විරෝධතා සම්බන්ධයෙන් තීරණ දැනුම් දීම අවසානයේ තේරීම්භාර නිලධාරී විසින් නාමයෝජනා ප්‍රතික්ෂේප වීමට හේතු වූ කරුණු පැහැදිලි කරනු ලැබේ. අනතුරුව එක් එක් සභාව සඳහා තරග කරන පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් කවරේද යන්න ප්‍රකාශයට පත් කර තරග කරන පක්ෂ සඳහා වී වී පක්ෂය වෙනුවෙන් අනුමත ලකුණ වෙන්කර දෙනු ලබන අතර ස්වාධීන කණ්ඩායම් සඳහා පිළිගත් දේශපාලන පක්ෂවලට වෙන් නොකළ ලකුණු අතුරින් එකක් එකඟතාවයෙන් හෝ කුසපත් ඇදීමෙන් වෙන් කර දෙනු ලැබේ. ස්වාධීන කණ්ඩායම් සඳහා ජන්ද ලකුණට අමතරව හඳුනාගැනීමේ අංකයක් බැගින් වෙන් කර දීමද මේ අවස්ථාවේදී සිදු කරනු ලැබේ.
(පරිශිෂ්ඨ 12)

නාමයෝජනා පිළිබඳ සමාලෝචනය

පළමු වන අදියර

93. මෙම ජන්ද විමසීම පළමු වැනි අදියර සඳහා පිළිගත් දේශපාලන පක්ෂ යටතේ ඉදිරිපත් වූ නාමයෝජනා 2,047න් 452 ක් පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥාපනතේ 31 (1) වැනි වගන්තිය යටතේ විධිමත් පරිදි ඉදිරිපත් නොවීම හේතුවෙන් ප්‍රතික්ෂේප විය. එම ප්‍රතික්ෂේප වූ නාමයෝජනා අතුරින් 149 ක් පිළිගත් දේශපාලන පක්ෂ යටතේ ද 303 ක් ස්වාධීන කණ්ඩායම් යටතේ ද ඉදිරිපත්ව තිබිණ. ජන්ද විමසීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂ 29 කින් ඉදිරිපත් වූ නාමයෝජනා 1,133 ක් යටතේ අපේක්ෂකයින් 22,637 ක්ද ස්වාධීන කණ්ඩායම් 462 කින් ඉදිරිපත් වූ නාමයෝජනා 462 ක් යටතේ අපේක්ෂකයින් 6,471 ක් ද අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබන ලදි. ඒ අනුව තරගයට ඉදිරිපත් වූ මුළු අපේක්ෂක සංඛ්‍යාව 29,108 කි. තෝරා පත්කර ගත යුතු සභික සංඛ්‍යාව වූයේ 3,036 කි. මෙම ජන්ද විමසීම ජන්ද මධ්‍යස්ථාන 7,396 කදී පවත්වන ලද අතර ජන්ද විමසීම සඳහා සුදුසුකම් ලැබූ ජන්දහිමියන් සංඛ්‍යාව 9,438,132 කි.

94. අපේක්ෂකයින් 29,108 ක් අතුරින් එක් එක් අපේක්ෂකයාට හිමිවන මනාප අංකය නාමයෝජනා කටයුතු අවසන් වී දින කිහිපයක් ඇතුළත වෙන් කර දිය හැකි විය. පිළිගත් නාමයෝජනා 1,595 ක් වූ බැවින් භාෂා තුනෙන් නාමයෝජනා ලියවිලි නැවත සකස් කිරීම නාමයෝජනා මුල් ලියවිලි සමඟ පරීක්ෂා කිරීම සහ සිංහල අකාරාදිය අනුව අනුපිළිවෙලින් අපේක්ෂක නාමලේඛන පිළියෙල කිරීම සහ එක් එක් අපේක්ෂකයාට හිමිවන අංකය ලබා දීම යන කාර්යයන් සියල්ල 2011.02.05 දින වන විට අවසන් කරන ලදී.

දෙවන අදියර

95. ජන්ද විමසීම සඳහා පිළිගනු නොලැබූ නාමයෝජනා 452 අතුරින් නාමයෝජනා 75 කට අදාළව අභියාචනාධිකරණයෙහි නඩු පවරන ලදී. නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීම, නාමයෝජනා පත්‍රයක් භාර නොගැනීම, නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප නොකිරීම යන හේතුමත අධිකරණ ක්‍රියාමාර්ගවලට එළඹීම හේතුවෙන් පළාත් පාලන ආයතන 64 කද බිම්බෝම්බ ඉවත් කිරීම් අවසන් නොවීම හේතුවෙන් (මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩ්ඉරුප්පු ප්‍රාදේශීය සභාව සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව) ප්‍රාදේශීය සභා 2 කද වශයෙන් පළාත් පාලන ආයතන 66 ක හැර පළාත් පාලන ආයතන 235ක් වෙනුවෙන් 2011.02.25 වැනි දින තැපැල් ජන්ද නිකුත් කිරීම අවසන් කෙරිණ. එහෙත් ඉන් අනතුරුව මුලතිව් දිස්ත්‍රික්කයෙහි තුනුක්කායි ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් ද අභියාචනාධිකරණයෙහි විභාග වෙමින් පැවති නඩුවට අදාළව අතුරු තහනම් නියෝග පනවනු ලැබීම හේතුවෙන් තුනුක්කායි ප්‍රාදේශීය සභා ජන්ද විමසීම ද කල් තැබීමට සිදුවිය. ඒ අනුව අභියාචනාධිකරණ තීරණය දැනුම් දීම පමා වීම හේතුවෙන් තුනුක්කායි ප්‍රාදේශීය සභාව ඇතුළු පළාත් පාලන ආයතන 67 ක ජන්ද විමසීම 2011.07.23 වැනි දින දක්වා කල් තබමින් අංක 1707/19 හා 2011.05.26 දින දරන ගැසට් නිවේදනය පළ කරන ලදී. එහෙත් බිම් බෝම්බ ඉවත් කිරීම් අවසන් නොවීම නිසා ජන්ද විමසීම් කල් තැබූ පුදුකුඩ්ඉරුප්පු සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා දෙකෙහි ජන්ද විමසීම තවදුරටත් 2011.12.31 දින දක්වා කල් තැබීමේ නිවේදනය මුලතිව් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් 2011.07.25 දිනැති අංක 1716/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

96. මේ නිසා ඡන්ද විමසීම 2011.07.23 දිනට කල්දමනු ලැබූ පළාත් පාලන ආයතන වල ඡන්ද විමසීම් වලට අදාළ මූලික සංවිධාන කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී. මෙහිදී ඇතැම් පළාත් පාලන ආයතන සඳහා ඡන්ද පත්‍රිකා මුද්‍රණය අවසන් කර තිබූ නමුත් පළාත් පාලන ආයතන වැඩි සංඛ්‍යාවක් සඳහා ඡන්ද පත්‍රිකා මුද්‍රණය පවා අත්හිටුවා තිබූ බැවින් අධිකරණ තීන්දු ලැබුණු පසු මූලික කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම, 2010 ඡන්දහිමි නාමලේඛනය අනුව අදාළ පළාත් පාලන ආයතන සඳහා නාමලේඛන සකස් කර සහතික කිරීම, තැපැල් ඡන්ද නාමලේඛන යථාවත් කිරීම, තැපැල් ඡන්ද නිකුත් කිරීම, තැපැල් ඡන්ද සලකුණු කිරීම සහ නිල ඡන්ද දැන්වීම් පත් බෙදා හැරීම ආදී සියලු කටයුතු කඩිනමින් අවසන් කර 2011.07.23 වැනි දින ඡන්ද විමසීම පවත්වන ලදී. මෙම ඡන්ද විමසීම සඳහා 2010 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පදනම් කර ගනු ලැබූ අතර ඒ අනුව සුදුසුකම් ලැබූ ඡන්දහිමියන් සංඛ්‍යාව 2,628,769 කි. පිළිගත් දේශපාලන පක්ෂ 20 ක් යටතේ නාමයෝජනා 237 ක් සහ ස්වාධීන කණ්ඩායම් 72 ක් යටතේ නාමයෝජනා 72 ක්ද ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්ව තිබිණ. තරගය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂක සංඛ්‍යාව 5,619 ක් වූ අතර තෝරා පත් කර ගත යුතු සභික සංඛ්‍යාව 875 ක් විය. ඡන්ද මධ්‍යස්ථාන 2,226 කදී මෙම ඡන්ද විමසීම පැවැත්විණි.
(සටහන 9,10),(පරිශිෂ්ඨ 13,14)

තෙවන අදියර

97. (40 වැනි අධිකාරය) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 2011 අංක 02 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලන) නියෝග යටතේ කල් තබන ලද පළාත් පාලන ආයතන 22 සහ නැවත සංස්ථාපනය කරන ලද කොළඹ මහ නගර සභාව සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම 2011.08.04 වැනි දින ප්‍රකාශයට පත් කරන ලෙස අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත දැනුම් දෙන ලදී. මෙය 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ තුන්වැනි අදියර වශයෙන් හඳුන්වන ලදී.

98. මෙම ඡන්ද විමසීම සඳහා කොළඹ මහ නගර සභාව වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂ 11 කින් සහ ස්වාධීන කණ්ඩායම් 20 කින් නාමයෝජනා ඉදිරිපත් වූ අතර තරගය සඳහා පිළිගනු ලැබුවේ පක්ෂ 9 ක් සහ ස්වාධීන කණ්ඩායම් 10 ක් පමණි. ඒ අනුව පළාත් පාලන ආයතන 23 සඳහාම පිළිගත් පක්ෂවලින් නාමයෝජනා 169 ක් සහ ස්වාධීන කණ්ඩායම්වලින් නාමයෝජනා 132 ක් වශයෙන් ලැබුණු මුළු නාමයෝජනා සංඛ්‍යාව 301 ක් වූ අතර එයින් පක්ෂ 09 කින් හා ස්වාධීන කණ්ඩායම් 28 කින් ඉදිරිපත් වූ නාමයෝජනා 37 ක් ප්‍රතික්ෂේප විය. පිළිගත් දේශපාලන පක්ෂවලින් නාමයෝජනා 160 ක් සහ ස්වාධීන කණ්ඩායම්වලින් 104 ක්ද වශයෙන් නාමයෝජනා 264 ක් තරගය සඳහා ඉදිරිපත් වූ අතර තරග කළ මුළු අපේක්ෂක සංඛ්‍යාව 6,488 කි. එයින් තෝරා පත් කර ගත යුතු සභික සංඛ්‍යාව වූයේ 420 ක් පමණි. ඡන්ද මධ්‍යස්ථාන 1,167 කදී ඡන්ද විමසීම පවත්වන ලද අතර සුදුසුකම් ලැබූ ඡන්දහිමියන් සංඛ්‍යාව 1,589,622 කි.

99. මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩ්ඉරුප්පු හා මුහුදුබඩපත්තු යන ප්‍රාදේශීය සභා දෙකෙහි බිම්බෝම්බ ඉවත් කිරීම අවසන් නොවීමත් ඒ හේතුවෙන් නැවත පදිංචි කිරීම් අවසන් නොවීමත් නිසා ඡන්ද විමසීම 2011.03.17 දින සිට 2011.05.30 දින දක්වා කල් තබමින් මුලතිව් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් පළ කරන ලද ගැසට් නිවේදනය 2011.02.24 දිනැතිව අංක 1694/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී. එයින් අනතුරුව තවදුරටත් තත්ත්වය එසේම පැවති බැවින් 2011.07.23, 2011.12.31, 2012.03.10 සහ 2012.03.24 වශයෙන් ඡන්ද විමසීම් දිනය වරින් වර කල් තැබීම සිදු කෙරිණ. 2012.03.24 වැනි දින අවතැන් වූ ඡන්දහිමියන් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම මත ඡන්ද විමසීම පැවැත්වීමට සියලු කටයුතු සූදානම්ව තිබියදී තැපැල් ඡන්ද සලකුණු කිරීමට නියමිතව තිබූ 2012.03.15 දිනට පෙර දින මෙම ඡන්ද විමසීම පැවැත්වීමට විරෙහිව අභියාචනාධිකරණයෙහි පෙත්සම් දෙකක් ගොනු කිරීම හේතුවෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් තැපැල් ඡන්ද සලකුණු කිරීම අත්හිටුවන ලෙස තේරීම්භාර නිලධාරීන් මඟින් සභතික කිරීමේ නිලධාරීන් වෙත දැනුම් දෙන ලදී. ඊට අමතරව මේ සම්බන්ධයෙන් මාධ්‍ය නිවේදන මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී. 2012.03.19 වැනි දින අභියාචනාධිකරණය, පෙත්සම්කරුවන් විසින් කර ඇති ඉල්ලීමට අනුව ඡන්ද විමසීම අත්හිටුවමින් ඊට ආඥාවක් නිකුත් කරන ලදී. ඒ අනුව 2012.03.24 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ ඡන්ද විමසීම දින නියමයකින් තොරව කල් තැබීමට සිදුවිය. 2012.04.23 වැනි දින පළමු වරට මෙම පෙත්සම් විභාගයට ගනු ලැබූ අතර මේ දක්වාත් පෙත්සම් විභාගය අවසන් වී නැත. මේ අනුව 2011.01.06 වැනි දින පළ කරන ලද නාමයෝජනා දැන්වීම් අනුව නාමයෝජනා භාර ගනු ලැබූ පළාත් පාලන ආයතන 301 න් 234 ක් 2011.03.17 වැනි දින ද 65 ක් 2011.07.23 වැනි දින ද 2011.12.31 දින දක්වා කල් තබා තිබූ පළාත් පාලන ආයතන 23 ට අදාළ ඡන්ද විමසීම 2011.10.08 වැනි දින ද පවත්වන ලද අතර මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩ්ඉරුප්පු හා මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා දෙකෙහි ඡන්ද විමසීම අධිකරණ නියෝග මත අත්හිටුවා ඇත. පෙත්සම් විභාගය මේ දක්වාත් අවසන්ව නැත.
(පරිශිෂ්ඨ 15,16,17,18,19)

V වැනි කොටස

හදිසි මුද්‍රණ කටයුතු

100. නාමයෝජනා භාරගැනීම හා ඒ හා සම්බන්ධ පසු කටයුතු අවසන් වූ වහාම රජයේ මුද්‍රණාලයාධිපති වෙත භාර දීම සඳහා එක් එක් පළාත් පාලන ආයතනයට අදාළව පිළිගත් නාමයෝජනා අනුව ලිපිලේඛන කට්ටලයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසී යන භාෂා 3 න්ම සකස් කිරීම අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේදී සිදු කරනු ලැබේ. එම ලිපිලේඛන කට්ටලයට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- ඡන්ද පත්‍රිකාවේ ආදර්ශය
- ගෘහ දැන්වීමේ ආදර්ශය (සිංහල, දෙමළ)
- 45(1) වගන්තිය යටතේ ඡන්ද පොළෙහි පළ කළ යුතු දැන්වීමේ ආදර්ශය
- ඡන්ද විමසීම් දැන්වීම සහ ඇමුණුම් වශයෙන් අවශ්‍ය ලිපිලේඛන
- ඡන්ද මධ්‍යස්ථාන ලැයිස්තුව
- සිංහල අකාරාදිය අනුව අනුපිළිවෙලට සකස් කළ අපේක්ෂක නම් ලැයිස්තුව

මෙම ලිපිලේඛන සියල්ලක් ප්‍රධාන කාර්යාලයේදී නැවත පරීක්ෂා කර කඩිනමින් ඡන්ද පත්‍රිකාවේ ආදර්ශය, ගෘහ දැන්වීමේ ආදර්ශය, 45(1) වගන්තිය යටතේ දැන්වීමේ ආදර්ශය, ඡන්ද විමසීම් දැන්වීම හා අදාළ ඇමුණුම් හදිසි මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලයාධිපති වෙත යවනු ලැබේ.

ඡන්ද පත්‍රිකා

101. ඡන්ද විමසීමකදී රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත පැවරෙන අතිශය වැදගත් වූත්, රහසිගත වූත්, කඩිනමින් අවසන් කළ යුතු වූත් මුද්‍රණ කාර්යය වන්නේ ඡන්ද පත්‍රිකා මුද්‍රණයයි.

102. නාමයෝජනා භාර ගැනීම 2011.01.20 සිට 27 දින මධ්‍යහ්න 12.00 දක්වා වූ කාල සීමාව ඇතුළත සිදු කර පිළිගත් නාමයෝජනා පරීක්ෂා කර අපේක්ෂක නම් සිංහල අකාරාදී පිළිවෙල අනුව පෙළ ගස්වා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් රැගෙන එන නාමයෝජනා ලියවිලි ප්‍රධාන කාර්යාලයේදී නැවත පරීක්ෂා කර රජයේ මුද්‍රණාලයාධිපති වෙත භාර දෙන ලදී. 2011.02.05 වැනි දින වන විට සියලුම දිස්ත්‍රික්කවලට අදාළ ලියකියවිලි භාරදීම අවසන් කළ හැකි විය.

103. තැපැල් ඡන්ද දායකයින්ට අදාළ ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම 2011.02.25 දිනට යෙදී තිබුණු බැවින් පළාත් පාලන ආයතන 301 කට අදාළ ඡන්ද පත්‍රිකා වෙන වෙනම ආදර්ශ යටතේ මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ දෙපාර්තමේන්තුවට තිබුනේ දින 20 ක් තරම් කෙටි කාලයකි. එහෙත් මේ අතරතුර ප්‍රතික්ෂේප වූ නාමයෝජනා සම්බන්ධයෙන් අභියාචනාධිකරණය වෙත පෙත්සම් ඉදිරිපත් කිරීම නිසා ඊට අදාළ පළාත් පාලන ආයතන 64 ට අයත් ඡන්ද පත්‍රිකා මුද්‍රණය අත්හිටුවිය යුතුද යන ගැටළුව මතු විය. මේ සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බැලීමෙන් අනතුරුව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබූ පළාත් පාලන ආයතනවල ඡන්ද පත්‍රිකා මුද්‍රණය එතෙක් ආරම්භ කර නැත්නම් එම කාර්යය ප්‍රමාද කරන ලෙස උපදෙස් නිකුත් කරනු ලැබීය.

104. අක්මීමන, අකුරැස්ස හා මොණරාගල යන ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් වූ රිට් ඉල්ලුම් පත්‍රවලට අදාළ වූ අතුරු තහනම් නියෝග නිකුත් කරනු ලැබූ අතර එම සභාවන්හි 2011 මාර්තු මස 17 වැනි දින ඡන්ද විමසීම පැවැත්වීම වාරණය කරන ලදී. එතෙක් කැඳවන ලද පෙත්සම් සමහරක නොතීසි නිකුත් කිරීම හා වාරණ නිකුත් කිරීම පිළිබඳ තීන්දු ලබා දීම පෙබරවාරි මස 23 හා 24 දිනයන්ට නියම කර තිබුනු අතර පෙත්සම් 25 ක පමණ නැවත කැඳවීමට නියමිතව පැවතියේ පෙබරවාරි මස 28 වැනි දිනටය.

105. තැපැල් ඡන්ද නිකුත් කිරීම පෙබරවාරි මස 25 දිනටත්, තැපැල් ඡන්ද සලකුණු කිරීම මාර්තු මස 8,9 යන දිනයන්ටත් යොදා ගෙන තිබූ බැවින් ඉදිරිපත් වී ඇති පෙත්සම්වලට අදාළ පළාත් පාලන ආයතනවල තැපැල් ඡන්ද නිකුත් කිරීම අත්හිටුවන ලද අතර 2002 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 2 වැනි ඡේදයෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 38(3) වගන්තිය යටතේ අදාළ දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරීන් විසින් මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි ඉහත කී පළාත් පාලන ආයතන 64 හි සහ නැවත පදිංචි කිරීම අවසන් නොවීම නිසා කල් තැබීමට යෝජිත පළාත් පාලන ආයතන දෙකෙහි ඡන්ද විමසීම කල් තබන ලදී. එහෙත් ඒ වන විට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබූ පළාත් පාලන ආයතන 64ක් ඡන්ද පත්‍රිකා මුද්‍රණය අවසන් කොට තිබූ නමුත් පෙත්සම් සමහරක් නිශ්ප්‍රභා කිරීම නිසා එම පළාත් පාලන ආයතනවල ඡන්ද පත්‍රිකාවල වෙනසක් නොවූ බැවින් ඡන්ද පත්‍රිකා නැවත මුද්‍රණය කළ යුතු වූයේ පළාත් පාලන ආයතන 08 ක් සඳහා පමණි.

106. අධිකරණ ක්‍රියාමාර්ගවලට යොමු වීම හේතුවෙන් පළාත් පාලන ආයතන 65 ක ඡන්ද විමසීම කල් තැබූ බැවින් හා බිම්බෝම්බ ඉවත් කිරීම අවසන් නොවීම හා නැවත පදිංචි කිරීම් අවසන් නොවීම හේතුවෙන් පුදුකුඩ්ඉරුප්පු හා මුහුදුබඩපත්තු යන ප්‍රාදේශීය සභා දෙකෙහි ඡන්ද විමසීම් කල් තැබූ බැවින් රජයේ මුද්‍රණාලයාධිපති වෙත ඇණවුම් භාරදුන් පළාත් පාලන ආයතන අතුරින් ආයතන 67 ක හැර 234 ක ඡන්ද පත්‍රිකා කඩිනමින් ලබා දෙන ලදී. තැපැල් ඡන්ද නිකුත් කිරීමට පෙර සම්පූර්ණ ඡන්ද පත්‍රිකා ප්‍රමාණ සැපයිය නොහැකි වූ පළාත්

පාලන ආයතන කිහිපයක තැපැල් ඡන්ද සඳහා පමණක් ඡන්ද පත්‍රිකා සැපයීමත් පසුව අවශ්‍ය සම්පූර්ණ ප්‍රමාණය ලබා දීමත් සිදු කෙරිණ.

107. සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමයත් සමඟ වැඩි ජන සහයෝගයක් ඇති පක්ෂ වලට අමතරව තවත් පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වලටද සමානුපාතිකව නියෝජනය හරහා යම් සහිකධුර සංඛ්‍යාවක් ලබා ගැනීමේ හැකියාවක් ඇතැයි යන විශ්වාසය නිසා හෝ ගණන් කිරීම මධ්‍යගතව සිදු කරන නිසා ගණන් කිරීමේ ශාලාවලට තමාගේ හිතවතුන් ගණන් කිරීමේ නියෝජිතයන් වශයෙන් යොදා ගැනීම සඳහා ව්‍යාජ ලෙස පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් කිහිපයක් තරග කිරීමට ඉදිරිපත් වීම නිසා ක්‍රමයෙන් වක් වක් සභාවක් සඳහා තරග කරන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව වැඩිවීමේ ප්‍රවණතාවක් ඇති වී තිබේ. කොළඹ මහ නගර සභාවට පක්ෂ 09 ක් සහ ස්වාධීන කණ්ඩායම් 10 ක් තරග කිරීමත්, කල්මුණේ මහ නගර සභාවට පක්ෂ 09 ක් සහ ස්වාධීන කණ්ඩායම් 08 ක් තරග කිරීමත්, කාත්තන්කුඩි නගර සභාවට පක්ෂ 04 ක් සහ ස්වාධීන කණ්ඩායම් 14 ක් ඉදිරිපත් වීමත් උදාහරණ වශයෙන් දැක්විය හැකිය. මේ හේතුව නිසා ඡන්ද පත්‍රිකාව දිගින් වැඩිවීම ඡන්ද පත්‍රිකා මුද්‍රණයේදී මෙන්ම ඡන්ද විමසීම හා ගණන් කිරීම යන අවස්ථාවලදී ඡන්ද පත්‍රිකා හැසිරවීමේදීද අනවශ්‍ය වෙහෙසක් දැරීමට සිදු විය.

108. කෙසේ හෝ ඡන්ද විමසීමේ අදියර තුනටම අදාළව පළාත් පාලන ආයතන 322 සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් ඡන්ද පත්‍රිකා වර්ග 322 ක් ඉතා කෙටි කාල සීමාවක් තුළ මුද්‍රණය කර තැපැල් ඡන්ද නිකුත් කිරීම නියම කරගත් දිනය වන විට අවශ්‍ය ඡන්ද පත්‍රිකා ප්‍රමාණය පමණක් හෝ ලබා දෙමින් ඡන්ද පත්‍රිකා කඩිනමින් මුද්‍රණය කර අදාළ තේරීම්භාර නිලධාරී වෙත බෙදා හැරීම තුළින් රජයේ මුද්‍රණාලයාධිපතිවරයා සහ කාර්ය මණ්ඩලය සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරන ලදී.

ගෘහ දැන්වීම්

109. සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමයත් සමඟ ඡන්ද පත්‍රිකාවෙහි අපේක්ෂකයාගේ නම සඳහන් නොවීමත් ඒ වෙනුවට තරග කරන පක්ෂ සහ කණ්ඩායම්වල නම් සඳහන් වීමත් නිසා තරග කරන අපේක්ෂකයින් පිළිබඳව ඡන්දදායකයා දැනුවත් කිරීමට මෙම ගෘහ දැන්වීම ඉතා වැදගත් විය. මෙම දැන්වීම නිල ඡන්ද දැන්වීම් පත් සමඟ එක ගෘහයකට එකක් බැගින් යැවීමට පිළියෙල කළ අතර ඡන්ද විමසන දිනය, වේලාව සහ පළාත් පාලන ආයතනයේ නම පූර්විකාවක් වශයෙන්ද එම පළාත් පාලන ආයතනය සඳහා තරග කරන පක්ෂ සිංහල අකාරාදී පිළිවෙලට අනුක්‍රමිකව දැක්වෙන පරිදිත් තරග කරන ස්වාධීන කණ්ඩායම් ඉන් අනතුරුව වක් වක් කණ්ඩායම් වෙනුවෙන් වෙන් කළ අංක අනුපිළිවෙලිනුත් සඳහන් කර එක් එක් පක්ෂය, ස්වාධීන කණ්ඩායම යටතේ තරග කරන අපේක්ෂකයින්ගේ නම් (සිංහල අකාරාදිය අනුව පෙළග ස්වා) වක් වක් නම සඳහා අනුක්‍රමිකව අංකයක් දී එම අංක අනුපිළිවෙලින් අපේක්ෂක අංකය සහ අපේක්ෂක නම සඳහන් කිරීමෙන් මෙම ගෘහ දැන්වීම පිළියෙල වේ. මෙය ද නාමයෝජනා අවසානයේ එක් එක් දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් සකස් කර මැතිවරණ කොමසාරිස්වරයා වෙත භාරදෙන ලියවිලිවලට ඇතුළත් වේ. එය ප්‍රධාන කාර්යාලයේදී නැවත පරීක්ෂා කර නිවැරදි කරවා මුද්‍රණය පිණිස රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත භාර දෙනු ලැබේ. මෙම ගෘහ දැන්වීම් සිංහල හා දෙමළ යන භාෂා දෙකින්ම සකස් විය යුතු අතර එකම කඩදාසියේ දෙපැත්ත මේ සඳහා භාවිතා කරනු ලැබේ.

110. සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය මත ඡන්දදායකයාට තමා කැමති අපේක්ෂකයා තෝරා බේරා ගැනීමටත් එම අපේක්ෂකයාගේ අංකය අනුව ඡන්ද පත්‍රිකාවේ අදාළ අංකය මතුපිට සහ ඉදිරිපිට ඇති කොටු දෙකෙහි මනාප සලකුණු කිරීමටත් මෙම ගෘහ දැන්වීම ලබා දීම අතිශය වැදගත් වේ. මෙය නීතිමය අවශ්‍යතාවක් නොවෙතත් සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය ආරම්භයේදී එවකට සේවයේ යෙදී සිටි කොමසාරිස්වරයා විසින් ගනු ලැබූ මෙම තීරණය මෙතෙක් නොකඩවා ක්‍රියාත්මක කරනු ලැබ ඇත. සාමාන්‍ය ඡන්ද දායකයින්ට නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව සමඟද තැපැල් ඡන්ද දායකයන් වෙත තැපැල් ඡන්ද පැකට්ටුව සමඟද මෙම ගෘහ දැන්වීම යවනු ලැබේ. ගෘහ දැන්වීම සකස් කිරීමේදීද මහත් ගැටළුවක් බවට පත්ව ඇත්තේ තරග කරන පක්ෂ හා කණ්ඩායම් සංඛ්‍යාවේ විශාලත්වයයි. ඒ අනුව පසු කාලීනව ගෘහ දැන්වීම විශාල වීම හේතුවෙන් නිල ඡන්ද දැන්වීම් පත් අතරට තබා ක්ලිප් කිරීමට නොහැකි වීම, තරමක් ගැටළුකාරී තත්ත්වයකි. මේ නිසා තැපැල්පතිවරයා සමඟ සකච්ඡා කර ගෘහ දැන්වීම්, නිල ඡන්ද දැන්වීම්පත් සමඟ බෙදා දීමේ පදනම මත නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා වෙනමත් ගෘහ දැන්වීම් වෙනමත් තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී.

111. වක් වක් පළාත් පාලන ආයතනය සඳහා සකස් වන ගෘහ දැන්වීම වෙනස් බැවින් වැරදි ගෘහ දැන්වීම් ගෘහ මූලිකයන් වෙත පත් වූ අවස්ථා පිළිබඳව ද පැමිණිලි ලැබුණි. මෙසේ වෙන වෙනම භාරදීම නිසා සමහරකු වෙත නිල ඡන්ද දැන්වීම්පත් ලැබුණු නමුත් ගෘහ දැන්වීම නොලැබුණු බවටද පැමිණිලි ලැබුණි. කෙසේ වෙතත් අපේක්ෂකයාට පෝස්ටර්, බැනර්, කටවුට් ප්‍රසිද්ධ කිරීම නීතියෙන් තහනම් බැවින් මෙසේ ගෘහ දැන්වීමක් මඟින් ඡන්දදායකයා දැනුවත් කිරීමට ගත් පියවර අතිශයින් වැදගත් වේ. ගෘහ දැන්වීමේ ආදර්ශයක් යා කර ඇත.
(පරිශිෂ්ඨ 20)

ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම

112 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38(1) වගන්තිය අනුව නාමයෝජනා කටයුතු අවසන් වූ පසු ඒ ඒ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී විසින් භාෂාත්‍රයෙන් යුතුව ගැසට් පත්‍රයේ පළ කළ යුතු දැන්වීමකි. දිස්ත්‍රික්කයට අදාළ එක් එක් පළාත් පාලන ආයතනය සම්බන්ධයෙන් වෙන් වෙන්ව පහත සඳහන් කරුණු ඇතුළත් කර මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ යුතු වේ.

I. පළාත් පාලන ආයතනය
II. ඡන්ද විමසීම පවත්වනු ලබන දිනය හා වේලාව
III. අපේක්ෂකයින්ගේ නම්, එක් එක් අපේක්ෂකයාට හිමි අනුක්‍රමික අංකය සමග
IV. එක් එක් පක්ෂයට, ස්වාධීන කණ්ඩායමට වෙන් කරනු ලැබ ඇති අනුමත ලකුණ සහ ස්වාධීන කණ්ඩායම් හඳුනාගැනීමේ අංක
V. අදාළ පළාත් පාලන ආයතනයේ එක් එක් ඡන්ද කොට්ඨාසයට අයත් ඡන්ද පොළේ නම හා පිහිටීම

113. ඊට අමතරව මෙම දැන්වීමෙහි දැක්වෙන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අනුපිළිවෙල ඡන්ද පත්‍රිකාවෙහිද ඒ අයුරින්ම මුද්‍රණය කෙරෙන බවද දැන්වීමට ඇතුළත් කෙරේ. ඡන්ද විමසීම් දැන්වීම පළ කළ හැකි දිනය ඡන්ද විමසීම් දිනය තීරණය කිරීමටද පාදක කර ගනී. එබැවින් ඉතා කඩිනමින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය. මෙම දැන්වීම මඟින් සියලු පාර්ශ්ව ඡන්ද විමසීමට අදාළව දැනුවත් කෙරෙනු ඇත.

114. 2011 ජනවාරි 27 වැනි දිනෙන් නාමයෝජනා භාරගැනීම අවසන් වූ පළාත් පාලන ආයතන 301 ක් සම්බන්ධයෙන් අංක 1691/21 - 1691/45 දක්වා අති විශේෂ ගැසට් පත්‍ර 25 ක් යටතේ 2011 පෙබරවාරි 01 වැනි දිනෙන් යුතුව ඡන්ද විමසීම් දැන්වීම පළ කරන ලදී. එහෙත් ඒ අතරින් ප්‍රතික්ෂේප වූ නාමයෝජනා 75 කට අදාළව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් පළාත් පාලන ආයතන 65 ක ඡන්ද විමසීම කල් තැබීමට සිදු විය. 2002 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 38(3) වගන්තිය අනුව එම පළාත් පාලන ආයතන 65 හි ඡන්ද විමසීම 2011.05.30 දින දක්වා කල් තබමින් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් පළ කරන ලද ගැසට් නිවේදනය අංක 1694/10 හා 2011 පෙබරවාරි 24 වැනි දිනැතිව ගැසට් පත්‍රයේ පළ කරන ලදී. බිම්බෝම්බ ඉවත් කිරීම අවසන් නොවීම හේතුවෙන් නැවත පදිංචි කිරීම් අවසන් නොවීම නිසා ඡන්ද විමසීම පැවැත්වීමට සුදුසු වාතාවරණයක් නොමැති වීම මත මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩ්ඉරුප්පු ප්‍රාදේශීය සභාව සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව සඳහා වූ ඡන්ද විමසීම කල් තැබීමද මෙම ගැසට් පත්‍රයටම ඇතුළත් කරන ලදී.
(පරිශිෂ්ඨ 21)

115. ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පත්‍රවලට අදාළව ගනු ලැබූ අධිකරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අභියාචනාධිකරණයෙහි තීරණ 2011.05.12 දින දක්වාත් නොලැබීම නිසා ඡන්ද විමසීම 2011 ජූලි 23 දින දක්වා තව දුරටත් කල් තබමින් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් පළ කරන ලද 38(3) වගන්තිය යටතේ දැන්වීම අංක 1707/15 හා 2011 මැයි මස 26 වැනි දිනැතිව ගැසට් පත්‍රයේ පළ කරන ලදි. පුදුකුඩ්ඉරුප්පු සහ මුහුදුබඩපත්තු යන ප්‍රාදේශීය සභා දෙකෙහි ඡන්ද විමසීම් පැවැත්වීමේ දිනය නැවත කල් තබමින් 2011.12.31 දින දක්වා දීර්ඝ කිරීමේ ගැසට් නිවේදනය 2011 ජූලි මස 25 වැනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලදි.

116. ඒ අතරතුර අධිකරණ ක්‍රියාමාර්ගවලට එළඹීම නිසා කල් තබන ලද පළාත් පාලන ආයතනවලට අදාළව අධිකරණය විසින් ඉඩ දෙන ලද නාමයෝජනා නැවත ඇතුළත් කරමින් අංක 1712/14 හා 2011 ජුනි මස 30 වැනි දින 38(1) වැනි වගන්තිය යටතේ සංශෝධිත දැන්වීම වශයෙන් ඉඩ දෙන ලද එක් එක් පක්ෂයේ, ස්වාධීන කණ්ඩායමේ තොරතුරු ඇතුළත් කරමින් අදාළ සංශෝධිත ගැසට් නිවේදනය පළ කරන ලදි.

117. හදිසි අවස්ථා නියෝග යටතේ ධුර කාලය 2011.12.31 දක්වා කල් තබන ලද පළාත් පාලන ආයතන 23 සම්බන්ධයෙන් 2011.12.31 දිනට පෙර ඡන්ද විමසීම් පැවැත්විය යුතු බැවින් 2011.08.04 දින නාමයෝජනා දැන්වීම් පළ කරන ලෙස අදාළ තේරීම්භාර නිලධාරීන් දැනුවත් කරන ලදි. එම පළාත් පාලන ආයතන 23 ට අදාළව නාමයෝජනා භාර ගැනීම 2011 අගෝස්තු 25 වැනි දින මධ්‍යාහ්න 12.00ට අවසන් විය. ඊට අදාළ ඡන්ද විමසීමේ දැන්වීම අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් අංක 1721/16 හා 2011 අගෝස්තු 30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදි.
(පරිශිෂ්ඨ 22)

45(1) වගන්තිය යටතේ දැන්වීම

118. මෙම දැන්වීම සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් සකස් කර ඡන්ද පොළේ ප්‍රදර්ශනය කළ යුතු දැන්වීමකි. සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමයකදී ඡන්දදායකයාට තමා කැමති පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට පළමුව ඡන්දය ප්‍රකාශ කළ හැකි අතර, දෙවනුව තමා ඡන්දය ප්‍රකාශ කරනු ලැබූ පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම යටතේ තරග කරනු ලබන අපේක්ෂකයකුට, අපේක්ෂකයින් දෙදෙනකුට හෝ අපේක්ෂකයින් තිදෙනකුට වශයෙන් මනාප ඡන්ද තුනක් ලබා දිය හැකිය. මනාප තුනම එක් අපේක්ෂකයකුට සලකුණු කරන්නේ නම් අපේක්ෂකයාගේ අංකය මතුපිට එක් කතිරයක්ද එය ඉදිරිපස ඇති කොටු දෙකෙහි කතිර දෙකක් ද වශයෙන් මනාප තුන ලකුණු කළ හැකිය. ඡන්දදායකයාට තමා කැමති අපේක්ෂකයාගේ අංකය

ඡන්ද පොළේදී සොයා ගැනීම සඳහා මෙම 45(1) වගන්තිය යටතේ දැන්වීම උපකාරී වේ. මෙම දැන්වීම ඡන්ද පොළෙන් පිටත ඡන්දහිමියන්ට පහසුවෙන් බලා ගත හැකි වන පරිදි ඡන්දදායකයින්ගේ මග පෙන්වීම සඳහා උපදෙස් දෙන දෙවන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූලව සකස් කළ දැන්වීමක් සමඟ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ප්‍රදර්ශනය කරනු ලැබේ. මෙම දැන්වීමෙහිද ගෘහ දැන්වීමෙහි සඳහන් පරිදි සිංහල අකාරාදිය අනුව පෙළ ගස්වන ලද අපේක්ෂක නම් සහ එක් එක් අපේක්ෂකයාට වෙන් කර දෙන ලද අංකය සඳහන් වේ. ඊට අමතරව දැන්වීමෙහි ඉහළ කොටසේ එම පළාත් පාලන ආයතනය සඳහා තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂවල නම්, ඡන්ද ලකුණු සහ ස්වාධීන කණ්ඩායම්වලට වෙන් කර දී ඇති අංකය සහ සලකුණ පැහැදිලිව දක්වා තිබේ.

VI වැනි කොටස

අනෙකුත් පූර්ව අවශ්‍යතා

තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම්

119. 1987 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් පළාත් පාලන ආයතන සඳහාද සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය සමඟ තැපෑලෙන් ඡන්දය දීමේ ක්‍රමයද හඳුන්වා දෙන ලදී. ඒ අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ රාජකාරී හේතුවෙන් ඡන්ද පොළේදී ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකිවන ආරක්ෂක අංශයේ සහ රාජ්‍ය අංශයේ නිලධාරීන් හා සේවකයින් වෙනුවෙන් තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සලසා ඇති අතර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 39 ආ (1) වගන්තිය අනුව තැපෑලෙන් ඡන්දය දීම සඳහා අයදුම්කළ හැක්කේ කාටද, අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ කවර කාලසීමාවක් තුළද යන්න දක්වා ඇති අතර, එම ආඥාපනතේ 9 වැනි උපලේඛනය මගින් තැපෑලෙන් ඡන්දය දීමට අදාළ විධිවිධාන සලසා ඇත.

120. තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම සඳහා කරනු ලබන ඉල්ලීමක් 26 වැනි වගන්තිය යටතේ නාමයෝජනා දැන්වීම පළ කරනු ලැබූ දිනට පසු දින 10 ක් ඇතුළත ලැබෙන පරිදි අදාළ සහතික කිරීමේ නිලධාරීන් මගින් තමා ඡන්දහිමියකු වශයෙන් ලියාපදිංචි දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම දින 10 කාලසීමාව මෙම කාර්යය සඳහා ප්‍රමාණවත් නොවන බැවින් පළමුවැනි අදියරේදී 2011.01.16 දිනට අවසන් වීමට නියමිතව තිබූ තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ කාලසීමාව 2011.01.27 දින දක්වා දීර්ඝ කරන ලදි. මෙම සම්පූර්ණ කාලසීමාව ආවරණය වන පරිදි තැපැල් ඡන්දහිමියන්ගේ පහසුව සඳහා සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවල මෙන්ම කොළඹ නගරයේ තෝරා ගත් ස්ථාන ගණනාවක ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනය සිදු කරන ලදි. ඊට අමතරව රාජ්‍ය ආයතනවල ඉල්ලීම අනුව සංයුක්ත තැටි (සීඩී) මඟින් ද නාමලේඛන ප්‍රදර්ශන කටයුතු ඉටු කිරීමට පියවර ගන්නා ලදි.
(පරිශිෂ්ඨ 23,24)

121. තැපැල් ඡන්ද අයදුම්පත් සහතික කිරීම, තැපැල් ඡන්ද අඩංගු රක්ෂණ පැකට්ටු භාර ගැනීම, සුරක්ෂිතව ගබඩා කර ගැනීම සහ තැපැල් ඡන්දහිමියන් ලවා රහස්‍ය ආකාරයෙන් ඡන්ද පත්‍රිකා සලකුණු කරවා රක්ෂණ තැපෑලෙන් අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත යැවීම දක්වා තැපැල් ඡන්ද සම්බන්ධව සියලු කටයුතුවල වගකීම අදාළ අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ, කාර්යාලයේ, ආයතනයේ ප්‍රධානියා විසින් පත් කරනු ලබන සහතික කිරීමේ නිලධාරී වෙත පැවරෙනු ඇත.
(පරිශිෂ්ඨ 25,26,27,28)

122. මෙම ඡන්ද විමසීමට අදාළව තැපැල් ඡන්ද අක්‍රමිකතා වැලැක්වීමේ පියවරක් වශයෙන් තැපැල් ඡන්දදායකයෙකු සම්බන්ධයෙන් අයදුම්පත සහතික කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කිරීමට පෙරාතුව තැපැල් ඡන්දහිමියාගේ ආසන්නතම ආයතන ප්‍රධානියා විසින් එම තැපැල් ඡන්ද අයදුම්පත නිර්දේශ කිරීම සඳහා විශේෂිත ක්‍රමවේදයක් තැපැල් ඡන්ද අයදුම්පතට ඇතුළත් කරන ලදී. ඊට අමතරව තැපැල් ඡන්ද අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් පසුව තේරීම්භාර නිලධාරීන් විසින් අයදුම්පත පිළිගත් බව සහතික කිරීමේ නිලධාරීන් මගින් ඡන්දහිමියා වෙත දැනුම් දීමත් සෘජුවම අයදුම්කරුගේ පෞද්ගලික ලිපිනය වෙතද දැනුම්දීමත් සිදු කරන ලදී. තැපැල් ඡන්දහිමියන්ට අදාළ නිල ඡන්ද දැන්වීම්පත් තේරීම්භාර නිලධාරී වෙත රඳවා ගැනීම වෙනුවට එම නිල ඡන්ද දැන්වීම්පත්වල "තැපැල් ඡන්දහිමියකු වශයෙන් පිළිගෙන ඇත" යන වගන්තිය සහිත රබර් මුද්‍රාව තබා එම නිල ඡන්ද දැන්වීම්පත් ඡන්දහිමියන් වෙත බෙදා හැරීම මගින් තැපැල් ඡන්දහිමියකු වශයෙන් පිළිගෙන ඇති බව දැනුවත් කරන ලදී. ඉහත කී සියලු පියවරයන් මගින් ව්‍යාජ තැපැල් ඡන්ද ඉල්ලීම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගත හැකි විය. මෙම ක්‍රියා පිළිවෙල 2008 සහ 2009 වර්ෂවල පැවති පළාත් සභා ඡන්ද විමසීම්වලදී ද ක්‍රියාත්මක කරන ලදී.
(පරිශිෂ්ඨ 29)

123. 2011 මාර්තු මස 30 වැනි දින අංක 1699/35 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් නිල කාලය 2011 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කරන ලද පළාත් පාලන ආයතන 23 ට විශේෂයෙන් කොළඹ මහ නගර සභාව ඇතුළුව මහ නගර සභා 17 ක් ඇතුළත් වූ බැවින් සමස්ථ වශයෙන් එම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා තැපැල් ඡන්ද අයදුම්පත් ලැබීමේ ඌණතාවක් දැක ගත හැකි විය. මහ නගර සභා ප්‍රදේශවල සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන්ගෙන් බොහොමයක් පිටස්තර ප්‍රදේශවල ඡන්දහිමියන් වීමත්, ඡන්ද විමසීම සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදීද විශේෂයෙන් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ලියාපදිංචි ඡන්දහිමියන් නොවන නිලධාරීන් අතුරින් තෝරා ගැනීමට උපරිම උත්සාහ දැරීමත් ඊට හේතු වශයෙන් දැක්විය හැකිය. එකී පළාත් පාලන ආයතන 23 ට අදාළව නාමයෝජනා දැන්වීම 2011.08.04 දිනෙන් යුතුව ප්‍රකාශයට පත් කිරීමට අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් දෙනු ලැබූ අතර තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ දින 10 කාලසීමාව තවදුරටත් අවස්ථාව ලබා දීමක් වශයෙන් 2011.08.25 දින දක්වා දීර්ඝ කරන ලදී.

124. අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් ඡන්ද විමසීම කල් තබා ඇති පුදුකුඩ්ඉරුප්පු සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභා දෙක සම්බන්ධයෙන් 2011.01.06 වැනි දින පළ කරන ලද නාමයෝජනා දැන්වීමත් සමඟ ලැබුණු තැපැල් ඡන්ද අයදුම්පත් සම්බන්ධයෙන් සුදුසුකම් ලැබූ

ඡන්දහිමියන්ට අදාළ ඡන්ද පත්‍රිකා 2011.02.25 දින නියමිත සහතික කිරීමේ නිලධාරීන් වෙත යවා ඇත. එහෙත් 1694/10 හා 2011.02.24 දිනැති ගැසට් නිවේදනය මගින් ඡන්ද විමසීම 2011.05.30 දක්වා කල් තබනු ලැබූ බැවින් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම අත්හිටුවන ලදී. එම ඡන්ද පත්‍රිකා සහතික කිරීමේ නිලධාරීන් වෙතින් ආපසු ගෙන්වා ගන්නා ලෙස තේරීම්භාර නිලධාරී වෙත උපදෙස් දෙන ලදී.

125. 2011.01.06 දින සිට 2011.01.27 වැනි දින දක්වා තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගෙන පළමුවැනි අදියරෙහි ඡන්ද විමසීම් පැවැත් වූ මහ නගර සභා 3, නගර සභා 30, ප්‍රාදේශීය සභා 201 ඇතුළු 234 ක් වූ පළාත් පාලන ආයතන සංඛ්‍යාව සඳහා තැපැල් ඡන්දහිමියන්ට අදාළ ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම 2011.02.25 වැනි දින සිදුකළ අතර තැපැල් ඡන්ද සලකුණු කිරීම 2011.03.08 සහ 09 යන දින දෙක තුළදී සිදු කරන ලදී.
(පරිශිෂ්ඨ 30)

126. ප්‍රතික්ෂේප වූ නාමයෝජනා සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග නිසා කල් තැබූ පළාත් පාලන ආයතන 65 ට අදාළව 2011.07.23 වැනි දින පරිපාලන දිස්ත්‍රික්ක 20 ක ඡන්ද විමසීම පැවති අතර එම ඡන්ද විමසීම් සඳහා 2010 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය භාවිතා කළ යුතු වූ බැවින් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර 2010 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අනුව තැපැල් ඡන්ද නාමලේඛනය සංශෝධනය කළ යුතු විය. ඒ අනුව සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ට පමණක් තැපැල් ඡන්ද පහසුකම් ලබා දීමටත් අනෙකුත් ඡන්දහිමියන් මැතිවරණ රාජකාරියෙන් නිදහස් කර ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමත් සිදු කරන ලදී. ඒ අනුව සුදුසුකම් ලත් තැපැල් ඡන්දහිමියන්ට අදාළ ඡන්ද පත්‍රිකා රක්ෂණ පැකට්ටුවල බහා අදාළ සහතික කිරීමේ නිලධාරීන් වෙත යැවීම ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී 2011.07.01 දින සිදු කරන ලද අතර ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම 2011.07.12 දින සිදු කරන ලදී.
(පරිශිෂ්ඨ 31)

127. මහ නගර සභා 17 නගර සභා 01 ප්‍රාදේශීය සභා 05 සඳහා 2011.10.08 වැනි දින පැවති ඡන්ද විමසීමට අදාළව තැපැල් ඡන්දහිමියන්ගේ ඡන්ද පත්‍රිකා රක්ෂණ පැකට්ටුවල බහා සහතික කිරීමේ නිලධාරීන් වෙත යැවීම සඳහා තැපෑලට භාර දීම 2011.09.21 වැනි දින ද තැපැල් ඡන්ද සලකුණු කිරීම අදාළ සහතික කිරීමේ නිලධාරී කාර්යාලයන්හිදී 2011.09.29 සහ 30 යන දිනයන්හි සිදු කරන ලදී. තැපැල් ඡන්ද සලකුණු කිරීම ඒ ඒ සහතික කිරීමේ නිලධාරී කාර්යාලයේදී සිදු කරන ලද අතර විශේෂයෙන් කිසියම් අක්‍රමිකතාවක් සිදුවීමට ඉඩ ඇතැයි වාර්තා වූ ස්ථාන සම්බන්ධයෙන් අධීක්ෂණ මට්ටමේ නිලධාරීන් යැවීමට තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. දේශපාලන පක්ෂ නියෝජිතයන්ට අමතරව **PAFFREL** සහ **CMEV** යන නිරීක්ෂණ ආයතනවල නිරීක්ෂකයින්ටද සහතික කිරීමේ නිලධාරී කාර්යාලවල රැඳී සිට තැපැල් ඡන්ද සලකුණු කිරීමේ ක්‍රියාවලිය තුළ යම් අක්‍රමිකතාවක් සිදුවේද යන්න නිරීක්ෂණය කිරීමට අවසර දෙන ලදී. ඊට අමතරව තැපැල් ඡන්ද සලකුණු කිරීමේ අවස්ථාව නිරීක්ෂණය සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන් පත් කිරීම උචිතයයි අදහස් කරන ලද සහතික කිරීමේ නිලධාරී කාර්යාල සඳහා අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද විමසීම් රාජකාරී පිළිබඳ මනා පළපුරුද්දක් ඇති සහකාර තේරීම්භාර නිලධාරීන් පිරිසක් ද නිරීක්ෂණ කාර්යයේ යොදවන ලදී.

128 තැපැල් ඡන්ද සලකුණු කරන ස්ථාන අතුරින් විශේෂ ආරක්ෂාව අපේක්ෂා කරන සහතික කිරීමේ නිලධාරී කාර්යාල සඳහා සුදුසු පරිදි ආරක්ෂාව සැලසීමටත් සෙසු ස්ථාන සඳහා පොලිස් ජංගම සේවා මගින් ආරක්ෂාව සැලසීමටත් පියවර ගන්නා ලෙස පොලිස්පතිවරයා දැනුවත් කරන ලදී. මෙම ඡන්ද විමසීම සඳහා සියලුම පරිපාලන දිස්ත්‍රික්කවලට අදාළව තැපැල් ඡන්ද අයදුම්පත් 395,003ක් තේරීම්භාර නිලධාරීන් වෙත ලැබුණු අතර පරිපාලන දිස්ත්‍රික්ක වශයෙන් වැඩිම අයදුම්පත් සංඛ්‍යාව ලැබී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කය වෙතය. එය අයදුම්පත් 51,176 කි. ලැබුණු අයදුම්පත් අතුරින් ප්‍රමාද වී ලැබීම හා වෙනත් හේතූන් මත අයදුම්පත් 76,839ක් ප්‍රතික්ෂේප විය. ඒ අනුව පිළිගත් අයදුම්පත් සංඛ්‍යාව 318,164 කි. මෙම සංඛ්‍යාව සඳහා ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම හා ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම එක් එක් අදියර අනුව නියමිත දිනයන්හිදී සිදු කරන ලදී.

129. තැපැල් ඡන්ද අයදුම්පත් තැපැල් මඟින් යැවීමේදී ද තැපැල් ඡන්දහිමියන්ට අදාළ ඡන්ද පත්‍රිකා සහතික කිරීමේ නිලධාරීන් වෙත යැවීමේදී හා ආපසු තේරීම්භාර නිලධාරීන් වෙත නියමිත පරිදි බෙදා හැරීමේදීද තැපැල් දෙපාර්තමේන්තුව විශේෂ පරිශ්‍රමයක් දරන ලදී. 2011 පෙබරවාරි මස අවසන් සතියේ තැපැල් දෙපාර්තමේන්තුවේ ලිපි බෙදීමේ අංශයෙහි හටගත් වැඩ වර්ජනය නිසා තැපැල් ඡන්ද පැකට්ටු නියමිත දිනයන් තුළ බෙදාහැරීමේ කාර්යය කාර්යක්ෂම කිරීම පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් තැපැල්පතිවරයා සමඟ විශේෂ සාකච්ඡාවක්ද පවත්වන ලදී.

නිල ඡන්ද දැන්වීම්පත්

130. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 39 (1) වැනි වගන්තිය අනුව ඡන්ද විමසීම් ප්‍රදේශයක ඡන්දහිමි නාමලේඛනයේ නම් සඳහන් සියලුම ඡන්දහිමියන් වෙත ඡන්ද විමසීම් දිනට දින 05 කට පෙර ලැබෙන පරිදි නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතු වේ. එම නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවෙහි ඡන්දහිමියාගේ නම, අනුක්‍රමික අංකය, අදාළ ඡන්ද මධ්‍යස්ථානය, ඡන්ද විමසීම් දිනය හා වේලාව අවශ්‍යයෙන්ම සඳහන් විය යුතුය. මෙමගින්

ඡන්දහිමියා වෙත තමා ඡන්දය ප්‍රකාශ කිරීමට යා යුතු ඡන්ද පොළ කුමක්ද යන්න පිළිබඳවත් ඡන්ද විමසීම පැවැත්වෙන දිනය හා වේලාව පිළිබඳවත් දැනුවත් කිරීමක් සිදුකරනු ලබන අතර ඡන්දහිමියාගේ අනුක්‍රමික අංකය සඳහන් කිරීම මගින් ඡන්ද පොළ කාර්යය මණ්ඩලයට ඡන්දහිමියාගේ නම ඡන්දහිමි නාමලේඛනයෙන් සොයා ගැනීම පහසු කරනු ඇත.

131. නිල ඡන්ද දැන්වීම්පත සමඟ අදාළ පළාත් පාලන ආයතනය සඳහා ඉදිරිපත් වී ඇති නාමයෝජනා අනුව පක්ෂ සහ කණ්ඩායම් යටතේ තරග කරනු ලබන සියලුම අපේක්ෂකයින්ගේ නම් සිංහල අකාරාදිය අනුව අනුක්‍රමික අංක සහිතව සකස් කළ ලේඛනයක් සෑම ගෘහ මූලිකයකු වෙතම තැපැල් මගින් ලබා දෙනු ලැබේ. මෙය නීතිමය අවශ්‍යතාවක් නොවුවත් මේ වන විට ඡන්ද විමසීමකදී මහජනතාව විශේෂයෙන් මෙම අපේක්ෂක ලැයිස්තුව බලාපොරොත්තුවන තත්ත්වයට පත්ව ඇත. ඒ අනුව එම අවශ්‍යතාව මෙම ඡන්ද විමසීමේදී ද ඉටු කරන ලදී.

132. 2006 වර්ෂයේ පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමෙන් ආරම්භ කළ නිල ඡන්ද දැන්වීම්පත් පරිගණකයෙන් සකස් කිරීම මේ වන විට ඉතා ප්‍රශස්ථ තත්ත්වයට පත්ව තිබිණ. එබැවින් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා සම්බන්ධ කටයුතු කඩිනමින් අවසන් කළ හැකි විය. මේ හේතුවෙන් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවල ගුණාත්මක බව මෙන්ම මූල්‍යමය වශයෙන්ද දෙපාර්තමේන්තුවට අත් වූ ප්‍රතිලාභය අගය කළ යුතුය.

133. 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2009 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය යොදා ගනු ලැබූ පළමු වැනි අදියරේදී ඡන්දහිමියන් 9,438,132 වෙනුවෙන්ද දෙවැනි අදියරේදී 2010 ඡන්දහිමි නාමලේඛනයට අනුව නැවත පරීක්ෂා කිරීමෙන් පසුව ඡන්දහිමියන් 2,628,769 ක් වෙනුවෙන්ද තුන්වැනි අදියරේදී ඡන්දහිමියන් 1,589,622 ක් වෙනුවෙන්ද මෙම නිල ඡන්ද දැන්වීම්පත් අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් තැපැල් මඟින් යවන ලදී.

134. සෑම ඡන්දහිමියකු වෙතම ඡන්ද විමසීම් දිනට දින 5 කට පෙර ලැබෙන පරිදි නිල ඡන්ද දැන්වීම් පතක් තැපැල් මඟින් යැවිය යුතු අතර කිසියම් හේතුවකින් නියමිත දින වනවිට බෙදා හැරිය නොහැකි වූ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා අදාළ තැපැල් කාර්යාලයේ සුරක්ෂිතව ගබඩා කර තැබිය යුතුය. නිල ඡන්ද දැන්වීම්පත තැපැල් මඟින් නොලැබුණු කිසියම් ඡන්දහිමියකුට තම අනන්‍යතාව සනාථ කර තමාගේ නිල ඡන්ද දැන්වීම්පත ඉල්ලා සිටියහොත් එය ඔහු හෝ ඇය වෙත භාරදීමට තැපැල් දෙපාර්තමේන්තුව බැඳී සිටී.

135. ව්‍යාජ ලෙස ඉදිරිපත්ව ඇති තැපැල් ඡන්ද අයදුම්පත් කලින් හඳුනාගෙන තැපැල් ඡන්ද සම්බන්ධයෙන් සිදු විය හැකි අක්‍රමිකතා නිවැරදි කිරීමේ පියවරක් වශයෙන් සෑම තැපැල් ඡන්දහිමියකුටම අදාළ නිල ඡන්ද දැන්වීම්පත්වල "තැපැල් ඡන්දහිමියකු වශයෙන් පිළිගෙන ඇත" යන්න රබර් මුද්‍රාවක් මඟින් සටහන් කිරීමත්, මිය ගිය හා විදේශ ගත වූ පුද්ගලයින්ගේ ඡන්දය ව්‍යාප ලෙස සලකුණු කිරීම වැළැක්වීමේ පියවරක් වශයෙන් කල්තබා ග්‍රාම නිලධාරීන්ගෙන් ලබා ගන්නා තොරතුරු මත මිය ගිය ඡන්දහිමියන්ට අදාළ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවල "මිය ගිය අයකු බව වාර්තා වී ඇත" යන්න සහ විදේශ ගත වූ ඡන්දහිමියන්ට අදාළ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවල "විදේශ ගත වූ අයකු බව වාර්තා වී ඇත" යන්න රබර් මුද්‍රාවක් මඟින් සටහන් කර අදාළ නිල ඡන්ද දැන්වීම්පත් ඡන්දහිමියන් වෙත යැවීමත් සිදු කරන ලදී.

136. අතීත ඡන්ද විමසීම්වලදී නිල ඡන්ද දැන්වීම්පත් බෙදන අවස්ථාවේදී පැහැරගැනීම් බෙහෙවින් අසන්නට ලැබුණු සිද්ධියක් විය. ඊට අමතරව ඡන්ද විමසීමට පෙර දිනයෙහිදී ඇතැම් ඡන්දහිමියන්ගේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා එකතු කිරීම ද සිදු කෙරිණ. එහෙත් මේ වන විට මිය ගිය හා විදේශ ගත වූ පුද්ගලයින්ගේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවල ඒ බව සටහන්ව තිබීම නිසා එබඳු පුද්ගලයින් ඡන්ද පොළ නිලධාරීන්ගේ විශේෂ අවධානයට යොමු වන බැවින් සහ ඡන්ද පොළේදී වලංගු අනන්‍යතා පත්‍රයක් මඟින් ඡන්දදායකයාගේ අනන්‍යතාව සනාථ කර ගැනීමෙන් පසුව පමණක් ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලබන බැවින් සහ ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා නිල ඡන්ද දැන්වීම්පත අනිවාර්ය අවශ්‍යතාවක් නොවන බැවින් නිල ඡන්ද දැන්වීම්පත් පැහැර ගැනීම හා එකතු කිරීම පිළිබඳව මෙම ඡන්ද විමසීමේදී අසන්නට ලැබුණේ ඉතාම සුළු වශයෙනි. එසේ වුවද ඡන්ද විමසීමට පෙර දින රාත්‍රියේ කිළිනොච්චි දිස්ත්‍රික්කයෙන් මෙවැනි සිදුවීම් කිහිපයක් වාර්තා වී ඇත. ඒ නිසා ඇති වූ ව්‍යාකූල තත්ත්වය නැති කිරීම සඳහා ඡන්දය දීම සඳහා නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව අවශ්‍ය නොවන බවත් වලංගු හැඳුනුම්පතක් තිබීම හා නාමලේඛනයේ නම තිබීම ප්‍රමාණවත් බවටත් අදාළ ප්‍රදේශවල පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී.

137. නිල ඡන්ද දැන්වීම්පත් බෙදා හැරීම තැපැල් දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන අතර පරිගණක ආශ්‍රයෙන් මුද්‍රණය කරනු ලබන නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී නිවැරදිතාව පරීක්ෂා කර තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාර දෙනු ලැබේ. ඒ අනුව 2011 මාර්තු මස 17 වැනි දින පැවති ඡන්ද විමසීමට අදාළ වූ පළාත් පාලන ආයතන 234 හි ඡන්දහිමියන්ට අදාළ නිල ඡන්ද දැන්වීම්පත් තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාර දීම 2011.03.01 දින ද බෙදීම අවසන් කිරීම 2011.03.11 දින ද විශේෂ බෙදීම වශයෙන් 2011.03.06 ඉරිදා දින යොදා ගන්නා ලෙස ද මැතිවරණ කොමසාරිස්වරයා විසින් උපදෙස් දෙන ලදී.

138. එමෙන්ම දෙවැනි අදියරට අදාළව නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා නිකුත් කිරීම 2011.07.06 දින ද විශේෂ බෙදීම 2011.07.10 දින ද අවසන්

බෙදීම 2011.07.16 දින ද සිදු කරන ලද අතර ඡන්ද විමසීමේ තුන්වැනි අදියරට අදාළව නිල ඡන්ද දැන්වීම්පත් නිකුත් කිරීම 2011.09.20 දින ද විශේෂ බෙදීම 2011.09.25 දින ද අවසන් බෙදීම 2011.10.01 දින ද සිදු කරන ලදී.

139. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව නොමැතිව වුවද ඡන්දහිමියා වලංගු අනන්‍යතා ලියවිල්ලක් මඟින් ඡන්ද පොළ නිලධාරීන් වෙත සිය අනන්‍යතාව සනාථ කරන්නේ නම් ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීමට බාධාවක් නැත. එහෙත් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව මඟින් ඡන්දහිමි නාම ලේඛනයෙන් ඡන්දහිමියාගේ නම පහසුවෙන් සොයා ගත හැකි බැවින් ඡන්ද පොළ නිලධාරීන්ගේ කටයුතු කඩිනම් කෙරෙනු ඇත.

ඡන්දදායකයා විසින් සිය අනන්‍යතාව තහවුරු කිරීමේ අවශ්‍යතාව

140. ඡන්ද පත්‍රිකාවක් නිකුත් කළ යුත්තේ ඡායා රූපයක් සහිත හැඳුනුම්පතක් ඉදිරිපත් කරන්නේ නම් පමණක් බව ප්‍රකාශිත නීතියක අවශ්‍යතාව 1959 තරම් ඈත කාලයක සිට සාකච්ඡා කළද එම නීතිය පාර්ලිමේන්තුවේ සම්මත වූයේ 2004 වර්ෂයේදීය. 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත අනුව ඡන්ද විමසීමකදී ඡන්දපොළෙන් ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීම සඳහා ඡන්දදායකයා විසින් වලංගු අනන්‍යතා ලියවිල්ලක් මඟින් ඡන්ද පොළ නිලධාරීන් වෙත තම අනන්‍යතාව සනාථ කළ යුතුය. එහෙත් එම පනතේ පොදු විධිවිධාන යටතේ මේ පනත ක්‍රියාත්මක වීමට පෙර 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය යටතේ හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධ සියලු පරිපාලන වැඩ පිළිවෙල සපුරා ඇති බවට කොමිෂන් සභාව සැහීමට පත්විය යුතු අතර මැතිවරණ කොමිෂන් සභාව විසින් එම කරුණු සහතික කරමින් එම සහතිකය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය. එසේ සහතික කිරීමට පෙර හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා යොදා ඇති වැඩපිළිවෙල සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවල නියෝජිතයින්ගේ අදහස්වලට මැතිවරණ කොමිෂන් සභාව විසින් නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. ඒ සමඟම මැතිවරණ කොමිෂන් සභාව විසින් එම සහතිකය පළ කිරීමට පෙර පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් 2(1) වගන්තිය ප්‍රකාර වැඩ කටයුතු සිදුකර ඇති බවට සහතිකයක් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. මෙය ඉතා සංකීර්ණවූත් ඉදිරියට යා නොහැකිවූත් තත්ත්වයට පත්ව තිබීම හේතුවෙන් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL) සංවිධානය විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද 176/2006 දරන පෙත්සමෙහි ඉදිරිපත් වූ කරුණු සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් දෙනු ලැබූ එකඟතාව මත 2006 වර්ෂයේ පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී එම පනතෙහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

141. ඒ අනුව 2006 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමෙන් පසුව පවත්වනු ලැබූ සියලුම ඡන්ද විමසීම්වලදී ඡන්ද පොළට පැමිණෙන ඡන්දදායකයා අනිවාර්යයෙන්ම ජාතික හැඳුනුම්පත හෝ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන යම් වලංගු අනන්‍යතා ලේඛනයක් ඡන්ද පොළ නිලධාරීන් වෙත ඉදිරිපත් කර අනන්‍යතාව සනාථ කළ යුතු විය.

142. වලංගු අනන්‍යතා ලියවිලි වශයෙන් පහත සඳහන් ලේඛනවලින් කවර හෝ එකක් ඉදිරිපත් කළ හැකි බවත් එම ලේඛන අතුරින් කිසිවක් තමා සන්තකයේ නොමැති ඡන්දහිමියන්ට තමා පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වෙතින් හෝ තමා පදිංචි වත්තේ වතු අධිකාරී වෙතින් මෙම කාර්යය සඳහා පමණක් වලංගු වන සේ තාවකාලික හැඳුනුම්පතක් ලබා ගත හැකි බවත් නිවේදනය කරන ලදී. (පරිශිෂ්ඨ 32,33,34)

1. ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය
4. රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
5. වැඩිහිටි හැඳුනුම්පත (ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද)
6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් පූජ්‍ය සහ පූජක පක්ෂය වෙනුවෙන් නිකුත් කර ඇති හැඳුනුම්පත

143. ඒ අනුව මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කළ පෝස්ටර් දැන්වීමක පිටපත් සියලුම ග්‍රාම නිලධාරීන් වෙත යවා ග්‍රාම නිලධාරී කාර්යාලවල සහ අදාළ කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට සලස්වා මේ සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී. තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර, අයදුම්පත් සහ උපදෙස් සියලුම ග්‍රාම නිලධාරීවරුන් සහ වතු අධිකාරීවරුන් වෙත යවන ලදී. ඡන්දහිමියා විසින් රැගෙන ආයුතු වූයේ 1"×1½" ප්‍රමාණයේ වර්ණ හෝ කළු සුදු ඡායාරූප පිටපත් 2ක් පමණි. 2006 වර්ෂයේදි ග්‍රාම නිලධාරීවරුන් හා වතු අධිකාරීවරුන් විසින් සකස් කරනු ලබන හැඳුනුම්පත් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සත්‍යාපනය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වුවද ඉන් පසුව පැවති ඡන්ද විමසීම්වලදී එම කටයුතු මැතිවරණ දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධරයෙකු විසින් සිදුකරන ලදී.

144. පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන් මෙම ඡන්ද විමසීමේදීද මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ තාවකාලික හැඳුනුම්පත් අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී ලවා නැවත වලංගු කරවා ගැනීමට ද පහසුකම් සලස්වන ලදී. ඊට අමතරව 2009 ඡන්දහිමි නාමලේඛනයේ නම් සඳහන් ඡන්දහිමියන් අතුරින් වලංගු අනන්‍යතා

ලියවිල්ලක් නොමැති ජන්දහිමියන් වෙත ප්‍රමුඛත්වය දෙමින් ජාතික හැඳුනුම්පත් කඩිනමින් නිකුත් කිරීමේ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙලක් අරම්භ කරන ලෙස පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දෙන ලදී. ඒ පිළිබඳව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් දැක් වූ ප්‍රතිචාරය අගය කළ යුතු වේ. මේ වෙනුවෙන් ජංගම සේවා පැවැත්වීම ඇතුළත් විවිධ කාර්යයන් සඳහා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන කිහිපයකම සහාය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට ලැබිණි.

145. මේ වන විට වාර්ෂික ජන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයත් සමඟ 85% කට අධික ලියාපදිංචි ජන්දහිමියන් සංඛ්‍යාවකගේ ජාතික හැඳුනුම්පත් අංක ජන්දහිමි නාමලේඛනයට ඇතුළත්ව තිබීමත්, වලංගු අනන්‍යතා ලේඛන වශයෙන් ජාතික හැඳුනුම්පතට අමතරව තවත් ලේඛන ගණනාවක් හඳුන්වාදීමත්, පසුගිය ජන්ද විමසීම්වලදී ලබා ගත් තාවකාලික හැඳුනුම්පත් ග්‍රාම නිලධාරී මඟින් නැවත වලංගු කරවා ගැනීමට පහසුකම් සැලසීමත්, ඒ කිසිවක් නොමැති ජන්දහිමියන්ට තාවකාලික හැඳුනුම්පත් ලබා ගැනීමට පහසුකම් සැලසීමත් නිසා ජන්දදායකයාගේ අනන්‍යතාව සනාථ කිරීමට නොහැකි වීමේ හේතුව මත ජන්ද පොළෙන් ජන්ද පත්‍රිකාවක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප වූයේ ඉතාමත් කලාතුරකිනි.

146. ජන්ද පොළේදී ජන්දදායකයා විසින් වලංගු අනන්‍යතා ලේඛනයක් මඟින් සිය අනන්‍යතාව සනාථ කිරීම අනිවාර්ය කිරීම හේතුවෙන් හොර ජන්ද දැමීමට උත්සාහ කිරීම් වළකාලීමට හැකි වූ අතර ඒ හේතුව නිසාම ජන්ද පොළ සාමකාමී වාතාවරණයක් යටතේ පවත්වා ගත හැකි විය.

උචිත ලකුණින් සලකුණු කිරීම

147. පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥාපනතේ 53 (අ) වගන්තිය අනුව ජන්ද පොළේදී ජන්දදායකයා වෙත ජන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙරාතුව ජන්දදායකයාගේ වම් අතෙහි සුලැඟිල්ල පරීක්ෂා කොට සුලැඟිල්ලෙහි නියපොත්ත සහ නිය කන්න ද ඇතුළුව මුල්පුරුක මැකිය නොහැකි තීන්ත වර්ගයකින් සලකුණු කළ යුතුය. මෙය උචිත ලකුණින් සලකුණු කිරීම යනුවෙන් පනතෙහි දක්වා ඇත.

148. වම් අතේ සුලැඟිල්ල පරීක්ෂා කිරීමට ඉඩ නොදීම, පරීක්ෂාවේදී මීට පෙර උචිත ලකුණින් සලකුණු කර ඇති බවක් අනාවරණය වීම සහ පරීක්ෂා කිරීමට ඉඩ දුන් නමුත් සලකුණු කිරීමට ඉඩ නොදීම යන අවස්ථාවල ජන්ද පත්‍රිකාවක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. එමෙන්ම වම් අතේ සුලැඟිල්ල නොමැති ජන්දහිමියකු පැමිණියහොත් පළමුව වෙදැඟිල්ල ද ඊළඟට මැදැඟිල්ල, දබරැඟිල්ල, මහපටැඟිල්ල ආදී වශයෙන් අනුපිළිවෙලින් ඇඟිලි පරීක්ෂාකර නියමිත ඇඟිල්ලෙහි උචිත සලකුණු තැබිය යුතුය. වම් අතෙහි ඇඟිලි කිසිවක් නොමැති නම් දකුණු අතෙහි ඒ අනුපිළිවෙලින් සුලැඟිල්ලේ සිට මහපටැඟිල්ල දක්වා පරීක්ෂා කළ යුතු අතර අත් දෙකෙහිම ඇඟිලි නොමැති නම් වම් අතේ කෙළවර සලකුණු කරනු ලැබේ. ජන්දදායකයා තමාගේ වම් අතේ සුලැඟිල්ල පරීක්ෂා කිරීමට ඉඩ නොදුනහොත් හෝ වම් අතේ සුලැඟිල්ල නොමැති නම් හෝ සුලැඟිල්ල පරීක්ෂාවේදී යම් ලකුණක් ඇති බව අනාවරණය වුවහොත් හෝ කිසිම ලකුණක් නොමැති බව පරීක්ෂාවේදී අනාවරණය වූ නමුත් සලකුණු කිරීමට ඉඩ නොදුන හොත් අදාළ ජන්දහිමියා ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපති වෙත යොමු කරනු ලැබේ. ලකුණක් ඇති බව අනාවරණය වුවහොත් වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා හොර ජන්දය දැමීමට පැමිණි අයකු වශයෙන් පොලිසියට භාරදීමත් සලකුණු කිරීම ප්‍රතික්ෂේප කළහොත් ජන්ද පොළෙන් ජන්ද පත්‍රිකාවක් අනවශ්‍ය බවට ජන්දහිමියා විසින් ගත් තීරණයක් වශයෙන් සලකා කිසිම ජන්ද පත්‍රිකාවක් නිකුත් නොකරන අතර ජන්ද පොළෙන් බැහැර කිරීමත් සිදු කරන ලදී.

149. උචිත ලකුණින් සලකුණු කිරීම මඟින් අපේක්ෂා කරනු ලබන්නේ හොර ජන්ද දැමීමට පැමිණෙන පුද්ගලයින් වළකාලීම සහ කිසියම් විධියකින් එබඳු හොර ජන්ද දැමීමේ අරමුණින් කිසියම් පුද්ගලයකු පැමිණියහොත් ජන්ද පොළේදී ඔහු හඳුනා ගැනීම සඳහා වේ. එහෙත් ජන්ද පොළේදී ජන්දදායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා හැඳුනුම්පත පරීක්ෂා කිරීම අනිවාර්ය කිරීමත් ජන්දහිමි නාමලේඛනය පරිගණක ගත කිරීම මත එක් ලිපිනයක පමණක් ලියාපදිංචි කිරීම විධිමත්ව සිදුකළ හැකිවීමත් සමඟ හොර ජන්ද දැමීම ජන්ද පොළෙන් ඉවත් කරගත හැකි විය. කෙසේ වෙතත් නීතිමය වශයෙන් මෙම සලකුණු කිරීමේ ක්‍රියාදාමය අනුගමනය කිරීමට දෙපාර්තමේන්තුව බැඳී සිටී. ජන්ද විමසීමකදී මේ වෙනුවෙන් විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් හා දුන් වලංගු හැඳුනුම්පත් හරහා අනන්‍යතාව සනාථ කිරීම අනිවාර්ය කර ඇති හෙයින් ඉදිරියේදී මෙම අවශ්‍යතාව මැතිවරණ නීතියෙන් ඉවත් කිරීම මැනවි යයි අදහස් කරමි.

ජන්ද මධ්‍යස්ථාන අධීක්ෂණය

150. සෑම ජන්ද විමසීමකදීම ජන්ද පොළ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා සහ ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරුන්ට අවශ්‍ය සහාය ලබා දීම සඳහා කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන් යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබේ. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා දිස්ත්‍රික්කයේ ඇති ජන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව, මධ්‍යස්ථානවල පිහිටීම, ලියාපදිංචි ජන්ද සංඛ්‍යාව ආදී කරුණු ගණනාවක් සැලකිල්ලට ගෙන මෙම කලාප බෙදා වෙන් කරනු ලබන අතර ආසන්න වශයෙන් කලාපයකට ජන්ද මධ්‍යස්ථාන 5 - 7

දක්වා සංඛ්‍යාවක් ඇතුළත් කරනු ලැබේ. ඇතැම් අවස්ථාවල මෙම මධ්‍යස්ථාන සංඛ්‍යාව මධ්‍යස්ථාන එකකට හෝ දෙකකට සීමාවන අවස්ථාද ඇත. මෙම ඡන්ද විමසීමට අදාළව පළාත් පාලන ආයතන 322 සඳහා පිහිටුවන ලද කලාප සංඛ්‍යාව 2,085 කි.

151. කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන් විසින් තමන්ට නියමිත කලාපයට අයත් ඡන්ද මධ්‍යස්ථානවල කටයුතු කෙරෙහි පූර්ණ අවධානයෙන් සිටිය යුතුය. ඒ අනුව ඡන්ද විමසීමට පෙරදින පස්වරුවේ එක්වරක්ද, ඡන්ද විමසීම් දිනයෙහි වාර තුනක්ද, කලාපය තුළ සංචාරය කළ යුතුය. ඡන්ද විමසීමට පෙර දින පස්වරුවේ ඡන්ද පොළ වෙත යන සහකාර තේරීම්භාර නිලධාරීවරයා පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව ඡන්ද පොළ පරීක්ෂා කළ යුතුය.

I. ඡන්ද පොළ සැකසීම නිවැරදිද
II. ඡන්ද පොළට නියමිත ඡන්දහිමි නාමලේඛන, ඡන්ද පත්‍රිකා, ඡන්ද පෙට්ටි සහ අනෙකුත් සියලුම ලිපි ලේඛන, බඩු භාරදීමේ නිවේදන පත්‍රය අනුව ලැබී තිබේද
III. වාර්තා කර ඇති නිලධාරී සංඛ්‍යාව ප්‍රමාණවත්ද
IV. ඡන්ද පොළේ ආරක්ෂාව ප්‍රමාණවත්ද
V. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සෙසු නිලධාරීන් වෙනුවෙන් පෙරහුරුව පවත්වා තිබේද
VI. නිලධාරීන්ට අවශ්‍ය නවාතැන් පහසුකම් සහ ආහාර සැපයීම සඳහා යොදා ඇති වැඩපිළිවෙල සතුටුදායකද

152. මේ සියල්ලක් පිළිබඳව නියම තත්ත්වය අංක 1 පණිවුඩය මගින් තේරීම්භාර නිලධාරී වෙත දැන්විය යුතුය. යම් ඌණතාවයක් ඇත්නම් ඒ සපයා දීම් සඳහා වහා අවශ්‍ය පියවර ගත යුතුය. මෙම ප්‍රථම සංචාරයේදී ඡන්ද විමසීම ආරම්භයේ සහ අවසන් කරන අවස්ථාවේ තමාගේ සහාය අවශ්‍ය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් පිළිබඳ තක්සේරුවක්ද කර ගැනීම උචිතයයි උපදෙස් දෙනු ලැබේ. ඡන්ද විමසීම් දිනයෙහි පෙ.ව.6.30 ට පෙර එසේ හඳුනාගත් මධ්‍යස්ථාන වෙත ගොස් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ කටයුතු පිළිබඳව අවශ්‍ය සහාය ලබා දිය යුතුය. ඡන්ද විමසීම් දිනයෙහි තම කලාපයේ සියලුම ඡන්ද පොළවල් වෙත වාර තුනක් අවම වශයෙන් සංචාරය කළ යුතු අතර ඒ සෑම වාරයකදීම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට කිසියම් ගැටළුවක් මතු වී ඇත්නම් වහා අවශ්‍ය පියවර ගෙන ගැටළු නිරාකරණය කළ යුතුය. වහා තේරීම්භාර නිලධාරී දැනුවත් කළ යුතුය. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති කාර්යය පරිපාටි සංග්‍රහයෙහි අවශ්‍ය සටහන් තැබිය යුතුය.

153. ඡන්ද විමසීම පැවැත්වෙන අතරතුර තමාගේ කලාපයට අයත් සියලුම මධ්‍යස්ථාන සම්බන්ධයෙන් නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරී විසින්ද සකස් කළ යුතුය. කිසියම් ඡන්ද පොළක ඡන්ද අක්‍රමිකතා සිදුවී ඇතැයි වාර්තා වී ඇත්නම් ඡන්ද පොළ ශූන්‍ය කළ යුතුද නැද්ද යන්න තීරණය කිරීම සඳහා කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරී වාර්තාවද සලකා බලනු ලැබේ. කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීවරයා තම කලාපයට අයත් සියලුම ඡන්ද මධ්‍යස්ථානවල ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඡන්ද විමසීම් කටයුතු අවසන් කර ඡන්ද පෙට්ටිද රැගෙන ඡන්ද පොළෙන් බැහැරව ගිය පසු කලාප රාජකාරී අවසන් කර තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කර තමාගේ ජර්නලය භාර දිය යුතු වේ.

154. මෙම ඡන්ද විමසීම් අවස්ථාව වන විට ජංගම දුරකථන භාවිතය ඉතා ඉහළ මට්ටමක පැවති බැවින් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට මතුවන ගැටළු පිළිබඳව කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරී හෝ දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් අමතා නිරාකරණය කර ගත හැකි වීම විශේෂයෙන් සැලකිය යුතු කරුණක් විය.

ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතු

155. ඡන්ද විමසීමකදී ඡන්ද පොළ නියෝජිතයින් හැර වෙනත් කිසිදු නිරීක්ෂකයකු පත් කිරීම සඳහා ඡන්ද විමසීම් පනත් මගින් විධිවිධාන සලසා නැත. එසේ වුවද 1982 ජනමත විචාරණය සහ 1988 පළාත් සභා ඡන්ද විමසීම යන ඡන්ද විමසීම් පැවති වාතාවරණය නිසාත් රාජ්‍ය තන්ත්‍රය මැතිවරණ දූෂණවලට සම්බන්ධ වූ බවට මතයක් විපක්ෂ ක්‍රියාකාරීන් තුළ පමණක් නොව මධ්‍යස්ථ පුරවැසියන් තුළ පවා ඇතිවී තිබෙන බව නිරීක්ෂණය වූ නිසාත් මහජනයා අතර ඡන්ද විමසීම් කෙරෙහි තිබූ විශ්වසනීයත්වය පළුදු වීමේ ප්‍රවණතාවක් මතුවීමේ අවධානමක් ඇතිවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1988 ජනාධිපතිවරණයේදී මුල් වරට ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණයකිරීම සඳහා විදේශ නිරීක්ෂකයින් මෙන්ම දේශීය නිරීක්ෂකයින් සඳහාද අවකාශ සලසන ලදී. උපදේශක කමිටු පිහිටුවීමද ආරම්භ වූයේ මෙම වාතාවරණය යටතේය. උපදේශක කමිටුවේ ඉල්ලීම සලකා විදේශ නිරීක්ෂකයින් ගෙන්වා ගැනීමට තීරණය කළ අතර අවශ්‍ය නිරීක්ෂක කණ්ඩායම් තෝරා ගැනීම මැතිවරණ කොමසාරිස්වරයාගේ කාර්යයක් විය. ඡන්ද විමසීම් කටයුතු පිළිබඳව විදේශ නිරීක්ෂකයින් වෙතින් ලබා ගන්නා වාර්තාව ඡන්ද විමසීමේ කටයුතු සිදු වූ ආකාරය පිළිබඳව පැහැදිලි ලිඛිත සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කිරීම සහ භීෂණය හා දූෂණය වැළැක්වීම මෙම නිරීක්ෂකයින් යොදා ගැනීමේ අරමුණ විය.

156. උතුරු නැගෙනහිර හැර අනෙකුත් සියලුම පළාත්වල පළාත් පාලන ආයතන සඳහා 1991 වර්ෂයේදී එක්දින ඡන්ද විමසීමක් වශයෙන් පවත්වන ලද ඡන්ද විමසීමේදී නාමයෝජනා කටයුතු සහ ඡන්ද විමසීම් කටයුතු යන අවස්ථා දෙකෙහිදීම නිරීක්ෂණය සඳහා විදේශ නිරීක්ෂණ කණ්ඩායම් කිහිපයක සහාය ලබාගෙන ඇතත් 1993, 1997 සහ 2002 වර්ෂවල පැවති ඡන්ද විමසීම් සඳහා විදේශ නිරීක්ෂකයින් යොදා ගැනීමක් සිදු කර නැත.

157. 2002 වර්ෂයේ පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාරගත් දින සිට විවිධ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවූ බැවින් උපදේශක කමිටු රැස්වීමේදී ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා ජාත්‍යන්තර නිරීක්ෂකයින් ගෙන්වා ගැනීමේ අවශ්‍යතාව ලේකම්වරුන්/ නියෝජිතයන් කිහිපදෙනෙකු ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා දේශපාලන පක්ෂවල පොදු එකඟත්වය පළ කරන ලදී. එහෙත් ඒ වන විට නිරීක්ෂණ කණ්ඩායම් ගෙන්වා ගැනීමට කාලය ප්‍රමාණවත් නොවීම හා අරමුදල් පිළිබඳ ගැටළු හේතුවෙන් එම ඉල්ලීම ඉටු කළ නොහැකි විය. එහෙත් 1988 සිට මේ දක්වා දේශීය නිරීක්ෂණ කණ්ඩායම් තම දායකත්වය දක්වන ලදී. 2006 වර්ෂයේ පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා පැවති උපදේශක කමිටු රැස්වීමේදී විදේශ නිරීක්ෂකයින් ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවක් නොමැති බව ඒකමතිකව තීරණය කරන ලදී. එහෙත් 2008 මඩකළපුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 9 ක් සම්බන්ධයෙන් පැවති ඡන්ද විමසීමට අදාළව විදේශ නිරීක්ෂක කණ්ඩායම් කිහිපයක් ගෙන්වා ගැනීමට කටයුතු කරන ලදී. 1988 වර්ෂයෙන් පසුව පැවති සෑම ඡන්ද විමසීමකදීම දේශීය නිරීක්ෂණ ආයතන කිහිපයකින් මැතිවරණ නිරීක්ෂණය සිදු කරන ලදී. ඒ අතුරින් මාර්ග ආයතනය හා සර්වෝදය ප්‍රමුඛ සංවිධාන කිහිපයක් එක්ව පිහිටුවා ගන්නා ලද නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL) ආයතනය විශේෂ උනන්දුවකින් කටයුතු කරන ලදී. 1994 ජනාධිපතිවරණය සඳහා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) යන නිරීක්ෂණ ආයතනය මුල්වරට නිරීක්ෂණ කාර්යයේ නිරත විය. කෙසේ වෙතත් 2004 අප්‍රේල් මස 02 වැනි දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණය දක්වා ඉහත සඳහන් නිරීක්ෂණ ආයතනවලට අවසර ලැබුණේ ඡන්ද විමසීම පිළිබඳ ඡන්ද මධ්‍යස්ථානයෙන් බැහැරව සාමාන්‍ය නිරීක්ෂණයක් කිරීම සඳහා පමණි.

158. 2004 අප්‍රේල් මස 02 වැනි දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී මුල්වරට මෙම නිරීක්ෂණ ආයතන දෙකෙහි නිරීක්ෂකයින්ට ඡන්ද පොළ තුළට ඇතුළු වී ස්ථිතික නිරීක්ෂකයන් යොදවා ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කිරීමට අවසර දෙන ලදී.

159. ඒ අනුව 2006 සහ 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලදීද එම අවසරය ලැබිණ. 2006 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී ඉහත සඳහන් නිරීක්ෂණ ආයතන දෙකට අමතරව දිරිය පදනම නිරීක්ෂණ ආයතනයටද ඡන්ද පොළේ නැවතී සිට නිරීක්ෂණය කිරීමට අවසර දෙන ලදී. 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමෙහි පළමුවැනි අදියරේදී නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL) සහ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) යන නිරීක්ෂණ ආයතන දෙකට ඡන්ද පොළේ නැවතී සිට නිරීක්ෂණ කටයුතු කිරීමටත් ඊට අමතරව ජංගම නිරීක්ෂකයින් යෙදවීමටත් අවසර දෙන ලද අතර නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (CaFFE), සෙප්කෝ ජනතා සංවිධානය, මානව සංවර්ධන සංවිධානය, මැතිවරණ නිරීක්ෂණ ජාලය සහ ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය යන නිරීක්ෂණ ආයතන සඳහා ඡන්ද පොළෙන් බැහැරව සිට නිරීක්ෂණය කිරීම සඳහාත් අවසර දෙන ලදී.

160. 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී නිරීක්ෂණ ආයතන සහ නිරීක්ෂකයින්ට ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ආචාර ධර්ම පද්ධතියක්ද හඳුන්වා දෙන ලදී.

161. මෙම නිරීක්ෂකයින්ගෙන් අපේක්ෂා කරන ලද්දේ පූර්ණ අපක්ෂපාතීත්වයෙන් යුතුව ඡන්ද විමසීම නිරීක්ෂණය කර එක් එක් ඡන්ද පොළ ඡන්ද විමසීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් වශයෙන් පැවැත්විය හැකිවිද නැතහොත් කිසියම් අක්‍රමිකතා සිදුවූයේද යන්න පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමය. ඡන්ද පොළක ඡන්ද විමසීම ශූන්‍ය කළ යුතුද නැද්ද යන්න තීරණය කිරීමේ එක් සාක්ෂියක් වශයෙන් මෙම නිරීක්ෂණ වාර්තාද සැලකිල්ලට ගන්නා ලදී.

ඡන්ද පොළ නියෝජිතයින් හා සම්බන්ධිත කරුණු

162. නියමිත දිනයෙහි පෙ.ව.7.00 ට ඡන්ද විමසීම ආරම්භ කර ප.ව.4.00 දක්වා නොකඩවා පැවැත්විය යුතුය. මෙම කාලසීමාව තුළ අදාළ පළාත් පාලන ආයතනය සඳහා තරග කරන සියලුම පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් ඡන්ද පොළේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා එම පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් පත් කරනු ලබන නියෝජිතයින් දෙදෙනකුටද ඡන්ද පොළේ නැවතී සිටිය හැකිය. එම ඡන්ද පොළ නියෝජිතයින්ට ඡන්ද විමසීම ආරම්භ කිරීමට මිනිත්තු 30 කට පෙර ඡන්ද පොළ වෙත පැමිණෙන ලෙස උපදෙස් දෙනු ලැබේ. ඒ අනුව ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර ඡන්ද පෙට්ටි, ඡන්ද පත්‍රිකා, ඡන්දහිමි නාමලේඛන ආදිය පරීක්ෂා කර බැලීමට ඉල්ලා සිටිය හොත් ඊට අවකාශ සැලසිය යුතුය. ඊට අමතරව කිසියම් පක්ෂ නියෝජිතයෙකු ඉල්ලා සිටිය හොත් ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර ඡන්ද පෙට්ටි මුද්‍රා තබන අවස්ථාවේදී තම පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ ස්ටිකරයක් ඡන්ද පෙට්ටිය තුළ හෝ ඡන්ද පෙට්ටියේ පියන වැසූ පසු ස්ටිකරයට අනතුරක් නොමැතිව පෙට්ටිය විවෘත කළ නොහැකි වන පරිදි ඡන්ද පෙට්ටියේ පිටතින් හෝ ඇතුළතින් ඇලවීමට ඉඩ දෙනු ලැබේ. එම ස්ටිකරයේ ආදර්ශයක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත ද භාර දිය යුතු අතර ඡන්ද විමසීම අවසානයේ ඡන්ද පෙට්ටි තේරීම්භාර නිලධාරී වෙත භාර දෙන අවස්ථාවේදී එක් එක් පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ ඡන්ද පොළ නියෝජිතයින් විසින් භාර දෙනු ලැබූ ස්ටිකරයේ ආදර්ශයන් ද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තේරීම්භාර නිලධාරී වෙත භාර දිය යුතුය.

163. ඡන්ද විමසීම ආරම්භ කළ සහ ප.ව.4.00ට ඡන්ද විමසීම අවසන් වන තෙක් ඡන්දපොළේ කටයුතු නිරීක්ෂණය කිරීමත්, හොර ඡන්ද දැමීමට පැමිණෙන කිසියම් පුද්ගලයකු වුවහොත් ඔහු හෝ ඇය හඳුනා ගැනීමට ඡන්ද පොළ කාර්ය මණ්ඩලයට සහය දැක්වීමත් ඡන්ද පොළ නියෝජිතයන්ගෙන් අපේක්ෂා කෙරේ. ඡන්ද පොළ නියෝජිතයින් මෙන්ම ඡන්ද පොළ නිරීක්ෂකයින්ද තමාගේ ඡන්ද පොළෙහි ඡන්ද විමසීම ආරම්භ කළ සහ අවසන් කළ කාලය ඇතුළත ඡන්ද විමසීමට බාධාවන අන්දමේ යම් සිද්ධියක් සිදුවී නම් ඒ පිළිබඳ සවිස්තර තොරතුරු සහ සමස්ථ වශයෙන් ඡන්ද විමසීම පැවැත්වුණු ආකාරය පිළිබඳව වාර්තාවක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති මඟින් තේරීම්භාර නිලධාරී වෙත සැපයිය යුතුය.

ආරක්ෂක කටයුතු

164. ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලය, ඡන්ද විමසීමට අදාළ බඩු බාහිරාදිය, ඡන්ද මධ්‍යස්ථාන, අපේක්ෂකයින් හා ඡන්දදායකයින් ඇතුළු ඡන්ද විමසීමකට අදාළ සියලුම අංශ වෙත සමස්ථ වශයෙන් ආරක්ෂාව සැලසීමේ ප්‍රධාන වගකීම පොලිස්පතිවරයා ඇතුළු පොලිස් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. මැතිවරණ නීතිය බලාත්මක කිරීමේ වගකීමක්ද පොලිස් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඒ අනුව ඡන්ද විමසීම් සංවිධානයේදී නිරන්තරයෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පොලිස්පතිවරයා වෙත උපදෙස් ලබා දෙනු ඇත.

165. 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 104 ඇ ව්‍යවස්ථාව අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් දෙනු ලබන උපදෙස් ක්‍රියාත්මක කිරීමට පොලිස් දෙපාර්තමේන්තුව බැඳී සිටී.

166. ඒ අනුව නාමයෝජනා අවස්ථාව, ඡන්ද පත්‍රිකා මුද්‍රණය හා ප්‍රවාහනය, ඡන්ද පත්‍රිකා ගබඩා කර ඇති ස්ථාන, තැපැල් ඡන්ද නිකුත් කිරීම, තැපැල් ඡන්ද සලකුණු කිරීම, ඡන්ද විමසීම, ඡන්ද ගණන් කිරීම, ප්‍රතිඵල ප්‍රකාශය යන සියලුම අවස්ථාවල පොලිසිය විසින් විශේෂ ආරක්ෂක විධිවිධාන සැලසිය යුතුව ඇත. ඊට අමතරව දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් කරනු ලබන මැතිවරණ ප්‍රචාරක කටයුතු, කාර්යාල පිහිටුවීම, රැස්වීම් පැවැත්වීම ආදී සියලුම අවස්ථාවල දේශපාලන අංශ සහ පොදු මහජනතාවගේ ආරක්ෂාව සැලසීම පිළිබඳ වගකීම පොලිස්පතිවරයා ඇතුළු පොලිස් දෙපාර්තමේන්තුව වෙත පැවරෙනු ඇත. ඒ අනුව ඡන්ද විමසීමට පෙර ඡන්ද විමසීම් දින සහ ඡන්ද විමසීමට පසු යන සියලු අවස්ථාවන්හි මහජන ආරක්ෂාව සැලසීමෙහිලා පොලිස් දෙපාර්තමේන්තුව වෙත පැවරෙන වගකීම අතිමහත්ය.

167. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීමට අහිතකර විය හැකි යම් ක්‍රියා හෝ සිද්ධි වැළැක්වීම හෝ පාලනය කිරීමට සන්නද්ධ හමුදා යෙදවීම සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම කළ හැකි වන්නේය.

168. දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙනුවෙන් පවත්වනු ලැබූ උපදේශක කමිටු රැස්වීම් සඳහා පොලිස්පතිවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ද කැඳවනු ලැබූ අතර එම උපදේශක කමිටු රැස්වීමේදී ගනු ලැබූ තීරණ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් දිස්ත්‍රික් මට්ටමේදී දිස්ත්‍රික් දේශපාලන බලධාරීන්, බලයලත් නියෝජිතයින් හා කණ්ඩායම් නායකයින් වෙත සහ ප්‍රාදේශීය පොලිස් ප්‍රධානීන් වෙත පැහැදිලි කර දීම හේතුවෙන් ආරක්ෂක කටයුතු සංවිධානය වඩාත් ඵලදායී ලෙස ක්‍රියාවෙහි යෙදවිය හැකි විය. බොහෝ විට මෙම උපදේශක කමිටු රැස්වීම්වලදී නීතිවිරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු හා ප්‍රචාරක රැස්වීම් සඳහා ස්ථාන වෙන් කර ගැනීමේ ගැටළු විසඳා ගැනීමට හැකිවිය.

169. ඇතැම් අපේක්ෂකයින් වෙනුවෙන් පොලිස් ආරක්ෂාව සැලසීම අත්‍යවශ්‍ය බවට පක්ෂ ලේකම්වරුන් විසින් හෝ අදාළ අපේක්ෂකයින් විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී සලකා බලා නිසි ක්‍රියාමාර්ග ගැනීම්වස් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලදී. එමෙන්ම ඇතැම් ඡන්ද මධ්‍යස්ථාන සඳහා විශේෂ පොලිස් ආරක්ෂාව ලබා දෙන ලෙසට පක්ෂ ලේකම්වරුන්, බලයලත් නියෝජිතයින්, කණ්ඩායම් නායකයින් හා අපේක්ෂකයින් විසින් කරනු ලැබූ ඉල්ලීම් පිළිබඳව දිස්ත්‍රික් මැතිවරණ නිලධාරීන්ගෙන් නිරීක්ෂණ ලබාගැනීමෙන් අනතුරුව නිසි උපදෙස් සහිතව අවශ්‍ය පියවර ගැනීමට පොලිස්පතිවරයා වෙත යොමුකරන ලදී. මෙම ඉල්ලීම් බොහෝමයකට පදනම වූයේ පසුගිය ඡන්ද විමසීම්වලදී ලැබූ අත්දැකීම් හා ඇති වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම්ය.

170. ඡන්ද මධ්‍යස්ථාන ආරක්ෂාව සඳහා පොලිස් සාජන්වරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් කොස්තාපල්වරයකු සහ පොලිස් කොස්තාපල්වරයෙකු බැගින් සියලුම ඡන්ද මධ්‍යස්ථාන සඳහා යෙදවීමට පොලිස්පතිවරයා විසින් පියවර ගනු ලැබූ අතර ඡන්ද මධ්‍යස්ථාන 4 ක් හෝ 5 ක් ආවරණය වන පරිදි ජංගම මුර සංචාරක සේවා යෙදවීමට ද පියවර ගන්නා ලදී. මෙම ජංගම සංචාරක සේවා සඳහා සිවිල් ආරක්ෂක බලකායේ දෙදෙනෙකු බැගින් ද වැක් කරන ලදී.

171. මෙම ඡන්ද විමසීමට අදාළව ද මැතිවරණ මහලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ මධ්‍යස්ථාන ඒකාබද්ධ වන සේ ඡන්ද විමසීමට

පෙර දින සහ ඡන්ද විමසීම් දින මැතිවරණ මහලේකම් කාර්යාලයේ විශේෂ මෙහෙයුම් ඒකකයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම මෙහෙයුම් ඒකකයේ ක්‍රියාකාරිත්වය සඳහා ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් පිරිසක් සේවයේ යෙදවූ අතර යම් ප්‍රදේශයක සිදුවන අක්‍රමිකතාවක් සම්බන්ධව කිසියම් පැමිණිල්ලක් ලැබුණු වහාම එම පැමිණිල්ල පිළිබඳව සත්‍යතාව සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට මෙහෙයුම් මැදිරි භාර පොලිස් ඒකකය මගින් සිදු කරනු ලැබූ අතර, ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමසාරිස්වරයා වෙත වහාම වාර්තා කරන ලදී. තරග කරනු ලබන සියලුම පිළිගත් දේශපාලන පක්ෂයකින් නියෝජිතයකු බැගින් සහ ඡන්ද විමසීම නිරීක්ෂණයට අවසර ලබා ඇති එක් එක් නිරීක්ෂණ ආයතනයකින් එක් නිරීක්ෂකයකුද වශයෙන් සාමාජික පිරිසකට මෙම මෙහෙයුම් ඒකකයට සහභාගි වීමට අවසර දෙන ලදී. දිවයිනේ සියලුම ඡන්ද විමසීම් ප්‍රදේශ ඒ මගින් සම්බන්ධීකරණය කෙරිණ. මෙම මෙහෙයුම් ඒකකය වෙත පැමිණිලි යොමු කිරීම සඳහා භාවිත කළ යුතු ෆැක්ස් අංක පිළිබඳව මාධ්‍ය නිවේදන මගින් සහ පුවත්පත් දැන්වීම් මගින් මහජනයා දැනුවත් කරන ලදී.

172. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් තුන්වැනි අදියරෙහි වනම් 2011.10.08 වැනි දින පැවති ඡන්ද විමසීමට අදාළව නාමයෝජනා අවසන් දිනෙන් පසු 2011.08.28 දින සිට ඡන්ද විමසීම පවත්වා අවසන් වන තෙක් මුළු කාල පරිච්ඡේදය තුළම මෙම සම්බන්ධීකරණ ඒකකය ක්‍රියාවෙහි යොදවන ලදී. ඡන්ද විමසීම් අදියර තුනට අදාළව මැතිවරණ මහලේකම් කාර්යාලයෙහි ක්‍රියාත්මක වූ සම්බන්ධීකරණ ඒකකය වෙත පූර්ව ඡන්ද විමසීම් සහ ඡන්ද විමසීම් දින වශයෙන් ලැබුණු පැමිණිලි සංඛ්‍යාව පිළිබඳ සටහනක් මෙහි ඇතුළත් කර ඇත. ලැබුණු පැමිණිලි පිළිබඳ සංක්ෂිප්ත සටහනක්ද ඇතුළත් කර ඇත.
(සටහන 12)

VII වැනි කොටස

ඡන්දදායකයින් හා ඡන්ද විමසීමට සම්බන්ධ අනිකුත් පාර්ශ්ව දැනුවත් කිරීම

173. ඡන්දහිමියන්ට තම ඡන්දයෙන් තමාගේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය සඳහා සුදුසු පුද්ගලයකු සහිකත්වය සඳහා තෝරා පත් කර ගැනීමට අවකාශ සලසා දීම ඡන්ද විමසීමක් පැවැත්වීමේ මූලික අරමුණ වේ. එහිදී ඡන්දහිමියාට ඡන්ද විමසීම පිළිබඳ ක්‍රියාවලිය සහ එවැනි ඡන්ද විමසීමකදී මතුවන ගැටළු පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. එයින් සමහරක් ව්‍යවස්ථාපිත කරුණු සම්බන්ධයෙන් වන අතර සමහරක් ව්‍යවස්ථාපිත නොවන නමුත් ව්‍යවස්ථාවෙන් පැන නගින සමහර තත්ත්වයන් නිරාකරණය කර දීමේ අපේක්ෂාවෙන් කරනු ලබන දැනුවත් කිරීම්ය.

174. ව්‍යවස්ථාපිත දැන්වීම් මැතිවරණ කොමසාරිස්වරයා හෝ මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් මත තේරීම්භාර නිලධාරීන් විසින් සිදු කරනු ලබන අතර ව්‍යවස්ථාපිත නොවන දැන්වීම් මැතිවරණ කොමසාරිස්වරයා සහ තේරීම්භාර නිලධාරීන්ට අමතරව පොලිස්පතිවරයා ඇතුළු පොලිස් දෙපාර්තමේන්තුව, දේශපාලන පක්ෂ නායකත්වය සහ අපේක්ෂකයින් විසින් සිදු කරනු ඇත.

175. ඊට අමතරව මැතිවරණ කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන් පොලිස්පතිවරයාගේද සහභාගීත්වය ඇතිව මැතිවරණ මහලේකම් කාර්යාලයේ පැවැත්වෙන උපදේශක කමිටු තුළින් ද දේශපාලන පක්ෂ ලේකම්වරුන්, ස්වාධීන කණ්ඩායම් නායකයින්, අපේක්ෂකයින්, නිරීක්ෂකයින් හා ඡන්දහිමියන් දැනුවත් කිරීමේලා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබන බවද සැලකිය යුතුය. මෙම උපදේශක කමිටුවලදී ගනු ලබන තීන්දු හා තීරණ ප්‍රාදේශීය මට්ටම දක්වා ගලා යෑමේ ක්‍රමවේදයක් වශයෙන් තේරීම්භාර නිලධාරීගේ ප්‍රධානත්වයෙන් බලයලත් නියෝජිතයින් හා කණ්ඩායම් නායකයින්ද සමග පැවැත්වෙන දිස්ත්‍රික් මට්ටමේ සාකච්ඡාද මෙහිදී වැදගත් වනු ඇත.

ව්‍යවස්ථාපිත දැන්වීම්

නාමයෝජනා දැන්වීම

176. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමකදී පළ කළ යුතු ව්‍යවස්ථාපිත දැන්වීම් ගණනාවක් ඇත. මෙයින් ප්‍රධානතම දැන්වීම නාමයෝජනා දැන්වීමයි. නාමයෝජනා දැන්වීම දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී විසින් ප්‍රසිද්ධ කළ යුතුය. එක් එක් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වෙන වෙනම සකස් කරනු ලබන දැන්වීමක් බැවින් පළාත් පාලන ආයතනයේ තේරීම්භාර නිලධාරී විසින් මෙම දැන්වීම නිකුත් කරනු ලැබේ. නාමයෝජනා දැන්වීමෙහි පළාත් පාලන ආයතනයේ නම, නාමයෝජනා භාර ගනු ලබන කාල සීමාව, නාමයෝජනා කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව හා එයින් කවර සංඛ්‍යාවක් තරුණ අපේක්ෂකයින් විය යුතුද, නාමයෝජනා භාර ගනු ලබන ස්ථානය හා භාර ගන්නේ කවුරුන් විසින්ද, ස්වාධීන කණ්ඩායමක් වශයෙන් තරග කරන්නේ නම් තැන්පත් කළ යුතු ඇප මුදල හා ඇප මුදල් භාර ගැනීම අවසන් වන දිනය හා වේලාව, නාමයෝජනා ආකෘති ගාස්තු ගෙවීමකින් තොරව තේරීම්භාර නිලධාරීගෙන් ලබා ගත හැකි බව හා පිළිගත් දේශපාලන පක්ෂ සඳහා අනුමත කරන ලද ලකුණු හා ස්වාධීන කණ්ඩායම් සඳහා අනුමත කරන ලද ලකුණු හා හඳුනා ගැනීමේ අංක නිකුත් කරනු ලබන දිනය, වේලාව හා ස්ථානය යන කරුණු අන්තර්ගත විය යුතුය.

177. නාමයෝජනා දැන්වීමට සමගාමීව මැතිවරණ කොමසාරිස්වරයා විසින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතනවල නම් සටහන් කරමින් එක් එක් පළාත් පාලන ආයතනය සඳහා තෝරා පත් කර ගත යුතු සහික සංඛ්‍යාව, නාමයෝජනා කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව තරුණ හා වෙනත් වශයෙන් සහ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල යන කරුණු ඇතුළත් ප්‍රසිද්ධ දැන්වීමක් දිවයිනේ ජනප්‍රිය දිනපතා පුවත්පත් කිහිපයක (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) භාෂා තුනෙන්ම පළ කළ යුතුවේ. ඒ සමගම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 28(1)(ආ) වගන්තිය යටතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා නාමයෝජනා කළ යුතු තරුණ අපේක්ෂක සංඛ්‍යාව දැක්වෙන නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

178. ඡන්ද විමසීමේ 1 වැනි අදියරට අදාළව නාමයෝජනා දැන්වීම ඉහත සඳහන් පුවත්පත් දැන්වීම් හා 28(1)(ආ) වගන්තිය යටතේ ගැසට් නිවේදනය යන ව්‍යවස්ථාපිත දැන්වීම් තුනම 2011.01.06 දිනෙන් යුතුව පළ කරන ලද අතර ඡන්ද විමස මේ තුන්වැනි අදියරේදී මෙම දැන්වීම් 2011 අගෝස්තු 08 වැනි දින පළ කරන ලදී.

ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම

179. නාමයෝජනා දැන්වීමෙන් පසු නිකුත් කළ යුතු ව්‍යවස්ථාපිත දැන්වීම ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම වේ. මෙම දැන්වීම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38(1) වගන්තිය යටතේ තේරීම්භාර නිලධාරී විසින් පළ කළ යුතු දැන්වීමකි.

180. දිස්ත්‍රික්කයේ එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා ඡන්ද විමසීම පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය (ඡන්ද මධ්‍යස්ථාන ලැයිස්තුව) ඡන්ද විමසීම සඳහා තරග කරන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් එම පක්ෂ

හා කණ්ඩායම්වලට වෙන් කර දෙන ලද ඡන්ද ලකුණු, සිංහල අකාරාදිය අනුව අපේක්ෂක නම් පෙළ ගැස්වීමෙන් අනතුරුව එක් එක් අපේක්ෂකයාට වෙන් කර දී ඇති අංකය සහ අපේක්ෂකයාගේ නම අංක අනුක්‍රමිකව මෙම ඡන්ද විමසීම් දැන්වීමට ඇතුළත් කළ යුතුවේ. ඡන්ද විමසීම් දැන්වීම එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී විසින් සකස් කර මැතිවරණ කොමසාරිස්වරයා වෙත භාරදීමෙන් අනතුරුව නැවත පරීක්ෂා කර නිවැරදිතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපතිවරයා වෙත භාරදෙනු ලැබේ.

181. ඇත්ත වශයෙන්ම ඡන්ද විමසීම් දැන්වීමෙහි ඇතුළත් කළ යුතු තොරතුරු සංඛ්‍යාවේ විශාලත්වයත් දැන්වීම සකස් කිරීම සඳහා ඇති සීමිත දින ගණනත් නිසා ඡන්ද විමසීම් දිනට පෙර මෙම දැන්වීම අනුව ඡන්දදායකයාට තොරතුරු සොයා බැලීම අසීරු වනු ඇත. මෙම දැන්වීමෙහි ඡන්ද විමසීමට අදාළ තොරතුරු රාශියක් ඇතුළත් කෙරෙන බැවින් පසු විපරම් සඳහා ඉතා වැදගත් ලේඛනයක් වශයෙන් මෙය සැලකිය හැකිය. එබැවින් ඡන්ද විමසීම් දැන්වීමේ සඳහන් කරුණු පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ විකල්ප පියවරක් වශයෙන් නිල ඡන්ද දැන්වීම්පත් සමඟ එක් ගෘහයකට එකක් බැගින් ගෘහ දැන්වීම් යැවීමට පියවර ගන්නා ලදී.

නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව

182. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 39 (1) වැනි වගන්තිය අනුව ඡන්ද විමසීම් ප්‍රදේශයක ඡන්දහිමි නාමලේඛනයේ නම් සඳහන් සියලුම ඡන්දහිමියන් වෙත ඡන්ද විමසීම් දිනට දින 05 කට පෙර ලැබෙන පරිදි නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් තැපැල් මගින් යැවිය යුතු වේ. එම නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවෙහි ඡන්දහිමියාගේ නම, අනුක්‍රමික අංකය, අදාළ ඡන්ද මධ්‍යස්ථානය, ඡන්ද විමසීම් දිනය හා වේලාව අවශ්‍යයෙන්ම සඳහන් විය යුතුය. නිල ඡන්ද දැන්වීම් පත් පිළිබඳ සම්පූර්ණ තොරතුරු මෙම වාර්තාවෙහි IV වන කොටසෙහි ඇතුළත් කොට ඇත.

තැපැල් ඡන්දහිමියන් වෙත කරනු ලබන දැනුම් දීම

183. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 39ආ(6) වැනි උප වගන්තිය යටතේ තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් තේරීම්භාර නිලධරයාගේ තීරණය ලිඛිතව දැනුම් දිය යුතුය. එම ලියවිල්ල තේරීම්භාර නිලධාරී විසින් ඡන්දහිමියා වෙත යැවිය යුතු ව්‍යවස්ථාපිත දැන්වීමකි. තැපැල් ඡන්ද අයදුම්පත පරීක්ෂා කිරීමෙන් අනතුරුව පිළිගත් බව හෝ නොපිළිගත් බව එම ලියවිල්ල මගින් දැනුම් දිය යුතුය. අයදුම්පතක් නොපිළිගනු ලබන්නේ නම් ඊට හේතු ද සහිතව වහාම අදාළ තැපැල් ඡන්දහිමියා වෙත දැනුම් දීමෙන් අඩුපාඩු සම්පූර්ණ කර වෙනත් අයදුම්පතක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුට අවකාශ ලැබේ. තැපැල් ඡන්ද අයදුම්පත පිළිගත් බවද සහතික කිරීමේ නිලධාරී මගින් තැපැල් ඡන්දහිමියා වෙත දැනුම් දෙනු ලබන අතර ව්‍යාජ තැපැල් ඡන්ද අයදුම්පත් අනාවරණය කර ගැනීම සඳහා තැපැල් ඡන්ද අයදුම්පත් පිළිගනු ලැබූ බව දැනුම්දීමේ ලිපිය අදාළ තැපැල් ඡන්දහිමියාගේ පෞද්ගලික ලිපිනය වෙත ද යොමු කරනු ලැබේ. එහෙත් අදාළ ඡන්දහිමියාගේ ඡන්දය අහිමි වීම වළකාගත හැක්කේ තැපැල් ඡන්ද දායකයකු නොවන අයකුට තැපැල් ඡන්දය පිළිගත් බව දැනුම් දීමේ ලිපියක් ලැබුණ හොත් ඒ බව වහාම අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත දැන්වුවහොත් පමණි.

තැපැල් ඡන්ද නිකුත් කරන බව දැන්වීම

184. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 9 වැනි උපලේඛනයෙහි 10(1) වගන්තිය අනුව තේරීම්භාර නිලධාරී විසින් ඡන්ද විමසීමක නාමයෝජනා කාල සීමාවේ අවසන් දිනට පසු දින 10 ක් ඉකුත් වීමට පෙර තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන දිනය වේලාව හා ස්ථානය පිළිබඳවත් එම අවස්ථාවට පැමිණ සිටිය හැකි නියෝජිතයින් සංඛ්‍යාව පිළිබඳවත් බලයලත් නියෝජිතයින් හා කණ්ඩායම් නායකයින් වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. එම දැනුම් දීම සමඟ ආඥාපනතේ නව වැනි උපලේඛනයෙහි 8 සහ 9 නියෝගවල උධෘතයක්ද යවනු ලැබේ.

ගණන් කිරීම පිළිබඳ දැන්වීම

185. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 61(1) වගන්තිය අනුව තේරීම්භාර නිලධාරී විසින් එක් එක් පළාත් පාලන ආයතනයේ ඡන්ද ගණන් කිරීම ආරම්භ කරනු ලබන වේලාව ගණන් කිරීමේ මධ්‍යස්ථානය හා එක් එක් මධ්‍යස්ථානයට වෙන් කරන ලද ඡන්ද පොළවල් පිළිබඳව තරග කරනු ලබන එක් එක් පක්ෂයේ ලේකම්, බලයලත් නියෝජිත, ස්වාධීන කණ්ඩායමක් නම් කණ්ඩායම් නායක වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

186. එමෙන්ම තේරීම්භාර නිලධාරී විසින් ආඥාපනතේ 9 වැනි උපලේඛනයේ 19 වැනි වගන්තියට අනුකූලව තැපැල් ඡන්ද ගණන් කිරීම ආරම්භ කරනු ලබන දිනය, වේලාව පිළිබඳ ලිඛිත දැන්වීමක් පක්ෂ ලේකම්වරයාට බලයලත් නියෝජිතයාට හෝ කණ්ඩායම් නායකයාට ලබා දිය යුතුය.

ප්‍රතිඵල ප්‍රකාශ කිරීම පිළිබඳ දැන්වීම

187. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65 වගන්තිය යටතේ තේරීම්භාර නිලධරයා විසින් ඒ ඡන්ද විමසීමේදී තරග කරනු ලබන පිළිගත්

දේශපාලන පක්ෂයක ලේකම්ට හෝ බලයලත් නියෝජිතයාට හෝ ස්වාධීන කණ්ඩායමක් නම් කණ්ඩායම් නායකයාට හෝ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන වේලාව සහ ස්ථානය පිළිබඳව ලිඛිත දැන්වීම භාර දිය යුතුය.

ප්‍රතිඵල ගැසට් පත්‍රයේ පළ කිරීම

188. ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශය අවසන් වීමෙන් අනතුරුව තේරීම්භාර නිලධරයා විසින් එක් එක් පළාත් පාලන ආයතනයට අදාළව වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් පක්ෂයේ ලේකම්, ස්වාධීන කණ්ඩායමේ නායක වෙත සහිකධුර හිමිකරගත් එක් එක් අපේක්ෂකයා ලබාගත් මනාප සංඛ්‍යාව දැනුම් දිය යුතු අතර අදාළ සභාව සඳහා නගරාධිපති/ නියෝජ්‍ය නගරාධිපති, සභාපති/ උප සභාපති හා සහිකයින් වශයෙන් තෝරා පත් කර ගත යුත්තේ කිනම් සහිකයන්ද යන්න විමසා සිටිනු ලැබිය යුතුය. එම තීරණය දැනුම් දීම සඳහා සතියක පමණ කාලයක් වෙන්කර දෙනු ලැබේ.

189. නියම කරන ලද කාල සීමාව ඇතුළත අදාළ නාමයෝජනා ලැබුණහොත් 66(1) වගන්තිය යටතේ තේරීම්භාර නිලධාරී විසින් නගරාධිපති/ නියෝජ්‍ය නගරාධිපති, සභාපති/ උප සභාපති හා සහිකයින් වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ අපේක්ෂකයින්ගේ නම් සඳහන් දැන්වීමක් පළ කරනු ලැබේ. එම ඡන්ද ප්‍රතිඵලය ඡන්ද විමසීම් නිලධරයා මගින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත වාර්තා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵලය 66(2) වගන්තිය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ. වෙන් කරන ලද කාල සීමාව ඇතුළත නගරාධිපති/ නියෝජ්‍ය නගරාධිපති හෝ සභාපති/ උප සභාපති නම් කරනු නොලැබුවහොත් මනාප ලැබූ අනුපිළිවෙලින් නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සහිකයින් තෝරා පත් කර ගත් බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ව්‍යවස්ථාපිත නොවන දැන්වීම්

ගෘහ දැන්වීම

190. සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය යටතේ පැවැත්වෙන ඡන්ද විමසීම්වලදී නිල ඡන්ද දැන්වීම්පත් සමඟ ගෘහයකට එකක් බැගින් බෙදා දෙන ගෘහ දැන්වීම ව්‍යවස්ථාපිත නොවූ එහෙත් ඉතා වැදගත් දැන්වීමකි.

191. ඡන්දහිමියා ඡන්දය ප්‍රකාශ කරන පක්ෂය කුමක්ද යන්න තෝරා ගැනීමටත් අපේක්ෂක අංක අදාළ වන්නේ එම පක්ෂයට බැවින් කල් තබා ඡන්දහිමියාට තම මනාපය පළ කරන අපේක්ෂකයාගේ හෝ අපේක්ෂකයින්ගේ අංක කවරේදැයි තීරණය කිරීම සඳහා මෙම ගෘහ දැන්වීම උපයෝගී කර ගත හැකිය.

192. මේ පිළිබඳව ඡන්ද පොළේ පළ කෙරෙන දැන්වීම 45(1)(ආ) වගන්තිය යටතේ දැන්වීමෙහි සහ 38(1) වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ඡන්ද විමසීම පිළිබඳ දැන්වීමෙහි මෙම විස්තර ඇතුළත් වුවත් සාමාන්‍ය ඡන්දදායකයන්ට මෙම ලේඛනවලින් තොරතුරු සොයා ගැනීම අපහසු බැවින් ගෘහ දැන්වීම ව්‍යවස්ථාපිත නොවන නමුත් ඉතා වැදගත් ලියවිල්ලක් වශයෙන් හඳුන්වා දිය හැකිය.

මාධ්‍ය නිවේදන

193. මෙම දැන්වීම් සෘජුවම නීතියෙන් නියම කර නැතත් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතෙහි ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීමේදී අනිවාර්යයෙන් ඡන්දහිමියන් දැනුවත්ව සිටිය යුතු බැවින් මාධ්‍ය නිවේදන මගින් හා පුවත්පත් දැන්වීම් මගින් එම දැනුම් දීම් කරනු ලැබේ. මේ මගින් ඡන්ද විමසීම්වලදී වැදගත්වන ඇතැම් නියෝග කෙරෙහි ඡන්දහිමියන්ගේ අවධානය යොමු කරවීමත් ඇතැම් පහසුකම් ප්‍රයෝජනයට ගන්නා ලෙසත් දැනුම් දීම සඳහා පියවර ගනු ලැබේ.

194. නාමයෝජනා දැන්වීම සමඟම මැතිවරණ කොමසාරිස්වරයා විසින් තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් පිළිබඳව මාධ්‍ය නිවේදන මගින් හා අත්‍යාවශ්‍ය සේවාවන් ඉටු කරනු ලබන හා මැතිවරණ රාජකාරි පැවරෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වෙත යවන චක්‍රලේඛයක් මගින් තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් පිළිබඳව දැනුම් දෙනු ලැබේ.

195. තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් යටතේ පළ කළ අංක 2 දරන මාධ්‍ය නිවේදනය මගින් තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගන්නා දින වකවානු පිළිබඳවත්, තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කර සහතික කිරීමේ නිලධාරී මගින් තේරීම්භාර නිලධාරීන් වෙත යැවිය යුතු ආකාරය පිළිබඳවත් දැනුම් දෙන ලදී. එමෙන්ම තැපැල් ඡන්ද කාලය දීර්ඝ කිරීම හා තැපැල් ඡන්දහිමියන් හා සහතික කිරීමේ නිලධාරීන් සඳහා විශේෂ උපදෙස් මේ මගින් නිවේදනය කරන ලදී.
(පරිශිෂ්ඨ 23)

196. ව්‍යවස්ථාපිත නොවන අනෙක් වැදගත් මාධ්‍ය නිවේදනයක් නම් ඡන්ද පොළේදී අනන්‍යතාව සනාථ කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ඡන්දහිමියන් වෙත කෙරෙන විශේෂ දැනුම් දීමයි. මේ පිළිබඳව පෝස්ටර් දැන්වීමක් මගින් සියලුම ග්‍රාම නිලධාරී බල ප්‍රදේශවල පුළුල් ප්‍රචාරයක් ලබා දීමට කටයුතු කළ අතර මාධ්‍ය නිවේදන අංක 15 මගින් සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ඡන්දහිමියන් දැනුවත් කිරීම සිදු කරන ලදී.
(පරිශිෂ්ඨ 32)

197. 2004 අංක 14 දරන ඡන්ද විමසීම් විශේෂ විධිවිධාන පනත අනුව ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීම සඳහා ඡන්දහිමියා විසින් ඡන්ද පොළ නිලධාරීන් වෙත තමාගේ අනන්‍යතාව සනාථ කිරීම අනිවාර්යය බවත් ඡන්ද පොළේදී පිළිගන්නා අනන්‍යතා ලේඛන කවරේද යන්නත් ඒ මගින් දැනුවත් කරන ලදී.

198. නාමයෝජනා භාර ගැනීමේදී 28 වගන්තියට අනුකූලව භාර නොදීමේ හේතුව මත 31 වගන්තිය යටතේ නාමයෝජනා 452 ක් ප්‍රතික්ෂේප වීමත් එම නාමයෝජනා අතරින් 75 ක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගවලට එළඹීම හා එම පෙත්සම් සම්බන්ධයෙන් අධිකරණ තීරණ දැනුම් දීමේ ප්‍රමාදයත් නිසා පළාත් පාලන ආයතන 65 ක ඡන්ද විමසීම කල් තැබීමට සිදු විය. ඒ පිළිබඳව මහජනයා දැනුවත් කිරීම් වශයෙන් අංක 16 මාධ්‍ය නිවේදනය හා පුවත්පත් දැන්වීම පළ කරන ලදී. ඒ සමඟම ඡන්ද විමසීම කල් තැබූ පළාත් පාලන ආයතනවල තැපැල් ඡන්ද නිකුත් නොකරන බව දැනුම් දීම සඳහා අංක 18 මාධ්‍ය නිවේදනය නිකුත් කරන ලදී.
(පරිශිෂ්ඨ 35,36)

199. අංක 19 මාධ්‍ය නිවේදනය මගින් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දිනයන් පිළිබඳව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් දැනුවත් කරන ලදී. ඡන්ද විමසීමට අදාළ වැරදි ක්‍රියා පිළිබඳව මාධ්‍ය නිවේදන මගින් දැනුවත් කළ යුතු අතර එයින් සමහරක් ඡන්ද පොළේදී ප්‍රදර්ශනය කිරීමට පියවර ගන්නා ලදී. නාමයෝජනා ප්‍රතික්ෂේප වූ ඇතැම් පක්ෂවල/ කණ්ඩායම්වල අපේක්ෂකයින් එම පළාත් පාලන ආයතනය සඳහා තරග කරන වෙනත් පක්ෂයක හෝ කණ්ඩායමක අපේක්ෂකයින් වෙනුවෙන් තමන්ගේ නම් ආදේශ කර ගනිමින් ප්‍රචාරක කටයුතුවල යෙදීමක් දක්නට ලැබුණු බැවින් ඡන්ද අපේක්ෂකයින් හා සියලුම ඡන්ද දායකයින් දැනුවත් කිරීමේ විශේෂ නිවේදනයක් නිකුත් කරන ලදී.
(පරිශිෂ්ඨ 37,38,39,40)

200. ඊට අමතරව කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් සඳහා පෞද්ගලික ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහාත් තැපැල් ඡන්ද හිමිකම් නොමැති පෞද්ගලික අංශයේ සේවය කරන්නන් සඳහා ඡන්දය ප්‍රකාශය කිරීමට යාම සඳහා නිවාඩු ලබා ගැනීම සම්බන්ධව විධිවිධාන කෙරෙහිත් අශක්නුතාවයට පත් ඡන්දහිමියකුට ඡන්ද පොළේදී ඡන්දය සලකුණු කිරීම සඳහා සහයකයකු කැටුව යාම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම පිළිබඳවත් පුවත්පත් දැන්වීම් මගින් හා මාධ්‍ය නිවේදන මගින් ඡන්ද විමසීම් අදියර තුනේදීම වෙන වෙනම ඡන්දදායකයින් දැනුවත් කිරීම කරන ලදී. පුවත්පත් දැන්වීම් මගින් මහජනයා දැනුවත් කළ විශේෂිත දැන්වීමක් වශයෙන් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීමේදී ඡන්දය සහ මනාපය නිරවුල්ව සලකුණු කරන ආකාරය පිළිබඳව දැනුවත් කරමින් පළ කළ දැන්වීම සැලකිය හැක. සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ මේ වන විට අවුරුදු 23 කට ආසන්න කාලයක් ඡන්දය ප්‍රකාශ කර ඡන්දය සහ මනාපය ප්‍රකාශ කිරීම පිළිබඳව ඡන්දදායකයා දැනුවත්ව ඇති බැවින් නැවත සිහිපත් කිරීමක් වශයෙන් ඡන්ද විමසීම් අදියර තුනේදීම ඡන්දය ප්‍රකාශ කිරීම හා මනාප ලකුණු කිරීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් යන හිසින් යුතුව ඡන්ද පත්‍රිකාවේ ආදර්ශයක් සහ ඡන්දය සලකුණු කිරීමේදී හා මනාප සලකුණු කිරීමේදී කතිරය (X) යෙදිය යුතු ආකාරය පිළිබඳවත් දැනුවත් කිරීමේ පුවත්පත් නිවේදන පළ කරන ලදී.
(පරිශිෂ්ඨ 41,42)

වෙනත් දැන්වීම්

201. මෙවැනි පණිවුඩවලට අතිරේක වශයෙන් තම තමන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමට වේලාසනින්ම ඡන්ද මධ්‍යස්ථාන වෙතට යන ලෙසත් ඒ යන විට වලංගු හැඳුනුම්පතක් රැගෙන යාම අනිවාර්යය අවශ්‍යතාවයක් බවත් වලංගු හැඳුනුම්පතක් වශයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව අනුමත කර ඇත්තේ කවර හැඳුනුම්පතක්ද යන්නත් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව රැගෙන යාම අනිවාර්යය නොවන බවත් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව රැගෙන යාමෙන් ප්‍රමාදයකින් තොරව ඡන්දහිමි නාමලේඛනයෙන් ඡන්දහිමියාගේ නම සොයා ගැනීමට ඡන්ද පොළ නිලධාරීන්ට පහසු වන බවත් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව ඡන්ද පොළ අවට රැඳී නොසිට නීතිය හා සාමය ආරක්ෂා කිරීමට සහාය දෙන ලෙසත් ඡන්ද විමසීම් අදියර තුනේදීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍යයන් මගින් ඡන්ද දායකයින්ගෙන් ඉල්ලා සිටින ලදී.

202. ඡන්දය විමසන දවසේ කළ යුතුදේ නොකළ යුතුදේ පිළිබඳව විශේෂ උපදෙස් ලබා දීමෙන් පොලිස් දෙපාර්තමේන්තුවද ඡන්දහිමියන්ට සහාය විය. මේ පණිවිඩය පුවත්පත් නිවේදන මගින් මෙන්ම උපදේශක කමිටු රැස්වීම්වලදී පක්ෂ ලේකම්වරුන්, බලයලත් නියෝජිතයින් හා කණ්ඩායම් නායකයින්ට නෛතික විධිවිධාන පැහැදිලි කර දීම මගින් සිදු කරන ලදී. මෙම උපදේශක කමිටු රැස්වීම් පක්ෂ ලේකම්වරුන් සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයේදීද බලයලත් නියෝජිතයින් හා කණ්ඩායම් නායකයින් සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවලදීද පවත්වන ලදී. එම අවස්ථාවලට අනිවාර්යයෙන්ම පොලීසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කණ්ඩායමක්ද සහභාගී විය.

203. විශේෂයෙන් මැතිවරණ අවස්ථාවකදී පැන නගින ප්‍රශ්න සම්බන්ධයෙන් වඩාත් වැදගත් සන්නිවේදන ක්‍රමවේදයක් වශයෙන් තරග වැදී සිටින දේශපාලන

පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් හරහා පක්ෂ ලේකම්වරුන් කණ්ඩායම් නායකයින් හා අපේක්ෂකයින් විසින් සිදු කරනු ලබන ප්‍රචාරක කටයුතු සැලකිය හැකිය. ප්‍රචාරක රැස්වීම් මෙහිදී වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. ඡන්දය සහ මනාපය ආයාචනා කරනු ලබන විට ඡන්දය හා මනාපය ලකුණු කරන ආකාරය පිළිබඳවත් ඡන්ද පොළට රැගෙන යා යුතු දේ පිළිබඳවත් ඡන්ද පොළට උදෙන්ම යාමේ වැදගත්කමත් ඡන්ද දායකයින්ට නිවසේදීම පැහැදිලි කර දෙනු ඇත.

204. ඊට අමතරව නිරීක්ෂණ ආයතන විසින්ද ඡන්දදායකයා දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. එහෙත් මෙහිදී නිරීක්ෂණ ආයතන අපක්ෂපාතී මෙහෙවරක් කළ යුතුය. මෙම ඡන්ද විමසීමේදී මැතිවරණ කොමසාරිස්වරයාගේ චිකඟත්වය ඇතිව පැෆ්රල් සංවිධානය විසින් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වලංගු අනන්‍යතා ලියවිල්ලක් රැගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳව දැනුවත් කරමින් පෝස්ටර් මගින් දිවයින පුරා පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී. ඒ සමඟම එම සංවිධාන විසින් විවිධ අවස්ථාවල අවස්ථාවට උචිත පරිදි මාධ්‍ය මගින් ඡන්දදායකයා දැනුවත් කිරීම්ද සිදු කරන ලදී.

VIII වැනි කොටස

දේශපාලන පක්ෂ ලේකම්වරුන්, බලයලත් නියෝජිතයින්, කණ්ඩායම් නායකයින් හා අපේක්ෂකයින් දැනුවත් කිරීම

පක්ෂ ලේකම්වරුන් සමඟ පැවති සාකච්ඡා (උපදේශක කමිටු රැස්වීම්)

205. ඡන්ද විමසීමක දී තරග කරන දේශපාලන පක්ෂවල ලේකම්වරුන් හා අපේක්ෂකයින් පොලිස් නිලධාරීන් හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම සඳහා මෙම උපදේශක කමිටු විශේෂයෙන් වැදගත් වූ බව සඳහන් කළ යුතුය. උපදේශක කමිටුවල ආරම්භය 1988 පැවති භීෂණකාරී ඡන්ද විමසීම් සමඟ වුවද ඊට පසුව පැවති සෑම ඡන්ද විමසීමකදීම මෙම උපදේශක කමිටු ක්‍රියාත්මක කෙරිණ.

206. සමානුපාතික නියෝජන ඡන්දක්‍රමය යටතේ පවත්වනු ලබන සෑම ඡන්ද විමසීමකදීම දේශපාලන පක්ෂවල හැසිරීම බොහෝදුරට වීකාකාරී වුවත් එක ඡන්ද විමසීමකදී ලැබූ අත්දැකීම් ඊළඟ ඡන්ද විමසීමේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් නොවේ. එබැවින් එක් එක් ඡන්ද විමසීමකදී ඊට අදාළව නීතිමය තත්ත්වය හා නීත්‍යානුකූලව මැතිවරණ ව්‍යාපාරයේ යෙදීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී. දේශපාලන පක්ෂවල අපේක්ෂකයින්ගෙන් බලාපොරොත්තු වන සහයෝගය පුනරීක්ෂණය කිරීමත් මෙම උපදේශක කමිටුවලින් බලාපොරොත්තු විය.

207. මැතිවරණ කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන් පක්ෂ ලේකම්වරුන් හා පොලිස්පතිවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ පැවැත් වූ මෙම උපදේශක කමිටුවේදී ගනු ලබන තීන්දු හා තීරණ පිළිබඳව දිස්ත්‍රික් මට්ටමේදී බලයලත් නියෝජිතයින්, ස්වාධීන කණ්ඩායම් නායකයින් හා අපේක්ෂකයින් කැඳවා සාකච්ඡා කරන ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදී.

208. මෙම උපදේශක කමිටු රැස්වීම මගින් මැතිවරණ කොමසාරිස්වරයා, පොලිස්පති සහ පක්ෂ ලේකම්වරුන්, අපේක්ෂකයින් අතර අන්‍යෝන්‍ය සම්බන්ධීකරණයට අවස්ථාව සලසාදීම, විශේෂ ගැටළු සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා සාකච්ඡා මණ්ඩපයක් වශයෙන් ක්‍රියා කිරීම සහ නීතිමය හා ක්‍රියා පටිපාටිමය තත්ත්වයන් පැහැදිලි කර දීමේ ස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක විය. ඒ හේතුවෙන් ඡන්ද විමසීම් සංවිධානයේදී සක්‍රිය වූත් අතිශය වැදගත් වූත් දායකත්වයක් මේ මගින් ලබා ගත හැකි විය. මෙම කමිටු රැස්වීම්වලට ලේකම්වරුන්ට නිරන්තරයෙන්ම සහභාගීවීමට අපහසුතා ඇති විය හැකි බැවින් ඔවුන් නියෝජනය කිරීම සඳහා මෙන්ම ඔවුන් සමඟ සහභාගීවීමට ඒ ඒ පක්ෂයෙන් නිත්‍ය නියෝජිතයන් නම් කරන ලෙස ඉල්ලා සිටි අතර ඡන්ද විමසීමේ තුන්වන අදියරේ දී එකී නිත්‍ය නියෝජිත කමිටුව නිතර රැස් වන ලදී.

209. සාමාන්‍යයෙන් උපදේශක කමිටු රැස්වීමේදී මැතිවරණ නීතිය පැහැදිලි කරදීමත් පසුගිය ඡන්ද විමසීම්වලදී ගනු ලැබූ තීන්දු තීරණ නැවත සිහිපත්කර පූර්වාදර්ශ වශයෙන් ගත හැකි තත්ත්වයන් පිළිබඳව පැහැදිලි කිරීමත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදු කරනු ලැබූ අතර දේශපාලන පක්ෂ ලේකම්වරුන් නීතියේ යම් යම් ගැටළුකාරී ස්ථාන පැහැදිලි කර ගැනීමත් තමන්ට සිදුවී ඇති අසාධාරණයන් ඉදිරිපත් කර සාධාරණ විසඳුමක් බලාපොරොත්තු වීමත් සඳහා මෙය අවස්ථාව කර ගන්නා ලදී. පොලිස්පතිවරයා ඇතුළු පොලිස් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් වූ සියලු කරුණු අලලා නීතිය හා පොලීසියේ ස්ථාවරය පැහැදිලි කර දෙන ලදී. ඒ ඒ ඡන්ද කොට්ඨාස මට්ටමින් ඒ ඒ පක්ෂය/ ස්වාධීන කණ්ඩායම විසින් පිහිටුවනු ලබන අවසරලත් ඡන්ද කාර්යාලවල පක්ෂ/ අපේක්ෂක ප්‍රචාරක දැන්වීම් හා බැනර් ප්‍රදර්ශනය සඳහා අනුමැතිය දීම් වස් එම ස්ථානවලට අදාළව පමණක් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රචාරක දැන්වීම් ප්‍රසිද්ධ කිරීම තහනම් කර ඇති වගන්තිය තදින් ක්‍රියා කිරීමෙන් වැලකී සිටින ලෙස පොලිසියට දැනුම් දෙනු ලැබුවේ මෙම රැස්වීම්වලදී ඇති කර ගත් එකඟතාවය අනුවය.

210. ඡන්ද විමසීම් අදියර තුනේදීම පැවති උපදේශක කමිටු රැස්වීම්වලදී සාකච්ඡාවට බඳුන් වූ කරුණු පහත දැක්වා ඇත.

- ප්‍රචාරක රැස්වීම් සඳහා ස්ථාන වෙන්කර ගැනීමේදී ඇතිවන ගැටළු
- යම් යම් සිද්ධි සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීමේදී ඇතිවන ගැටළු
- ගුවන් විදුලියේ හා රූපවාහිනියේ පක්ෂග්‍රාහී බව
- නීති විරෝධී ඡන්ද කාර්යාල පවත්වාගෙන යාම හා අනුමත ඡන්ද කාර්යාලවලට තර්ජන එල්ලවීම
- පෝස්ටර්, බැනර්, කටවුට් මගින් සිදුකරන නීති විරෝධී ප්‍රචාරණ කටයුතු
- පෞද්ගලික වාහනවල ප්‍රචාරක ස්ටිකර් ප්‍රදර්ශනය හා පෞද්ගලික/ ලංගම බස්රථවල බලහත්කාරයෙන් ස්ටිකර් ඇලවීම
- ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චිය සඳහා අවසර ලබා ගැනීමේදී ඇතිවන දුෂ්කරතා
- ඡන්දය සලකුණු කිරීම සඳහා උදවුවීම පිණිස සහායකයකු සමඟ නොපැමිණෙන, එහෙත් සහාය අවශ්‍ය ඡන්දහිමියන්ට ඡන්දය සලකුණු කිරීමට සහාය වීමේ ගැටළු (238 ඡේදය බලන්න)
- විශේෂ ආරක්ෂාව අවශ්‍ය ඡන්ද මධ්‍යස්ථාන
- විවිධ ප්‍රදේශවල විශේෂයෙන් යාපනය දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රචාරක කටයුතු සඳහා ඇතිවන බාධා

ආදී වශයෙන් දේශපාලන පක්ෂවලට පැන නැඟී ඇති ගැටළු සාකච්ඡා කළ අතර දේශපාලන පක්ෂවලට පිළිගත හැකි සාධාරණ විසඳුම් ලබා දියහැකි විය.

211. ඒ අනුව මෙම උපදේශක කමිටුව (හෝ නිත්‍ය නියෝජිත කමිටුව) දුක් ගැනවිලි විමසා බැලීම සඳහා සාකච්ඡා මණ්ඩපයක් ලෙසද ප්‍රයෝජනවත් වූ අතර එමගින් එක් එක් පාර්ශ්වයේ කාර්යභාරය පිළිබඳව අවබෝධයක් ලැබීම අගය කළ යුතු තත්ත්වයකි. මැතිවරණ කාර්ය සංවිධානය, පොලිස් දෙපාර්තමේන්තුව හා පක්ෂ ලේකම්වරුන් අතර අන්‍යෝන්‍ය සහයෝගය කෙරෙහි උපදේශක කමිටුවල අවධානය යොමුවිය. මෙම උපදේශක කමිටු මගින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පිළිබඳ අපේක්ෂාව ව්‍යාකබද්ධ ව්‍යායාමයක් සහ වගකීමක් බව අදාළ සියලුම පාර්ශ්ව වෙත ඒත්තු ගැන්වීමට බොහෝදුරට සමත් වූ බව කිව යුතුය.

212. ඡන්ද විමසීම් නීතියෙහි කාලීන වශයෙන් අවශ්‍ය වෙනස් කිරීම් පිළිඳව පක්ෂ ලේකම්වරුන් සමඟ පැවති මෙම උපදේශක කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කර තීන්දු තීරණවලට එළඹීමට හැකිවීම මෙහිදී අතිශයින් වැදගත් වූ බවද කිව යුතුය. ඒකී කරුණු ඡන්ද විමසීම් නීතිවලට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලය ඇත්තේ පාර්ලිමේන්තුවට බැවින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ආණ්ඩුව හා පාර්ලිමේන්තුව නියොජනය කරන දේශපාලන පක්ෂ විසින් ගනු ලබනු ඇතැයි අපේක්ෂා කෙරේ.

IX වැනි කොටස

කාර්ය මණ්ඩල සහ ප්‍රවාහන අවශ්‍යතා

කාර්ය මණ්ඩල අවශ්‍යතා

213 මෙම ඡන්ද විමසීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සමස්ථ වශයෙන් පූර්ණ සංගණනයක් කිරීමේ අවශ්‍යතාවක් මතුවූයේ නැත. 2010 වර්ෂයේ ජනවාරි මස ජනාධිපතිවරණය සහ 2010 අප්‍රේල් මස පාර්ලිමේන්තු මහ මැතිවරණය පවත්වනු ලැබූ බැවින් ඒ සඳහා වැක් රැස් කළ නිලධාරී දත්ත යථාවත් කර ගැනීමක් පමණක් සිදු කරන ලදී. එහිදී සංශෝධන ආකෘති පත්‍ර මඟින් වැක් වැක් දෙපාර්තමේන්තුව, ආයතනය, පාසලට අදාළ කාර්ය මණ්ඩලයෙහි වෙනස්වීම් වශයෙන් අළුතින් සේවයට පැමිණි නිලධාරීන් හා සේවයෙන් විශ්‍රාම ගිය සහ ස්ථානමාරු ලැබූ නිලධාරීන් පිළිබඳව තොරතුරු සටහන් කර ගන්නා ලදී.

214. ඡන්ද විමසීමකට අදාළව මූලික කටයුතු සංවිධානය ඡන්ද විමසීමේ රාජකාරි, ගණන් කිරීමේ රාජකාරි සහ ප්‍රතිඵල සකස් කිරීමට අදාළ රාජකාරි සහ අවශ්‍ය සේවා සැලසීමේ රාජකාරි වශයෙන් විවිධ කාර්යයන් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ. මේ සඳහා දිස්ත්‍රික් මට්ටමෙන් රජයේ කාර්යාල සහ රජයේ විදුහල් කාර්ය මණ්ඩල සම්බන්ධයෙන් තොරතුරු වැක් රැස් කර ගනු ලැබේ. වැක් වැක් දිස්ත්‍රික්කය තුළින් සපයා ගත හැකි නිලධාරී සංඛ්‍යාවට අමතරව අවශ්‍ය වන නිලධාරීන් කොළඹ සංචිතයෙන් ලබා දීමට පියවර ගනු ලැබේ.

215. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් වශයෙන් කොළඹ සංචිතයෙන් තෝරා ගන්නා ජ්‍යෙෂ්ඨ නිලධාරී පිරිසක් මැතිවරණ මහ ලේකම්කාර්යාලයේ අතිරේක/ නියෝජ්‍ය කොමසාරිස්වරුන්ගේ සහය ඇතිව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පුහුණු කරවනු ලබන අතර දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් පුහුණු කරවීම මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් වී වී දිස්ත්‍රික්කය භාරව පත්කර ඇති නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා, ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස්වරයා, සහකාර මැතිවරණ කොමසාරිස්වරයා හෝ විසින් ඉටු කළ යුතු වනු ඇත.

216. මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අදියර 3 කදී සිදු කරනු ලැබූ බැවින් අවශ්‍ය කාර්යය මණ්ඩලයෙන් වැඩි කොටසක් දිස්ත්‍රික්කය තුළින්ම සපයා ගත හැකි විය. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් සහ සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් යම් නිලධාරීන් සංඛ්‍යාවක් පමණක් කොළඹ සංචිතයෙන් වී වී දිස්ත්‍රික්කවලට යැවීම අවශ්‍ය විය. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති ඇතුළු සෙසු කාර්යය මණ්ඩල සඳහා දිස්ත්‍රික් කාර්යය මණ්ඩලයට අමතරව අවශ්‍ය නිලධාරීන් යාබද දිස්ත්‍රික්ක වෙතින් ලබා ගැනීමට පියවර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. ඊට අමතරව ඡන්දභිමියාගේ හැඳුනුම්පත් පරීක්ෂාව සහ ඡන්ද පොළ කටයුතු පරීක්ෂාව සඳහා කොළඹ සංචිතයෙන් සුදුසු නිලධාරීන් යැවීම මෙම ඡන්ද විමසීමේදීද සිදු කරන ලදී.

217. මෙම ඡන්ද විමසීමේ දෙවැනි අදියරේදී යාපනය, කිළිනොච්චිය හා මුලතිව් දිස්ත්‍රික්කවල ඡන්ද විමසීම් සඳහා සෑම ඡන්ද පොළකටම වැක් නිලධාරියෙකු බැගින් හෝ පිටස්තර දිස්ත්‍රික්කවලින් යැවීමට පියවර ගන්නා ලදී. මෙය පක්ෂ ලේකම්වරුන් සමඟ පැවති උපදේශක කමිටු රැස්වීම්වලදී කරන ලද ඉල්ලීමක් ඉටු කිරීමට ගත් උත්සාහයකි.

218. ඡන්ද විමසීම් රාජකාරියෙහි යොදවනු ලැබූ නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් පිරිසක් ගණන් කිරීමේ රාජකාරි සඳහා ද යොදවනු ලැබූ අතර සෑම ගණන් කිරීමේ මධ්‍යස්ථානයකටම ඡන්ද පොළ රාජකාරියේ නොයෙදුණු නිලධාරීන් පිරිසක් ද පත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

219. ඡන්ද මධ්‍යස්ථාන සංවිධානය අදාළ ඡන්ද මධ්‍යස්ථානය පිහිටා ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වෙත පවරනු ලැබූ අතර විශේෂිත අවස්ථාවල වැනම් වැක් මධ්‍යස්ථානයකට වඩා වැඩි මධ්‍යස්ථාන සංඛ්‍යාවක් පැවරෙන අවස්ථාවල වෙනත් කොට්ඨාසයක ග්‍රාම නිලධාරිවරයකු වෙත පැවරිණ. අදාළ ඡන්ද කොට්ඨාසයේ ඡන්ද සංඛ්‍යාව 1,200 හෝ ඊට අඩු නම් තනි පෝලිමේ ඡන්ද පොළක් වශයෙන්ද, ඡන්ද සංඛ්‍යාව 1,200 ට වැඩි නම් පෝලිම් දෙකේ ඡන්ද පොළක් වශයෙන්ද ක්‍රියාත්මක කළයුතු බවට උපදෙස් දෙන ලදී. වැයින් තනි පෝලිමේ ඡන්ද පොළවල් නැවත ඡන්ද සංඛ්‍යාව 800 ට අඩු සහ 801 සිට 1,200 දක්වා වශයෙන්ද පෝලිම් දෙකේ ඡන්ද පොළවල් 1,201 - 1,500 දක්වා සහ 1,500ට වැඩි ඡන්ද පොළවල් වශයෙන්ද වර්ග කරනු ලැබේ. වම බෙදා වෙන් කිරීම මත අවශ්‍ය ඡන්ද පොළ නිලධාරී සංඛ්‍යාව පිළිබඳව තීරණය කළයුතු බවට උපදෙස් දෙන ලදී. ඡන්ද සංඛ්‍යාව 2500 ඉක්මවන ඡන්ද කොට්ඨාස සඳහා ගැහැණු/ පිරිමි වශයෙන්ද ඡන්ද පොළවල් දෙකක් පිහිටුවීමෙන් ඡන්ද පොළේ ඇතිවන තදබදය වලකා ගතයුතු බවද අවධාරණය කරන ලදී. ගැහැණු පිරිමි වශයෙන් වෙන් කරනු ලබන ඡන්ද කොට්ඨාස පිළිබඳව ඡන්ද විමසීම් දැන්වීම මඟින් ප්‍රසිද්ධියට පත්කිරීමට සහ නිල ඡන්ද දැන්වීම්පත් මඟින් ඡන්දභිමියා දැනුවත් කිරීමට ක්‍රියා කරන ලදී.

ජන්ද පොළ කාර්ය මණ්ඩල	ජන්ද සංඛ්‍යාව අනුව පත් කළ යුතු නිලධාරී සංඛ්‍යාව			
	800 ට අඩු	801-1200	1201-1500	1501ට වැඩි
ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපති	1	1	1	1
කණිෂ්ඨ ජන්ද ස්ථානාධිපති	1	1	2	2
ලිපිකරු	4	4	8	8
අතිරේක ලිපිකරු	0	1	2	3
කාර්යාල කාර්ය සහායක	1	1	1	1
අනන්‍යතාව සනාථ කර ගැනීම	1	1	2	2
එකතුව	**8**	**9**	**16**	**17**

220. ජන්ද පොළ කාර්ය මණ්ඩල පත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂයෙන් සැලකිළිමත් විය යුතු බවට තේරීම්භාර නිලධාරීන් දැනුවත් කරන ලදී.

I. රාජකාරියේ ස්වරූපය අනුව පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මැතිවරණ රාජකාරී සඳහා තෝරා ගැනීමේ අවශ්‍යතාව

II. ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපති වශයෙන් ජන්ද පොළක් භාරව රාජකාරී පැවරීම සඳහා තෝරා ගන්නා නිලධාරීන් අඩු තරමින් කණිෂ්ඨ ජන්ද ස්ථානාධිපති වශයෙන් වාර 4 කට වැඩි සංඛ්‍යාවක් හෝ ජන්ද පොළ රාජකාරියෙහි යෙදුණු නිලධාරීන් වීමේ අවශ්‍යතාව

III. නිලධාරියාගේ නිත්‍ය රාජකාරියෙහි ස්වරූපය හා සේවා ස්ථානය, පදිංචි ලිපිනය පිළිබඳව සැලකිලිමත්ව රාජකාරී පැවරිය යුතු බවත් මැතිවරණ රාජකාරිය අපක්ෂපාතීව ඉටු කළ යුතු අතර ඒ අපක්ෂපාතීත්වය නිලධාරියා වෙතින් පිළිබිඹු විය යුතුය යන්න පිළිබඳවත් අවධාරණය කිරීම

IV. එකම සේවා ස්ථානයේ නිලධාරීන් එකම ජන්ද පොළක මැතිවරණ රාජකාරී සඳහා පත් නොකළ යුතු බව මෙන්ම කිසියම් සේවා ස්ථානයක් ජන්ද පොළක් වශයෙන් යොදා ගෙන ඇත්නම් එහි සේවක පිරිස් එම ජන්ද පොළෙහි කාර්ය මණ්ඩලය වශයෙන් පත් නොකළ යුතු බව

V. කිසියම් නිලධරයකු හෝ එම නිලධරයාගේ පවුලේ කිට්ටු ඥාතිවරයකු ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ බවට තොරතුරු ලැබී ඇත්නම් එබඳු නිලධාරීන් වෙත මැතිවරණ රාජකාරී නොපැවරිය යුතු බව

VI. පසුගිය ජන්ද විමසීම්වලදී නිසි පරිදි රාජකාරී ඉටු නොකළ බවට වාර්තා වී ඇති අකාර්යක්ෂම හා වගකීමෙන් තොර නිලධාරීන් වෙත රාජකාරී නොපැවරිය යුතු බව

221. මෙම ජන්ද විමසීමට අදාළව යොදාගත් කාර්ය මණ්ඩලය නිලධාරීන් 189, 929 කින් සමන්විත විය. මෙම කාර්ය මණ්ඩලය ජන්ද විමසීම් මූලික සංවිධාන කටයුතු, ජන්ද විමසීමේ රාජකාරී, ගණන් කිරීමේ රාජකාරී සහ ප්‍රතිඵල සකස් කිරීමේ රාජකාරී යන සමස්ථ ක්‍රියාවලිය සඳහාම අවශ්‍ය වූ කාර්ය මණ්ඩලය වේ. ජන්ද විමසීම් රාජකාරියෙහි යෙදුනු නිලධාරීන් ගණන් කිරීම හෝ ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ කාර්යයන් සඳහා ද බොහෝවිට යොදා ගන්නා ලදී.

222. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා අවශ්‍ය වූ කාර්ය මණ්ඩලයෙන් වැඩි කොටසක් දිස්ත්‍රික්කය තුළින් සපයා ගත හැකි වූ අතර සෙසු අවශ්‍යතාව කොළඹ සංචිතයෙන් ලබා ගැනීම සිදු කෙරිණ. මෙම ජන්ද විමසීමේ දෙවැනි හා තුන්වැනි අදියරයන් පළාත් පාලන ආයතන කිහිපයකට පමණක් සීමා වූ බැවින් දිස්ත්‍රික් අවශ්‍යතාව එම දිස්ත්‍රික්කය තුළින්ම සපයා ගත හැකි විය. එහෙත් පක්ෂ ලේකම්වරුන්ගේ ඉල්ලීම් පරිදි විශේෂ වැඩ පිළිවෙලක් වශයෙන් වෙනත් දිස්ත්‍රික්කවල සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාවක් වෙත උතුරු නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනවල ජන්ද විමසීම් රාජකාරී පැවරීමත් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ට ජන්ද පොළ රාජකාරී පිළිබඳ හුරුවක් ලබා දීමේ අපේක්ෂාවෙන් හැකිතාක් එම නිලධාරීන් වෙනත් දිස්ත්‍රික්කවලට යැවීමත් සිදු කරන ලදී.

223. වෙනත් දිස්ත්‍රික්කවලින් වැඩි නිලධාරීන් සංඛ්‍යාවක් යාපනය, කිළිනොච්චි, මන්නාරම හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල සේවයේ යොදවා තිබීම අනුව මෙය පැහැදිලි වේ. එසේ පිටතට යැවූ නිලධාරීන්ගෙන් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් 42 ක්, සහකාර තේරීම්භාර නිලධාරීන් 269ක්, ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතීන් 126 ක්, කණිෂ්ඨ ජන්ද ස්ථානාධිපතීන් 373 ක්, ලිපිකරු නිලධාරීන් 173 ක් සහ කාර්යාල කාර්ය සහයකයන් 18 ක් වශයෙන් නිලධාරීන් 1,001 කි. කොළඹ සංචිතයෙන් ලබා දුන් නිලධාරී සංඛ්‍යාව 6,562 කි. එයින් වැඩි සංඛ්‍යාවක් එනම් 3,005 ක් සහකාර තේරීම්භාර නිලධාරීන් වූ අතර 890 ක් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්ය. කොළඹ සංචිතයෙන් වැඩිම නිලධාරී සංඛ්‍යාව ලබා ගෙන ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කය සඳහාය. ගම්පහ දිස්ත්‍රික්කයට කොළඹ සංචිතයෙන් නිලධාරීන් 1,408 ක් ලබා ගෙන ඇත.
(සටහන 04)

ප්‍රවාහන අවශ්‍යතා

224. ජන්ද විමසීම් සංවිධානයෙහිලා කාර්ය මණ්ඩලයට අමතරව ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග ද අතිශයින් වැදගත් වේ. කාර්ය මණ්ඩල සංගණනය සමඟම කොළඹ නාගරිකයේ වාහන තොරතුරු ප්‍රධාන කාර්යාලය මඟින්ද කොළඹ දිස්ත්‍රික්කයේ සෙසු ප්‍රදේශ සහ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ වාහන තොරතුරු අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් ද රැස්කරනු ලැබේ. එහෙත් මෙම පළාත් පාලන ආයතන ජන්ද විමසීම්වලදී

කාර්යය මණ්ඩල සංගණනය මෙන්ම වාහන සංගණන තොරතුරු යථාවත් කර ගැනීමකට පමණක් සීමා විය. මුලින්ද සඳහන් කළ පරිදි 2010 වර්ෂය තුළ ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය යන ජාතික මැතිවරණ දෙක පැවැත්වූ බැවින් එහිදී එක් රැස් කරන ලද සංගණන දත්ත මේ සඳහා ද උපයෝගී කර ගන්නා ලදී.

225. මැතිවරණ සංවිධානයේදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, ඡන්ද පෙට්ටි, ඡන්ද පත්‍රිකා ඊට අදාළ ආරක්ෂිත බඩු බාහිරාදිය සහ ආරක්ෂක නිලධාරීන් දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරී කාර්යාලයේ සිට දිස්ත්‍රික්කයේ සියලුම ඡන්ද මධ්‍යස්ථාන කරා ප්‍රවාහනය කිරීමත් ඊට අමතරව සෙසු මැතිවරණ කාර්ය මණ්ඩල සඳහා නියමිත ඡන්ද පොළවල් දක්වා ප්‍රවාහන පහසුකම් සැලසීමත් ඡන්ද දායකයින්ට පහසුවෙන් තම ඡන්ද පොළවල් කරා යාමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීමත් මූලික වේ. ඊට අමතරව මැතිවරණ සංවිධානයේ මූලික කටයුතු හා ඡන්ද විමසීම් ගණන් කිරීම ඇතුළු සමස්ථ කාර්ය භාරය සංවිධානයේ යෙදෙන නිලධාරීන් සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීමත් කළ යුතුවේ.

226. ඡන්ද විමසීමකදී අවශ්‍ය ආරක්ෂක ජාලය ක්‍රියාත්මක කිරීමේලා පොලීසියටද තම දෙපාර්තමේන්තුව සතු වාහන ප්‍රමාණවත් නොවන බැවින් දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරීන් විසින් පොලීසියේ ඉල්ලීම පරිදි අවශ්‍ය වාහන සපයා දීමට පියවර ගනු ලැබේ. එමෙන්ම තැපැල් ඡන්ද හා නිල ඡන්ද දැන්වීම්පත් සම්බන්ධව විශාල කාර්ය භාරයක් තැපැල් දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බැවින් තැපැල් දෙපාර්තමේන්තුව යම් ඉල්ලීමක් කළ හොත් එම අවශ්‍යතාවද දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරීන් විසින් ඉටු කරනු ලැබේ.

227. මෙම ඡන්ද විමසීම අවස්ථා තුනකදී සිදු කළ බැවින් නිලධාරී අවශ්‍යතාව මෙන්ම වාහන අවශ්‍යතාවද සපුරා ගැනීම වඩාත් පහසු කාර්යයක් විය. වාහන අවශ්‍යතාව සපුරා ගැනීමේදී දිස්ත්‍රික්කය තුළ රජයේ වාහන, මධ්‍යම ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ, පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගමයට අයත් පෞද්ගලික බස් රථ හා පෞද්ගලික වෑන් රථ මෙන්ම ඡන්ද විමසීම් රාජකාරී සඳහා තෝරා ගනු ලැබූ නිලධාරීන්ගේ පෞද්ගලික වාහන ද යොදා ගැනීමට පියවර ගන්නා ලදී. මෙසේ යොදා ගනු ලැබූ මුළු වාහන සංඛ්‍යාව 10,262 කි. එයින් 1,141 ක් කොළඹ සංචිතයෙන් වූ අතර වෙනත් දිස්ත්‍රික්කවලින් 271 ක් සහ දිස්ත්‍රික්කය තුළින් නිලධාරීන්ගේ පෞද්ගලික වාහනද සමඟ වාහන 8,850 ක් යොදවා ගන්නා ලදී.
(සටහන 13)

X වැනි කොටස

ජන්දහිමියන් වෙත විශේෂ සහන සැලසීම

කායික දුබලතාවයෙන් යුතු ජන්දහිමියන් සඳහා පෞද්ගලික ප්‍රවාහන පහසුකම් යොදා ගැනීමට අවසර දීම

228. පළාත් පාලන ආයතන ජන්දවිමසීම් ආඥාපනතේ 81 ඇ වගන්තිය අනුව ජන්ද පොළට යාම සහ ඊම සඳහා ජන්දහිමියන් විසින් පෞද්ගලික ප්‍රවාහන පහසුකම් යොදා ගැනීම නීතියට පටහැනිය. එහෙත් ශාරීරික වශයෙන් ආබාධිත හෝ තාවකාලිකව රෝගාතුරව සිටින ජන්ද හිමියකුට ජන්ද විමසීම් දිනට දින 7කට පෙර ලැබෙන පරිදි තමා විසින්ම හෝ එසේ නොමැතිනම් තමා වෙනුවෙන් අපේක්ෂකයෙකු නොවන වෙනත් අයෙකු විසින් අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරි වෙත, ඒ සඳහා අවසර ලබා ගැනීම පිණිස ලිඛිත ඉල්ලීමක් කළ හැකිය. අදාළ ඉල්ලුම් පත්‍රය සමඟ ආබාධිත බව හෝ රෝගී බව සනාථ කෙරෙන වෛද්‍ය වාර්තාවක්ද ඉදිරිපත් කළ යුතුය.

229. තේරීම්භාර නිලධාරි විසින් තමා වෙත ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර පිටපත් තුනකින් යුතුව නියමිත ආකෘතියේ බලපත්‍රය සකස්කර මුල් පිටපත ජන්දහිමියා වෙත යවනු ලබන අතර දෙවැනි පිටපත ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයාගේ ලිපිගොනුවට ඇතුළත් කරනු ලැබේ. තුන්වැනි පිටපත අදාළ බලපත්‍ර පොතෙහිම රඳවාගනු ලැබේ.

230. මෙම ජන්දවිමසීම් අදියර තුනේදීම ආබාධිත ජන්දහිමියන් වශයෙන් වාහන බලපත්‍ර අයදුම් කර තිබුණේ කළුතර, ගාල්ල, මාතර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවලින් ජන්දහිමියන් සුළු සංඛ්‍යාවක් පමණි. (පරිශිෂ්ඨ 43)

අශක්නුතාවට පත් ජන්දහිමියන් වෙනුවෙන් ජන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවසර දීම

231. 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 54(2) වගන්තිය අනුව ඉදිරි ජන්ද විමසීම්වලදී පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයකට හෝ යම් ශාරීරික අශක්නුතාවකට පත් ජන්දහිමියෙකුට ජන්ද පොළේදී ජන්ද පත්‍රිකාව සලකුණු කර ගැනීම සඳහා සහායකයකු කැටුව යා හැකිවන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ඇත.

232. කැටුව යන සහායකයා කිසියම් අශක්නුතාවකට පත් නොවූ වයස අවුරුදු 18 සම්පූර්ණ වූ අයෙකු විය යුතු අතර එම ජන්ද විමසීම සඳහා තරග කරනු ලබන අපේක්ෂකයකු නොවිය යුතුය. එමෙන්ම එම ජන්ද විමසීමේදී බලයලත් නියෝජිතයෙකු හෝ ජන්ද පොළ නියෝජිතයෙකු වශයෙන් කටයුතු නොකරන්නෙකු විය යුතුය.

233. ඉහත සඳහන් පරිදි සහායකයකු කැටුව යාම සඳහා අදාළ පනතේ දසවැනි උපලේඛනය මගින් හඳුන්වා දී ඇති යෝග්‍යතා සහතිකයක් අදාළ ජන්දපොළෙහි නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය.

234. අදාළ ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර ග්‍රාම නිලධාරි ලවා සහතික කරවා ගැනීමෙන් අනතුරුව එම සහතිකය රජයේ වෛද්‍ය නිලධාරිවරයකු වෙත ඉදිරිපත් කර සහතික කරවා ගත යුතුය.

235. ජන්ද පොළේදී ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපති විසින් ජන්දදායකයා රැගෙන එන යෝග්‍යතා සහතිකයෙහි සහායකයාගේ ප්‍රකාශය සටහන් කරවා ගනු ලබන අතර ජන්ද පොළ කාර්යය මණ්ඩලයේ සාමාජිකයෙකු ද සමඟ ජන්දහිමියා සහ සහායකයා ජන්ද කුටිය වෙත කැඳවාගෙන ගොස් සහායකයා ලවා ජන්ද පත්‍රිකාව සලකුණු කරවා ජන්ද පෙට්ටියට බහාලීමට සලස්වනු ලැබේ.

236. ප්‍රථමවරට ඉහත කී ප්‍රතිපාදන යටතේ ජන්දය ප්‍රකාශ කිරීම 2011 පළාත් පාලන ආයතන ජන්ද විමසීමෙහි දෙවැනි අදියරේදී එනම් 2011 ජූලි මස 23 වැනි දින පැවති පළාත් පාලන ආයතන ජන්ද විමසීමේදී ක්‍රියාත්මක කෙරිණ. ඒ අනුව 2011 ඔක්තොම්බර් මස 08 වැනිදින පැවති ජන්ද විමසීමේ තුන්වැනි අදියරේදී ද මෙය ක්‍රියාත්මක විය.

237. එහෙත් සහායකයින් කැටුව පැමිණි අශක්නුතාවට පත් ජන්දහිමියන්ගේ සංඛ්‍යාව ඉතාම අල්පය. මේ පිළිබඳව දෙවැනි අදියර වෙනුවෙන් ජූලි මස 09 වැනි දින ද තුන්වන අදියර වෙනුවෙන් සැප්තැම්බර් මස 21 වැනි දින ද මාධ්‍ය නිවේදන හා පුවත්පත් දැන්වීම් මගින් පුළුල් වශයෙන් ජන්දහිමියන් දැනුවත් කරන ලදී.

238. පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥාපනතේ 54 වැනි වගන්තියේ දෙවැනි උප වගන්තිය ඉවත් කර තිබේ. එබැවින් මෙතෙක් ක්‍රියාත්මක වූ පරිදි පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥාපනතේ 54(2) වැනි වගන්තිය අනුව අන්ධභාවයට හෝ වෙනත් ශාරීරික හේතුවක් නිසා 45 වැනි වගන්තිය යටතේ වූ මග පෙන්වීම්වලට අනුකූලව ජන්දය දීමට අපොහොසත් ජන්ද දායකයකු ඉල්ලා සිටිවිට ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා විසින් ජන්දපොළෙහි තම කාර්යමණ්ඩලයේ වෙනත් සාමාජිකයකු ඉදිරිපිට ජන්දදායකයාගේ ජන්ද පත්‍රිකාව ඔහු විසින් දන්වනු ලබන ආකාරයෙන් ලකුණු කර ජන්ද පත්‍රිකාව ජන්ද පෙට්ටියට බහාලීමට සැලැස්විය යුතුය යන්න නීතියෙන් ඉවත්ව ඇති

බැවින් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට එම කාර්යය ඉටුකළ නොහැකිය. එබඳු අවස්ථාවක ගත යුතු පියවර පිළිබඳව පැහැදිලි නීති උපදෙස් නොමැතිවීම ගැටළුවකි. මෙම ගැටළුවට පිළියමක් වශයෙන් සහායකයකු කැටුව නොවන එහෙත් සහාය අවශ්‍ය වන ඡන්දහිමියන්ට සුපුරුදු පරිදි සහාය වන ලෙස ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට උපදෙස් දෙන ලදී. මෙසේ ක්‍රියාකිරීම සඳහා පක්ෂ ලේකම්වරුන්ගේ/ නිත්‍ය නියෝජිතයන්ගේ කමිටු රැස්වීමකදී එකඟතාව ලබා ගන්නා ලදී.

239. එමෙන්ම කැටුව එන සහායකයා වයස 18 සම්පූර්ණවූවකු විය යුතුය යන්න පිළිබඳව දක්වා ඇතත් වයස 18 සම්පූර්ණ විය යුත්තේ කිනම් දිනකට ද යන්න නිශ්චිතව සඳහන් නොවේ. මේ සඳහා අවශ්‍ය විධිවිධාන සැකසිය යුතුය. වයස පිළිබඳ තොරතුරු අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වෙතින් සහතික කරවා ගැනීමට නියම කළ යුතුය.
(පරිශිෂ්ඨ 44,45)

සේවා නියුක්තිකයින්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබා දීම

240 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 84 අ වගන්තියෙන් සලසා ඇති විධිවිධාන අනුව සේවා යෝජකයා විසින් තමා යටතේ සේවය කරන කිසියම් තැනැත්තකු ලියවිල්ලකින් ඉල්ලීමක් කර ඇත්නම් ඒ ඡන්ද විමසීමේදී ඒ තැනැත්තාට ඡන්ද පොළ වෙත ගොස් ඡන්දය ප්‍රකාශකර පැමිණීමට ප්‍රමාණවත්යයි සලකුණු ලබන පැය දෙකකට නොඅඩු අඛණ්ඩ කාලසීමාවක් වැටුප් අහිමි නොවන පරිදි නිවාඩු දිය යුතුය.

241 මෙම විධිවිධාන කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී රු.500.00ක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

242. ඡන්ද විමසීම් අදියර තුනේදීම 2011.03.03, 2011.07.11 සහ 2011.09.26 යන දිනයන්ගෙන් යුතුව මාධ්‍ය නිවේදන මගින් හා පුවත්පත් දැන්වීම් මගින් මේ පිළිබඳව පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී. එහෙත් බොහෝ විට ඡන්ද විමසීමට පෙර දින හා ඡන්ද විමසීම් දින අවශ්‍ය නිවාඩු ලබා නොදීම සම්බන්ධයෙන් සේවය පක්ෂයට එරෙහිව විවිධ ආයතනවල සේවකයින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැමිණිලි ඉදිරිපත් කිරීම දැකිය හැකි තත්ත්වයකි. බොහෝ විට මෙම පැමිණිලි ලැබුණු වහාම අදාළ ආයතන ප්‍රධානීන් වෙත ලිඛිත උපදෙස් ෆැක්ස් මගින් යවනු ලැබූ අතර දුරකථනය මගින්ද අදාළ නීතිමය තත්ත්වය පැහැදිලි කර දෙන ලදී.

243. ඇතැම් විට මෙම පැමිණිල්ල ඉදිරිපත් වන අවස්ථාව වන විට අවශ්‍ය පියවර ගැනීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම අත්දකින ලද තත්ත්වයකි. සේවක පිරිස් තමාගේ රැකියාවට කිසියම් තර්ජනයක් එල්ල විය හැකිය යන බිය නිසා පැමිණිලි කිරීමෙන් හෝ අධිකරණ ක්‍රියාමාර්ගවලට එළඹීමෙන් වැළකී සිටින අවස්ථා දැකිය හැකිය. මේ පිළිබඳව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශය වෙත පැමිණිලි කළද ඡන්ද විමසීම අවසන් වීමත් සමඟ අවශ්‍ය ඉදිරි පියවර ගැනීමක් සිදුනොවේ.

244. මෙම ගැටළුව විසඳීම සඳහා පිළියමක් වශයෙන් ඡන්ද විමසීම සෙනසුරාදා දිනයක පැවැත්වීම අනිවාර්යය කරමින් 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතට සිදු කරන ලද සංශෝධනය (2004 අංක 05 දරන පනත) අගය කළ යුතුය. ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා සෙනසුරාදා දිනය යොදා ගැනීමෙන් තැපැල් ඡන්ද පහසුකම් නොමැති නිලධාරීන් සහ සේවකයින් සඳහා නිවාඩු ලබා දීමේදි ඇතිවන මිනිස් පැය පාඩුව එක්තරා දුරකට හෝ අවම කරගත හැකිය. මේ නිසා ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් සේව්‍ය සේවක දෙපක්ෂය අතර ඇතිවන ගැටළුකාරී තත්ත්වයන් බොහෝ දුරට මගහැරී ඇත. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා සෙනසුරාදා දිනය යොදාගැනීම අනිවාර්ය නොවෙතත් ඉහත කී අවශ්‍යතාවන් සැලකිල්ලට ගෙන මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ සෑම අදියරකදීම ඡන්ද විමසීමේ දිනය වශයෙන් සෙනසුරාදා දිනය යොදා ගන්නා ලදී.
(පරිශිෂ්ඨ 46,47)

XI වැනි කොටස

ඡන්ද විමසීම පැවැත්වීම

මූලික පසුබිම

245. 2011 පෙබරවාරි මස 01 දින පළ කරන ලද ඡන්ද විමසීම් දැන්වීම අනුව පළාත් පාලන ආයතන 301ක් සම්බන්ධයෙන් ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත වුවද ප්‍රතික්ෂේප වූ නාමයෝජනාවන් 68 ක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගවලට එළඹීම නිසා අදාළ පළාත් පාලන ආයතන 65 හි ඡන්ද විමසීම කල් තබමින් 38(3) වගන්තිය යටතේ දැන්වීම පළ කරන ලදී. ඒ සමඟම මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරුප්පු හා මුහුදුබඩපත්තු යන ප්‍රාදේශීය සභා දෙකෙහිද බිම් බෝම්බ ඉවත් කිරීම අවසන් නොවීම හා ඒ අනුව නැවත පදිංචි කිරීම් අවසන් නොවීම යන හේතු දෙක මත එම පළාත් පාලන ආයතන දෙකට අදාළව 38(3) වගන්තිය යටතේ ඡන්ද විමසීම කල් තැබීමේ දැන්වීම අංක 1716/1 හා 2011.07.25 දිනැතිව ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

246. මෙයට පෙරද සඳහන් කර ඇති පරිදි පළාත් පාලන ආයතන 234 ක් සඳහා ඡන්ද විමසීම 2011.03.17 දින ද අධිකරණ ක්‍රියාමාර්ග අවසන් නොවීම නිසා කල් තබන ලද පළාත් පාලන ආයතන 65 කට අදාළ ඡන්ද විමසීම 2011.07.23 දින ද 2011 අංක 2 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන හා පරිපාලන) නියෝගය යටතේ කල් තබන ලද පළාත් පාලන ආයතන 22 හා නැවත සංස්ථාපනය කරන ලද කොළඹ මහ නගර සභාව ඇතුළු පළාත් පාලන ආයතන 23 සඳහා ඡන්ද විමසීම 2011.10.08 දින පැවැත්වීමට කටයුතු කරන ලදී.
(සටහන 14)

ඡන්ද මධ්‍යස්ථාන පිළියෙල කිරීම

247. ඡන්දදහිමි නාමලේඛනය වාර්ෂිකව පිළියෙල කරනු ලබන අතර ඒ සමඟම එක් එක් ඡන්ද කොට්ඨාසයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයද තීරණය කරනු ලැබේ. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමකදී එම පාර්ලිමේන්තු ඡන්දදහිමි නාමලේඛනය එක් එක් පළාත් පාලන ආයතනය අනුව බෙදා වෙන් කිරීමට සිදුවන අතර එහිදී ඇතැම් ඡන්ද කොට්ඨාසයක් පළාත් පාලන ආයතන දෙකක හෝ තුනක කොටස්වලින් සමන්විතව තිබිය හැකිය. එබඳු අවස්ථාවකදී එසේ වෙන් වන කොටස් වෙන වෙනම ඡන්ද කොට්ඨාස වශයෙන් සලකා කටයුතු කිරීමට සිදුවනු ඇත. එසේ වෙන් කරනු ලබන කොට්ඨාස සඳහා වෙන වෙනම ඡන්ද මධ්‍යස්ථානද හඳුනාගත යුතු වේ.

248. කෙසේ වෙතත් ඡන්ද විමසීමකට මූලික සූදානම් වීමකදී ඡන්ද මධ්‍යස්ථාන පිළිබඳව නැවත සොයා බැලීමක් කළ යුතු වනු ඇත. මේ සඳහා ග්‍රාම නිලධාරීන් මගින් එක් එක් ඡන්ද මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ යෝග්‍යතාව පිළිබඳ සවිස්තර වාර්තාවක් ගෙන්වා ගනු ලැබේ. ලැබෙන වාර්තා අනුව පරීක්ෂා කර තීරණයක් ගැනීම සුදුසුයයි අදහස් කරන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෞද්ගලිකවම පරීක්ෂා කර බලා තීරණ ගනු ලැබේ.

249. ඡන්ද පොළ ගොඩනැගිල්ල ඡන්ද මධ්‍යස්ථානයක් වශයෙන් අවශ්‍ය මේස පුටු යොදා සකස් කිරීම ඡන්ද පොළ කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍ය සුබ සාධන සේවා සැලසීම අදාළ කොට්ඨාසය භාර ග්‍රාම නිලධාරී වෙත පවරන අතර එම කටයුතු අධීක්ෂණය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පවරනු ලැබේ.

250. නියමිත ඡන්ද සංඛ්‍යාව අනුව ඡන්ද පොළට පැමිණෙන කාර්ය මණ්ඩලය, තරග කරන පක්ෂ හා කණ්ඩායම් සංඛ්‍යාව අනුව ඡන්ද පොළේ රැඳී සිටීමට නියමිත ඡන්ද පොළ නියෝජිත සංඛ්‍යාව හා අනුමැතිය ලැබූ නිරීක්ෂණ කණ්ඩායම් සංඛ්‍යාව අනුව පහසුකම් සැලසිය යුතු ඡන්ද පොළ නිරීක්ෂකයින් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඡන්ද පොළ සකස් විය යුතු ආකාරය හා ඉටු කළ යුතු රාජකාරී පිළිබඳව සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් ග්‍රාම නිලධාරීන් දැනුවත් කරනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත බඩු බාහිර භාරදීම

251. ඡන්ද විමසීමට පෙරදින පෙරවරුවේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට පත්වීම් ලිපි බෙදා දීම ගණන් කිරීමේ ශාලා පරිශ්‍රයේදී සිදු කරනු ලබන අතර ඡන්ද පොළට අවශ්‍ය බඩු බාහිරාදිය නිකුත් කිරීම අදාළ ඡන්ද කොට්ඨාසයේ ඡන්ද පත්‍රිකා ගණන් කිරීම සිදු කරනු ලබන ගණන් කිරීමේ ශාලාවෙහිදී සිදු කරනු ලැබේ. පසු දින ඡන්ද විමසීම අවසන් කර කඩිනමින් මෙම ස්ථානය වෙත ඡන්ද පෙට්ටි හා අදාළ ලිපි ලේඛන භාර දීම පහසු වනු පිණිස මෙම පියවර ගෙන ඇත.

252. පත්වීම් ලිපි වශයෙන් කල් තබා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට යවන්නේ කැඳවීම් ලිපියක් පමණි. එම ලිපිය සමඟ නිලධාරියාගේ විධිමත් පත්වීමට අදාළව සංකේත අංකයක් යවනු ලැබේ. මෙයින් බලාපොරොත්තු වන්නේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් දේශපාලන බලධාරීන්ගෙන් ආරක්ෂා කර ගැනීම වේ.

253. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත නිවේදන පත්‍රයක් අනුව නියමිත බඩු බාහිරාදිය භාර දීම ඒ සඳහා පත් කළ සහකාර තේරීම්භාර නිලධාරිවරයකු ඇතුළු කාර්ය මණ්ඩලයෙන් සිදු කෙරේ. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා බඩු බාහිරාදිය භාර ගැනීමෙන් පසු ඡන්ද

පොළ වෙත යා යුතු බැවින් නිවේදන පත්‍රය අනුව එකින් එක සියලුම අයිතමයන් නිවැරදිව තමාට ලැබී ඇද්ද යන්න තහවුරු කර ගත යුතුය.

ඡන්ද පොළ කාර්ය මණ්ඩලය

254. ඡන්ද පොළ කාර්ය මණ්ඩලය වශයෙන් තෝරා ගන්නා නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා වී වී දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සංවිධානය කරනු ලබන උපදෙස් පන්ති මඟින් ඡන්ද විමසීමට අදාළ සියලු කටයුතු පිළිබඳව සම්පූර්ණ පුහුණුවක් ලබා දෙනු ලැබේ. බොහෝ විට මෙම නිලධාරීන් වසර ගණනාවක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වශයෙන් සේවය කර තිබුණද මෙම පුහුණු පන්තිවලට පැමිණීම අනිවාර්යය අවශ්‍යතාවයකි. සෙසු නිලධාරීන් පුහුණු කර ගැනීම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත පවරනු ලැබේ. එම නිලධාරීන්ට අවශ්‍ය ලිඛිත උපදෙස් පත්වීම් ලිපිය සමඟ යවනු ලබන අතර ඡන්ද විමසීමට පෙර දින ඡන්ද පොළේදී පවත්වනු ලබන පෙරහුරුවේදී ඡන්ද පොළේදී ඉටු කළ යුතු රාජකාරී පිළිබඳව තම ඡන්ද පොළ කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලෙස ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට උපදෙස් දෙනු ලැබේ.
(උපලේඛන 01)

255. මෙම පෙරහුරුවේදී ඡන්ද පත්‍රිකා අඩංගු මුද්‍රා තබන ලද පැකට්ටුව, තීන්ත ආලේපන පැකට්ටුව සහ රහස්‍ය මුද්‍රාව සහිත පැකට්ටුව විවෘත නොකළ යුතු අතර, ඡන්ද පෙට්ටි, ඡන්දහිමි නාමලේඛන, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති ප'නලය ආදී අනෙකුත් සියලුම ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩ දෙන ලෙස වැඩි දුරටත් උපදෙස් දෙනු ලැබේ.

කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන්

256. වක් වක් පළාත් පාලන ආයතනයට අයත් ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව කලාප කිහිපයකට වෙන් කර වී වක් වක් කලාපයක් යටතට ගැනෙන ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද විමසීම් කටයුතු අධීක්ෂණය සඳහා කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන් පත් කරනු ලැබේ. කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරියකු වශයෙන් පත් කරනු ලබන්නේ ඡන්ද පොළ රාජකාරී පිළිබඳ මනා අවබෝධයක් ඇති නිලධාරීන් පිරිසකි. කෙසේ වුවත් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ලබා දෙන උපදෙස් සියල්ලක් කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන් වෙතද ලබා දෙනු ලැබේ.

257. සාමාන්‍යයෙන් වක කලාපයකට ඡන්ද මධ්‍යස්ථාන 5 - 8 දක්වා සංඛ්‍යාවක් ඇතුළත් කරනු ලැබේ. ඡන්ද මධ්‍යස්ථාන අතර දුර ප්‍රමාණය, භූ විෂමතාව, ජනාකීර්ණ බව ආදිය සැලකිල්ලට ගෙන වක කලාපයකට ඇතුළත් කළ යුතු ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. මේ අනුව පළමුවැනි අදියර සඳහා කලාප 1,407 ක් ද දෙවැනි අදියර සඳහා කලාප 445 ක් ද තෙවැනි අදියර සඳහා කලාප 233 ක්ද වශයෙන් කලාප 2,085 කට බෙදා වෙන් කෙරිණ. වී අනුව මෙම ඡන්ද විමසීම සඳහා කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් 2,085 ක් රාජකාරියෙහි නිරත විය.

258. කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන් තම කලාපයට අයත් ඡන්ද මධ්‍යස්ථාන අතුරින් වකක පෙරහුරුව පැවත්වෙන අවස්ථාවේදී, ඡන්ද විමසීම ආරම්භ කරන අවස්ථාවේදී හා අවසන් කරන අවස්ථාවේදී වම කටයුතු නිරීක්ෂණය කර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට යම් සහායක් අවශ්‍ය නම් ලබා දෙන ලෙස දැනුම් දෙනු ලැබේ. කලාපයේ චාරිකාවේ යෙදෙන අවස්ථාවේ තමාගේ සහය වඩාත් අවශ්‍ය වන්නේ කවර මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාටද යන්න සහකාර තේරීම්භාර නිලධාරී විසින් තීරණය කළ යුතු වේ. කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් තම කලාපයට අයත් සියලුම මධ්‍යස්ථානවල ඡන්ද විමසීම් කටයුතු පිළිබඳ සොයා බැලිය යුතු අතර ඡන්ද විමසීම අවසානයේ වී පිළිබඳව වාර්තාවක් තේරීම්භාර නිලධාරී වෙත ලබා දිය යුතු වේ.

ඡන්ද පොළ නියෝජිතයින්

259. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 49(1) වගන්තිය අනුව තරග කරන වක් වක් පක්ෂයක් ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් වක් ඡන්ද පොළකට නියෝජිතයින් දෙදෙනකු බැගින් පත් කළ හැකිය. වම නියෝජිතයින්ගේ කාර්යය වන්නේ හොර ඡන්ද දැමීමට පැමිණෙන ව්‍යාජ ඡන්ද දායකයින් හඳුනා ගැනීම බැවින් ඡන්ද පොළ නියෝජිතයින් වශයෙන් තෝරා ගැනීමේ දී ඡන්ද දායකයින් දන්නා හඳුනන අදාළ ඡන්ද කොට්ඨාස බල ප්‍රදේශය තුළ පදිංචි පුද්ගලයින් අතුරින් තෝරා ගන්නේ නම් වඩාත් උචිතය.

260. ඡන්ද පොළ නියෝජිත පත් කිරීම පක්ෂයක් නම් පක්ෂයේ ලේකම්, බලයලත් නියෝජිත හෝ ස්වාධීන කණ්ඩායමක් නම් කණ්ඩායම් නායක විසින් ද කළ යුතුය. ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වලංගු අනන්‍යතා ලියවිල්ලක් මඟින් ඡන්දදායකයා තමාගේ අනන්‍යතාව සනාථ කිරීමේ අවශ්‍යතාව අනිවාර්ය කිරීමත් සමඟ හොර ඡන්ද දැමීම ඡන්ද පොළෙන් ඉවත් විය. වී සමඟම ඡන්ද පොළ නියෝජිතයින්ගේ කාර්ය භාරය සරල විය.

261. කෙසේ වෙතත් නියෝජිත සහභාගිත්වය පිළිබඳ වක් වක් ඡන්ද පොළේ තොරතුරු පරීක්ෂාවේදී හෙළිවන තත්ත්වයක් නම් ඇතැම් ඡන්ද මධ්‍යස්ථාන සඳහා ඡන්ද පොළ නියෝජිතයින් පත් කිරීමට ඇතැම් පක්ෂ හා

කණ්ඩායම් උත්සාහ කර නොමැති බවයි. මෙසේ වීමට තවත් හේතුවක් වශයෙන් ව්‍යාජ ලෙස පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් තරගයට ඉදිරිපත් කිරීම සැළකිය හැකිය. එම පක්ෂ හා කණ්ඩායම් ප්‍රධාන පක්ෂවල අවශ්‍යතාව මත ඉදිරිපත්ව ඇති බැවින් එම පක්ෂවලට අවශ්‍ය යැයි තීරණය කරණු ලබන මධ්‍යස්ථාන සඳහා පමණක් නියෝජිතයින් සහභාගි කරවා ඇති බවක්ද දැකිය හැකිය.

ඡන්ද පොළ නිරීක්ෂකයින්

262. මීට ඉහත පැවති මැතිවරණ ගණනාවකදී මෙන් මෙම ඡන්ද විමසීමේදීද නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL) සහ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) යන නිරීක්ෂණ ආයතන දෙකට එක් ආයතනයකින් එක් නියෝජිතයකු බැගින් ඡන්ද පොළ තුළ රැඳී සිට නිරීක්ෂණය කිරීමටත් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (CaFFE), සෙප්කෝ ජනතා සංවිධානය, මානව සංවර්ධන සංවිධානය, මැතිවරණ නිරීක්ෂණ ජාලය (NEM), නිදහස් හා සාධාරණ මැතිවරණ ව්‍යාපාරය (MFFE) සහ ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය (NPOC) යන නිරීක්ෂණ ආයතනවලට ඡන්ද පොළෙන් බැහැරව සිට නිරීක්ෂණය කිරීමටත් අවසර දෙන ලදී.
(පරිශිෂ්ඨ 48)

263. එම නිරීක්ෂණ ආයතනවලින් බලාපොරොත්තු වූයේ ඡන්ද විමසීම අවසානයේ ඡන්ද පොළේ කටයුතු කළ ආකාරය පිළිබඳව වාර්තාවක් ලබා ගැනීමත් කිසියම් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් හෝ කඩාකප්පල්කාරී ක්‍රියාවක් හෝ වංචනික ක්‍රියාවක් සිදුවේ නම් වහාම ඒ පිළිබඳ තොරතුරු තේරීම්භාර නිලධාරී වෙත හා මැතිවරණ මහලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති පැමිණිලි විමර්ශන මධ්‍යස්ථානය වෙත ලබා ගැනීමත් සඳහාය. එමගින් වහා අවශ්‍ය පියවර ගෙන එම අක්‍රමිකතා වළක්වා ලිය හැකිවනු ඇත. දේශීය නියෝජිතයින් ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය සඳහා යොදා ගැනීමට අදාළ මූලික තොරතුරු සමහරක් මෙම වාර්තාවෙහි VI වන කොටසෙහි ඇතුළත් කර ඇත.
(උපලේඛන 2)

අනුගමනය කරන ලද විශේෂිත ක්‍රියාමාර්ග

264. 2011.01.06 සහ 2011.08.04 යන දිනයන්හි නාමයෝජනා කැඳවූ මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලදී දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයක් වූයේ නාමයෝජනා ඉදිරිපත් කළ පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාවේ විශාලත්වයයි. යම් යම් පක්ෂ තම පක්ෂයේ අවශ්‍යතාවන් මුදුන්පත් කර ගැනීම සඳහා වෙනත් පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ව්‍යාජ ලෙස තරගයට ඉදිරිපත් කර ඇති බවක් දැකිය හැකි විය. ඊට අමතරව ඇතැම් අපේක්ෂකයින් වංචනිකව මනාප රැස්කර ගැනීමේ අපේක්ෂාවෙන් තමාගේ අංකය සහිතව ප්‍රදේශයේ ජනප්‍රිය පුද්ගලයින්ගේ ඡායාරූප යෙදූ අත් පත්‍රිකා බෙදා හැරීම් ද දක්නට ලැබිණ. එබඳු අවස්ථා සම්බන්ධයෙන් වහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

265. සමානුපාතික නියෝජන ක්‍රමය නිසා පක්ෂ අතර මෙන්ම එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර ද මනාප රැස්කිරීම සම්බන්ධයෙන් දැඩි තරගයක් ඡන්ද විමසීම්වලදී දැකිය හැකි විය. එනිසාම නාමයෝජනා දිනෙන් පසු නීති විරෝධී පෝස්ටර්, බැනර් සහ කටවුටි ප්‍රදර්ශනය කිරීම රාජ්‍ය දේපළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනීම ආදී අක්‍රමිකතා සම්බන්ධයෙන් විවිධ පාර්ශවවලින් ලැබුණු පැමිණිලි සංඛ්‍යාව අති විශාලය. ඒ තත්ත්වයන් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් වහා පොලිස්පතිවරයා සහ අනෙකුත් අදාළ අංශ දැනුවත් කර පෝස්ටර්, බැනර් සහ කටවුටි ඉවත් කිරීම සඳහා සහ රාජ්‍ය දේපළ පරිහරණය වැළැක්වීම සඳහා හැකි සෑම පියවරක්ම ගන්නා ලදී. නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු අධික වීමට මෙම ඡන්ද විමසීම අවස්ථා තුනකදී පවත්වනු ලැබීම එක් හේතුවක් විය. ඒ හේතුවෙන් දේශපාලන පක්ෂවල විශේෂයෙන් බලයේ සිටින පක්ෂයේ දැඩි බලපෑමක් අදාළ ඡන්ද විමසීම් ප්‍රදේශ කෙරෙහි යොමු විය. නීති විරෝධී ප්‍රචාරක කටයුතු වර්ධනය වීමත් දෙවනුව ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් ඇතිවීමත් දක්නට ලැබිණ. එමෙන්ම පක්ෂ කාර්යාල පිහිටුවීම සම්බන්ධයෙන්ද නීතිමය සීමාවන් හා එකඟතාවයන් ඉක්මවා කටයුතු කරනු දක්නට ලැබිණ.

266. මැතිවරණ කොමසාරිස්වරයා සාමකාමී සහ සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා තරග කරනු ලබන පක්ෂවල ලේකම්වරුන් කැඳවා පොලිස්පතිවරයාගේද සහභාගීත්වයෙන් යුතුව කරනු ලැබූ උපදේශක කමිටු රැස්වීම්වලදී ප්‍රධාන මාතෘකාව බවට පත්වූයේද මෙම නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු හා ප්‍රචණ්ඩ ක්‍රියාවන්ය.

267. එහිදී නීතිය බලාත්මක කිරීමේ කාර්යය පොලිස්පතිවරයා ඇතුළු සමස්ත පොලිස් කාර්ය මණ්ඩලය විසින් ඉටු කළ යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය උපදෙස් දෙන ලදී. ඊට අමතරව උපදේශක කමිටු රැස්වීම්වලදී පක්ෂ ලේකම්වරුන් විසින් ඉදිරිපත් කළ ඇතැම් ඉල්ලීම් සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී. එයින් සමහරක් මීට පෙර පැවති ඡන්ද විමසීම්වලදීද ක්‍රියාත්මක වූ බවද සඳහන් කළ යුතුය. මැතිවරණයකදී මැතිවරණ කොමසාරිස්වරයා ඇතුළු කාර්ය මණ්ඩලයට ව්‍යවස්ථාපිත කාර්යය ඉටුකිරීමට වඩා වැඩි වෙහෙසක් දැරීමට සිදුව ඇත්තේ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා දේශපාලන බලධාරීන් හා අනුගාමිකයන් විසින් සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සහ ඡන්ද විමසීම හා ගණන් කිරීම සම්බන්ධයෙන් ඇතිකර ගනු ලබන

සැක සංකා දුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා බව මෙහිලා සඳහන් කළ යුතුව ඇත. මේ සඳහා අනුගමනය කළ විශේෂිත ක්‍රියාමාර්ග අතර,

I. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් ආවරණය වන පරිදි පිහිටුවා ඇති නීති විරෝධී බැනර්, කටවුට් පිළිබඳව කඩිනම් වාර්තාවක් දිස්ත්‍රික් තේරීම්හාර නිලධාරීන් වෙතින් ලබාගෙන පොලිස්පතිවරයා වෙත යොමු කිරීම.

II. රාජ්‍ය දේපළ අයථා පරිහරණය වැලැක්වීමේලා සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත අවශ්‍ය ලිඛිත උපදෙස් ලබා දීම සහ අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන් කැඳවා ඒ පිළිබඳ සවිස්තරාත්මකව සාකච්ඡා කිරීම.

III. රාජ්‍ය සහ පෞද්ගලික යන සියලුම මාධ්‍ය ආයතන සඳහා මාධ්‍ය උපමාන නිකුත් කිරීම සහ විද්‍යුත් මාධ්‍ය ආයතන ප්‍රධානීන් කැඳවා උපමාන ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම.

IV. දේශපාලන හේතූන් මත සිදුකරන ලදැයි පැමිණිලි කළ පත්වීම් හා ස්ථාන මාරුවීම් සලකා බලා සේවා අවශ්‍යතා මත කරන ලද්දක් බව තහවුරු නොවන්නේ නම් එම පත්වීම් සහ මාරුවීම් ඡන්ද විමසීම අවසන්වන තෙක් කල් තැබීමට උපදෙස් දීම.

V. රජයේ වාහන සහ වෙනත් රාජ්‍ය දේපළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගෙන ඇති බව තහවුරු වූ අවස්ථාවල එම තත්ත්වයන් වළකාලීමට අවශ්‍ය කටයුතු කිරීම.

VI. ඡන්ද පොළ රාජකාරි සහ ගණන් කිරීමේ රාජකාරි සඳහා ඡන්ද විමසීම් බල ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන්ට අමතරව යාබද දිස්ත්‍රික්කවලින් සහ කොළඹ සංචිතයෙන් අධීක්ෂණ මට්ටමේ නිලධාරීන් යැවීමට කටයුතු කිරීම.

VII. ඡන්ද පොළේදී ඡන්ද විමසීම් අවසානයේ මුද්‍රා තබා සකස් කරනු ලබන ඡන්ද පෙට්ටිය තද ගණකම ඇති පොලිතින් බෑගයක (විනිවිද පෙනෙන) බහා පළුදු වීමකින් තොරව ගැලවිය නොහැකි ප්ලාස්ටික් අගුලක් යොදා ගණන් කිරීමේ මධ්‍යස්ථානය දක්වා ප්‍රවාහනය කිරීම.

VIII. ඡන්ද විමසීමෙන් පසුව සකස් කරනු ලබන ඡන්ද පත්‍රිකා ගිණුමෙහි පිටපත් ඡන්ද පොළ නියෝජිතයින් වෙත ලබා දීම.

IX. ඡන්ද පොළ නියෝජිතයින් විසින් ඡන්ද පෙට්ටිවල අලවන ස්ටිකර ආදර්ශ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු මඟින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් වෙත යැවීම අවශ්‍යයයි අදහස් කරන නියෝජිතයින් සඳහා ඡන්ද පෙට්ටිය තුළද ස්ටිකර්යක් ඇලවීමට අවසර දීම.

X. එක් එක් පක්ෂයක්, කණ්ඩායමක් වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථානයේ සිටින එක් නියෝජිතයකුට ඡන්ද පෙට්ටිය රැගෙන යන වාහනය පිටුපසින් තමන්ගේ වාහනයකින් ගණන් කිරීමේ ස්ථානය දක්වා යාමට අවශ්‍ය වාහන අවසර පත්‍රයක් එම ඡන්ද පොළේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා මඟින් ලබාදීමට කටයුතු කිරීම.

XI. ඡන්ද පෙට්ටි ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ලැබීමට පෙර එක් එක් පක්ෂය/ කණ්ඩායම වෙනුවෙන් එම මධ්‍යස්ථානයට නම් කර ඇති ගණන් කිරීමේ නියෝජිතයින් අතුරින් එක් අයකුට ප.ව. 3.30 සිට ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ රැඳී සිට ඡන්ද පෙට්ටි ලැබීම නිරීක්ෂණය කිරීමට අවසර දීම.

XII. ගණන් කිරීමේ මධ්‍යස්ථායේදී කාබනිකෘත කඩදාසියේ සකසනු ලබන පක්ෂ හා කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යා පිළිබඳ ප්‍රතිඵලය එම ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි පළමු, දෙවැනි හා තෙවැනි ස්ථාන හිමිකර ගත් පක්ෂ හෝ කණ්ඩායම්වල නියෝජිතයින්ට එක් පිටපතක් බැගින් නිකුත් කිරීම.

XIII. මනාප ගණන් කරනු ලබන අවස්ථාවේ දී අදාළ පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ සියලුම අපේක්ෂකයින්ට එක් එක් ගණන් කිරීමේ ශාලාවක කටයුතු නිරීක්ෂණය කළ හැකි වන පරිදි ගණන් කිරීමේ මධ්‍යස්ථානය වෙත ඇතුළුවීමට අවසර ලබා දීම සඳහා පියවර ගැනීම.

XIV. මනාප ප්‍රතිඵලයෙහි පිටපතක් අදාළ පක්ෂයේ ලේකම් හෝ බලයලත් නියෝජිත, ස්වාධීන කණ්ඩායම් නායක වෙත ලබා දීම.

XV. පළාත් පාලන ආයතන ඡන්ද විමිසීම් පනතට අනුව එක් ගණන් කිරීමේ ශාලාවට එක් එක් පක්ෂ/ කණ්ඩායම්වලින් පත් කළ හැක්කේ ගණන් කිරීමේ නියෝජිතයන් දෙදෙනෙක් වුවද, දේශපාලන පක්ෂ ලේකම්වරුන්/ නිත්‍ය නියෝජිතයන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඒ ඒ සභාවලට තරග කරන පක්ෂ/ කණ්ඩායම් සංඛ්‍යාව සලකා බලා එකී නියෝජිත සංඛ්‍යාව උපරිම 5ක් වනසේ වෙනස් කිරීම.

(ඡේදය 275 බලන්න)

XII වැනි කොටස

ඡන්ද හා මනාප ගණන් කිරීම

පසුබිම

268. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පිළිබඳව සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීමත් සමඟ 1979 සහ 1983 වර්ෂවල පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලදී තමා කැමති පක්ෂය වෙනුවෙන් ඡන්දය සලකුණු කිරීමට ඡන්ද හිමියාට අයිතියක් තිබූ අතර එක් එක් පක්ෂය හා කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව අනුව එක් එක් පක්ෂයට, කණ්ඩායමට සමානුපාතිකව හිමිවන සභිකධුර සංඛ්‍යාව සඳහා සභිකයින් තෝරා පත් කිරීම අදාළ නාමයෝජනා පත්‍රවල නම් සඳහන් අනුපිළිවෙලින් සිදු කෙරිණ.

269. නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් කිරීමේ අනුපිළිවෙල පක්ෂයේ බලධාරීන් විසින් තීරණය කරනු ලැබූ බැවින් මේ ක්‍රමය පිළිබඳව ඡන්දදායකයා දැක්වූ බලවත් අකමැත්ත මත සභිකයින් තෝරා පත් කර ගැනීම සඳහා ඡන්දදායකයාටද යම් අයිතියක් ලබා දෙන ලෙස තේරීම් කාරක සභාව වෙත යෝජනා ඉදිරිපත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1987 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් මනාප තුනක් තමා කැමති අපේක්ෂකයන් තිදෙනෙකුට ලකුණු කිරීමට අවකාශ සලසා දෙන ලදී.

270. සංඛ්‍යාත්මක සුළුතරයක් වන ජන කණ්ඩායම්වලට අයත් ඡන්ද හිමියන්ට තමන් කැමති අපේක්ෂකයන්ට හෝ සන්ධානගත පක්ෂවල සාමාජිකයන්ට/හිතවතුන්ට ස්වකීය පක්ෂයේ අපේක්ෂකයෙකු සමස්ත අපේක්ෂක ලැයිස්තුවෙන් තෝරාපත් කර ගැනීමට අවකාශ සලසමින් 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් ඡන්ද දායකයෙකුට ස්වකීය මනාප තුනම එක් අපේක්ෂකයකුට වුවද ලකුණු කිරීමට අවකාශ සලසා දෙන ලදී. ඒ අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා පළමුව තමා කැමති පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම තෝරා ගැනීම සඳහා එක ඡන්දයකුත් දෙවනුව මනාප ඡන්ද තුනක් එම පක්ෂය යටතේ තරග කළ එක් අපේක්ෂකයකුට, අපේක්ෂකයින් දෙදෙනකුට නැතහොත් අපේක්ෂකයින් තිදෙනකුට සලකුණු කිරීමටත් අවකාශ සලසන ලදී. මේ අනුව ඡන්ද පත්‍රිකාවෙහි පළමුව තරග කරනු ලබන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ඇතුළත් කරන ලද අතර දෙවනුව තරග කරන අපේක්ෂක සංඛ්‍යාව සඳහා එක් එක් අපේක්ෂකයාගේ අංකය සහිත කොටුවක් සහ ඒ ඉදිරියේ හිස් කොටු දෙකක් වශයෙන් අපේක්ෂක අංක පේළි දෙකක් වන සේ ඇතුළත් කරන ලදී.

271. ඒ අනුව ගණන් කිරීමේදී පළමුව කවර පක්ෂයකට හෝ කවර කණ්ඩායමකට දෙන ලද ඡන්දයක් ද වශයෙන් තෝරා ගෙන එක් එක් පක්ෂයට කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව ගණන් බැලීමත් ඉන් අනතුරුව වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් පක්ෂයෙන් ආරම්භ කර සභිකධුර හිමි කර ගත් සියලුම පක්ෂවල එක් එක් අපේක්ෂකයා ලබා ගෙන ඇති මනාප සංඛ්‍යාව ගණන් බැලීමත් සිදු කරන ලදී. ඒ අනුව ගණන් කිරීමේ ක්‍රියාවලිය වඩාත් සංකීර්ණ එකක් වූ අතර ඒ හේතුව මත ගණන් කිරීමේ මධ්‍යස්ථාන හා ගණන් කිරීමේ කාර්ය මණ්ඩල වෙන් කිරීම ඉතා සැළකිල්ලෙන් සිදු කළ යුතු විය.

ගණන් කිරීමේ මධ්‍යස්ථාන සකස් කිරීම

272. ඉහත සඳහන් ගණන් කිරීමේ ක්‍රියාවලිය අනුව ගණන් කිරීම අතිශය සංකීර්ණ හා වෙහෙසකර වූ කාර්යයක් බැවින් එක් එක් පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව අනුව ගණන් කිරීමේ මධ්‍යස්ථාන ගණනාවකට වෙන් කිරීම මූලික වශයෙන් සිදු කරන ලදී. ඒ අනුව එක් මධ්‍යස්ථානයකට ආසන්න වශයෙන් ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව 10,000 ක් විය යුතු යැයි යන පදනම මත එක් එක් පළාත් පාලන ආයතනය සඳහා අවශ්‍ය ගණන් කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව ගණන් බලන ලදී.

273. අනතුරුව දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන, ඡන්ද ප්‍රදේශ අක්ෂර අනුපිළිවෙල අනුගමනය කරමින් පළමුව මහ නගර සභා දෙවනුව නගර සභා සහ අවසන් වශයෙන් ප්‍රාදේශීය සභා ඇතුළත් වන පරිදි දිස්ත්‍රික්කයේ ඇති සියලුම මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වෙනුවෙන් ගණන් කිරීමේ මධ්‍යස්ථාන අංක කරනු ලැබේ. අනතුරුව එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා තැපැල් ඡන්ද ගණන් කිරීම සඳහා පිළිවෙලින් මධ්‍යස්ථාන අංක කරනු ලබයි.
(සටහන 15)

ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය

274. එක් එක් ගණන් කිරීමේ ශාලාවක් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරිවරයෙකුගේ වගකීම හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු අතර සහකාර තේරීම්භාර නිලධාරීන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති මට්ටමේ හා කණිෂ්ඨ හා ලිපිකරු මට්ටමේ නිලධාරීන් සංඛ්‍යාවකගේ සහාය ඇතිව ගණන් කිරීම සිදු කරනු ලැබේ. සාමාන්‍යයෙන් එක් ගණන් කිරීමේ ශාලාවකට කාර්ය මණ්ඩලය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීද සමඟ 40 - 45 අතර නිලධාරීන් සංඛ්‍යාවක් පත් කරනු ලැබේ. ශාලාවේ ඉඩ කඩ අනුව මෙම සංඛ්‍යාව සුළු වශයෙන් අඩු වැඩි වීමට ඉඩ ඇත. තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලාවක් සඳහා සාමාන්‍යයෙන් 10 -15 අතර නිලධාරීන් සංඛ්‍යාවක් පත් කරනු ලැබේ.

ගණන් කිරීමේ නියෝජිතයින්

275. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 60 වැනි වගන්තිය අනුව එක් එක් ගණන් කිරීමේ ශාලාවකට එක් පක්ෂයකින් හෝ කණ්ඩායමකින් ගණන් කිරීමේ නියෝජිතයින් දෙදෙනෙකු බැගින් පත් කිරීම නීතිමය තත්ත්වය වුවත් උපදේශක කමිටු රැස්වීමේදී පක්ෂ ලේකම්වරුන් හා නිත්‍ය නියෝජිතයන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු මත ගත් තීරණයක් අනුව එක් එක් පළාත් පාලන ආයතනය සඳහා තරග කරනු ලබන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් සංඛ්‍යාව අනුව ගණන් කිරීමේ නියෝජිත සංඛ්‍යාව තීරණය කරන ලදී. ඒ අනුව,

කණ්ඩායම් සංඛ්‍යාව	1 - 5	**නියෝජිතයින් 05 බැගින්**
කණ්ඩායම් සංඛ්‍යාව	6 - 10	**නියෝජිතයින් 04 බැගින්**
කණ්ඩායම් සංඛ්‍යාව	10 ට වැඩි	**නියෝජිතයින් 03 බැගින්**

276. මෙයින් අදහස් කරන ලද්දේ ගණන් කිරීමේ ශාලාවෙහි කටයුතු පිළිබඳව දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට වැඩි නියෝජිත සංඛ්‍යාවක් පත් කර ගැනීම සඳහා අවකාශ ලබා දීම වේ. එමඟින් නිතරම ගණන් කිරීමේ ක්‍රියාවලිය හා එම කටයුත්තේ යෙදෙන නිලධාරීන් සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ ඇති සැක සංකා සහ අනියත බිය තරමක් දුරට හෝ දුරු කර ගත හැකි වේ යැයි අපේක්ෂා කරන ලදී.

ගණන් කිරීමේ දැන්වීම

277. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 61(1) වගන්තිය යටතේ තේරීම්භාර නිලධාරී විසින් එම ඡන්ද විමසීම් සඳහා තරග කරන පක්ෂවල ලේකම්වරුන් බලයලත් නියෝජිතයින් හා ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත ඡන්ද ගණන් කිරීම ආරම්භ කරනු ලබන වේලාව ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ පිහිටීම එම මධ්‍යස්ථානයට වෙන් කරන ලද ඡන්ද පොළවල් පිළිබඳව දැනුම් දීමේ ලියවිල්ල ගණන් කිරීමේ දැන්වීම වේ. මෙම දැන්වීම යැවීම සඳහා නිශ්චිත දිනයක් පනතේ සඳහන් නොවෙතත් ගණන් කිරීමේ නියෝජිතයින් පත් කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් ඇතිව පක්ෂ සහ කණ්ඩායම් මේ මඟින් දැනුවත් කිරීම අවශ්‍ය වේ. ගණන් කිරීමේ ශාලාවට අදාළ සියලුම ඡන්ද පෙට්ටි ලැබුණු පසු අවශ්‍ය කාර්යය මණ්ඩලයද පැමිණ සිටී නම් ගණන් කිරීම ආරම්භ කළ හැකිය. එහෙත් ගණන් කිරීමේ දැන්වීමෙන් දැනුම් දුන් වේලාවට පෙර ගණන් කිරීම ආරම්භ නොකළ යුතුය. එබැවින් ගණන් කිරීමේ දැන්වීම මඟින් ප.ව. 7.00 ට ගණන් කිරීම ආරම්භ කරනු ලබන බව දැනුම් දෙන ලදී.

ගණන් කිරීම ආරම්භ කිරීමේ පූර්ව අවශ්‍යතා

278. ගණන් කිරීමේ ශාලාවට නියමිත ඡන්ද පෙට්ටි සියල්ල ලැබී ඇත්නම් හා ගණන් කිරීමේ දැන්වීමෙන් නියම කළ වේලාව ඉකුත් වී ඇත්නම් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීට එම ශාලාවට පත් කර ඇති ගණන් කිරීමේ නිලධාරීන් ශාලාව වෙත කැඳවිය හැකිය. නිලධාරීන්ගේ පත්වීම් ලිපි පරීක්ෂා කර පැමිණීම සටහන් කර ගැනීමෙන් පසු පැළඳ ගැනීමට එක් එක් මැතිවරණ තනතුරට අදාළව සකස් කළ ලාංඡන නිකුත් කරනු ලැබේ. අනතුරුව අදාළ නිලධාරීන් නියමිත පරිදි ගණන් කිරීමේ ශාලාවෙහි අසුන් ගැනීමට සලස්වා ගණන් කිරීමේ නියෝජිතයින් ශාලාවට කැඳවනු ලැබේ. අනතුරුව නියෝජිත පත්වීම් ලිපි හා හැඳුනුම්පත් පරීක්ෂා කර පැමිණීම සටහන් කර ගැනීම හා ඔවුන්ට නියමිත ලාංඡන පැළඳ ගැනීමට උපදෙස් දීම සිදු කරනු ලැබේ.

279. ඉන් අනතුරුව මූලික පියවරක් වශයෙන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් භාරදෙන ලද Z කවරයේ වාර්තාව (ඡන්ද පොළ කලබල පිළිබඳ වාර්තාව) පරීක්ෂා කර කිසියම් ඡන්ද පොළක ඡන්ද විමසීමට බාධාකාරී වන අන්දමේ කිසියම් සිද්ධියක් සිදු වූ බවට වාර්තා වී ඇද්ද යන්න පරීක්ෂා කර එම සිද්ධිය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් Z වාර්තාවේ සඳහන් කර නැතත් පොලීසිය මඟින් හෝ මහජන පැමිණිලි මඟින් කිසියම් සිද්ධියක් සිදු වී ඇති බව තේරීම්භාර නිලධාරී හෝ මැතිවරණ කොමසාරිස් වෙත වාර්තා වී ඇත්නම් ඒ බැව් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිට දැන්වූ විට ඊට අදාළ ඡන්ද පොළවල් සම්බන්ධයෙන් ඉහත කී වාර්තා පරීක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ.

280. එම වාර්තා අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමකට බාධාවන අන්දමේ කිසියම් සිද්ධියක් සිදුවී ඇති බව සනාථ වේ නම් ගණන් කිරීමේ නිලධාරී විසින් ඒ පිළිබඳ වාර්තාවක් සකස් කර තේරීම්භාර නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. තේරීම්භාර නිලධාරී විසින් මැතිවරණ කොමසාරිස් වෙත එම වාර්තා ෆැක්ස් මඟින් යොමු කොට අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය. ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අදාළ ඡන්ද පොළවල් කිසිවක ඡන්ද විමසීමට බාධාවන අන්දමේ කිසියම් සිද්ධියක් සිදු වූ බව වාර්තා වී නොමැතිනම් තේරීම්භාර නිලධාරී වෙත ඒ බව දැනුම් දී ගණන් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගණන් කිරීම ආරම්භ කළ හැකිය. මෙම ඡන්ද විමසීමේ අදියර තුනේදීම ඡන්ද විමසීම ශූන්‍ය කිරීමට තරම් වන අන්දමේ සැලකිය යුතු සිද්ධියක් වාර්තා වී නොතිබුණු බැවින් නියමිත පරිදි ගණන් කිරීම ආරම්භ කළ හැකි විය.

ගණන් කිරීම ආරම්භ කිරීම

281. ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර ගණන් කිරීමේ නියෝජිතයින්ට අදාළ ඡන්ද පෙට්ටි පරීක්ෂා කර බලන ලෙස උපදෙස් දෙනු ලැබේ. නියෝජිතයන් විසින් ඡන්ද පොළේදී තම පක්ෂය විසින් අලවන ලද ස්ටිකර් නිරුපද්‍රිතව තිබේද යන්න පරීක්ෂා කර සෑහීමට පත් වීමෙන් අනතුරුව ඡන්ද පත්‍රිකා ගණන් කිරීම ආරම්භ කරනු ලැබේ.

ගණන් කිරීම අදියර තුනකි

- එක් එක් ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ඡන්ද පත්‍රිකා ගිණුමෙහි සඳහන් ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව සමඟ සැසඳීම.
- එක් එක් පක්ෂය, ස්වාධීන කණ්ඩායම ලබා ඇති ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම.
- එක් එක් අපේක්ෂකයා ලබා ඇති මනාප සංඛ්‍යාව ගණනය කිරීම.

පළමුවැනි අදියර

අ. විවෘත කරනු ලබන ඡන්ද පෙට්ටිය අයත් මධ්‍යස්ථානය පිළිබඳව ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන්ගේ අවධානය යොමු කිරීම සඳහා ඡන්ද කොට්ඨාස අංකය සහ ඡන්ද මධ්‍යස්ථානයේ නම හඬ නගා කියවා අදාළ ඡන්ද පෙට්ටියේ සියලුම ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ මේසය මතට හලනු ලැබේ.

ආ. එකවර ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක ඡන්ද පෙට්ටිවල ඡන්ද පත්‍රිකා මේ ආකාරයෙන් ගණන් කිරීමේ මේසයේ වෙන වෙනම ස්ථානවලට හලනු ලැබේ.

ඇ. අනතුරුව ගණන් කිරීමේ මේසය මත ඇති ඡන්ද පත්‍රිකා 50 මිටි වශයෙන් බැඳීම කරනු ලැබේ. මෙහිදී කිසිම ආකාරයේ තේරීමක් කරනු නොලැබේ.

ඈ. එක් එක් පෙට්ටියේ ඡන්ද පත්‍රිකා ගණන් කිරීම අවසන් වූ වහාම ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී විසින් ගණන් කරන ලද ඡන්ද සංඛ්‍යාව ඡන්ද පත්‍රිකා ගිණුම සමඟ සසඳා බලනු ලැබේ. එය නොසැසඳේ නම් නැවත ගණන් කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. උපරිම වශයෙන් වාර තුනක් ගණන් කළ පසුවද එම සංඛ්‍යාවම නම් ජර්නලයේ සටහනක් යොදා එම ඡන්ද පත්‍රිකා ධාරකයට මාරු කරනු ලැබේ.

ඉ. සියලුම පෙට්ටිවල ඡන්ද පත්‍රිකා ධාරකයට මාරු කරන තෙක් මෙම ක්‍රියාවලිය කරගෙන යනු ලැබේ.

දෙවන අදියර

අ. ගණන් කිරීමේ මේසය බාධක යොදා කොටස් කීපයකට වෙන් කරනු ලැබේ. තරග කරනු ලැබූ එක් එක් පක්ෂය හා ස්වාධීන කණ්ඩායම අනුව ඡන්ද පත්‍රිකා වෙන් කිරීම මෙහිදී සිදු කරනු ලැබේ. ඡන්දය ප්‍රකාශ කර ඇත්තේ කවර පක්ෂයටද කවර කණ්ඩායමටද වශයෙන් තේරීමේදී තීරණයකට එළඹිය නොහැකි ඡන්ද පත්‍රිකා අවිනිශ්චිත ඡන්ද පත්‍රිකා වශයෙන් වෙන් කරනු ලැබේ.

ආ. එක් එක් පක්ෂය හෝ කණ්ඩායම සඳහා දෙන ලද ඡන්දයක් වශයෙන් තෝරන ලද ඡන්ද පත්‍රිකා වෙන් වෙන්ව ගණන් කර 50 මිටි වශයෙන් සකස් කිරීම.

ඇ. අවිනිශ්චිත ඡන්ද පත්‍රිකා බඳුන ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීගේ තීරණය සඳහා වරින් වර යවා එක් එක් ඡන්ද පත්‍රිකාව පිළිබඳව ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීගේ තීරණය ලබා ගනු ලැබේ. මේ අවස්ථාවේදී එම තීරණය පිළිබඳව ගණන් කිරීමේ නියෝජිතයින් දැනුවත් කරනු ඇත.

ඈ. සකස් කරන ලද ඡන්ද පත්‍රිකා 50 මිටිවල ඡන්ද පත්‍රිකා 50 නිවැරදිද එකම පක්ෂයේ හෝ කණ්ඩායමේ ඡන්ද පත්‍රිකාද යන්න පරීක්ෂා කිරීම.

ඉ. නැවත පරීක්ෂා කිරීම.

ඊ. අහඹු පරීක්ෂාව - මෙහිදී එකම පක්ෂයකට / එකම ස්වාධීන කණ්ඩායමකට දෙන ලද ඡන්ද ඇතුළත් ඡන්ද පත්‍රිකා 50 මිටි 10 ක් එක් කර 500 මිටි වශයෙන් සකස් කර ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීගේ මේසය මත එක් එක් පක්ෂයේ කණ්ඩායමේ ඡන්ද ලකුණ අලවන ලද පෙට්ටි මත ඡන්ද පත්‍රිකා මිටි තැන්පත් කරනු ලැබේ.

දෙවැනි අදියර අවසානයේ ගණන් කිරීමේ ශාලාවේ පළමු ප්‍රතිඵලය වනම් එක් එක් පක්ෂය, ස්වාධීන කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ලිඛිත ප්‍රකාශය පිටපත් 6 කින් යුතුව කාබනිකෘත කඩදාසියෙහි සකස් කර එහි මුල් පිටපත ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී විසින් සහතික කර නියමිත කවරයේ බහා මුද්‍රා තබා ප්‍රතිඵල සැකසුම් ශාලාව වෙත යවනු ලැබේ. කාබනිකෘත කඩදාසියෙහි සකස් කරන ලද ප්‍රතිඵලයේ 2, 3, 4 පිටපත් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව අනුව 1, 2, 3 ස්ථාන හිමි වූ පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයින් වෙත භාර දෙනු ලැබේ. පස්වන පිටපත ගණන් කිරීමේ ශාලාවේ ප්‍රදර්ශනය කරනු ලැබූ අතර 6 වන පිටපත ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීගේ කාර්ය පරිපාටි සංග්‍රහයේ ගොනු කරනු ලැබේ.

තුන්වන අදියර

එක් එක් අපේක්ෂකයා ලබා ඇති මනාප සංඛ්‍යාව තීරණය කිරීම.

අ. වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් පක්ෂයේ ඡන්ද පත්‍රිකාවලින් මනාප ගණන් කිරීම ආරම්භ කරනු ලැබේ.

ආ. මනාප සලකුණු කර ඇති ආකාරය අනුව ඡන්ද පත්‍රිකා තේරීම.

- මනාප එකක් සහිත ඡන්ද පත්‍රිකා
- මනාප දෙකක් සහිත ඡන්ද පත්‍රිකා
- මනාප තුනක් සහිත ඡන්ද පත්‍රිකා
- මනාප තුනට වැඩි ඡන්ද පත්‍රිකා
- මනාප ලකුණු කර නොමැති ඡන්ද පත්‍රිකා
- මනාප අවිනිශ්චිත ඡන්ද පත්‍රිකා

ඇ. මනාප 1, මනාප 2, මනාප 3 සහිත ඡන්ද පත්‍රිකා වෙන වෙනම 50 මිටිවලට සකස් කිරීම හා එක් එක් මිටියට අනුපිළිවෙලින් අංක යෙදීම.

ඈ. එක් එක් ඡන්ද පත්‍රිකා මිටියෙහි ඡන්ද පත්‍රිකා 50 මනාපය සලකුණු කර ඇති ආකාරය සැසඳුම් පත්‍රයෙහි සටහන් කිරීම, ඡන්ද පත්‍රිකා මිටියට යෙදූ අංකය සැසඳුම් පත්‍රයෙහි ද සටහන් කරනු ලැබේ.

ඉ. වෙනත් නිලධාරියෙකු විසින් එම සැසඳුම්පත් පරීක්ෂා කිරීම.

ඊ. සැසඳුම් පතෙහි මනාප එකතුව සාරාංශ පත්‍රවලට ගැනීම.

උ. මනාප අවිනිශ්චිත ඡන්ද පත්‍රිකා බඳුන ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී විසින් වරින් වර පරීක්ෂා කර අදාළ ඡන්ද පත්‍රිකා පිළිබඳ තීරණය දෙනු ලැබේ. මනාප තුනට වැඩි, මනාප ලකුණු නොකළ සහ තීරණයකට එළඹිය නොහැකි ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප ඡන්ද පත්‍රිකා බඳුනෙහි බහාලනු ලැබේ.

ඌ. අවසන් සාරාංශ පත්‍රය CE/CO/PR3 ගණන් කිරීමේ ශාලාවේ මනාප ප්‍රතිඵලය වශයෙන් ප්‍රතිඵල සැකසුම් ශාලාව වෙත යවනු ලැබේ.

සහිකධුර හිමිකරගත් සියලුම පක්ෂ හා කණ්ඩායම්වල මනාප ගණන් කිරීම සිදු කරනු ලැබේ. වැඩිම ඡන්ද සංඛ්‍යාව හිමිකරගත් පක්ෂයේ මනාප ගණන් කිරීම අවසන් කර ප්‍රතිඵල ලේඛනය (CE/CO/PR3) ප්‍රතිඵල සැකසුම් මැදිරිය වෙත යැවීමෙන් අනතුරුව ඊළඟ පක්ෂයේ ඡන්ද පත්‍රිකාවල මනාප ගණන් කිරීම ආරම්භ කරනු ලැබේ. ගණන් කිරීමේ ශාලාවේ සකස් වන මනාප ප්‍රතිඵලය කාබනිකෘත කඩදාසියේ සකස් කර අදාළ පක්ෂයේ ගණන් කිරීමේ නියෝජිතට භාර දෙනු ලැබේ. සහිකධුර හිමිකරගත් පක්ෂ සහ කණ්ඩායම්වල පමණක් මනාප ගණන් කිරීමට ගත් තීරණය මත මනාප ගණන් කිරීමට සිදුවන කණ්ඩායම් සංඛ්‍යාව සීමා වී ඇත.

ගණන් කිරීම පිළිබඳ සැක දුරු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග

(අ) ඡන්ද පෙට්ටි ගණන් කිරීමේ ශාලා වෙත රැගෙන එන අවස්ථාවේ එක් එක් පක්ෂයේ, කණ්ඩායමේ ගණන් කිරීමේ නියෝජිතයකුට ශාලාවේ රැඳී සිටීමට අවසර දීම.

(ආ) ඡන්ද මධ්‍යස්ථානයේදී ඡන්ද පෙට්ටියට බහාලන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව පිළිබඳව සකස් කෙරෙන ඡන්ද පත්‍රිකා ගිණුමේ පිටපතක් ඡන්ද පොළ නියෝජිතට භාර දීම.

(ඇ) එක් එක් පක්ෂය, කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශයේ පිටපතක් කාබනිකෘත කඩදාසියෙහි සකස් කර 2, 3, 4 පිටපත් 1, 2, 3 ස්ථාන ලබා ගත් පක්ෂවල නියෝජිතයන් වෙත භාර දීම.

(ඈ) මනාප ගණන් කිරීමෙන් පසුව ලද අදාළ පක්ෂයේ ගණන් කිරීමේ නියෝජිත වෙත මනාප ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් භාර දීම.

(ඉ) මනාප ගණන් කරන අවස්ථාවට අදාළ පක්ෂයේ සියලුම අපේක්ෂකයින්ට ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පැමිණීමට අවකාශ සලසා දීම.

(ඊ) ඡන්ද හා මනාප ගණන් කිරීමට අදාළව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු වේ නම් පැමිණිලි කිරීමට අවකාශ සලසා දීම.

නැවත ගණන් කිරීම සඳහා ඉල්ලුම් කිරීම

282. කොට්ඨාස ක්‍රමය මත පැවති ඡන්ද විමසීමකදී එම කොට්ඨාසය සඳහා තරග කළ සියලුම අපේක්ෂකයින් ඉදිරියේ ඡන්ද පොළේදීම ගණන් කිරීම සිදු කෙරිණ. ඒ අනුව ගණන් කිරීමේ නියෝජිතට ගණන් කිරීමේ සමස්ත ක්‍රියාවලියම එම මධ්‍යස්ථානය තුළදී නිරීක්ෂණය කළ හැකි විය. එවන් මධ්‍යස්ථානයක ගණන් කිරීම අවසන් කළ පසු ගණන් කිරීමේ නියෝජිතයකුට නැවත ගණන් කිරීමක් ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් භාරදිය හැකිය. එය සියලුම ගණන් කිරීමේ නිලධාරීන් හා නියෝජිතයින් ඉදිරිපිට ගණන් කිරීමේ මධ්‍යස්ථානයේදීම සිදු කරනු ලැබේ. ගණන් කිරීමේ නිලධාරීන්ද ඊට සූදානම්ව සිටිති.

283. එහෙත් සමානුපාතික නියෝජන පදනම යටතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයම ඡන්ද විමසීම් ප්‍රදේශය වූ නිසාත් ගණන් කිරීම ඡන්ද ගණන් කිරීම හා මනාප ගණන් කිරීම යන සංකීර්ණ ක්‍රියාවලියක් වීම නිසාත් මුළු පළාත් පාලන ආයතනය සඳහාම එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක ගණන් කිරීම කළ නොහැකි විය. ඒ අනුව ගණන් කිරීමේ මධ්‍යස්ථානය තුළ නියෝජිතයන්ගේ ඉල්ලීම පරිදි නැවත ගණන් කිරීමක් සිදු කරනු ලැබුවුමුත් ඒ වනවිට මුළු පළාත් පාලන ආයතනයේම ඡන්ද ප්‍රතිඵලය පිළිබඳ හැඟීමක් ගණන් කිරීමේ නියෝජිතයින්ට නොමැති වීම මෙහිලා සඳහන් කළ යුතු වැදගත් කරුණකි. එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ගණන් කිරීමේ එක් එක් අදියර අවසන් වූයේ විවිධ කාල පරතරයන් සහිතවය. සියලුම ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ප්‍රතිඵල අනුව පළාත් පාලන ආයතනයේ ඡන්ද ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය පිළියෙල කිරීමෙන් අනතුරුව නැවත ගණන් කිරීමක් සඳහා විධිවිධාන

සලස්වා නැත. සමානුපාතික නියෝජන පදනම යටතේ සිදු කෙරෙන ගණන් කිරීමක දී එබඳු නැවත ගණන් කිරීමක් ප්‍රායෝගික ද නොවේ. එබැවින් සමස්ත ප්‍රතිඵලය පිළිබඳව සෑහීමට පත් නොවන පක්ෂ හා කණ්ඩායම් නැතහොත් තනි තනි පුද්ගලයින් ඡන්ද හෝ මනාප පිළිබඳව නැවත ගණන් කිරීමක් අපේක්ෂාවෙන් අධිකරණයේ පෙත්සම් ගොනු කරන බව පෙනී යයි.

284. ඇත්ත වශයෙන්ම මෙම පෙත්සම්වල ඉදිරිපත් කරන කරුණු අනුව නිශ්චිත කරුණු අනාවරණය කිරීමකින් තොරව අසා දැනගත් ප්‍රවෘත්තියක් හෝ අනුමාන කිරීමක් හෝ එසේත් නැතහොත් එම අවස්ථාවේ දැනගත් ප්‍රතිඵලය කෙරෙහි ඇති වූ යම් සැකයක් හෝ අවිශ්වාසයක් ඔහුගේ එම ඉල්ලීමට පදනම් වේ.

285. මේ අනුව පසුගිය වසර කිහිපය තුළ පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් වලට අදාළව අවස්ථා කිපයකදීම මනාප නැවත ගණන් කරන ලෙස අධිකරණ නියෝග ලබා ගත් නමුත් අධිකරණ ශාලාවේදී හෝ මැතිවරණ මහලේකම් කාර්යාලයේදී අදාළ සියලුම පාර්ශ්වයන් ඉදිරියේ සිදු කරන ලද නැවත ගණන් කිරීම් කිසිවකදී, මුල් ප්‍රතිඵලය අනුව තේරීපත් වූ මන්ත්‍රීවරයන් /සභිකයන් සම්බන්ධයෙන් කිසිදු වෙනස් වීමක් ඇති නොවීම ඡන්ද හා මනාප ගණන් කිරීමේ ක්‍රියාවලිය කෙතරම් සංකීර්ණ වුවද නිලධාරීන් සැලකිලිමත්ව තම කාර්යය ඉටුකර ඇති බව සනාථ විය. කෙසේ වෙතත් 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී ද ඡන්ද ප්‍රතිඵලය පිළිබඳව සෑහීමට පත් නොවූ පාර්ශ්ව විසින් අභියාචනාධිකරණයෙහි පෙත්සම් 21 හා පළාත්බද මහාධිකරණයෙහි පෙත්සම් 07 ක් ගොනු කරන ලදී. එයින් පෙත්සම් 23 ක් මේ වන විට නිශ්ප්‍රභා කර ඇත. අධිකරණ තීරණ මෙතෙක් ලැබී නොමැති පෙත්සම් සංඛ්‍යාව 4 කි.

XIII කොටස

ප්‍රතිඵල සැකසීම හා ප්‍රතිඵල ප්‍රකාශය

286. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 59 අ(1) වගන්තිය අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ විධි විධානවලට යටත්ව තේරීම්භාර නිලධාරී විසින් ඡන්ද ගණන් කිරීම සඳහා ගණන් කිරීමේ නිලධාරීන් පත්කළ යුතු අතර ගණන් කිරීමේ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව එම ආඥාපනතේ 65 වගන්තිය අනුව ප්‍රතිඵල ප්‍රකාශයට පත්කළ යුතුව ඇත.

ප්‍රතිඵල සකස් කිරීමේ ස්ථානය

287. එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා වෙන වෙනම ප්‍රතිඵලයක් සකස් වියයුතු බැවින් පළාත් පාලන ආයතන සංඛ්‍යාව අනුව ස්ථාන හඳුනාගත යුතුව ඇත.

288. එක් එක් පළාත් පාලන ආයතනයක් භාරව ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු සහකාර තේරීම්භාර නිලධාරියකු වශයෙන් පත්කරනු ලැබේ.

289. එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා තරග කරන පක්ෂයකින් හෝ කණ්ඩායමකින් නියෝජිතයන් දෙදෙනකු බැගින් පැමිණීමට නීතියෙන් ඉඩකඩ සලසා ඇති බැවින් ඒ පිළිබඳව ද අවධානය යොමුකළ යුතුය.

290. ගණන් කිරීමේ ශාලාවලින් රැගෙන එන ප්‍රතිඵල ලේඛන පරීක්ෂා කර භාරගැනීම, එම ප්‍රතිඵල එකතු කර සභාවේ ප්‍රතිඵලය සකස් කිරීම සහ අවසානයේ එක් එක් අපේක්ෂකයා ලබා ඇති මනාප සංඛ්‍යාව ගණන් බැලීම දක්වා සියලු පියවරයන් සිදුකෙරෙන ආකාරය නියෝජිතයින්ට හොඳින් පෙනෙන පරිදි මෙන්ම නිලධාරීන්ට බාධා ඇති නොවන පරිදි නියෝජිත ආසන පිළියෙල කළ යුතුවේ.

ප්‍රතිඵල සකස් කිරීමේ නිශ්චිත කාර්යයන්

- අදාළ පළාත් පාලන ආයතනය වෙනුවෙන් තරග කළ එක් එක් පක්ෂය හා කණ්ඩායම ලබා ඇති ඡන්ද සංඛ්‍යාව නිශ්චය කිරීම.
- එක් එක් පක්ෂය/ ස්වාධීන කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව අනුව හිමිකම් ලබන සභිකධුර සංඛ්‍යාව ගණනය කිරීම.
- එක් එක් පක්ෂය/ ස්වාධීන කණ්ඩායම යටතේ තරග කළ එක් එක් අපේක්ෂකයා ලබා ගත් මනාප සංඛ්‍යාව ගණනය කිරීම.
- එක් එක් පක්ෂය/ ස්වාධීන කණ්ඩායම යටතේ තේරී පත්වන සභිකයින් නිශ්චය කිරීම.

පළමු ප්‍රතිඵල ප්‍රකාශය

291. එක් එක් පළාත් පාලන ආයතනයට අදාළව එක් එක් පක්ෂය හා ස්වාධීන කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව අනුව හිමිවන සභිකධුර සංඛ්‍යාව CE/RO/V3 (1) ආකෘතිය මගින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත එවීමෙන් (ෆැක්ස් මගින්) පසු ප්‍රධාන කාර්යාලයෙහි සිදුකරනු ලබන ප්‍රතිඵල පරීක්ෂාව සමග තුලනය වේ නම් ප්‍රතිඵලය සනාථ කර තේරීම්භාර නිලධාරී වෙත දැනුම් දෙනු ලැබේ.

292. එයින් අනතුරුව පළමුව එක් එක් පක්ෂය හා ස්වාධීන කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාවත් ඉන් අනතුරුව ප්‍රසාද ආසන දෙකද සමග එක් එක් පක්ෂයට හිමිවන සභිකධුර සංඛ්‍යාවත් අදාළ තේරීම්භාර නිලධාරී විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙහිදී අදාළ සභාව සඳහා තරග කළ සියලුම පක්ෂ හා කණ්ඩායම් ලබා ඇති වලංගු ඡන්ද සංඛ්‍යාව එකතු කිරීමෙන් ලැබෙන "අදාළ ඡන්ද සංඛ්‍යාව" එම පළාත් පාලන ආයතනය සඳහා තෝරා පත් කර ගත යුතු සභිකධුර සංඛ්‍යාවෙන් (ප්‍රසාද ආසන 2 හැර) බෙදීමෙන් ලැබෙන පූර්ණ සංඛ්‍යාව "සම්ප්‍රයුක්ත සංඛ්‍යාව" යනුවෙන් හඳුන්වන අතර එම පළාත් පාලන ආයතනය සඳහා තරග කළ එක් එක් පක්ෂය/ ස්වාධීන කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ඉහත කී සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් බෙදීමෙන් එක් එක් පක්ෂය හා එක් එක් කණ්ඩායම හිමිකර ගෙන ඇති සභිකධුර සංඛ්‍යාව ලැබේ.

293. මෙම ගණන් බැලීමේදී තවදුරටත් සභිකධුර සංඛ්‍යාවේ ඌණතාවක් ඇත්නම් වැඩිම ශේෂය සැලකිල්ලට ගෙන අදාළ ඌණතාව සම්පූර්ණ කරනු ලැබේ. මේ අනුව සභාව සඳහා තරග කළ එක් එක් පක්ෂය/ කණ්ඩායම හිමිකම් ලබා ඇති සභිකධුර සංඛ්‍යාව තීරණය වේ.

(සටහන 16)

දෙවැනි ප්‍රතිඵල ප්‍රකාශය

294. එක් එක් පළාත් පාලන ආයතනය සඳහා තරග කරන ලද පක්ෂ හා කණ්ඩායම් හිමි කර ගත් සභිකධුර සංඛ්‍යාව සඳහා අපේක්ෂකයින් නම් කිරීම දෙවැනි ප්‍රතිඵල ප්‍රකාශයෙන් සිදු කෙරේ. මෙහිදී එක් එක් ගණන් කිරීමේ ශාලාවෙන් ලැබෙන මනාප ප්‍රතිඵලය එම පළාත් පාලන ආයතනය සඳහා සභිකධුර හිමිකම් ලබා ඇති පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් අනුව වෙන් වෙන් වශයෙන් ලේඛනගත කර ගනු ලබන අතර සියලුම ගණන් කිරීමේ ශාලාවන්ගෙන් ප්‍රතිඵල ලේඛන ලැබුණු පසු එක් එක් අපේක්ෂකයා ලබා ගෙන ඇති මනාප සංඛ්‍යාව ගණනය කරනු ලැබේ.

(II වෙළුම බලන්න)

295. ඒ අනුව එක් එක් පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයින්ගේ මනාප සංඛ්‍යාවන් දැක්වෙන පරිදි මනාප ප්‍රතිඵල සකස් කිරීම පළමුවත්, දෙවනුව එක් එක් පක්ෂය/ ස්වාධීන කණ්ඩායම හිමි කර ගෙන ඇති සභිකධුර සංඛ්‍යාව සඳහා මනාප ප්‍රතිඵල ලේඛනයේ ඉහළින්ම නම් සඳහන් අපේක්ෂකයින් අතුරින් තෝරා ගැනීමත් සිදු කරනු ලැබේ.

296. ඒ අනුව එක් එක් පළාත් පාලන ආයතනය සඳහා තරග කරන ලද පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් හිමි කර ගනු ලැබූ සභිකධුර සංඛ්‍යාව සඳහා නම් කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵලය දෙවැනි ප්‍රතිඵල ප්‍රකාශය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නගරාධිපති/ නියෝජ්‍ය නගරාධිපති/ සභාපති/ උප සභාපති තෝරා පත්කර ගැනීම

297. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65(1) ඇ වගන්තිය අනුව ඡන්ද විමසීමේ ප්‍රතිඵල මත වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පක්ෂයේ ලේකම්වරයා වෙතින් නිශ්චිත කාල සීමාවක් තුළ මහ නගර සභාවක් නම් නගරාධිපති සහ නියෝජ්‍ය නගරාධිපති ද නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් නම් සභාපති හා උප සභාපති ද වශයෙන් පත්කළ යුත්තේ කිනම් සභිකයින් ද යන්න පිළිබඳ නාමයෝජනාවක් තේරීම්භාර නිලධාරී විසින් ලබාගත යුතු වේ.

298. එම නාමයෝජනාව අනුව තේරීම්භාර නිලධාරී විසින් නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති/ සභාපති, උප සභාපති සහ සභිකයන්ගේ නම් ඇතුළත් දැන්වීමක් 66(1) වගන්තිය යටතේ පළකළ යුතු අතර එම ප්‍රතිඵලය පිළිබඳ වාර්තාව ලැබුණු පසු 66(2) වගන්තිය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කිරීමට සලස්වනු ලැබේ. එයින් ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ කාර්යභාරය අවසන් වේ.
(II වෙළුම බලන්න)

299. අදියර තුන යටතේ ඡන්ද විමසීම පවත්වන ලද පළාත් පාලන ආයතන 322 හි එක් එක් පක්ෂය හා ස්වාධීන කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව පාලන බලය හිමිකරගත් පළාත් පාලන ආයතන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වගුව මඟින් දක්වා ඇත. ඊට අමතරව ඡන්ද විමසීම සඳහා තරග කළ එක් එක් පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ ලබා ගෙන ඇති ඡන්ද සංඛ්‍යාව සහ සභිකධුර සංඛ්‍යාව දැක්වෙන සංක්ෂිප්ත සටහනක් අංක 17 යටතේ ද එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය යටතේ ඡන්දය ප්‍රකාශ කිරීමේ වැඩිම හා අඩුම ප්‍රතිශතය දක්වන ලද පළාත් පාලන ආයතන සහ අදාළ ප්‍රතිශතය සටහන 18 යටතේ දක්වා ඇත.
(සටහන 17,18)

	දේශපාලන පක්ෂය/ කණ්ඩායම	ලබා ගත් ඡන්ද සංඛ්‍යාව	හිමිකරගත් සභිකධුර සංඛ්‍යාව	පාලන බලය හිමිකරගත් පළාත් පාලන ආයතන සංඛ්‍යාව
1	10 එක්සත් ජනතා නිදහස් සන්ධානය	4774791	2596	271
2	11 එක්සත් ජාතික පක්ෂය	2682442	1160	10
3	05 ඉලංකෙයි තමිල් අරසු කච්චි	248568	263	30
4	21 ජනතා විමුක්ති පෙරමුණ	142244	76	
5	62 ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය	127775	72	5
6	20 කඳුරට ජනතා පෙරමුණ	38024	21	1
7	43 ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ	34189	10	
8	03 අහිල ඉලංගෙයි මුස්ලිම් කාන්ග්‍රස්	16992	6	
9	16 එක්සත් ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ	12079	6	
10	14 එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය	7830	2	
11	35 ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ	5471	12	2
12	32 දේශප්‍රේමී ජාතික පෙරමුණ	5186	5	
13	53 ලිබරල් පක්ෂය	3803	2	
14	31 තමිල් මක්කල් විඩුදලෛප් පුලිකල්	3155	3	
15	52 ලංකා සමසමාජ පක්ෂය	2658	4	
16	25 ජාතික කොංග්‍රසය	2261	14	2
17	40 පුරවැසි පෙරමුණ	847	2	
	ස්වාධීන 1 1	93367	51	1
	ස්වාධීන 2 2	23709	12	
	ස්වාධීන 3 3	16257	7	
	ස්වාධීන 4 6	5068	2	
	ස්වාධීන 5 4	4646	2	
	ස්වාධීන 6 8	3481	2	
	ස්වාධීන 7 5	552	1	
		එකතුව	**4331**	**322**

සටහන

ස්වාධීන 1 දිස්ත්‍රික්ක 18 කින් සභිකධුර 51 ක් ලබා ඇත.
ස්වාධීන 2 දිස්ත්‍රික්ක 7 කින් සභිකධුර 12 ක් ලබා ඇත.
ස්වාධීන 3 දිස්ත්‍රික්ක 6 කින් සභිකධුර 7 ක් ලබා ඇත.
ස්වාධීන 4 දිස්ත්‍රික්ක 2 කින් සභිකධුර 2 ක් ලබා ඇත.
ස්වාධීන 5 එක් දිස්ත්‍රික්කයකින් සභිකධුර 1 ක් ලබා ඇත.
ස්වාධීන 6 දිස්ත්‍රික්ක 2 කින් සභිකධුර 2 ක් ලබා ඇත.
ස්වාධීන 8 දිස්ත්‍රික්ක 1 කින් සභිකධුර 2 ක් ලබා ඇත.

එකම අංකයෙන් හැඳින්වෙන විවිධ දිස්ත්‍රික්ක වල ස්වාධීන කණ්ඩායම් අතර කිසිදු සම්බන්ධතාවයක් නැති බව අවධාරනය කරනු ලැබේ.

එක් එක් පක්ෂය ස්වාධීන කණ්ඩායම විසින් පාලන බලය හිමිකර ගෙන ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා වශයෙන්

පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායම	මහ නගර සභා	නගර සභා	ප්‍රාදේශීය සභා	එකතුව
එක්සත් ජනතා නිදහස් සන්ධානය	17	29	225	271
ඉලංකෙයි තමිල් අරසු කච්චි	-	5	25	30
එක්සත් ජාතික පක්ෂය	2	5	3	10
ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය	1	-	4	5
ජාතික කොංග්‍රසය	1	-	1	2
ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ	-	-	2	2
කඳුරට ජනතා පෙරමුණ	-	-	1	1
ස්වාධීන කණ්ඩායම	-	-	1	1
එකතුව	**21**	**39**	**262**	**322**

300. ඡන්ද විමසීම හා ගණන් කිරීම අවසානයේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 66(1) වැනි වගන්තිය යටතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී විසින් ප්‍රතිඵලය ප්‍රකාශයට පත්කරනු ලැබූ පසු මැතිවරණ කොමසාරිස්වරයා විසින් 66(2) වගන්තිය යටතේ නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, උප සභාපති හා සභිකයින් වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ගැසට් නිවේදනය පහත සඳහන් දිනයන් හි ප්‍රකාශයට පත්කරන ලදී.

ඡන්ද විමසීම් දිනය	පළාත් පාලන ආයතන සංඛ්‍යාව	ගැසට් පත්‍ර දිනය/ ගැසට් පත්‍ර අංකය	
2011.03.17	234	2011.03.28	1699/2
2011.07.23	65	2011.07.30	1716/32
2011.10.08	23	2011.10.15	1727/24

301. ඡන්ද විමසීම් පවත්වන ලද පළාත් පාලන ආයතන සඳහා එක් එක් පක්ෂය/ ස්වාධීන කණ්ඩායම ලබාගත් ඡන්ද සංඛ්‍යාව සහ එක් එක් අපේක්ෂකයා ලබාගත් මනාප සංඛ්‍යාව දැක්වෙන සවිස්තර වාර්තාවක් සහ එක් එක් පළාත් පාලන ආයතනයේ නගරාධිපති/ නියෝජ්‍ය නගරාධිපති/ සභාපති/ උප සභාපති සහ සභිකයින්ගේ නම් ඇතුළත් සවිස්තර සටහනක් මෙහි දෙවෙනි වෙළුමෙහි ඇතුළත් කර ඇත. මනාප සංඛ්‍යාව ගණනය කර ඇත්තේ සභිකධුර හිමිකර ගත් පක්ෂවල හා කණ්ඩායම්වල පමණකි.

XIV වැනි කොටස

ඡන්ද විමසීමට අදාළව ගනු ලැබූ අධිකරණ ක්‍රියාමාර්ග

302. මෙම ඡන්ද විමසීමට අදාළව අවස්ථා කිහිපයකදී අදාළ පාර්ශ්ව විසින් අධිකරණය වෙත යොමු වීම් දක්නට ලැබිණ. පළමුව කොළඹ මහ නගර සභාව විසුරුවා හැර තිබියදී තවදුරටත් ඡන්ද විමසීම කල්තැබීමට ගනු ලැබූ තීරණය සම්බන්ධයෙන් SCFR/161/2011, SCFR/251/2011, SCFR/286/2011, SCFR/287/2011 වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් පෙත්සම් හතරක් ගොනු කෙරිණ. අනතුරුව මාතර මහ නගර සභාවට අදාළව SCFR/291/2011 ද කෝට්ටේ මහ නගර සභාවට අදාළව SCFR/292/2011 සහ මීගමුව මහ නගර සභාව සම්බන්ධයෙන් SCFR/296/2011 වශයෙන් මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කෙරිණ.

303. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ PL/7/1/05/46 හා 2011.01.06 දිනැති ලිපියෙන් මහ නගර සභා 19 ක ඡන්ද විමසීම කල් තබන බව මැතිවරණ කොමසාරිස් වෙත දැනුම් දී ඇති අතර අතිගරු ජනාධිපතිතුමා විසින් මහ නගර සභා 16 ක් ඇතුළුව පළාත් පාලන ආයතන 23 ක ඡන්ද විමසීම කල් තබමින් අංක 1689/12 හා 2011.01.18 දිනැති ගැසට් නිවේදනය පළ කරන ලදී. ඒ අනුව ඉහත කී සියලුම පෙත්සම් ගොනු කිරීම සිදු කෙරිණ.

ප්‍රතික්ෂේප වූ නාමයෝජනා සම්බන්ධයෙන් ගොනු කරන ලද පෙත්සම්

304. නාමයෝජනා අවස්ථාවෙහි ප්‍රතික්ෂේප වූ නාමයෝජනා අතුරින් නාමයෝජනා 75 ක් සම්බන්ධයෙන් එකී නාමයෝජනා පිළිගන්නා ලෙස ඉල්ලමින් අභියාචනාධිකරණය වෙත පෙත්සම් ඉදිරිපත් කරන ලදී. එම පෙත්සම් 75න් නාමයෝජනා 48 ක් පිළිගත යුතු බව අභියාචනාධිකරණය විසින් තීරණය කරන ලදී. පෙත්සම් 23 ක් නිශ්ප්‍රභා කරන ලද අතර 04 ක් ඉල්ලා අස්කරගන්නා ලදී. නාමයෝජනා ප්‍රතික්ෂේප වීමට අදාළව ගොනු කරන ලද පෙත්සම් පිළිබඳව සංඛ්‍යා සටහනක් පහත දැක්වා ඇත.

පෙත්සම යොමු කළ පක්ෂය, කණ්ඩායම	පෙත්සම් ගණන	නාමයෝජනා පිළිගැනීමට තීරණය කරන ලද පෙත්සම් ගණන	නිෂ්ප්‍රභා කරන ලද පෙත්සම් ගණන	ඉල්ලා අස්කරගන්නා ලද පෙත්සම් ගණන
අඛිල ඉලංකෙයි ද්‍රවිඩ එක්සත් පෙරමුණ	02	-	02	-
ඊලවර් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ	01	-	01	-
එක්සත් ජනතා නිදහස් සන්ධානය	36	35	01	-
එක්සත් ජාතික පක්ෂය	13	05	04	04
ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය	06	03	03	-
ජන සෙත පෙරමුණ	03	01	02	-
පුරවැසි පෙරමුණ	01	01	-	-
ස්වාධීන කණ්ඩායම	13	03	10	-
එකතුව	**75**	**48**	**23**	**04**

305. 2011.10.08 වැනි දින පැවති පළාත් පාලන ආයතන ඡන්දවිමසීම III වැනි අදියර යටතේ කොළඹ මහ නගර සභාව වෙනුවෙන් නාමයෝජනා 02ක් ප්‍රතික්ෂේප වීමට අදාළව අභියාචනාධිකරණය වෙත පෙත්සම් දෙකක් ගොනු කරන ලද අතර එයින් CA 568/2011 දරන පෙත්සම ඉල්ලා අස්කර ගනු ලැබූ අතර CA 573/2011 නඩුව ගාස්තු රහිතව නිෂ්ප්‍රභා කරන ලදී.

(සටහන 19)

ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරන ලද පෙත්සම්

306. නාමයෝජනා ප්‍රතික්ෂේපවීමට එරෙහිව අභියාචනාධිකරණයෙහි ගොනු කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් දෙන ලද තීන්දුවට එරෙහිව පහත සඳහන් පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනු කරන ලදී. එම පෙත්සම් සියල්ලක් 2011.07.23 වැනි දිනට පෙර විභාග කර තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී. එම පෙත්සම් සියල්ල නිශ්ප්‍රභා කෙරිණි.

පෙත්සම් අංකය		පළාත් පාලන ආයතනය	තීන්දුව ප්‍රකාශ කළ දිනය	තීන්දුව
අභියාචනා ධිකරණය	ශ්‍රේෂ්ඨ ධිකරණය			
CA (Writ) 155/2011	SC(SPI)LA 55/2011	හලාවත ප්‍රාදේශීය සභාව	2011.07.21	නිශ්ප්‍රභා කරන ලදී.
CA(Writ) 73/2011	SC(SPI)LA 112/2011	හෝමාගම ප්‍රාදේශීය සභාව	2011.07.06	නිශ්ප්‍රභා කරන ලදී.
CA(Writ) 135/2011	SC(SPI)LA 111/2011	වැලිගෙපොල ප්‍රාදේශීය සභාව	2011.07.18	නිශ්ප්‍රභා කරන ලදී.
CA(Writ) 118/2011	SC(SPI)LA 94/2011	වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව	2011.07.06	නිශ්ප්‍රභා කරන ලදී.
CA(Writ) 133/2011	SC(SPI)LA 116/2011	රාජාංගනය ප්‍රාදේශීය සභාව	2011.07.06	නිශ්ප්‍රභා කරන ලදී.
CA(Writ) 132/2011	SC(SPI)LA 117/2011	ගල්නෑව ප්‍රාදේශීය සභාව	2011.07.08	නිශ්ප්‍රභා කරන ලදී.

ඡන්ද ප්‍රතිඵලයට එරෙහිව ගොනු කරන ලද පෙත්සම්

307. ඡන්ද විමසීමට අදාළ ගණන් කිරීම් හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම් අවසන් වීමෙන් අනතුරුව ප්‍රතිඵලය පිළිබඳ සෑහීමට පත් නොවූ පාර්ශ්ව විසින් ඡන්ද විමසීම නැවත පැවැත්වීම හා මනාප නැවත ගණන් කිරීම අපේක්ෂා කරමින් අභියාචනාධිකරණය වෙත සහ පළාත්බද මහාධිකරණය වෙත පෙත්සම් ගොනු කරන ලදී.

308. මෙසේ ඉදිරිපත් වූ මුළු පෙත්සම් සංඛ්‍යාව 28 කි. එයින් පෙත්සම් 21 ක් අභියාචනාධිකරණය වෙතද පෙත්සම් 07 ක් පළාත්බද මහාධිකරණය වෙතද ඉදිරිපත් කෙරිණ. ඡන්ද විමසීම නැවත පවත්වන ලෙස කොළොන්නාව නගර සභාව වෙනුවෙන් පෙත්සමක් ඉදිරිපත් වූ අතර සහිකත්වය සඳහා පත් කරන ලෙස ඉල්ලමින් පානදුර නගර සභාව වෙනුවෙන් පෙත්සමක් ඉදිරිපත් විය. අනෙකුත් සියලුම පෙත්සම්වලින් මනාප නැවත ගණන් කිරීම අපේක්ෂා කරන ලදී. ඉදිරිපත් වූ පෙත්සම් 28 න් පෙත්සම් 02 ක් පිළිබඳව තීරණ මෙතෙක් ලැබී නැති අතර අනෙකුත් සියලුම පෙත්සම් නිෂ්ප්‍රභා කර ඇත.
(සටහන 20)

ඡන්ද විමසීම පැවැත්වීමට එරෙහිව ගොනු කරන ලද පෙත්සම්

309. මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩියිරුප්පු හා මුහුදුබඩපත්තු යන ප්‍රාදේශීය සභා දෙක වෙනුවෙන් ඡන්ද විමසීම පැවැත්වීමේ අරමුණෙන් 2011.01.06 දින මුලතිව් දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී විසින් නාමයෝජනා දැන්වීම ප්‍රසිද්ධ කරන ලදී. එහෙත් ඒ වන විටත් බිම් බෝම්බ ඉවත් කිරීම් හා නැවත පදිංචිකිරීම් අවසන්ව නොපැවති බැවින් ඡන්ද විමසීම පැවැත්වීමේ අසීරුතාවන් ඉදිරිපත් කෙරිණ. බිම් බෝම්බ ඉවත් කර නැවත පදිංචි කිරීම් අවසන් කිරීම කඩිනමින් සිදු කරනු ලැබූ මුත් ප්‍රදේශයේ ජනතාව අවතැන්ව සිටීමේ හේතුව මත ඡන්ද විමසීම තවදුරටත් කල් තැබිය යුතු යැයි ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මෙම ප්‍රාදේශීය සභා 2 හි ඡන්ද විමසීම පළමුව 2011.05.30 දින දක්වාත් ඉන් අනතුරුව 2011.12.31 දින දක්වාත් කල් තබන ලදී.

310. ඒ සම්බන්ධයෙන් පක්ෂ ලේකම්වරුන් කැඳවා සාකච්ඡා කර අවතැන් ඡන්දහිමියන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා දීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් එකඟත්වය පළ කර 2012.03.24 වන දින ඡන්ද විමසීම පැවැත්වීමට තීරණය කරන ලදී. එම තීරණයට එරෙහි වෙමින් 2012.03.14 වන දින අභියාචනාධිකරණයෙහි පෙත්සම් 2 ක් ගොනු කරන ලදී. ඒ වන විට ඡන්ද විමසීම පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කර තිබූ නමුත් පෙත්සම්කරුවන් විසින් ඉල්ලා ඇති පරිදි ඡන්ද විමසීම් පැවැත්වීම අත්හිටුවමින් අභියාචනාධිකරණය විසින් 2012.03.19 දින රිට් ආඥා 2 ක් නිකුත් කරන ලදී. 72/2012 සහ 74/2012 අංක යටතේ නිකුත් කරන ලද මෙම වාරණ නියෝග 2 ට අදාළ පෙත්සම් විභාග කිරීම මෙම වාර්තාව අවසන් වන විටද විභාග කර අවසන්ව නොපැවතුණි.

XV වැනි කොටස

මැතිවරණ නීතිය බලාත්මක කිරීම සඳහා ගනු ලැබූ පියවර

මූලික පසුබිම

311. මැතිවරණයකදී ඡන්දදායකයා, අපේක්ෂකයා සහ මැතිවරණ කටයුතු මෙහෙයවීමේ යෙදෙන රාජ්‍ය නිලධාරීන් මැතිවරණ නීතියට අනුගතව මැතිවරණයට අදාළ සමස්ත කාර්යභාරය ඉටුකළ යුතු අතර මැතිවරණ නීතිය බලාත්මක කිරීම ශ්‍රී ලංකා පොලීසිය විසින් ඉටුකළ යුතුය. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අඥාපනත මගින් හඳුන්වා දී ඇති මැතිවරණ නීති තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සංශෝධන පනත් සහ විශේෂ විධිවිධාන පනත් ගණනාවක් වරින් වර සම්මත කර ඇත. ඊට අමතරව 13 වැනි 17 වැනි සහ 18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳවද සැලකිල්ල යොමු කළ යුතුවේ.

312. ඡන්ද විමසීම් නීතිවලින් බලාපොරොත්තු වන්නේ ඡන්ද විමසීම නිදහස්ව හා සාධාරණව පවත්වා ඡන්දදායකයාගේ නිදහස් ඡන්දය මගින් අවශ්‍ය සහිකයින් තෝරාපත් කර ගැනීමට අවකාශ සලසා දීම වේ. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සම්පූර්ණ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළම පුරා තම ප්‍රචාරක කටයුතු මෙහෙයවීම අත්‍යාවශ්‍ය. මෙහිදී පක්ෂ/කණ්ඩායම් අතර මෙන්ම එකම පිලේ අපේක්ෂකයන් අතර පැවති උග්‍ර තරගකාරීත්වය හේතුවෙන් ඡන්ද විමසීම් නීති උල්ලංඝනය වීමේ අවස්ථා වැඩිවීම සමාන්‍ය සිදුවීමක් බවට පත්විය. මෙම ඡන්ද විමසීම පළාත් පාලන ආයතන සඳහා සහිකයින් තේරීමකට වඩා ජාතික මැතිවරණයක ස්වරූපය ගත් අතර ආණ්ඩුවේ සම්පූර්ණ බලය පවා වී කෙරෙහි යෙදවීමක් දක්නට ලැබිණ.

313. සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය යටතේ පක්ෂය ප්‍රධාන වන අතර පක්ෂය ජයග්‍රහණය කරවීමේලා පක්ෂයේ බලවතුන් දැඩි කැපවීමෙන් කටයුතු කරනු දක්නට ලැබුණු අතර මනාප ඡන්ද සඳහා එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර පවා දැඩි තරගයක් මනාප පොරයක් දක්නට ලැබිණ. මේ තරගය සමහර අවස්ථාවල ප්‍රචණ්ඩකාරී තත්ත්වයන්ට පවා යොමුවනු දක්නට ලැබිණ.

314. මෙම ඡන්ද විමසීමේදී ඡන්ද නීති උල්ලංඝනය වීම පිළිබඳව පැමිණිලි රාශියක් ලද අතර එවායින් සමහරකදී මැතිවරණ නීති බලාත්මක නොකිරීම සම්බන්ධයෙන් විවේචනද ඇතුළත්ව තිබිණි. නීතිය බලාත්මක කිරීමට බැඳී සිටින පොලිස් දෙපාර්තමේන්තුවේ කවර හෝ නිලධාරියෙකු, මැතිවරණ නීති උල්ලංඝනය කරන දේශපාලනඥයන්ගේ/ දේශපාලන පක්ෂවල අධිකාරකරුවන්ගේ අනීතික ක්‍රියා හමුවේ නිහඬ පිළිවෙතක් අනුගමනය කරනු ලැබුවහොත් එය සමස්ත සමාජයේම දෝෂ දර්ශනයට ලක් වේ.

315. මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රථ පෙළපාලි/ මහජන පෙළපාලි පැවැත්වීම, අනවසර පෝස්ටර්/ බැනර්/ කටවුට් යනාදිය ප්‍රදර්ශනය කිරීම සහ මහා මාර්ගවල ඡන්ද ලකුණු ඇඳීම ආදි නීති විරෝධී ක්‍රියාමාර්ගවලට එළඹීම මගින් ඡන්ද විමසීම් අඥා පනතේ 81 ආ වගන්තිය උල්ලංඝනය වන අවස්ථා බොහෝසෙයින් වාර්තා විය. රජයේ වාහන, රජයේ ගොඩනැගිලි, රාජ්‍ය නිලධාරීන් යනාදී රාජ්‍ය සම්පත් පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය කිරීමට නැතහොත් අගතියට පත් කිරීමට යොදා ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට හා ස්භාවික යුක්තියේ මූලධර්ම වලට පටහැනි ක්‍රියාවක් වන අතර මෙම ඡන්ද විමසීමේදී එවැනි සිදුවීම් සම්බන්ධයෙන් පැමිණිලි සැලකියයුතු සංඛ්‍යාවක් ලැබී තිබිණි.

316. විශේෂයෙන් පූර්ව ඡන්ද විමසීම් කාල පරිච්ඡේදය තුළ මැතිවරණ මහලේකම් කාර්යාලයෙහි පවත්වාගෙන ගිය පැමිණිලි විමර්ශන අංශය වෙත මැතිවරණ නීති කඩකිරීම් පිළිබඳව පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබිණි. එම පැමිණිලි අදාළ රාජ්‍ය ආයතන වලට සහ අදාළ වන විටදී පොලිසියේ නිසි බලධාරීන් වෙතද නිර්දේශ/ උපදෙස් සමග යොමු කරන ලදී. මෙම පැමිණිලි පිළිබඳව අප්‍රමාදව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව නිසි ලෙස සම්පූර්ණ නොවූවද බොහෝමයක් රාජ්‍ය ආයතන සහ පොලිසිය, මැතිවරණ බලධාරීන්ගේ උපදෙස් වලට අනුකූලව ක්‍රියාකළ බව නිරීක්ෂණය විය.

317. දාහත් වන ආණ්ඩුකම ව්‍යවස්ථාවෙන් ඇති කිරීමට යෝජිත ස්වාධීන පොලිස් කොමිසම ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම හරහා ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමට අදාළව පොලිස් නිලධාරීන් මෙහෙයවීමට හැකි වුවහොත් ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා පොලිස් නිලධාරීන්ගෙන් අපේක්ෂිත අප්‍රමාදව හා නීත්‍යානුකූලව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව ඉටු නොවන අවස්ථා පිළිබඳ පැමිණිලි ලැබීම අවමවනු ඇත.

318. ඡන්ද විමසීම් අවස්ථාවකදී එම ඡන්ද විමසීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් වශයෙන් පවත්වාගෙන යාම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාටත් තේරීම්භාර නිලධාරීටත් සහය වන ප්‍රධානතම රාජ්‍ය ආයතනය ශ්‍රී ලංකා පොලිසිය බව අමුතුවෙන් කිව යුතු නොවේ. පොලිස්පතිවරයාගේ සිට එම දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ට නීත්‍යානුකූලව තම රාජකාරි ඉටුකිරීම සඳහා අවශ්‍ය යහපත් වාතාවරණයක් පැවතීම අත්‍යවශ්‍යය. එවැනි යහපත් වාතාවරණයක් පවත්වා ගැනීමේ වගකීම දේශපාලන බලධාරීන් වෙත මෙන්ම සියලුම පුරවැසියන් වෙතද පැවරේ. එසේ වුවද ඡන්ද විමසීම් නීති බලාත්මක

කිරීම සඳහා පොලිසියෙන් සිදුකල යුතු කටයුතු විවිධ බලපෑම් හේතුවෙන් නිසිලෙස ඉටු නොවන බවට පැමිණිලි ලැබීම නිසා එම කාර්යයන් ඉටු කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව හා තේරීම්භාර නිලධාරීන් මැදිහත් වියයුතු බවට මෙම පැමිණිලි ඉදිරිපත් කරන දේශපාලන පක්ෂ/ සිවිල් සංවිධාන හා පුරවැසියන් අපේක්ෂා කරන තත්ත්වයක් ඇති වී තිබේ. එසේ වුවත් මැතිවරණ දෙපාර්තමේන්තුවට වී සඳහා සුදුසු යාන්ත්‍රණයක් නොමැත. මැතිවරණ දෙපාර්තමේන්තුවට කළ හැක්කේ අවශ්‍ය උපදෙස් ලබාදීම සහ අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන සලසා දීම පමණි. එයට අමතරව නීති විරෝධී ප්‍රචාරක කටයුතු හා නීති විරෝධී කාර්යාල පවත්වා ගෙන යන ස්ථාන පිළිබඳව සහ රාජ්‍ය දේපල අනිසි පරිහරණය පිළිබඳව දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙතින් තොරතුරු වාර්තා ලබාගෙන පොලිස් බලධාරීන් වෙත යොමු කිරීමද කළ හැකිය. එහෙයින් ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම පොලිස්පතිවරයා ප්‍රමුඛ පොලිස් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අත්හැරිය නොහැකි වගකීමක් බව පෙන්වාදෙනු කැමැත්තෙමි. මේ සඳහා ඡන්ද විමසීම් කාලසීමාව තුළ පොලිස් සේවය දේශපාලන බලපෑම්වලින් තොරව ස්වාධීනව පවත්වාගෙන යාමට දේශපාලන බලධාරීන්ගේ පූර්ණ සහයෝගය අත්‍යවශ්‍යය. එසේ නොවුවහොත් සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට අපහසු වනු ඇති අතර ඡන්ද විමසීම හා එහි ප්‍රතිඵලය පිළිනොගත යුතුයැයි මහජන මතයක් ගොඩනැගෙනු ඇත. මේ පිළිබඳව සියලුම දේශපාලන බලධාරීන්ගේ, අපේක්ෂකයින්ගේ හා සියලු පුරවැසියන්ගේ විශේෂ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

319. කෙසේ වෙතත් මැතිවරණ නීතිය බලාත්මක කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් විශේෂ පියවර කිහිපයක් ගනු ලැබූ බව මෙහිලා සඳහන් කළ යුතුව ඇත.

- රාජ්‍ය දේපළ අනිසි ලෙස දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම වැළැක්වීම
- නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු හා නීති විරෝධී පෙළපාලි වළක්වා ලීම
- මාධ්‍ය ආයතන වෙත උපමාන නිකුත් කිරීම
- වත්කම් හා බැරකම් ප්‍රකාශය පිළිබඳ නියමය ක්‍රියාත්මක කිරීම
- පැමිණිලි විමර්ශන මධ්‍යස්ථාන පිහිටුවීම
- පසු විමර්ශන කටයුතු

රාජ්‍ය දේපළ අනිසි ලෙස දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම වැළැක්වීම

320. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වැනි සංශෝධනය 104 ආ (4) අ ව්‍යවස්ථාවට අනුව මැතිවරණයක් සඳහා නාමයෝජනා දැන්වීම් පළකළ දින සිට ඡන්ද විමසීම අවසානය දක්වා වන ඡන්ද විමසීම් කාලපරිච්ඡේදය තුළ වී ඡන්ද විමසීම සඳහා තරගකරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වලකාලීමේ කාර්යය සඳහා රජයට හෝ රාජ්‍ය සංස්ථාවකට අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරී ඇත. 103 වැනි ව්‍යවස්ථාව සහ 27(2) වගන්තිය අනුව මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවන තුරු මැතිවරණ කොමසාරිස්වරයා වෙත මෙම වගකීම පැවරෙනු ඇත.

321. මේ අනුව පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදීද, ජනාධිපති ලේකම්, අමාත්‍ය මණ්ඩල ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් ඇතුළු සියලුම අමාත්‍යංශ ලේකම්වරුන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අනෙකුත් බලධාරීන් වෙත චක්‍රලේඛ ලිපියක් මගින් රාජ්‍ය දේපළ අනිසි පරිහරණය වලකාලීමේ අවශ්‍යතාව දැනුම් දෙන ලදී.
(උපලේඛන 3)

322 එසේ වුවත් රාජ්‍ය වාහන, රාජ්‍ය ගොඩනැගිලි හා රාජ්‍ය නිලධාරීන් ඇතුළු රාජ්‍ය දේපළ මැතිවරණ ප්‍රචාරණ කාර්යයෙහි යෙදවීම පිළිබඳව මහජන පැමිණිලි සැලකිය යුතු ප්‍රමාණයක් ලැබිණි. ඇතැම් අවස්ථාවල රාජ්‍ය උත්සව පැවැත්වීම හරහා පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධන කථා පැවැත්වීම්, වියළි ආහාර ඇතුළු ආහාර පාන වර්ග, ඉදිකිරීම් ද්‍රව්‍ය, ගෘහ හා ගෙවතු උපකරණ, රෙදිපිළි යනාදිය බෙදා දීම් පිළිබඳව වාර්තා විය. මෙවැනි කටයුතු වැලැක්වීම සඳහා ඡන්ද විමසීමේ දෙවැනි අදියරේදී ඉහත කී චක්‍රලේඛ ලිපිය යැවීමට අමතරව සියලුම අමාත්‍යාංශවල අතිරේක ලේකම්වරුන් හා ප්‍රවාහන විෂය භාර මාණ්ඩලික නිලධාරීන් කැඳවා වී වී අමාත්‍යාංශය සතු වාහන හා රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම වැළැක්වීමේ වගකීම එම නිලධාරීන් වෙත පවරන ලදී.

323. ශ්‍රී ලංකාවේ විවිධ ඡන්ද විමසීම් වරින්වර පැවැත්වීමේ වත්මන් රටාව හමුවේ ඡන්ද විමසීමක් පැවැත්වෙන සෑම අවස්ථාවකම බලයේ රැඳී සිටින තවත් මහජන නියෝජිත පිරිසක් සිටින බැවින් ඔවුන් ස්වකීය නිලබලය යොදාගෙන තම පක්ෂයේ අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය සඳහා රාජ්‍ය දේපළ අනිසි ලෙස යොදා ගැනීම වළකාලිය නොහැකි තත්ත්වයට පත්ව ඇත. මේ තත්ත්වය යටතේ නීතිය බලාත්මක කිරීමට බැඳී සිටින රාජ්‍ය නිලධාරීන්/ පොලිස් නිලධාරීන් අතුරින් සමහරකු, අකටයුතු වල යෙදෙන ඇතැම් දේශපාලනඥයින් හමුවේ උදාසීනත්වයක් දැක්වීම පුදුමයට හේතුවක් නොවේ.

324. රාජ්‍ය දේපළ අනිසි පරිහරණය සම්බන්ධයෙන් කිසියම් සංවිධානයකින්, ආයතනයකින් හෝ පුද්ගලයකුගෙන් පැමිණිල්ලක් ලද විට අදාළ උපදෙස්

ද සහිතව එම පැමිණිල්ල නිසි වගකිවයුත්තන් හට යොමු කිරීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදු කරන ලදී. ඊට අමතරව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පක්ෂ ලේකම්වරුන් හා පක්ෂ නියෝජිතයින් වෙනුවෙන් පවත්වනු ලැබූ උපදේශක කමිටුවලදීද මෙම රාජ්‍ය දේපළ අනිසි පරිහරණය වළකාලීමේ අවශ්‍යතාව දැඩිව පෙන්වා දෙන ලදී. උපදේශක කමිටුවල සාකච්ඡා වූ ප්‍රමුඛ කරුණ වශයෙන් ද මෙය හඳුන්වා දිය හැකිය. ඇතැම් අවස්ථාවල මෙම කරුණු පිළිබඳව උපදේශක කමිටු රැස්වීම් දැඩි උණුසුම්කාරී ස්වරූපයට පත් කෙරෙන වාද විවාද පවා ඇති කෙරිණ. (පරිශිෂ්ඨ 49)

නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු හා නීතිවිරෝධී පෙළපාලි වළකාලීම

325. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 81(ආ) වගන්තිය මගින් නාමයෝජනා කාල සීමාවේ පළමු දිනයෙන් ආරම්භ වන හා ඒ ඡන්ද විමසීමේ දිනයට ඉක්බිති වූ දිනයෙන් අවසන් වූ කාල සීමාව තුළ කිසියම් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක කිසියම් අපේක්ෂකයකු තෝරා පත් කිරීමට අනුබල දීමක් වශයෙන් අපේක්ෂකයා රැගෙන යන වාහනයේ හා අපේක්ෂකයකුට ආධාර වශයෙන් පවත්වන රැස්වීම් දිනයේ අදාළ රැස්වීම් භූමියේ හැර වෙනත් කිසිදු ස්ථානයක පෝස්ටර්, කටවුට්, කොඩි, පතාක, දැන්වීම් ආදී කිසිවක් ප්‍රදර්ශනය කිරීම නීති විරෝධී වේ. විශේෂයෙන් මහජනයාට ඇතුළු වීමට අවසර ඇති පොදු ස්ථාන මැතිවරණය හා සම්බන්ධ ප්‍රචාරණ කටයුතුවලින් නිදහස්ව තිබිය යුතුය. මෙම සීමාවන් දේශපාලන බලපුළුවන්කාරකම් මත ඉක්මවායාමක් මෙම ඡන්ද විමසීම් අදියර තුනේදීම දක්නට ලැබුණි. විශේෂයෙන් පාලන බලය ඇති පක්ෂය මෙසේ සිය බලය අනිසි ලෙස පාවිච්චි කිරීම යම් යම් මට්ටමකින් සිදුවීම අතීතයේ සිටම දක්නට ලැබුණු නමුත් ක්‍රමයෙන් මෙය උග්‍රවන අන්දම දක්නට ලැබෙන තත්ත්වයකි. මේ අනුව නීතිය බලාත්මක කිරීම පැවරී ඇති පොලීසියේ ඇතැම් නිලධාරීන් එම නීතිමය තත්ත්වයන් නොසලකා හැරීම නිසා තරග කරන අපේක්ෂකයින් මෙන්ම දේශපාලන පක්ෂ සහ ඔවුන්ගේ අනුගාමිකයින්ද නීති උල්ලංඝනය කරමින් කටයුතු කිරීම සාමාන්‍ය තත්ත්වයක් බවට පත්ව ඇත.

326. එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර තමාගේ මනාප සංඛ්‍යාව වැඩිකර ගැනීමට තමාගේ අංකය ප්‍රදර්ශනය කිරීම සඳහා ගත් උත්සාහය බෙහෙවින් දක්නට ලැබිණි. පොදු මහජනයා ගැවසෙන ස්ථානවල අපේක්ෂකයින්ගේ ඡායාරූප සහ ඔවුන්ගේ අංක විශාල ප්‍රමාණයේ කටවුට් හා පෝස්ටර් මගින් ප්‍රදර්ශනය කිරීම දක්නට ලැබිණි. තම පක්ෂයේ ඡන්ද ලකුණ තමාගේ අංකය මහා මාර්ගයේ ඇඳීම සහ මග දෙපස තාප්ප, බිත්ති, ගස් ගල් සියල්ලෙහිම අංක ප්‍රදර්ශනය කෙරෙන පෝස්ටර් ඇලවීම බෙහෙවින් දක්නට ලැබුණු තත්ත්වයකි. මධ්‍යම ගමනා ගමන මණ්ඩලයට අයත් බස් රථවල මෙන්ම පෞද්ගලික වාහන වලද ස්ටිකර් හා පෝස්ටර් මගින් පක්ෂ නායකයින්ගේ ඡායාරූප සහිතව අපේක්ෂකයින්ගේ ඡායාරූපය හා අංකය ප්‍රදර්ශනය කළ අවස්ථා බෙහෙවින් දැකිය හැකි විය. මධ්‍යම ගමනාගමන මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන සතු බස් රථ හා සෙසු වාහනවල බලයේ සිටින පක්ෂයට අදාළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශණය කරන බවට පැමිණිලි ලැබිණි.

327. මෙහිදී මැතිවරණ දෙපාර්තමේන්තුවට ගත හැකි පියවර වූයේ නීති විරෝධී බැනර්, කටවුට්, පෝස්ටර් හා ස්ටිකර් ආදිය ඉවත් කිරීමට පොලීසියට උපදෙස් දීම සහ අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන පොලීසිය වෙත ලබාදීමයි. කෙසේ වෙතත් මෙම ඡන්ද විමසීම් පළමු අදියරයේදී පූර්ව ඡන්ද විමසීමේ කාලසීමාව තුළ පෝස්ටර්, බැනර්, කටවුට් ආදී නීති විරෝධී ප්‍රචාරක කටයුතු බෙහෙවින් දක්නට ලැබුනත් ඡන්ද විමසීම් දිනට පෙරදින සිට පොලීසිය විසින් එකී අනවසර ප්‍රචාරණ දැන්වීම් ඉවත් කිරීමට පියවර ගන්නා ලදී. පූර්ව ඡන්ද විමසීම් අවධියේ නීති විරෝධී ප්‍රචාරක කටයුතු වැළැක්වීම සම්බන්ධයෙන් සමහර පොලිස් ස්ථානවල මැදිහත් වීම ප්‍රමාණවත් නොවුවද ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් හරහා නිරන්තරයෙන් සිදුකරනු ලැබූ උපදෙස් දීම් මගින් එවැනි පොලිස් ස්ථානවල උදාසීන ක්‍රියාකාරිත්වය වෙනස් කිරීමට හැකි විය. ආණ්ඩුවේ අනුග්‍රහය සහිත අපේක්ෂකයින් බලයේ සිටින ස්වකීය නායකයාගේ ඡායාරූපය සමඟ තම ඡායාරූපය ඇතුළත් පෝසටර් හා කටවුට් විශාල වශයෙන් ප්‍රදර්ශනය කිරීමේදී එකී නීති විරෝධී ප්‍රදර්ශන පුවරු හා පොස්ටර් යනාදිය ඉවත් කිරීම අපහසු වූයේ ගලවා අවසන් කළ නොහැකි ආකාරයෙන් නැවත නැවත එම පෝස්ටර්, බැනර්, කටවුට් ප්‍රදර්ශණය කිරීම නිසා බව නිරීක්ෂණය විය. එසේ වුවත් ඡන්ද විමසීම පැවැත්වීමට ආසන්න වන විටදී අනවසර ප්‍රචාරක දැන්වීම් ඉවත් කිරීමට පොලීසිය සමත් විය.

328. 2011.03.17 වැනි දින පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ පළමු වැනි අදියරයේදී ලද අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් දෙවැනි හා තුන්වැනි අදියරවලදී මෙම නීති විරෝධී ප්‍රචාරක කටයුතු වළකාලීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් මහත් පරිශ්‍රමයක් දරන ලදී. ග්‍රාම නිලධාරීන්ගේ හා නිරීක්ෂණ සංවිධාන වල සහය ඇතිව දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් කාර්යාල හරහා නීති විරෝධී ප්‍රචාරක පෝස්ටර්, බැනර්, කටවුට් ඇති ස්ථාන පිළිබඳ ලේඛනයක් ලබාගෙන පොලිස්පති වෙත සහ අදාළ පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත ඉදිරිපත් කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් නැවත සේවයට බදවා ගන්නා ලද විශ්‍රාමික නිලධාරීන්ගේ හා තාවකාලික සහායකයන්ගේ සහයද ඇතිව පොලීසියේ සහය ලබා ගනිමින් මෙම නීතිවිරෝධී ප්‍රචාරක පුවරු, බැනර්, පෝස්ටර් ගලවා ඉවත් කිරීම සිදු කරන ලදී. මෙම කාර්යයට මැතිවරණ

දෙපාර්තමේන්තුවේ නිත්‍ය කාර්ය මණ්ඩලයේ සියලුම සමාජිකයන්ගේ හා මැතිවරණ දෙපාර්තමේන්තුවට සහය වන වෙනත් රාජ්‍ය ආයතන වල ස්ථිර කාර්ය මණ්ඩල වල සමාජිකයන් රැසකගේ සහය ලද බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

329. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 81 අ (2) වගන්තියට අනුව යම් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම සඳහා පෙළපාලි/ පෙරහැර පැවැත්විය නොහැකිය. එසේ වුවද ස්වකීය බලය හා ශක්තිය පෙන්වීම සඳහා බොහෝ අපේක්ෂකයන් මෙම නීති විරෝධී කාර්යයේ යෙදීමට උත්සාහ කරනු දැකිය හැකිය.

330. එක් මහ නගර සභා කොට්ඨාසයක හිටපු නගරාධිපතිවරයෙක් හා රජයේ අමාත්‍යවරයෙක් එකිනෙකාගේ බලය පෙන්වීම සඳහා විශාල පෙළපාලි දෙකක් සංවිධානය කර තිබූ අතර මේ පිළිබඳ තොරතුරු ලැබීමෙන් පසු මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෙළපාලි නවත්වන ලෙස පොලිසියට උපදෙස් දෙන ලදී. මෙහිදී එක් පෙළපාලියක් පොලිස් නියෝගවලට අනුකූල වෙමින් මීටර් 500ක් පමණ දුරකදී නැවැත්වීමට හැකි වූ නමුත් අනෙක් පෙළපාලිය නැවැත්වීමට හැකිවී නැත. එම පෙළපාලියේ ගමන් කළ දේශපාලඥයන්ට විශේෂ පොලිස් ආරක්ෂාවක් ලැබී තිබූ බැවින් මෙය විශේෂ කාර්ය බලකායේ ආරක්ෂාව ඇතිව ගමන් කරන ලද බවට වාර්තා වූ පළමු වන නීති විරෝධී පෙළපාලිය ලෙස සඳහන් කළ හැකිය.

331. එසේම කොළොන්නාව ඡන්ද ප්‍රදේශයේ දී දේශපාලන බලය පෙන්වීමේ රථ පෙළපාලියක් හා සබැඳි වෙඩි තැබීමකින් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා ජනාධිපතිවරයාගේ වෘත්තීය සමිති කටයුතු පිළිබඳ සම්බන්ධීකාරකවරයකු වූ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතා ඇතුළු සිවුදෙනෙකු මිය ගිය අතර තවත් කිහිපදෙනෙකුට බරපතල තුවාල සිදු වූ බව වාර්තාවී තිබේ. ඒ සම්බන්ධ නඩුව තවමත් විභාග වෙමින් පවතී.

332. ඡන්ද විමසීමේ තුන්වන අදියරයේදී ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්ක වලදී වාහන විශාල සංඛ්‍යාවක් සමග නීති විරෝධී රථ පෙළපාලි පැවැත්වීමට ප්‍රාදේශීය දේශපාලනඥයින් උත්සාහ කළ අතර මැතිවරණ කොමසාරිස් විසින් අදාළ දේශපාලන පක්ෂ නායකයින් දැනුවත් කර ප්‍රාදේශීය දේශපාලනඥයින්ට නිසි උපදෙස් ලබා දී එම පෙළපාලි නවත්වන ලදී. මුදල් බලය මෙන්ම මහජන බලය තමා වෙතට ඇති බව පෙන්වීම සඳහා පවත්වන මෙවැනි පෙළපාලි යාමට ඉඩ දුන්නේ නම් කලින් සඳහන් කළ ආකාරයේ ඝාතන තවදුරටත් සිදුවීමට ඉඩ තිබුණි.

333. 1931 වර්ෂයේදී සර්වජන ඡන්ද බලය ලැබීමෙන් පසුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය හඳුන්වා දෙනතෙක් පැවති කේවල ආසන ඡන්ද ක්‍රමයේ දී අපේක්ෂකයින් විවිධ පක්ෂවලින් හෝ ස්වාධීනව තරග වැදුණ ද, පුද්ගල සාධකය ඡන්දදායකයාට තම ඡන්දය ප්‍රකාශ කිරීමේ දී වැදගත් තීරණාත්මක කාරණයක් විය. තරග කරනු ලබන දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම්වල ප්‍රතිපත්ති මත පදනම්ව ඡන්දය ප්‍රකාශ කරනු ලබන සමානුපාතික ක්‍රමයේදී ද පුද්ගල සාධකයට ප්‍රමුඛත්වය ලැබුණේ මනාප ක්‍රමය එකතු වීමෙනි. සමානුපාතික ක්‍රමයේ තිබූ සාධනීය ලක්ෂණයන් හීන වී ගොස් පැරණි ක්‍රමයේ තිබූ බැහැර කළ යුතු ලක්ෂණ තවදුරටත් මෙම මනාප ඡන්ද ක්‍රමය තුළ දී වර්ධනය විය. එබැවින් මනාප ක්‍රමයෙන් බැහැරව සමානුපාතික ඡන්ද ක්‍රමයේ ලක්ෂණ තවදුරටත් ඇතුළත් කොට්ඨාශ කේන්ද්‍ර කරගත් ඡන්ද ක්‍රමයක අවශ්‍යතාව ඇති වී ඇත.

මාධ්‍ය ආයතන වෙත උපමාන නිකුත් කිරීම

334. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත් වන සංශෝධනය අනුව ඡන්ද විමසීමක් නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වීම සහතික වනු පිණිස මැතිවරණ කොමසාරිස්වරයා විසින් සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත උපමාන නිකුත් කිරීම දාහත් වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව පැවති සියලුම ඡන්ද විමසීම්වලදී සිදු කරන ලදී.

335. මැතිවරණය හා සම්බන්ධ ප්‍රවෘත්ති හා වැඩසටහන්ද මැතිවරණ රැස්වීම් පිළිබඳ විස්තර ප්‍රචාරය කිරීමේදීද කිසිදු දේශපාලන පක්ෂයකට, අපේක්ෂකයකුට විශේෂත්වයක් නොවන පරිදි වනම් ප්‍රවර්ධනය කිරීමක් හෝ අගතියකට පත් කිරීමකින් තොරව කටයුතු කිරීමේ අවශ්‍යතා මෙම උපමාන මඟින් පෙන්වා දෙන ලදී. ලංකා චිත්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ස්වාධීන රූපවාහිනී සේවය හා ලක්හඬ ගුවන් විදුලි සේවය රාජ්‍ය මාධ්‍ය ආයතන වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වැනි සංශෝධනය යටතේ අදාළ උපමාන පිළිපැදීමට නීත්‍යානුකූලව බැඳී සිටින බව පෙන්වා දෙන ලදී.

336. 2010 වර්ෂයේ පැවති ජනාධිපතිවරණයට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම් තුනට (SCFR 957/09, SCFR 958/09, SCFR 959/09) අදාළව දෙන ලද තීරණය වූයේ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් තහවුරු කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (5) (අ) ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන උපමාන වලට එකඟව ක්‍රියා කිරීමට රාජ්‍ය හා මාධ්‍ය ආයතන බැඳී සිටින බවයි. මෙසේ උපමාන දැක්වීමෙන් පසු එම උපමාන කඩ කරන බවට මැතිවරණ කොමසාරිස්වරයා

වෙත පැමිණිලි ලැබෙන අවස්ථාවලදී ඒ පිළිබඳව අදාළ ආයතනවලින් විමසා අවශ්‍ය උපදෙස් දෙන ලදී.

337. තවදුරටත් උපමාන උල්ලංඝනය කිරීම් සිදුවුවහොත් අදාළ මාධ්‍ය ආයතන වෙත නමින් හෝ නිලයෙන් නිසි බලධරයෙකු පත් කිරීමට දාහත් වන ව්‍යවස්ථා සංශෝධනයෙන් කොමිෂන් සභාව වෙත බලය පැවරිණ. එහෙත් මෙම ඡන්ද විමසීමේ පළමුවන අදියරේදී සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත උපමාන නිකුත් කිරීම සිදු කළ මුත් උපමාන කඩකරන්නවුන්ට අවවාද කිරීමක් විනා නිසි බලධරයෙකු පත් කිරීමට උත්සාහ නොගත් බව සඳහන් කළ යුතුය. 2010 ජනාධිපතිවරණය අවස්ථාවේ මාධ්‍ය ආයතන විසින් උපමාන කඩ කිරීම නිසා නිසි බලධරයෙකු පත් කළත් එම නිසි බලධරයා විසින් මාධ්‍ය ආයතන වෙත කරන ලද මඟ පෙන්වීම කෙරෙහි කිසිදු සැළකිල්ලක් නොදක්වමින් දිගින් දිගටම උපමාන උල්ලංඝනය කිරීමේ යෙදුන බැවින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිසි බලධරයාගේ කටයුතු නතර කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මාධ්‍ය ආයතන උපමාන උල්ලංඝනය කරන්නේ නම් එම ආයතනවල පරිපාලනය නිසි බලධරයා වෙත පැවරිය හැකිය. එහෙත් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වැනි ආයතනවල පරිපාලනය නිසි බලධරයෙකු වෙත පවරා කටයුතු කිරීමට තරම් යාන්ත්‍රණයක් මැතිවරණ දෙපාර්තමේන්තුවට නොමැත.

338. කෙසේ වෙතත් දාහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් මාධ්‍ය ආයතන පාලනය සඳහා නිසි බලධරයෙකු පත්කිරීම සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැවරී තිබුණු බලතල දාහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉවත් කර ඇත. ඒ අනුව ඡන්ද විමසීමේ දෙවැනි අදියරේදී විද්‍යුත් මාධ්‍ය ආයතන ප්‍රධානීන් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත කැඳවා ඡන්ද විමසීමකදී නාමයෝජනා දැන්වීමේ සිට ප්‍රතිඵල ප්‍රකාශ කිරීම දක්වා වන ඡන්ද විමසීම් කාලපරිච්ඡේදය තුළ මාධ්‍ය හැසිරිය යුතු ආකාරය පිළිබඳව මාධ්‍ය උපමාන පැහැදිලි කර දෙන ලදී. එමඟින් රාජ්‍ය මාධ්‍ය ආයතන පමණක් නොව සියලුම මාධ්‍ය ආයතන මෙම උපමාන පිළිපැදිය යුතු බවත් අන්‍යනෝන්‍ය අවබෝධයකින් යුතුව මාධ්‍ය හැසිරවීමේ අවශ්‍යතාවත් පෙන්වා දෙන ලදී.

339. පෝස්ටර්, බැනර්, කටවුටි ඉදිකරමින් නීති විරෝධී ලෙස මැතිවරණ ප්‍රචාරණ කාර්යයේ යෙදෙන දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින් මාධ්‍ය භාවිතයේදීද උපමානවලට එකඟව කටයුතු කිරීමක් දක්නට නොලැබිණ. විශේෂයෙන් රාජ්‍ය අනුග්‍රහය සහිත අපේක්ෂකයින් වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මෙන්ම පුවත්පත්වලින්ද පුළුල් ප්‍රචාරයක් ලබා දෙනු දක්නට ලැබිණ. එහෙත් ඉහත තත්ත්වය යටතේ මාධ්‍ය උපමාන කඩකිරීම් සම්බන්ධයෙන් දේශපාලන පක්ෂවලින් හෝ වෙනත් අංශයකින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අදාළ මාධ්‍ය ආයතන දැනුවත් කර එබඳු පැමිණිලි නොලැබෙන පරිදි කටයුතු කරන ලෙස අදාළ මාධ්‍ය ආයතන වෙත තරයේ උපදෙස් දෙන ලදී.
(උපලේඛන 4)

වත්කම් හා බැරකම් ප්‍රකාශය පිළිබඳ නියමය ක්‍රියාත්මක කිරීම

340. 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ (සංශෝධන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ පනතේ විධිවිධානවලින් ඡන්දවිමසීමක් සඳහා තරඟකරන සියලුම අපේක්ෂකයින් නාමයෝජනා දිනට තමාගේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය නාමයෝජනා දින සිට සහිකයකු වශයෙන් දිවුරුම් දීමට පෙර සහ පරාජිත අපේක්ෂකයින් නාමයෝජනා දින සිට මාස තුනක් ඇතුළත මැතිවරණ කොමසාරිස්වරයා වෙත භාර දියයුතුය. අදාළ පනතට අනුව සියලුම අපේක්ෂකයන් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ඡන්ද විමසීම් අදියර තුනේදීම අපේක්ෂකයින් දැනුවත් කරන ලද නමුත් පළමු වැනි හා දෙවැනි අදියරවලදී අපේක්ෂකයන් වැඩිදෙනෙකු වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේලා උත්සුක නොවූ බව සඳහන් කළ යුතුය. එහෙත් තුන්වන අදියරේදී වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකරන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියාමාර්ගවලට එළඹෙන බවත් ජයගත් සියලුම අපේක්ෂකයින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසත් එතෙක් සහිකධුර ගැසට් පත්‍රයේ පළ කිරීම පමා කරන බවත් මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කෙරිණි. ඒ අනුව 2011.10.08 වැනි දින පැවති ඡන්දවිමසීමේ තුන්වැනි අදියර සඳහා තරඟ කර සහිකධුර හිමිකරගත් සියලුම අපේක්ෂකයන් වෙතින් නියමිත පරිදි සහිකධුර ගැසට් පත්‍රයේ පළ කිරීමට පෙර වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගත හැකි විය.
(පර්ශිෂ්ඨ 50,51)

341. 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වැනි වගන්තිය අනුව එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් හා නාමයෝජනා පත්‍රයක නම් දක්වා ඇති එක් එක් තැනැත්තා සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ එකී පනතින් නියම කරනු ලැබූ ආකෘතියට අනුකූල වූ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් එකී නාමයෝජනා පත්‍රය භාරදීමෙන් මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය යනුවෙන් සඳහන් වේ. මෙහි "1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත" යන්න "1988 අංක74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ සංශෝධන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975

අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත" යනුවෙන් සඳහන් කිරීම වඩාත් සුදුසුය. කිසියම් අපේක්ෂකයකු නාමයෝජනා භාරදීමෙන් මාස තුනක් ඇතුළත මෙය ඉදිරිපත් නොකළහොත් ගත යුතු පියවර පිළිබඳව ඉදිරි සංශෝධනයකදී අවධානය යොමු වීම අත්‍යවශ්‍යය.

342. වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීමේ අරමුණ වන්නේ එම ප්‍රකාශය ලබා දීමෙන් අනතුරුව කිසියම් පුද්ගලයකු අයථා අන්දමින් සිය වත්කම් වැඩි කර ගෙන තිබේදැයි පරීක්ෂා කිරීම අවශ්‍ය වන අවස්ථාවක විවෘත කර බැලීම සඳහා බැවින් පරාජිත අපේක්ෂකයින්ගෙන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීමේ අවශ්‍යතාවක් නොමැති බවට සිදුකෙරෙන ප්‍රකාශ වලට එකඟවිය නොහැක. මක් නිසාදයත් සියලුම අපේකෂකයන් අයුතු ලෙස ධනය රැස්කර ගෙන ඇති බවට පැමිණිලි ලැබීම වළක්වා ගැනීම යහපත් දේශපාලන සංස්කෘතියකට අවශ්‍ය බැවිනි.

343. යම්කිසි අපේක්ෂකයකු වත්කම් බැරකම් ප්‍රකාශ ලබා නොදුනහොත් හෝ ව්‍යාජ තොරතුරු ලබාදුනහොත් හා ඒ බව අධිකරණයේදී සනාථ වී ඒ සම්බන්ධයෙන් වැරදිකරුවන් වුවහොත් එම අපේක්ෂකයාගේ (හෝ අදාළවන විට මහජන නියෝජිතයා) යම්කිසි නිශ්චිත කාලසීමාවක් ගතවන තෙක් ඡන්ද විමසීමකට ඉදිරිපත් විය නොහැකි බවට නීති සැකසිය යුතු බවට දේශපාලන පක්ෂ නිත්‍ය නියෝජිත සාකච්ඡාවලදී මතු කරන ලද අදහස ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

පැමිණිලි විමර්ශන මධ්‍යස්ථාන පිහිටුවීම

344. ඡන්ද විමසීම් අදියර තුනේදීම මැතිවරණ නීතිය බලාත්මක කිරීමේ පියවරක් වශයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලයේ සහ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවල පැමිණිලි භාර ගැනීමේ හා විමර්ශනය කිරීමේ ඒකක ඇති කරන ලදී. ඡන්ද විමසීමේ පළමු වැනි අදියරේදී නාමයෝජනා දැන්වීම පළ කළ දින සිටම ලිඛිත පැමිණිලි භාර ගැනීම සිදු කරනු ලැබූ නමුත් පැමිණිලි විමර්ශන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරන ලද්දේ ඡන්ද විමසීම් දින හා ඊට පෙර දින පමණි. පූර්ව ඡන්ද විමසීම් දිනවල ලිපි මගින් හා ෆැක්ස් මගින් ලැබෙන පැමිණිලි එම පැමිණිල්ලේ ස්වරූපය අනුව පොලිස්පතිවරයා සහ අදාළ බලධාරීන් වෙත යොමු කිරීමත් එම පැමිණිල්ල සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ගය පිළිබඳ වාර්තා ලබා ගැනීමත් සිදු කෙරිණ. ඡන්ද විමසීම් දිනට පෙර දින හා ඡන්ද විමසීම් දිනයෙහි මැතිවරණ මහලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් කිහිප දෙනකුගේ හා පොලිස් සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනකුගේ මෙහෙයවීම යටතේ පැමිණිලි විමර්ශන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරන ලදී. මෙම විමර්ශන මධ්‍යස්ථානයට එම ඡන්ද විමසීම සඳහා තරග කරන පක්ෂවලින් හා අනුමැතිය ලැබූ නිරීක්ෂණ ආයතනවලින්ද නියෝජිතයින්ට සහභාගී වන ලෙස ආරාධනය කරන ලදී. ඒ අනුව ලිපි මගින්, ෆැක්ස් මගින් හෝ දුරකථනයෙන් ලැබෙන පැමිණිලි පිළිබඳ එසැනින් ක්‍රියාත්මක වීමේ හැකියාවක් ලැබිණ. මීට සමගාමීව ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේද සම්බන්ධීකරණ කාර්යාලයක් පවත්වා ගෙන ගිය අතර ඊට අනුබද්ධිතව ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලද සම්බන්ධීකරණ ඒකක පිහිටුවන ලදී. මේ මගින් ගම් මට්ටම හා දිස්ත්‍රික් මට්ටම මැතිවරණ මහලේකම් කාර්යාලය සමඟ යා කෙරෙන ජාලයක් තුළින් ලැබෙන පැමිණිලි පිළිබඳ වහා ක්‍රියාත්මක වී ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම කඩිනම් කෙරිණ.
(පරිශිෂ්ඨ 52,53)

345. ඡන්ද විමසීමේ දෙවැනි හා තුන්වැනි අදියරවලදී නාමයෝජනා දිනට පසු දින සිට ඡන්ද විමසීම අවසන් දින දක්වා සම්පූර්ණ ඡන්ද විමසීම් කාලපරිච්ඡේදය තුළම මෙම පැමිණිලි විමර්ශන මධ්‍යස්ථානය ක්‍රියාත්මක විය. ඒ මගින් කිසියම් පක්ෂයක හෝ අපේක්ෂකයකුගේ ජයග්‍රහණය වෙනුවෙන් රාජ්‍ය දේපළ වැනම් රජයේ වාහන, රජයේ ගොඩනැගිලි, රජයේ භූමි හා රාජ්‍ය නිලධාරීන් යොදවා ගැනීම පිළිබඳව හා රාජ්‍ය උත්සව මුවාවෙන් සිදු කරනු ලබන දේශපාලන ප්‍රචාරක කටයුතු පිළිබඳවත් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත ලැබෙන පැමිණිලි පිළිබඳව වහා අවශ්‍ය පියවර ගත හැකි විය. ඊට අමතරව නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් පනතේ 81 වගන්තිය කඩකරමින් අපේක්ෂක ඡායාරූපය සහ අපේක්ෂක අංකය සහිතව කටවුට්, බැනර්, පෝස්ටර් මගින් ගෙන යන නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කාර්යයන් පිළිබඳව පොලිස්පතිවරයා දැනුවත් කර වහා එම නීති විරෝධී ප්‍රචාරක කටයුතු අත්හිටුවීමට පියවර ගන්නා ලදී. නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු අතර නීති විරෝධී කාර්යාල පිහිටුවීම, පූර්ව අවසරය ලබා ගත් පක්ෂයකින් අපේක්ෂකයින් වෙනුවෙන් නොව වෙනත් ජනප්‍රිය අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරය සඳහා එම කාර්යාල යොදා ගැනීම සහ ඇතැම් අපේක්ෂකයින් ප්‍රදේශයේ ජනප්‍රිය පුද්ගලයින්ගේ ඡායාරූපය සහිතව තමාගේ අංකය ප්‍රසිද්ධ කිරීම සඳහා අත් පත්‍රිකා බෙදා හැරීම වැනි වංචනික ක්‍රියාද හඳුන්වා දිය හැකිය. මෙම නීති විරෝධී ප්‍රචාරක කටයුතු සියල්ල වළකාලීමට ගත හැකි සියලු පියවර ගන්නා ලදී. කෙසේ හෝ පොලීසියේද සහාය ඇතිව වහා ක්‍රියාත්මක වීම සඳහා ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලද එයට අමතරව ප්‍රචණ්ඩකාරී ක්‍රියා/ මැතිවරණ දුෂණ ඇතිවිය හැකි බවට නැතහොත් සිදුවන බවට පැමිණිලි ලද පළාත් පාලන ආයතන බලප්‍රදේශවල පිහිටි ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලද නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගේ මෙහෙය වීම යටතේ ඒවන විට සේවයේ නියුතුව සිටි හෝ නැවත සේවයට කැඳවූ විශ්‍රාමික මාණ්ඩලික නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් පැමිණිලි විමර්ශනය කිරීම සඳහා සහ නීති විරෝධී ප්‍රචාරක කටයුතු ඇතුළු මැතිවරණ නීති කඩ කිරීම වැලැක්වීමේ මධ්‍යස්ථාන පිහිටුවන ලදී.

346. මැතිවරණ පැමිණිලි විමර්ශන මධ්‍යස්ථානවල ලිපිනයන්/ දුරකථන අංක පිළිබඳව විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය ඔස්සේ පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී. මෙම ක්‍රියාදාමය තුළින් නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු හා නීති කඩ කිරීම සම්බන්ධව සියලු පුරවැසියන්ට සෘජුවම තොරතුරු ලබා දීමට හැකි වූ අතර, එවැනි පැමිණිලි පිළිබඳව වහාම අවශ්‍ය පියවර ගැනීමට ක්‍රියා කිරීම නිසා මැතිවරණ නීති රීති උල්ලංඝනය කිරීමට තරග කරනු ලබන අපේක්ෂකයන් ද මැලිකමක් දක්වන ලදී. මැතිවරණ නීති බලාත්මක කිරීමේ මෙවැනි ක්‍රමවේද ස්ථාපිත කිරීම තුළින් පොදු මහජනතාව ඇතුළු දේශපාලන ක්‍රියාකාරීන් ද නිදහස් හා සාධාරණ අයුරින් ඡන්ද විමසීම් පැවැත්වීම කෙරෙහි පමණක් නොව සමස්ථ මැතිවරණ ක්‍රමය පිළිබඳවම පැහැදීමක් ඇති වූ බව ප්‍රකාශ කරමි.

පසු විමර්ශන කටයුතු

347. ඡන්ද විමසීමකදී දේශපාලන නායකත්වය වෙතින් සකස් වන ප්‍රධානතම වූත් අතිශය වැදගත් වූත් ලියවිල්ල නාමයෝජනා පත්‍රයයි. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමකදී අදාළ පක්ෂය හෝ කණ්ඩායම යටතේ තරගයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පුද්ගලයින්ගේ නම් සහ අපේක්ෂිත තොරතුරු ඇතුළත් කරන නාමයෝජනා පත්‍රය නියමිත ඇමුණුම්ද සහිතව නීතියෙන් නියම වී ඇති කාලසීමාව තුළදී නීත්‍යානුකූලව බලය ඇති පුද්ගලයකු විසින් අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත භාර දිය යුතුය.

348. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 9 වැනි වගන්තියෙන් පළාත් පාලන ආයතනයක සභිකධුරයක් දැරීම සඳහා නුසුදුසුකම් කවරේදැයි දක්වා ඇති අතර 28 වන වගන්තියෙන් නාමයෝජනා පත්‍රය සකස් කළ යුතු ආකාරය, භාර දිය යුතු කාලසීමාව සහ භාරදිය යුත්තේ කවුරුන් විසින් කාවෙතද යන්නත් නාමයෝජනා පත්‍රය සමග භාර දිය යුතු ඇමුණුම් කවරේද යන්නත් දක්වා ඇත. නාමයෝජනාවක් ප්‍රතික්ෂේප වන්නේ කවර හේතූන් මතද යන්න 31 වන වගන්තියෙහි දක්වා ඇත.

349. එහෙත් 2011 වර්ෂයෙහි පැවති මෙම ඡන්ද විමසීමේ පළමු වැනි අදියර යටතේ භාරගනු ලැබූ නාමයෝජනා පත්‍ර 2,047 න් 452 ක් පනතේ 28 වැනි වගන්තියට අනුකූලව ඉදිරිපත් නොවීම නිසා 31 වගන්තිය යටතේ ප්‍රතික්ෂේප විය. එම නාමයෝජනා ප්‍රතික්ෂේප වීමට හේතු සලකා බැලීමේදී නොසැලකිල්ල හා අනවධානය බොහෝ දුරට හේතු වී ඇති බව අනාවරණය විය.

350. තම පක්ෂයේ ජයග්‍රහණය තහවුරු කර ගනු පිණිස ප්‍රධාන පක්ෂ විසින් අමතර පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් කිහිපයක් තරගයට ඇතුළත් කිරීම සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීමෙන් පසුව පවත්වන ලද ඡන්ද විමසීම්වලදී බෙහෙවින් දක්නට ලැබුණ තත්ත්වයකි. එබඳු පක්ෂ හා කණ්ඩායම් ඉදිරිපත් කිරීමේදී නාමයෝජනා පත්‍රයෙහි ව්‍යාප නම් පවා ඇතුළත් කර තිබූ අවස්ථා දක්නට ලැබිණ.එම නාමයෝජනා පත්‍ර සකස් කිරීමේදී එතරම් සැලකිල්ලක් නොදැක්වීමද මෙසේ නාමයෝජනා විශාල සංඛ්‍යාවක් ප්‍රතික්ෂේප වීමට හේතු වූවා විය හැකිය. ප්‍රතික්ෂේප වූ නාමයෝජනා 452 අතුරින් නාමයෝජනා 68ක් සම්බන්ධයෙන් පමණක් අධිකරණ ක්‍රියාමාර්ගවලට එළඹීම ද මේ තත්ත්වය තහවුරු කරන්නකි.

351. නාමයෝජනා විශාල ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වුවද ඒ පිළිබඳව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙතින් තොරතුරු රැස්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රතික්ෂේප වීමට පාදක වූ කරුණු හා අදාළ පුද්ගලයන් පිළිබඳව සොයා බලා කඩිනමින් අවශ්‍ය පියවර ගැනීමට හැකිවීම මෙම ඡන්ද විමසීමේ විශේෂත්වයකි. 2011.03.17 දින ඡන්ද විමසීම අවසන් වූ වහාම ප්‍රතික්ෂේප වූ නාමයෝජනා පිළිබඳවත් ප්‍රතික්ෂේප වීමට හේතු වූ කරුණු කවරේද යන්නත් එසේ ප්‍රතික්ෂේප වූයේ කාගේ නොසැලකිල්ල නිසාද යන්නත් පිළිබඳව තවදුරටත් කරුණු සොයා බලන ලදී. ප්‍රතික්ෂේප වූ නාමයෝජනා 452 න් 233 ක් ප්‍රතික්ෂේප වී ඇත්තේ තරුණ අපේක්ෂකයින්ගේ වයස සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් නොකිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7 වැනි උපලේඛනයට අනුව දිවුරුම/ ප්‍රතිඥාව විධිමත්ව ඉදිරිපත් නොකිරීම යන හේතු මත බව අනාවරණය විය.

352. මේ අනුව කරන ලද පරීක්ෂාවේදී සාමදාන විනිශ්චයකරුවන් 43 දෙනකු අදාළ දිවුරුම් ප්‍රකාශ සහතික කර තම අත්සන යෙදීමේදී ඊට අදාළ ප්‍රකාශය නිවැරදිද ප්‍රකාශක අත්සන් කර තිබේද ප්‍රකාශකගේ නම නිවැරදිව සඳහන්ද තමා විසින් අත්සන සමඟ තමාගේ නිල මුද්‍රාව තබා තිබේද ආදී කිසිවක් පිළිබඳව සැලකිමත් වී නොමැත. එම සියලුම සාමදාන විනිශ්චයකරුවන් පිළිබඳව සම්පූර්ණ තොරතුරු අධිකරණ අමාත්‍යංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරමින් සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් තනතුරෙහි ගෞරවය ආරක්ෂා කළ යුතු බවත් නැති වී ගිය මහජන විශ්වාසය නැවත ඇතිකළ යුතු බවත් එබැවින් මෙම සාමදාන විනිශ්චයකරුවන් සම්බන්ධයෙන් සුදුසු විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් දැනුම් දෙන ලදී. ඡන්ද විමසීමකදී මෙසේ පසු විපරම් කර අදාළ නිලධාරීන් දැනුවත් කිරීම හා විනයානුකූල පියවර ගැනීම ඉදිරි මැතිවරණ සම්බන්ධයෙන් ගනු ලැබූ සුභදායී පියවරක් වශයෙන් පෙන්වා දිය හැකිය.

353. කෙසේ වෙතත් නාමයෝජනා පත්‍රයට නම් ඇතුළත් කිරීම සඳහා, අපේක්ෂකයින් තෝරා ගැනීමේදී පනතේ 9 වැනි වගන්තියේ ප්‍රකාර සුදුසුකම් කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් ඡන්ද විමසීමේදී සභිකධුර හිමිකරගත් කිහිප දෙනෙකුගේම සභිකත්වය අහිමි කිරීමට පවා සිදුවිය.

354. 262 වැනි අධිකාරයේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 9(1)ඈ(v)(අ)(ආ), 9(1)ඈ(vi)(අ), (ආ),(ඇඇ),(ඉ)(ඊ) සහ 9(3) වගන්ති යටතේ සහිකත්වය සඳහා නුසුදුසු පුද්ගලයින් කිසිවෙකු සහිකධුරයකට පත්වී ඇතැයි කරුණු ඉදිරිපත් කරමින් වීවන ලද මහජන පැමිණිලි අනුව දිස්ත්‍රික් මට්ටමින් කරුණු සොයාබලා මෙම පියවර ගන්නා ලදී.

355. මේ අනුව අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයකු වශයෙන් සිටියදී වීම පළාත් පාලන ආයතනය සඳහා තරග කිරීම නිසා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 9 (1) (ඉ) වගන්තිය යටතේ තරග කිරීමට නුසුදුස්සකු වන බැවින් වී යටතේ මාතර ප්‍රාදේශීය සභාව, තමන්කඩුව ප්‍රාදේශීය සභාව, කන්තලේ ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන සඳහා තරගකර සහිකධුර හිමිකරගත් තිදෙනෙකුගේ සහිකත්වය අහිමි කිරීමට සිදුවිය.

356. පළාත් පාලන ආයතන ඡන්දවිමසීම් ආඥාපනතේ 9 වැනි වගන්තියෙහි යම් විධානයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් පළාත් පාලන ආයතනයක යම් සහිකයකු වී ආයතනයේ සහිකයකු වශයෙන් අසුන්ගැනීමට හෝ ඡන්දය දීමට නුසුදුස්සකු වුවහොත් ඔහුගේ ආසනය හෝ ධුරය වනයින්ම හිස් විය යුතුයයි 10(1) වගන්තියෙහි දක්වා ඇත.

357. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10(1) වගන්තිය අනුව සහිකධුර අහිමි වීම හේතුවෙන් පුරප්පාඩු වූ සහිකධුර සඳහා 10(2) වගන්තිය යටතේ ක්‍රියාකර වීම පුරප්පාඩු පිරවිය යුතුය. මීට ඉහත පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලදී 9 වැනි වගන්තිය යටතේ සහිකධුර දැරීම සඳහා නුසුදුසු වූ පුද්ගලයින් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් සෘජු ක්‍රියාමාර්ගවලට නොවිළඹුනු බවද සඳහන් කළ යුතුය.

358. මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී සහිකත්වයට නුසුදුසු වූවන් සම්බන්ධයෙන් සෘජුවම අවශ්‍ය පියවර ගැනීම හේතුවෙන් ඊට පසුව පවත්වන ලද 2011 පළාත් පාලන ආයතන ඡන්දවිමසීම් 3 වැනි අදියරේදී හා 2012 පැවති පළාත් සභා ඡන්ද විමසීම්වලදී සහිකත්වය සඳහා සුදුස්සන් නාමයෝජනා කිරීම පිළිබඳව දේශපාලන බලධාරීන්ගේ විශේෂ අවධානය යොමු වීමක් දක්නට ලැබීම සතුටුදායක තත්ත්වයකි.

359. මාණ්ඩලික මට්ටමේ යම් තනතුරක් දරන රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථා නිලධරයකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයකු අපේක්ෂකයකු වශයෙන් තරග කරන්නේ නම් නාමයෝජනා භාර දීමට පෙර ඔහු හෝ ඇය දරන වීම තනතුරෙන් ඉල්ලා අස්විය යුතුය යන නියමයක් සහ දේශපාලන අයිතිවාසිකම් ඇති රාජ්‍ය, රාජ්‍ය සංස්ථා සහ පළාත් පාලන නිලධාරීන් සහ සේවකයින් නාමයෝජනා භාරදීමට සතියකට පෙර වැටුප් රහිත නිවාඩු අනුමත කරවා ගෙන තිබිය යුතුය යන නියමයන් පනතේ දක්වා ඇත.

360. අපේක්ෂකයින් වශයෙන් තරග කර තේරීපත් වූ දේශපාලන හිමිකම් ඇති වීහෙත් නාමයෝජනා භාරදීමට පෙර නිවාඩු අනුමත කර නොගත් රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් නාමයෝජනා භාරදීමට සතියකට පෙර සිට වැටුප් රහිත නිවාඩු මත තබන ලෙස අදාළ බලධාරීන් වෙත උපදෙස් දෙන ලදී.

XVI වැනි කොටස

ඡන්ද විමසීම වෙනුවෙන් දරන ලද වියදම

361. දිවයින පුරා පිහිටි පරිපාලන දිස්ත්‍රික්ක 25 ක අදියර තුනකින් පවත්වන ලද මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ඡන්දහිමියන් 13,656,523 දෙනෙකු වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සලසා ඡන්ද විමසීමෙන් පසු ඡන්ද ගණන් කිරීම සිදුකොට ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන ලදී. ඒ වෙනුවෙන් වැය වූ මුළු මුදල රුපියල් මිලියන 2,126.80 කි. ඒ අනුව මෙම ඡන්ද විමසීමේදී ලියාපදිංචි එක් ඡන්ද දායකයකු වෙනුවෙන් දරන ලද වියදම රුපියල් 155.74 කි.

362. මෙම ඡන්ද විමසීමේදී පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම රුපියල් මිලියන 677.7 කි. ඡන්ද විමසීම වෙනුවෙන් වැය කළ මුළු මුදල වූ රුපියල් මිලියන 2,126.80 න් රුපියල් මිලියන 1,449 ක්, එනම් මුළු වියදමින් 68.14% ක් සෘජුවම මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් දරන ලදි.

363. මෙම ඡන්ද විමසීමේ කටයුතු වෙනුවෙන් සෘජුවම ඡන්ද විමසීමට අදාළ සේවා ඉටුකළ මැතිවරණ කොමසාරිස්වරයා විසින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් රජයේ දෙපාර්තමේන්තු හතරක් විය. එම දෙපාර්තමේන්තු හතර පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වේ. මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා වැය වූ මුළු මුදලින් මෙම දෙපාර්තමේන්තු වැය කරන ලද මුදල ප්‍රතිශතයක් වශයෙන් පහත දැක්වේ.

දෙපාර්තමේන්තුව	වැය කළ මුදල රු.	ප්‍රතිශතය
පොලිස් දෙපාර්තමේන්තුව	318,200,000.00	14.96%
තැපැල් දෙපාර්තමේන්තුව	209,000,000.00	09.83%
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	147,013,899.19	6.91%
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	3,511,538.84	0.16%
එකතුව	**667,725,438.03**	**31.86%**

364. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, මෙම ඡන්ද විමසීම වෙනුවෙන් රුපියල් 147,013,899.19 ක් වැය කර ඇති අතර එම මුළු වියදමෙන් රුපියල් 63,436,642.27 ක් වැය වී ඇත්තේ ඡන්ද පත්‍රිකා සහ ද්විත්ව ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහාය. ඊට අමතරව නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා මුද්‍රණය කර ගැනීම සඳහා පෞද්ගලික අංශයට රුපියල් 13,591,274.33 ක් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් වැය කර ඇත.

365. මෙම ඡන්ද විමසීමේදී පොලිස් දෙපාර්තමේන්තුව දරන ලද වියදම රුපියල් 318,200,000.00 කි. ඉන් රුපියල් 2,625,600.00 ක් ඡන්ද විමසීමට අදාළව විශේෂ කාර්ය බලකාය හා රාජ්‍ය බුද්ධි සේවය විසින් ඡන්ද විමසීමට අදාළව සිදුකළ කාර්යයන් සඳහා ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීමටය. පොලිස් දෙපාර්තමේන්තුව වෙත වෙන්කළ ප්‍රතිපාදන වලින් වියදම් වූ මුදලින් රුපියල් මිලියන 105 ක් පොලිස් නිලධාරීන්ගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනා වෙනුවෙන් ද, රුපියල් මිලියන 103 ක් පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය අමතර වාහන මැතිවරණ කොමසාරිස්වරයාගේ අවසරය ඇතිව මැතිවරණ රාජකාරී සඳහා කුලී පදනම යටතේ ලබා ගැනීම වෙනුවෙන්ද, රුපියල් මිලියන 57 ක් පොලිස් දෙපාර්තමේන්තුවේ වාහන සඳහා ඉන්ධන යෙදවීම වෙනුවෙන්ද වැය කර තිබුණි. ඊට අමතරව නීති විරෝධී දැන්වීම්, බැනර්, කටවුට් ආදිය ඉවත් කිරීම සඳහා රුපියල් මිලියන 21 ක්ද, පොලිස් නිලධාරීන්ගේ සුබ සාධන කටයුතු සඳහා රුපියල් මිලියන 18 ක්ද වැය කර ඇත.

366. ඡන්ද විමසීම් අවස්ථාවලදී තැපැල් දෙපාර්තමේන්තුව මගින් ඉටු කරවා ගතයුතු විශේෂ රාජකාරී වෙනුවෙන් එම දෙපාර්තමේන්තුවට මැතිවරණ කොමසාරිස්වරයා විසින් මුදල් ප්‍රතිපාදන වෙන්කර දෙනු ලැබේ. ඒ ආකාරයට මෙම ඡන්ද විමසීම වෙනුවෙන් රුපියල් 209,000,000.00 ක් තැපැල් දෙපාර්තමේන්තුවට වෙන්කර දී තිබුණි. මෙම ප්‍රතිපාදන උපයෝගි කරගෙන මුද්දර හා තැපැල් ගාස්තු වශයෙන් රුපියල් මිලියන 205 ක් ද, සේවක අතිකාල වශයෙන් රුපියල් මිලියන 2.6 ක්ද, දුරකථන හා වෙනත් වියදම් සඳහා රුපියල් මිලියන 1.3 ක් ද වියදම් දරා තිබුණි.

367. මෙම ඡන්ද විමසීමේදී වියදමේ ස්වභාවය අනුව ඡන්ද විමසීමේ වියදම පහත පරිදි වර්ගීකරණය කර දැක්විය හැකිය.

වියදමේ ස්වභාවය	වැය කළ මුදල රු.	ප්‍රතිශතය
කාර්ය මණ්ඩලය වැටුප්, අතිකාල ගමන් වියදම් හා දීමනා	1,036,088,173.93	48.72%
වාහන කුලී	150,227,200.94	7.06%
ලිපි ද්‍රව්‍ය/ කාර්යාල භාණ්ඩ	31,115,530.92	1.46%
ඉන්ධන	116,404,876.9	5.47%
ඉදිකිරීම් හා අළුත්වැඩියා	34,609,118.05	1.63%
සුභසාධන වියදම්	136,558,279.57	6.42%
මුද්‍රණ වියදම්	162,428,673.52	7.64%
නීති විරෝධී ප්‍රදර්ශන ඉවත් කිරීම	21,190,200.00	1.00%
මුද්දර හා තැපැල් ගාස්තු	205,088,020.00	9.64%
විදුලිය	78,217,063.94	3.68%
ජලය, දුරකථන ඇතුළු සේවා හා වෙනත් වියදම්	154,885,200.21	7.28%
එකතුව	**2,126,812,337.98**	**100.00%**

368. මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා වියදම් වූ මුළු මුදලින් 48.72% ක ප්‍රමාණයක් වූ වැඩිම ප්‍රතිශතය කාර්ය මණ්ඩල ගෙවීම් සඳහා දැරීමට සිදුවී ඇති බව පෙන්වා දිය හැකිය. ඊළඟ වැඩිම වියදම් ප්‍රතිශතය පිළිවෙලින් මුද්දර හා තැපැල් ගාස්තු සඳහා 9.64% ක් ද, මුද්‍රණ කටයුතු වලට 7.64% ක් ද, ජලය, දුරකථන ඇතුළු ඡන්ද පොළ හා ගණන්කිරීමේ ශාලාවල සේවා සඳහා 7.28% ක් ද, වාහන කුලී සඳහා 7.06% ක් ද, සුබ සාධන වියදම් සඳහා 6.42% ක් ද, ඉන්ධන සඳහා 5.47% ක් ද, විදුලිය සඳහා 3.68% ක් ද වේ. ඡන්ද විමසීම වෙනුවෙන් දරන ලද වියදම් පිළිබඳව සවිස්තර වාර්තාවක් උපලේඛනයෙහි ඇතුළත් කර ඇත.
(උපලේඛන 5)

XVII වැනි කොටස

නිරීක්ෂණ හා නිර්දේශ

369. ආණ්ඩු බලය සහිත පක්ෂය එම බලය අනිසි ලෙස යොදා ගැනීම කවදත් සුලබව දක්නට ලැබුණු තත්ත්වයකි. ඒ තත්ත්වය දිනෙන් දින වැඩිවීමක් මිස අඩු වීමක් දක්නට නොලැබිණ. 1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟ එතෙක් පාර්ලිමේන්තුවට සහ පළාත් පාලන ආයතනවලට පමණක් සීමා වී තිබූ පාලන අධිකාරියට 1978 ව්‍යවස්ථාවත් සමඟ ජනාධිපතිවරයකුද පසුව පළාත් සභා ක්‍රමයක්ද එක් විය. ඒ අනුව කිසියම් ඡන්ද විමසීමක් පැවැත්වෙන අවස්ථාවක මහජන නියෝජිතයින් රාශියක් තම පක්ෂයේ අපේක්ෂකයින්ගේ ජයග්‍රහණය වෙනුවෙන් ඉදිරිපත් වීම වැළකිය නොහැකි තත්ත්වයට පත්ව ඇත. විශේෂයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟ බිහිවූ සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය නිසා එතෙක් කොට්ඨාසවලට බෙදා වෙන් කළ එක් එක් කොට්ඨාසයේ ඡන්දවලින් තේරී පත්වන පුද්ගලයකු කොට්ඨාසය නියෝජනය කිරීම සඳහා තෝරා පත් කර ගනු ලැබූ නමුත් සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ මුළු පළාත් පාලන ආයතනයම ඡන්ද විමසීම් ප්‍රදේශය වශයෙන් සලකා කටයුතු කළ යුතුවිය. පළාත් පාලන ආයතන බල ප්‍රදේශය පුරා සියලුම අපේක්ෂකයින් තම මැතිවරණ ව්‍යාපාරය කළ යුතු වේ. එනිසා පක්ෂ නායකත්වය විසින් තම පක්ෂයේ අපේක්ෂකයින් වශයෙන් තෝරා ගැනීමේ පවා ආර්ථික වශයෙන් ශක්තිමත් කවර හෝ ක්‍රමයකින් සමාජයේ ජනප්‍රියත්වයක් ලබා ඇති කවර මාර්ගයකින් හෝ ඉදිරියට යා හැකි පුද්ගලයින් අපේක්ෂකයින් වශයෙන් තෝරා ගැනීම හා එයට අමතර ප්‍රමුඛ දේශපාලනඥයින්ගේ සමීපතම ඥාතීන්ට අපේක්ෂකත්වය ලබා ගැනීම සඳහා වැඩි අවස්ථාවක් හිමි වන බවත් බෝහෝ විට දැකිය හැකි විය. තවද ඡන්ද විමසීම අවසන් වී කෙටි කලක් ඇතුළත පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් හා සභිකයින් ගණනාවට නොයෙකුත් අන්දමේ විෂමාචාර පිළිබඳව චෝදනා එල්ල වීම නිසා අධිකරණය ඉදිරියේ වරදකරුවන් වීම මත මහජන නියෝජිතයින් වශයෙන් පුද්ගලයන් තේරීමේදී යහපත් කල් ක්‍රියාවක් සහිත තැනැත්තන් තෝරා ගැනීමට නිර්ණායක හඳුන්වාදිය යුතු බවට මතයක් ගොඩනැගෙමින් පවතී.

370. ඡන්ද ක්‍රමයේ වෙනසක් සඳහා වසර ගණනාවක සිට පාර්ලිමේන්තුව හා දේශපාලන නායකත්වය වෙත යෝජනා ඉදිරිපත් කෙරිණ. 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමද කොට්ඨාස ක්‍රමය මත පැවැත්විය යුතු යැයි සාකච්ඡා වට ගණනාවක් පැවැත්වූ මුත් අවසානයේදී සමානුපාතික නියෝජන ක්‍රමය මතම ඡන්ද විමසීම පැවැත්වීමට තීරණය විය. 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් ඉදිරි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නැවත කොට්ඨාස ක්‍රමය හඳුන්වා දී ඇත. කෙසේ වෙතත් ඡන්ද විමසීමකදී ඡන්ද විමසීම් නීතිය එකම රැකවරණය බැවින් එම නීතිය පැහැදිලි විය යුතුය. නිශ්චිත විය යුතුය. දැනට අනුමත කර ඇති 2012 අංක 22 දරන සංශෝධන පනතට මැතිවරණ කොමසාරිස්වරයා විසින් සංශෝධන ගණනාවක් ඉදිරිපත් කර ඇති බැවින් කඩිනමින් එම සංශෝධනයන් පිළිබඳව බලධාරීන්ගේ අවධානය යොමු වීම අත්‍යවශ්‍යය. 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත අනුව ඉදිරි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම එක් එක් පළාත් පාලන ආයතනය කොට්ඨාසවලට බෙදා කොට්ඨාසයේ වැඩි ඡන්දයෙන් එකී කොට්ඨාස සඳහා නියෝජිතයන් තෝරා පත් කර ගැනීමත් සහික සංඛ්‍යාවෙන් 30% ක් සමානුපාතිකව තෝරා ගැනීමත් සිදු කෙරෙන බැවින් මෙතෙක් එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර දක්නට ලැබුණු මනාප පොරය ඉදිරියේදී දැකිය නොහැකි වනු ඇත. (උපලේඛන 6)

371. නාමයෝජනා භාර ගැනීම අවසන් වීමෙන් පසුව මැතිවරණ ප්‍රචාරක කාර්යයන්ගේ යෙදෙන ආකාරය පිළිබඳවත් ඡන්ද විමසීම අවසන් වී නියෝජිතයන්ට එරෙහිව ලැබෙන පැමිණිලි හා චෝදනා සංඛ්‍යාව හා චෝදනාවල ස්භාවය අනුව වර්තමාන සංස්කෘතිය බරපතල ලෙස පිරිහී ඇති බව සමාජයන් තුළ පැතිරෙමින් පවත්නා අදහස් පිළිබඳව ප්‍රමුඛ දේශපාලනඥයින්ගේ කඩිනම් අවධානය යොමුවිය අතර ස්වකීය පක්ෂයේ අපේක්ෂකයන් තෝරා ගැනීමේදී ජයග්‍රහණය කිරීමට එකම අරමුණ ලෙස නොසලකමින් යහපත් පුද්ගලයන් බව සමාජය පිළිගන්නා පුද්ගලයින් අපේක්ෂකයින් තෝරා ගැනීමට හැකි උපරිම උත්සාහ දැරීම යෝග්‍ය බව පෙන්වා දෙනු කැමිත්තෙමි. එමෙන්ම තමන් විසින් තෝරා ගන්නා අපේක්ෂකයා සමාජ විරෝධී අයකු නොවන බවට සැලකිලිමත් වීම පුරවැසියන්ගේ වගකීමක්ද වේ.

පළාත් පාලන ආයතන සංස්ථාපනය

372. 1865 තරම් ඈත කාලයකදී කොළඹ හා මහනුවර මහ නගර සභා ස්ථාපිත කිරීමත් සමඟ අරම්භ වූ ලංකාවේ පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක වූ විමධ්‍යගත ප්‍රාදේශිය පාලන ක්‍රමය, ක්‍රමක්‍රමයෙන් මහ නගර සභා, නගර සභා, සුළු නගර සභා හා ගම් සභා වශයෙන්ද පසුව මහ නගර සභා , නගර සභා හා දිස්ත්‍රික් සංවර්ධන සභා හරහා ද වර්තමානයේදී මහ නගර සභා, නගර සභා හා ප්‍රදේශිය සභා වශයෙන් නාගරික, ආර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ විවිධ අවශ්‍යතා සපුරාලමින් ක්‍රියාත්මක වේ. මුල් අවදියෙදී සීමා කිරීම් වලට යටත්ව ඡන්ද බලය හිමි වූ ප්‍රදේශවාසීන් කණ්ඩායමක් විසින් පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයින් තෝරා ගැනීම සිදුවූ අතර 1931 දී සර්වජන ඡන්ද බලය හඳුන්වා දීමෙන් අනතුරුව කිසිදු භේදයකින් තොරව ස්වකීය නියෝජිතයින් පත් කර ගැනීමේ අයිතිය නිශ්චිත වයස් සීමාව ඉක්මවූ වී

ඒ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල පදිංචි සියලුම ලාංකීක පුරවැසියන්ට හිමිවිය.

කිසියම් විශේෂිත හේතුවක් නිසා කල් දැමීමට සිදුවුවහොත් හැර 1969 තෙක් ඒ ඒ පළාත් පාලන ආයතන වල ඒ ඒ කොට්ඨාස නියෝජනය කිරීම සඳහා කොට්ඨසයට තරග කළ අපේක්ෂකයන් අතුරින් වැඩිම ඡන්ද සංඛ්‍යාව ලැබූ තැනැත්තා, ජයග්‍රහකයා ලෙස තෝරා ගැනීමේ ක්‍රමවේදය යටතේ (First Past the Post System) මේ පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම් නියමිත කාලය තුළදී පවත්වනු ලැබූ අතර 1971 දී දිවයින පුර බලපැවැත්වූ හදිසි තත්ත්වය (මහජන ආරක්ෂක පනත බලාත්මක කිරීම) නිසා ඉන් අනතුරුව 1979 තෙක් කිසිදු පළාත් පාලන ආයතනයකට නියෝජිතයන් සියලුම දෙනා තෝරා ගැනීමේ ඡන්ද විමසීමක් පවත්වා නැත. එවකට බලාත්මකව පැවති ඡන්ද විමසීම් නීතිය යටතේ පුරප්පාඩු කොට්ඨාස සඳහා අතුරු ඡන්ද විමසීම් පවත්වා ඇති අතර එම නීතිය යටතේ පැවති අවසන් අතුරු ඡන්ද විමසීම 1971 මාර්තු කොළඹ මහ නගර සභාවේ සුදු වැල්ල කොට්ඨාසයේ ඡන්ද විමසීමයි.

මෙම වාර්තාවේ මෙයට පෙරද සාකච්ඡා කර ඇති පරිදි 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව (වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව) මඟින් කොට්ඨාස නියෝජනය කිරීමේ ක්‍රමය අහෝසි කර සමානුපාත ඡන්ද විමසීම හඳුන්වා දෙන ලදී. 1979 මහ නගර සභා හා නගර සභා ඡන්ද විමසීම, 1981 දිස්ත්‍රික් සංවර්ධන සභා ඡන්ද විමසීම, 1983 මහ නගර සභා හා නගර සභා ඡන්ද විමසීම යන ඡන්ද විමසීම් සමානුපාත නියෝජන ක්‍රමය යටතේ පවත්වනු ලැබූ අතර එමඟින් තෝරා පත් කරනු ලැබූ නියෝජිතයන් මඟින් එකී ආයතන ක්‍රියාත්මක කරනු ලැබිණි.

373. 1979 වන තෙක් මහ නගර සභා, නගර සභා, සුළු නගර සභා, ගම් සභා, වශයෙන් පැවති පළාත් පාලන ආයතනවලින් මහ නගර සභා, නගර සභා එසේම ක්‍රියාත්මකව පවතින පරිදි සුළු නගර සභා හා ගම් සභා අහෝසි කර 1980 දිස්ත්‍රික් සංවර්ධන සභා පනත මඟින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා දිස්ත්‍රික් සංවර්ධන සභාවක් බැගින් පිහිටුවන ලදී.

374. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංවර්ධන සභා බල ප්‍රදේශයක් තුළින් මහ නගර සභා සහ නගර සභා එසේම ක්‍රියාත්මක වෙද්දී සෙසු ප්‍රදේශ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශ (ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාස) පදනම් කර ගනිමින් ප්‍රාදේශීය සභා වශයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවන ලදී. පැරණි ගම් සභා සහ සුළු නගර සභා වශයෙන් බෙදා වෙන් කළ පළාත් පාලන ආයතන ඒකාබද්ධ කර ප්‍රාදේශීය සභා වශයෙන් සංස්ථාපනය කිරීමද, පළාත් පාලනය යම් මට්ටමක මධ්‍යගත කිරීමකට ලක් කිරීමකි. ගම් සභා, සුළු නගර සභා පිහිටුවීමේදී සලකා බැලූ නිර්ණායකයන් මෙහිදී සැලකිල්ලට ලක් කිරීම අසීරු විය. ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසයක් වීම එකම නිර්ණායකය විය.

375. එසේ පිහිටුවන ලද ප්‍රාදේශීය සභා තුළ විවිධ විෂමතා දැකගත හැකිවිය. බොහෝ ප්‍රාදේශීය සභා එවකට පැවති පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාසයක් (වර්තමාන ඡන්ද ප්‍රදේශයක්) තරම් විශාල විය. ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම, දිවුලපිටිය, මහර, දොම්පෙ එබඳු ප්‍රාදේශීය සභා කිහිපයකි. මේ සෑම ප්‍රාදේශීය සභාවක්ම සුළු නගර සභා සහ ගම් සභා ගණනාවකින් යුක්ත වූ ප්‍රදේශ වේ. ඒ අනුව පළාත් පාලනය මධ්‍යගත වීමක් මේ තුළින්ද සිදු විය. පැරණි පළාත් පාලන ආයතන රටාව තුළ තමන්ගේ ගමට සුදුසු නායකයකු තෝරා පත් කර ගැනීම සිදු වූ අතර නව තත්ත්වය යටතේ මුළු සභාවටම නියෝජිතයන් තේරීමක් සිදු කෙරිණ. පළාත් පාලන ආයතනයට තේරී පත් වූ සභිකයින් මුළු සභා බල ප්‍රදේශයටම වගකිව යුතු පිරිසක් වශයෙන් පෙනී සිටින්නට විය.

376. යම් කිසි පළාත් පාලන ආයතනයක බල ප්‍රදේශ සීමා කිරීම, සංස්ථාපනය කිරීම සහ ශ්‍රේණි ඉහළ දැමීම ආදී සියලුම අවස්ථාවන්හි දී පිහිටීම, ජන ඝනත්වය, ජන සංඛ්‍යාව, සේවා හා යටිතල පහසුකම් දියුණුව, ප්‍රදේශයේ ආර්ථික ව්‍යුහය සහ සම්පත් විභජනය, ප්‍රාදේශීය ලෙස ඇති වැදගත්කම, ස්වාභාවික සීමා ආදී නිර්ණායකයන් සැලකිල්ලට ගත යුතුය. දේශපාලන බැඳීම්වලින් වැළකී සිටිය යුතුය. එසේ වුවත් 1987 වර්ෂයේ සිදු කළ ප්‍රාදේශීය සභා සංස්ථාපනයේ දී පුර්වයෙන් පැවති ගම් සභා සහ සුළු නගර සභා පිහිටුවීමට අදාළ වූ සාධක නොසලකා හැරීම මගින් පළාත් පාලන ආයතන පිහිටුවීමේදී මුලික සංකල්ප බිඳවැටුනු බවට මහජන මතයක් පසු කාලීනව ඇතිවිය. ඉන් අනතුරුව යම් යම් ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා සංස්ථාපනයේ දී ද මහජන යහපත, මහජන අවශ්‍යතාව, උපරිම සේවාවක් සැපයීමේ හැකියාව ආදී නිර්ණායකයන් පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වීමකින් තොරව වෙනත් අවශ්‍යතා විශේෂයෙන්ම දේශපාලන අවශ්‍යතා සැලකිල්ලට ගෙන ඇති බවට සිදු කෙරෙන ප්‍රකාශ සියල්ල අසත්‍ය සේ ඉවත දැමීය නොහැක.

377. ඒ වන විට සුළු නගර සභා සහ ගම් සභා වශයෙන් පැවති පළාත් පාලන ආයතන 632 ක් ඒකාබද්ධ කර ප්‍රාදේශීය සභා 257 ක් පිහිටුවීම හුදෙක් බලයේ සිටි රජයේ අවශ්‍යතාව මත සිදු කෙරිණ. ආයතන දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එක් වූ විට ඉන් එකක් ප්‍රධාන කාර්යාලය ලෙසත් ඉතිරි කාර්යාල උප කාර්යාල ලෙසත් ක්‍රියාත්මක කෙරිණ. උප කාර්යාල මඟින් බදු රැස්කර මූලස්ථානයට යැවීම ප්‍රධාන වගකීමක් විය. ඒ අනුව සේවා අතපසුවීම් සිදු විය. තවද මුළු සභා බල ප්‍රදේශය එකම ඡන්ද බල ප්‍රදේශයක් වශයෙන් ගෙන සමානුපාතික ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කිරීම

නිසා ඒ ඒ ගම්මාන හෝ කුඩා උප නගර හෝ නියෝජනය සඳහා නිශ්චිත නියෝජිතයෙකු නොමැති වීමෙන් පුරවැසියන් තුළ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අවිනිශ්චිත හැඟීම් ඇතිවීම ආරම්භ විය.

378. සංවර්ධන සහා හදුන්වා දීමට පෙර තිබූ ගම් සභා, ග්‍රාමීය ප්‍රදේශ සඳහා පිහිටුවන ලද්දක් වූ අතර, සුළු නගර සභා ක්‍රියාත්මක වූයේ අර්ධ නාගරික ප්‍රදේශ සඳහා ය. නගර සභා ලෙස උසස් කරන ලද්දේ බොහෝ විට මෙම සුළු නගර සභා ප්‍රදේශයන්ය. එබැවින් ප්‍රාදේශීය සභා පිහිටුවීම යටතේ සුළු නගර සභා සහ ගම් සභා ප්‍රදේශ මිශ්‍ර වීමක් වූ අතර, සමානුපාතික නියෝජන ක්‍රමය මත වැඩිපුර නියෝජිතයින් තේරීපත්වූයේ ජන ඝනත්වය වැඩි අර්ධ නාගරික ප්‍රදේශ වලිනි. එම නිසා ප්‍රාදේශීය සභා වැඩි වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ එම නාගරික කොටස්වල ජීවත්වන ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙනි. ඒ හේතුවෙන් ගම්සභා යටතේ විශේෂ අවධානයට යොමුව තිබූ කෘෂිකර්මය හා කෘෂිකාර්මික වටපිටාව අතරමං වූ ස්වරූපයකට පත්විය.

නාමයෝජනා කාර්ය පරිපාටිය

379. සමානුපාතික ජන්ද ක්‍රමය හදුන්වාදීමට පෙර පැවති කේවල ක්‍රමය මත, පළාත් පාලන ආයතනයක් කොට්ඨාස ගණනාවකට බෙදා වෙන් කරනු ලැබූ අතර, ඒ එක් එක් කොට්ඨාසයක් සඳහා වෙන් වෙන් වශයෙන් පවත්වනු ලැබූ ජන්ද විමසීමක් තුළින් සභිකයින් තෝරාපත් කර ගන්නා ලදී. මේ සඳහා දේශපාලන පක්ෂවලින් මෙන්ම ස්වාධීනව ද අපේක්ෂකයෝ ඉදිරිපත් වූහ. නාමයෝජනා භාර ගනු ලැබුවේ පළාත් පාලන ආයතනයේ මූලස්ථානයේදී වන අතර එක් එක් කොට්ඨාසයක් සඳහා වෙන වෙනම අපේක්ෂකයින්ගෙන් නාමයෝජනා භාර ගැණින. සෑම නාමයෝජනාවක්ම කොට්ඨාසය තුළ ලියාපදිංචි ජන්දහිමියන් දෙදෙනකුගේ යෝජනා ස්ථිරත්වයෙන් ඉදිරිපත් කළ යුතු විය. ඒ අනුව කොට්ඨාසයේ ජන්දදායකයින්ට අවශ්‍ය පුද්ගලයකු තෝරාපත් කර ගත හැකි විය. එම කොට්ඨාසයේ සියලු ඕනෑ එපාකම් පිළිබඳව සොයා බැලීමක් ඔහුගෙන් කෙරිණ. බොහෝවිට ජන්දදායකයින්ගේ පිළිගැනිම හිමිවන ග්‍රාමීය නායකයන් ඒ සඳහා තේරී පත් විය.

380. පළාත් පාලන ආයතන ජන්ද විමසීම් සඳහා සමානුපාතික නියෝජන ක්‍රමය හදුන්වා දෙමින් පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥා පනත, සංශෝධනය කරන ලද 1977 අංක 24 දරන පළාත් පාලන ආයතන ජන්ද විමසීම් සංශෝධන පනතේ විධිවිධාන අනුව නාමයෝජනා ඉදිරිපත් කිරීමට සිදුවූයේ අපේක්ෂක ලැයිස්තුවක් වශයෙනි. සභාව සඳහා තෝරාපත් කර ගැනීමට නියමිත සභික සංඛ්‍යාවට හයක් හෝ සභික සංඛ්‍යාවෙන් 1/3 ක් යන දෙකෙන් වඩා අඩු සංඛ්‍යාව එකතු කිරීමෙන් නියමිත අපේක්ෂක සංඛ්‍යාව තීරණය කෙරිණ. සමානුපාතික නියෝජනය හඳුන්වාදීමෙන් අනතුරුව පැවති 1979, 1983 මහ නගර සභා හා නගර සභා ජන්ද විමසීම් දෙකෙහිදී (1981 සංවර්ධන සභා ජන්ද විමසීමේදී ද) ඒ ඒ පක්ෂයට/ කණ්ඩායමට හිමිවන මන්ත්‍රී හෝ සභික ධූර සඳහා නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අනුපිළිවෙලින් නියමිත අපේක්ෂකයන් සංඛ්‍යාව තෝරාගන්නා ලදී. 1987 අංක 24 දරන පනතින්, පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥා පනතට හදුන්වාදෙන ලද සංශෝධනයකට අනුව ජන්දදායකයින් ගේ කැමැත්ත හෙවත් මනාපය අනුව නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අපේක්ෂකයන් තෝරා ගැනීමේ ක්‍රමවේදය එනම් මනාප සහිත සමානුපාතික නාමයෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවීම ආරම්භ වූ නමුත් එම ක්‍රමය භාවිතා කිරීමට නියමිත වූ තිබූ ප්‍රථම ජන්ද විමසීම 1987 දී පැවැත්වීම සඳහා සංවිධානය කර තිබූ පළාත් පාලන ආයතන ජනද විමසීම, ඉන්දු - ලංකා ගිවිසුම හා සැබැඳි ප්‍රචන්ඩ ක්‍රියා හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. ඒ අනුව මනාප සහිත සමානුපාතික ජන්ද ක්‍රමය, එක් ජන්දදායකයකුට හිමි මනාප තුන එක් අපේක්ෂකයකුට එක් මනාපයක් පමණක් බැගින් වන සේ (එනම් මනාප තුන එක බැගින් අපේක්ෂකයන් තිදෙනෙකුට හෝ අවශ්‍ය නම් මනාප එක බැගින් අපේක්ෂකයන් දෙදෙනකුට පමණක් හෝ එක් මනාපයක් පමණක් එක් අපේක්ෂකයකුට පමණක් හෝ දිය හැකි පරිදි) 1988 අප්‍රේල් 28 දින පැවති පළාත් සභා 4ක ජන්ද විමසීමේදී භාවිතා කරන ලදී.

1987 දී පැවැත්වීමට නියමිත වූ පළාත් පාලන ආයතන ජන්ද විමසීම පවත්වන ලද්දේ 1991 මැයි 12 වන දිනයේ දීය. එය සමස්ත දිවයිනේ සියලු ප්‍රදේශ අවරණය වන පරිදි පැවති ප්‍රථම එක්දින පළාත් පාලන ආයතන ජන්ද විමසීම ලෙස සැලකෙන නමුත් ප්‍රචන්ඩ ක්‍රියා හේතුවෙන් උතුරු - නැගෙනහිර සමහර ප්‍රදේශවල ජන්ද විමසිම් පැවැත්වීමට නොහැකිවිය.

මෙම ජන්ද විමසීම් පැවැත්වීමට පෙර හදුන්වා දුන් 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ජන්ද විමසීම් (සංශෝධන) පනත මගින් ජන්ද දායකයෙකුට අවශ්‍ය නම් ස්වකීය මනාප තුනම එක් අපේක්ෂකයකුට දිය හැකි පරිදි නීති සංශෝධනය කරන ලදී. තවද අපේක්ෂකයන් අතුරින් 40% ක් වයස අවු 18 - 35 අතර වයස් කාණ්ඩයේ තරුණ අපේක්ෂකයින් විය යුතු බව මෙම පනතින් නියම කෙරිණි.

381. නාමයෝජනා පත්‍රය සකස් වූයේ පක්ෂ නායකත්වයේ හා කණ්ඩායම් නායකත්වයේ මෙහෙයවීම යටතේය. පක්ෂ නායකත්වය සැමවිටම අපේක්ෂකයින් තෝරා ගැනීමේදී තම පක්ෂයට/ කණ්ඩායමට ජන්ද සංඛ්‍යාව වැඩිකර ගත හැකි පුද්ගලයින් අපේක්ෂකත්වයට තෝරා ගැනීමට පෙළඹිණ. එසේ තෝරා ගන්නා සමහර අපේක්ෂකයන් කෙසේ හෝ ජයග්‍රහණය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් මනාප රැස් කර ගැනීමට ක්‍රියා කිරීම, ජන්ද විමසීම් නීති උල්ලංඝණය වීම් වැඩිවීමට හේතුවී තිබේ.

382. අපේක්ෂකයින් සැමවිටම ස්වකීය මනාප සංඛ්‍යාව වැඩිකර ගැනීමේ අභිලාසයෙන් ක්‍රියාකරන හෙයින් නාමයෝජනා පත්‍රයට නම ඇතුළත් කිරීමේදී පවා තමන් කැමති අංකයක් ලබා ගැනීම සඳහා විශේෂයෙන් මුල් අංක වලට අමතර වාසියක් අත්වනු ඇතැයි යන හැඟීම නිසා නම් වෙනස් කර නාමයෝජනා පත්‍රයට නම් ඇතුළත් කරන බව දක්නට ලැබිණ. සිංහල අකාරාදි ක්‍රමයට නම් පෙළගස්වා අංක ලබා දෙන බැවින් අපේක්ෂක අංක අතුරින් මුල් අංක ලබා ගැනීම සඳහා බොහෝ විට මේ සඳහා නමේ මුලට "අ" අක්ෂර කිහිපයක් යෙදූ අවස්ථා දක්නට ලැබිණ. එමෙන්ම සමහර අපේක්ෂකයන් තමන් හැඳින්වීමට භාවිතා කරන වෙනත් අන්වර්ථ නාම භාවිතා වන බවද පෙනී ගොස් තිබේ. එබැවින් ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය අනුව අපේක්ෂක නම් නාමයෝජනා පත්‍රයට ඇතුළත් විය යුතුය යන්න නීතිගත කළ යුතුව ඇත.

383. සැබෑ ලෙසම තරග කරන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වලට අමතරව ආධාරක පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වලින් ද නාමයෝජනා ඉදිරිපත් කිරීම මෑත මැතිවරණවලදී දැකිය හැකි ප්‍රවණතාවකි. මෙවැනි පක්ෂ හා කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ මැතිවරණ ප්‍රචාරක කටයුතුවලදී සහ ඡන්ද විමසීම හා ගණන් කිරීම යන අවස්ථාවන්හි දී සැබෑ ලෙස තරග කරන පක්ෂ හා කණ්ඩායම් වෙනුවෙන් යුක්ති සහගත නොවන වාසි සලසා ගැනීමයි. ඒ හේතුවෙන් අනවශ්‍ය පරිදි ඡන්ද පත්‍රිකාව විශාලවීමත් ඡන්ද පොළේ නියෝජිතයින් සංඛ්‍යාව සහ ගණන් කිරීමේ නියෝජිතයින් සංඛ්‍යාව අධික වීමත් ආරක්ෂක කටයුතු සඳහා වැඩි අවදානයක් යොමු කිරීමට සිදුවීමත් නිසා මැතිවරණ සංවිධානයේදී ගැටළු ගණනාවකට මුහුණ දීමට සිදු විය. ඒ හේතුවෙන් මැතිවරණ වෙනුවෙන් දැරීමට සිදුවන වියදම අනවශ්‍ය පරිදි ඉහළ යාමක් දක්නට ඇත.

384. එමෙන්ම නාමයෝජනා කාලපරිච්ඡේදය වශයෙන් දින 7 1/2 ක කාලයක් ඡන්ද විමසීම් නීතිය අනුව වෙන්කර ඇතත් නාමයෝජනා භාරදීම සිදු කෙරෙනුයේ අවසන් දින දෙකහමාර තුළ බව පැහැදිලිව දක්නට ලැබෙන තත්ත්වයකි. එබැවින් දින 7 1/2 ක නාමයෝජනා කාලයක් මේ සඳහා වෙන් කිරීම අනවශ්‍යය.

නාමයෝජනා කරන අපේක්ෂකයින්ගෙන් 40% තරුණ අපේක්ෂකයින් විය යුතුයයි නීති පනවා ඇතත් තරුණ අපේක්ෂකයකු බව සනාථ කිරීමට අපේක්ෂකයා විසින් අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ප්‍රමාණවත් යයි සඳහන් කිරීම එම නීතිය හෑල්ලූවට ලක් කිරීමකි. පසුගිය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලදී ව්‍යාජ දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර තිබූ අවස්ථා හෙළිවිය. ඒ අනුව තරුණ අපේක්ෂකයකු බව සනාථ කිරීම සඳහා උප්පැන්න සහතිකයේ මුල් පිටපත නැතහොත් සහතික කල පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කළ යුතුය.

385. නාමයෝජනා ලැයිස්තුවේ එක් අපේක්ෂකයකු නියමිත පරිදි තොරතුරු සපයා නොමැතිවීම හෝ සපයා ඇති තොරතුරු අනුව එම අපේක්ෂකයා සුදුසුකම් සපුරා නොමැති බව හෙළිවීම මත සම්පූර්ණ නාමයෝජනා පත්‍රයම ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. තරුණ අපේක්ෂක කණ්ඩායමේ එක් තරුණ අපේක්ෂකයකුගේ වයස අවුරුදු 35 ඉක්මවා සිටීම හෝ නියමිත දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ නොවීම, කිසියම් අපේක්ෂකයකු දිවුරුම් ප්‍රකාශය සම්පූර්ණ නොකිරීම, කිසියම් අපේක්ෂකයකු නාමයෝජනා පත්‍රය අත්සන් නොකිරීම මෙබඳු අවස්ථා කිහිපයකි. කිසියම් නාමයෝජනාවක් ප්‍රතික්ෂේප වීම මත අධිකරණ ක්‍රියා මාර්ගයන්ට එළඹීම හේතුවෙන් ඡන්ද විමසීම නියමිත දිනට පැවැත්විය නොහැකි වන අතර, එමඟින් සම්පූර්ණ ක්‍රියාදාමය ව්‍යාකූලවනු ඇත. එක් දින ඡන්ද විමසීම් වශයෙන් පැවැත්වීමට තීරණය කළත් පසුගිය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සියල්ලම අවස්ථා කිහිපයකදී පැවැත්වීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ මෙම තත්ත්වය බව කිව යුතුය. මෙය වලක්වා ගතහැක්කේ නාමයෝජනා භාරදීමට පෙර පක්ෂ ලේකම්වරුන්, බලයලත් නියෝජිතයන් හා කණ්ඩායම් නායකයන් අදාළ නාමයෝජනා පත්‍ර වල සියලුම කරුණු ඡන්ද විමසීම් නීති වලට අනුකූලව තිබෙන බවට නිසැක වීමෙන් පමණි. නාමයෝජනා පත්‍ර භාරදීමට පෙර සියලුම කරුණු නිවැරදිව තිබේදැයි නාමයෝජන භාරදීමට පැමිණෙන තැනැත්තන්ට තේරීම්භාර නිලධාරීන් විසින් වාචිකව හා ලිඛිතව දන්වන නමුත් සමහරකු ඒ සම්බන්ධයෙන් නිසි අවධානයක් නොදැක්වීම කණගාටුවට කරුණකි.

තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් හා ඒ හා සබැඳී කරුණු

386. එක් දින ඡන්ද විමසීමක් වශයෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීමේ දී ඡන්ද විමිසීම් සංවිධානය කිරීම සඳහා නව ක්‍රියාමාර්ග හඳුන්වාදිය යුතු විය. ඒ අනුව මැතිවරණ බලධාරීන්ගේ කාර්යභාරය වඩාත් පුළුල් විය. ඡන්ද පොළ ආරක්ෂාව සඳහා විශාල ආරක්ෂක නිලධාරී සංඛ්‍යාවක් යෙදවීමට හා ඡන්ද විමසීම සඳහා විශාල කාර්ය මණ්ඩලයක් යෙදවීමට සිදුවීම විශේෂයෙන්ම කැපී පෙණිනි. මේ නිසා තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සැලසීම අත්‍යවශ්‍ය විය.

1987 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය හඳුන්වා දෙන ලද අතර එහි එක් අංශයක් වශයෙන් තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් ද ඇතුළත් කර ඇත. සමානුපාතික නියෝජන ක්‍රමය අනුව සම්පූර්ණ පළාත්

පාලන ආයතන බල ප්‍රදේශය ඡන්ද විමසීම් ප්‍රදේශයක් වශයෙන් සලකනු ලැබීමත්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් එක් දිනක් තුළ දීපව්‍යාප්තව පැවැත්වීමට ගනු ලැබූ තීරණයත් මත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්ද ජාතික මැතිවරණයක ස්වරූපයට පත්විය. ඒ අනුව ආරක්ෂක අංශ, මැතිවරණ නිලධාරීන් සහ සෘජුවම ඡන්ද විමසීමකදී අවශ්‍යවන සේවාවන්හි නිරත කාර්යය මණ්ඩලය සඳහා තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සැලසීම නීති ගත කෙරිණ. ඒ අනුව ත්‍රිවිධ හමුදාව, පොලිසිය, දුම්රිය, මධ්‍යම හා ප්‍රදේශීය ගමනා ගමන මණ්ඩල, විදුලි සංදේශ සහ මැතිවරණ රාජකාරීන්හි නිරත කරවීමට අපේක්ෂා කරන රාජ්‍ය නිලධාරීන්, සේවකයින් සහ ගුරු භවතුන් සඳහා මූලික වශයෙන් මෙම පහසුකම් සලසන ලදී.
(සටහන 21)

387. ඡන්ද විමසීම් / මැතිවරණ නීති වලට අනුව තැපැල් ඡන්ද හිමිකම් අහිමි වෙහෙත් මැතිවරණයකදී සෘජුවම නොවෙතත් වක්‍රව හෝ මැතිවරණ ක්‍රියාදාමය හා සම්බන්ධවන විවිධ අත්‍යවශ්‍ය සේවාවන්හි නිරත වන නිලධාරීන් හා සේවකයින් තමා වෙත පැවරී ඇති රාජකාරිය හේතුවෙන් ඡන්ද විමසීම දිනයෙහි තමාගේ ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව නොලැබෙන බව දන්වා තැපැල් ඡන්ද පහසුකම් ලබා දෙන ලෙස පසුගිය ඡන්ද විමසීම් අවස්ථා කිහිපයකදීම මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීම පිළිබඳව මෙහිදී සලකා බැලිය යුතුය. රජයේ රෝහල් වල, විදුලිබල මණ්ඩලයේ, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහ මහවැලි අධිකාරිය යටතේ ඇති ජලාශ වල ආරක්ෂක අංශ වල සේවා නියුක්තිකයන් විසින් නිරන්තරයෙන්ම එසේ ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබේ.

388. ආරක්ෂක අංශවල සහ රාජ්‍ය සේවයේ ඇතිවන වර්ධනය නිසා තැපැල් ඡන්ද පහසුකම් සැලසීමේදී දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත පැවරෙන කාර්යභාරයේ විශාලත්වය ඔරොත්තු නොදෙන තත්ත්වයකට පත්ව ඇත. තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම, පිළිගත් බව හෝ ප්‍රතික්ෂේප කළ බව දැනුම් දීම, පිළිගත් අයදුම්පත් සම්බන්ධ ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂණ පැකට්ටු සහතික කිරීමේ නිලධාරීන් වෙත යැවීම, සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකා ආපසු තේරීම්භාර නිලධාරීන් වෙත ගෙන්වා ගැනීම යන සියලු කටයුතු සඳහා සති 3ක පමණ කාලයක් වැයවෙනු ඇත. මෙම කාලසීමාව තුළ තැපැල් දෙපාර්තමේන්තුව මගින් ප්‍රශස්ත පරිදි ලිපි බෙදාහැරීම සිදු නොවුවහොත් තැපැල් ඡන්ද ක්‍රියාවලියේ ඇතිවන බිඳ වැටීම වළකාලිය නොහැක.

389. තැපැල් ඡන්ද අයදුම්පත්, අයදුම්කරු විසින් සම්පූර්ණකර සහතික කිරීමේ නිලධාරී වෙත භාර දිය යුතු අතර සහතික කිරීමේ නිලධාරී විසින් අයදුම්පත පරීක්ෂා කර සහතික කර තේරීම්භාර නිලධාරී වෙත චිවිය යුතුය. මෙහිදී අයදුම්පත නිසිපරිදි සම්පූර්ණ නොකිරීම, සහතික කිරීමේ නිලධාරියා විසින් සහතික කර නොතිබීම, නියමිත දිනට පෙර අයදුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත නොලැබීම යන හේතු මත අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය. අයදුම්පත් ලැබුණු පසු පරීක්ෂා කර ප්‍රතික්ෂේප අයදුම්පත් සම්බන්ධයෙන් ඉතා කඩිනමින් ප්‍රතික්ෂේප වීමට හේතු කවරේද යන්න සඳහන් කර අලුත් අයදුම්පතක් සමඟ අයදුම්කරු වෙත යවන ලෙස උපදෙස් දී ඇතත් බොහෝ අයදුම්පත් ලැබෙන්නේ අයදුම්පත් භාර ගැනීම අවසන් කිරීමට ආසන්නතම දින දෙක තුන තුළය. ඒ හේතුවෙන් ප්‍රතික්ෂේප අයදුම්පතක් සම්බන්ධයෙන් අලුත් අයදුම්පතක් ලබා ගැනීමටද අවස්ථාව නොලැබෙනු ඇත. අයදුම්පත් ප්‍රතික්ෂේප වන තැපැල් ඡන්ද අයදුම්කරුවන් මැතිවරණ රාජකාරිවලින් නිදහස් නොකෙරෙන අතර ඔවුන්ට ඡන්ද පොළේදී ඡන්දය ප්‍රකාශ කිරීමටද අවකාශ ලබාදීම අසීරුය.

390. ඇතැම් සහතික කිරීමේ නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම නිසා ද තැපැල් ඡන්ද ප්‍රතික්ෂේප වීම පසුගිය ඡන්ද විමසිම්වලදී දක්නට ලැබුණු තත්ත්වයකි. තැපැල් ඡන්ද සලකුණු කිරීමෙන් අනතුරුව සහතික කිරීමේ නිලධාරීන් විසින් එම (B) කවරය වෙනමත් අනන්‍යතා ප්‍රකාශ සියල්ල වෙනමත් තේරීම්භාර නිලධාරීන් වෙත යැවීම, අනන්‍යතා ප්‍රකාශය නිසිපරිදි සහතික කර නොතිබීම සහ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ඡන්ද පත්‍රිකා අඩංගු පැකට්ටු වගකීමකින් තොරව තැපැල් පෙට්ටියට බහාලීම වැනි අක්‍රමිකතා සහතික කිරීමේ නිලධාරීන් අතින් සිදුවූ අවස්ථා හමුවී ඇත. අනන්‍යතා ප්‍රකාශය ඡන්ද පත්‍රිකාව සහිත (B) කවරයට අමුණා නොමැතිවීම හා අනන්‍යතා ප්‍රකාශය අසම්පූර්ණ වීම මත ගණන් කිරීමේ අවස්ථාවේදී ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප වනු ඇත.

391. තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී ඡන්දභිමියාගේ සහ සහතික කිරීමේ නිලධාරීගේ නොසැලකිලිමත්කම හේතුවෙන් තැපැල් ඡන්ද අයදුම්කරු ඔහුගේ, පියාගේ හෝ සහෝදරයකුගේ හෝ වෙනත් ඥාතියෙකුගේ හෝ තමාගේ නමට ආසන්න වශයෙන් සමාන නමක් ඇති තැනැත්තෙකුගේ තොරතුරු චිනම් නම හා අනුක්‍රමික අංකය ඡන්දභිමි නාමලේඛනයෙන් උපුටාගෙන එම කරුණු තැපැල් ඡන්ද අයදුම්පතේ ඇතුළත් කිරීමෙන් බොහෝ විට රජයේ සේවකයකු නොවන සමාන්‍ය ඡන්ද හිමියෙකුගේ ඡන්දය අහිමිවනු ඇත. මෙවැනි සිද්ධීන් බොහෝ විට සිදුවන්නේ ආරක්ෂක හමුදා සමාජිකයන්ගේ තැපැල් ඡන්ද අයදුම් පත්‍ර වලට අදාළව බව පෙනිගොස් තිබේ. අදාළ අයදුම්කරු තැපැල් ඡන්ද අයදුම්පත්‍රය පෞද්ගලිකව සම්පූර්ණ නොකිරීම බොහෝ විට මෙවැනි තත්ත්වයන් ඇති වීමට හේතුවී තිබේ. එසේ වුවත් සියලුම ආරක්ෂක හමුදා කඳවුරු වෙත ඡන්දභිමි නාමලේඛනය ඇතුළත් සංයුත්ත තැටි නිකුත් කිරීම හරහා මෙවැනි සිදුවීම් අවම කර ගැනීමට මැතිවරණ දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක හමුදා දරන උත්සහය සාර්ථක වන බව නිරීක්ෂණය වී තිබේ.

392. මෙවැනි වැරදි හැකිතාක් දුරට වළකාලීම සඳහා තැපැල් ඡන්දහිමියෙකු වශයෙන් පිළිගනු ලැබූ බව දැනුම්දෙන ලිපිය සහතික කිරීමේ නිලධාරි මගින් අදාළ ඡන්දහිමියා වෙත යැවීමට අමතරව ඡන්දහිමියාගේ පෞද්ගලික ලිපිනය වෙතද පිටපතක් යවන ලෙස තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදී. ඊට අමතරව නිල ඡන්ද දැන්වීම්පත් තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාරදීමේදී තැපැල් ඡන්දහිමියන්ට අදාළ නිලඡන්ද දැන්වීම්පත තැපැල් නොකර රඳවා ගත යුතු වුවත් එම නිලඡන්ද දැන්වීම් පත්‍රිකාවල "තැපැල් ඡන්ද හිමියකු වශයෙන් පිළිගෙන ඇත," යන වගන්තිය රබර් මුද්‍රාවක් මගින් මුද්‍රා තබා ඡන්දහිමියන් වෙත යැවීමෙන් මෙබඳු අවස්ථා රැසක් වළක්වා ගත හැකිවිය. එහෙත් එය කළ හැකි වන්නේ අදාළ ඡන්දහිමියා ඒ සම්බන්ධයෙන් කඩිනමින් තේරීම්භාර නිලධාරී දැනුවත් කළහොත් පමණි. කෙසේ වෙතත් වෙනත් අයෙකු විසින් ස්වකීය ඡන්දය තැපැල් ඡන්දයක් ලෙස භාවිතා කිරීමට අයදුම්කර ඇති බව අදාළ තැනැත්තා වාර්තා නොකලහොත් සැබෑ ඡන්ද හිමියාට ඡන්ද පොළේදී ලබාගත හැකිවන්නේ ද්විත්ව ඡන්ද පත්‍රිකාවකි. කලකට පෙර මෙවැනි අවස්ථා සැලකිය යුතු ප්‍රමාණයක් වාර්තා වුවද දැන් එවැනි සිදුවීම් වාර්තා නොවන තරමට අඩු වී තිබේ.

393. 1987 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා තැපැල් ඡන්ද ක්‍රමය යෝජනා කළ නමුත් සමානුපාත ක්‍රමය හදුන්වාදීමට පෙර පැවති පැරණි පළාත් පාලන ආයතන ඡන්ද ක්‍රමය අනුව තැපැල් ඡන්දය හෝ වෙනත් විකල්ප ක්‍රමයක් ක්‍රියාත්මක වුයේ නැත. එහෙත් අද ජන සමාජයේ සංකීර්ණත්වය හා ජන සංඛ්‍යාවේ සීඝ්‍ර වර්ධනය හේතුවෙන් අවශ්‍යයෙන්ම මැතිවරණ රාජකාරී හේතුවෙන් ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වන රාජ්‍ය නිලධාරීන් සඳහා ඡන්දය භාවිතා කිරීමට කිසියම් ක්‍රමයක් භාවිතා කළ යුතු වේ. නැතහොත් එක් එක් දිස්ත්‍රික්කයක ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව සඳහා අවස්ථා කිහිපයකදී ඡන්ද විමසීම පැවැත්විය යුතු වනු ඇත.

394. කොට්ඨාස ක්‍රමය යටතේ එක් එක් කොට්ඨාසයක් ඡන්ද විමසීම් ප්‍රදේශයක් වීමත් කොට්ඨාසයේ ප්‍රකාශිත වලංගු ඡන්දවලින් වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයා සභිකධුරයට තෝරාපත් කර ගැනීමත් කොට්ඨාසයේ ඡන්ද ප්‍රතිඵලය අදාළ ඡන්ද පොළේදිම ප්‍රකාශයට පත්කළ යුතු වීමත් මත මෙතෙක් පැවති තැපැල් ඡන්ද ක්‍රමය තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක කිරීම අසීරු වනු ඇත. කොට්ඨාස ක්‍රමය අනුව ඡන්ද පත්‍රිකා ගණන් කිරීම ඡන්ද පොළේදී සිදුකළ යුතු බැවින් තැපැල් ඡන්ද ප්‍රතිඵලය හෝ තැපැල් ඡන්ද පැකට්ටුව අදාළ ඡන්ද පොළට ලැබෙන ක්‍රමවේදයක් සකස් කළ යුතුවේ.

ඡන්ද විමසීමේ හා ගණන් කිරීමේ සංකීර්ණ ස්වභාවය

395. එක් දින ඡන්ද විමසීමක් වශයෙන් පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම් පැවැත්වීම තුළින් එය ද ජාතික මැතිවරණයක තත්ත්වයට පත්විය. කොට්ඨාස ක්‍රමය යටතේ ඡන්ද විමසීමෙන් පසු ඡන්ද පොළේදී ම ඡන්ද ගණන් කර ප්‍රතිඵල ප්‍රකාශ කිරීම වැනි ඉතා සරල ක්‍රමයක් අනුගමනය කෙරිණ. කොට්ඨාස ක්‍රමය යටතේ ඒ ඒ සභාවකට සභිකයින් තෝරාපත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම් වෙන වෙනම පවත්වන ලදී. ඒ හේතුවෙන් තැපෑලෙන් ඡන්දය දීමේ ක්‍රමයක් අවශ්‍ය වූයේ ද නැත.

396. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ඡන්දය ප්‍රකාශ කිරීම කේවල ක්‍රමයට වඩා අතිශයින් සංකීර්ණ විය. කේවල ක්‍රමයේ දී අපේක්ෂක නම් අතුරින් තමා කැමති අපේක්ෂකයාට කතිරය ගැසීමෙන් ඡන්දය ප්‍රකාශ කිරීම අවසන් වේ. එහෙත් මනාප සහිත සමානුපාතික ක්‍රමයේදී පළමුව තමා කැමති පක්ෂය හෝ කණ්ඩායම ඉදිරියේ ඇති කොටුවේ කතිරය යෙදීමත් දෙවනුව තමා කැමති අපේක්ෂකයින් වෙනුවෙන් අදාළ අපේක්ෂක අංකය හෝ අංක මතුපිට සහ අපේක්ෂක අංකය ඉදිරිපිට ඇති කොටුවල කතිරය යෙදීමෙනුත් තමාගේ මනාපය ප්‍රකාශ කළ හැකිවේ. එම මනාප ඡන්දය අපේක්ෂකයින් තිදෙනකුට, දෙදෙනකුට හෝ එක් අයකුට දිය හැකිය. එහෙත් උපරිම වශයෙන් ලකුණු කළ හැක්කේ මනාප තුනක් පමණි.

397. සමානුපාතික ඡන්ද ක්‍රමය පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන යන සෑම ඡන්ද විමසීම් නීතියකටම ඇතුළත් කර ඇති බැවින් මේ වන විට මනාප ලකුණු කිරීම පිළිබඳව ඡන්දදායකයා යම් අවබෝධයක් ලබා ඇතත් මෙම ක්‍රමය මත ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප වීමේ ප්‍රවණතා බෙහෙවින් අධිකය. කෙසේවෙතත් තමා කැමති පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව තමා කැමති අපේක්ෂකයින් සඳහා මනාප තුනක් ලකුණු කිරීම ඡන්දදායකයාට අවබෝධ කර ගැනීම අසීරු වී ඇත. ඡන්දදායකයා මනාප සලකුණු කිරීමේදී සිදු කරනු ලබන වැරදි පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ඒ බව තහවුරු වේ. මනාප වැරදි ලෙස සටහන් කිරීමෙන් ඡන්ද පත්‍රිකාවම ප්‍රතික්ෂේප වන අවස්ථා දක්නට ලැබේ. මනාප ඡන්දය වශයෙන් ස්වාධීන කණ්ඩායම් හැදින්වීමේ අංකය මත කතිරය යෙදීම එබඳු එක් අවස්ථාවකි. එහිදී පක්ෂයකට හා ස්වාධීන කණ්ඩායමකට ප්‍රකාශ කළ ඡන්දයක් වශයෙන් සලකා එම ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප වේ.

398. ඒ අනුව මෙම ඡන්ද ක්‍රමය තුළින් ඡන්දදායකයා බලාපොරොත්තු වන සංසිද්ධිය ඉටුවේද යන්න සැක සහිතය. කේවල ඡන්ද ක්‍රමය යටතේ කෙලින්ම තමා කැමති අපේක්ෂයාට ඡන්දය දීමේ හැකියාව තිබූ නමුත් සමානුපාතිකව ඡන්දය දීමේදී තමා කැමති පක්ෂය

සහ තමා කැමති අපේක්ෂකයා යන නිර්ණායකයන් දෙකම එක්ව සලකා ඡන්දය සහ මනාපය ප්‍රකාශ කළ යුතුව ඇත. පක්ෂයට කැමති වුවත් එම පක්ෂයේ අපේක්ෂකයින්ට ඡන්දදායකයා කැමති නොවිය හැකිය.

399. එමෙන්ම අපේක්ෂකයාට කැමති වුවත් තමා එම පක්ෂයට කැමැත්තක් නොමැති නම් එම අපේක්ෂකයාට ද ඡන්දය ප්‍රකාශ කළ නොහැකිය. එයට හේතුව ඡන්දදායකයා ඡන්දය ප්‍රකාශ කරන පක්ෂයෙහි අපේක්ෂක කණ්ඩායම සමග මනාප අංක බැඳී පවතින බැවිනි. වී අනුව ඡන්දදායකයාගේ ප්‍රජාතන්ත්‍රීය අයිතිය අහිමි කර ඇත.

400. ගණන් කිරීමේ දී පළමුව එක් එක් පක්ෂය හා කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ගණන් බැලීමත් වී තුළින් එක් එක් පක්ෂය හා කණ්ඩායම හිමිකරගෙන ඇති සහිකධුර සංඛ්‍යාව ගණන් බැලීමත් සිදු කෙරේ. එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි පක්ෂ සහ කණ්ඩායම් ලැබූ ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ප්‍රතිඵලය සකස් කිරීමෙන් අනතුරුව වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් පක්ෂයේ සිට සියලුම පක්ෂ සහ කණ්ඩායම් යටතේ තරග කළ එක් එක් අපේක්ෂකයා ලබා ඇති මනාප සංඛ්‍යාව ගණන් බලනු ලැබේ. මනාප ගණන් කිරීම ඉතා වෙහෙසකර වූත්, සංකීර්ණ වූත් ක්‍රියාවලියකි. අනෙක් අතට මෙම මනාප ගණන් කිරීම ආරම්භ කිරීමට සිදු වන්නේද බොහෝ විට මධ්‍යම රාත්‍රිය ද ඉක්මවීමෙන් පසුව වීම වෙහෙසකර බව වැඩි වීමට තවත් හේතුවකි.

මනාප ගණන් කිරීමේදී එක් එක් පක්ෂය/ කණ්ඩායම වෙනුවෙන් පසු කළ යුතු අවස්ථා

- මනාප ගණන් කිරීම සඳහා වලංගු නොවන ඡන්ද පත්‍රිකා ඉවත් කිරීම.
- මනාප අවිනිශ්චිත ඡන්ද පත්‍රිකා සම්බන්ධ ගණන් කිරීමේ නිලධාරීගේ තීරණය දැනුම් දීම.
- මනාප ගණන් කිරීම සඳහා වලංගු ඡන්ද පත්‍රිකා 50 මිටි වලට සකස් කිරීම.
- එක් ඡන්ද පත්‍රිකා මිටියකට එක් සැසඳුම් පත්‍රයක් (CE/CO/PR/1)- (Tally Sheet) බැගින් සකස් කිරීම.
- 1 සැසඳුම් පත්‍ර (Tally Sheet) 20 ක මනාප තොරතුරු 1 වැනි සාරාංශ පත්‍රයෙහි (CE/CO/PR/2) සටහන් කිරීම.
- අදාළ පක්ෂය වෙනුවෙන් සකස් වී ඇති 1 වැනි සාරංශ පත්‍ර සියල්ලෙහි මනාප සටහන් ඇතුළත් කර 2 වැනි සාරාංශ පත්‍ර (CE/CO/PR/3) සකස් කිරීම.
- එම පක්ෂයට හෝ කණ්ඩායමට අදාළව ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ මනාප ප්‍රතිඵලය වන්නේ 2 වැනි සාරංශ පත්‍රයයි.
- අවසාන වශයෙන් එම සභාවට අයත් සියලුම ගණන් කිරීමේ ශාලාවල 2 වැනි සාරංශ පත්‍රවල එකතුව මත එම පක්ෂයට කණ්ඩායමට අදාළ එක් එක් අපේක්ෂකයා ලබා ඇති මනාප සංඛ්‍යාව පිළිබඳව ප්‍රතිඵලය සකස් කිරීම (CE/RO/PR/3).

401. ඉහත කී පියවර අනුගමනය කරමින් පක්ෂ හා කණ්ඩායම් ගණනාවක මනාප ගණන් කිරීම වෙන වෙන අවස්ථාවන්හි දී කළ යුතු වීම නිසා මනාප ගණන් කිරීම අවසන් වන්නේ ඡන්ද විමසීම් දිනට පසු දිනද රාත්‍රී කාලයේදීය. එනිසා නිලධාරීන් එම රාජකාරී ඉටු කරනු ලබන්නේ දැඩි පීඩාකාරී ශාරීරික, මානසික තත්ත්වයක් යටතේය. එනිසාම ගණන් කිරීමේ නියෝජිතයින්, අපේක්ෂකයින් අතර මෙම මනාප ගණන් කිරීම පිළිබඳව බොහෝ විට සැක සංකා ඇති කර ගනී. සමහර අපේක්ෂකයන් ඡන්ද විමසීම අවසන් වීමත් සමගම අධිකරණයට පවා යාමට පෙළඹුන අවස්ථාවන්ද දක්නට ලැබේ. මෙය බොහෝවිට සිදුවන්නේ එකම පක්ෂයේ/ කණ්ඩායමේ අපේක්ෂකයින් අතරය. වී අනුව ඡන්ද විමසීමට පෙර තිබූ මනාප පොරය ඡන්ද විමසීමෙන් පසු අධිකරණයට යාමෙන් හෝ විවිධ මැර ක්‍රියාවන්ගෙන් අවසන් වේ. අධිකරණ නියෝග මත මනාප නැවත ගණන් කිරීම් ගණනාවක් සිදු කරනු ලැබුව ද වී එකකදීවත් මුල් ගණන් කිරීමේදී ලබාගත් ස්ථානවල වෙනසක් ඇති නොවීම විශේෂයෙන් සඳහන් කළ යුත්තකි.

පුරප්පාඩු පිරවීම හා සම්බන්ධ ගැටළු

402. සහිකයකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ වෙනත් කිසියම් හේතුවක් මත සහිකධුර පුරප්පාඩුවක් ඇති වේ. සහිකධුර පුරප්පාඩුවක් ඇතිවූ විට එම පුරප්පාඩුව සඳහා පත්කළ යුත්තේ එම ඡන්ද විමසීම සඳහා තරග කර කිසියම් මනාප සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයෙකි. වී අනුව කිසියම් පළාත් පාලන ආයතනයක් සඳහා නිතරගයෙන් සහිකයින් තේරී පත් වුවහොත් එහි පුරප්පාඩුවක් පිරවීමේදී ගත යුතු ක්‍රියා මාර්ගය පැහැදිලි නැත.

403. එමෙන්ම ඡන්ද විමසීමකින් තේරී පත්වූ සහිකයකුගේ ධුරයක් සම්බන්ධයෙන් ඇතිවූ පුරප්පාඩු පිරවීමකදී වී වන විට නාමයෝජනා පත්‍රයේ සඳහන් සියලුම අපේක්ෂකයින් තේරී පත්වී අවසන්ව ඇත්නම් හෝ ඉතිරිව ඇති අපේක්ෂකයින් මනාප කිසිවක් ලබා ගෙන නැතිනම් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65 අ (2) වගන්තිය පරිදි වී බව තේරීම්භාර නිලධාරී විසින් මැතිවරණ කොමසාරිස්වරයාටත්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් විෂය භාර අමාත්‍යවරයාටත් දැනුම් දී සහිකධුරය සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට විධිවිධාන සැලැස්විය යුතුය. එහෙත් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ සභාවක් සඳහා අතුරු මැතිවරණයකට අවකාශ නැත.

404. මේ තත්ත්වයට විසඳුමක් වශයෙන් 2007 අංක 16 දරන පළාත් පාලන ආයතනය ඡන්ද විමසීම් විශේෂ විධිවිධාන පනතේ 3 වැනි වගන්තිය මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 65 අ වගන්තිය අනුව පුරප්පාඩුව සඳහා සුදුසු අපේක්ෂකයකු නොමැති අවස්ථාවක හෝ අපේක්ෂකයින්

අවසන්ව ඇති අවස්ථාවක පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ සුදුසුකම් ලබන තැනැත්තකු එම පළාත් පාලන ආයතනයේ සභිකයකු වශයෙන් නම් කරන ලෙස අදාළ පක්ෂ ලේකම්වරයා වෙත හෝ කණ්ඩායම් නායක වෙත තේරීම්භාර නිලධාරී විසින් දැනුම් දිය යුතුව ඇත.

405. මේ තත්ත්වය යටතේ ප්‍රජාතන්ත්‍රීය අයිතිය සම්පූර්ණයෙන් උල්ලංඝනය වී ඇති අතර පක්ෂ නායකයාගේ අභිමතය පරිදි සභාවේ සභිකධුර සඳහා පුද්ගලයින් පත්කර ගැනීමට සම්පූර්ණ අවකාශය ලබාදී ඇත. ඒ අනුව සභිකයින් ඉල්ලා අස්වන බවට ව්‍යාජ ලිපි ඉදිරිපත් කර සභිකයින් ඉවත් කිරීමට පක්ෂ නායකත්වය උත්සාහ කිරීම හා 10 අ වගන්තිය යටතේ සභිකයින්ගේ පක්ෂ සාමාජිකත්වය අහිමි කිරීම මගින් සභිකත්වයෙන් ඉවත්කිරීම හා අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය අහිමි කිරීම මත නාමයෝජනා පත්‍රයෙන් කපා හැරීම වැනි සිදුවීම් මෙම පනත සම්මත වීමෙන් පසුව බෙහෙවින් වැඩි වී ඇත.

406. මේ අනුව 2011 වර්ෂයේ බලයට පත්වූ සමහර පළාත් පාලන ආයතන කිහිපයක මේ වන විට ඡන්දයෙන් තේරීපත් වූ සභිකයින් ඇත්තේ ඉතාම අල්ප සංඛ්‍යාවකි. අනෙකුත් සියලුම සභිකයින් පක්ෂ ලේකම්වරයාගේ ඕනෑකම මත පත්කර ගත් පුද්ගලයින්ය. ඒ අනුව ඡන්දදායකයාගේ ඡන්දයෙහි වටිනාකමක් නැති තත්ත්වයට පත්ව ඇත. විශාල වැය බරක් දරා මැතිවරණ පවත්වා තෝරා පත් කර ගන්නා සභිකයින් පක්ෂ ලේකම්වරයාට අවශ්‍ය පරිදි ඉවත් කර වෙනත් පුද්ගලයින් පත්කර ගැනීමට ඉඩ සැලසීම තුළින් ඡන්දයෙහි වටිනාකමක් නැතිවා මෙන්ම මැතිවරණයට දරන වියදම ද අනවශ්‍ය වියදමක් බවට පත්වනු ඇත.

407. නාමයෝජනා පත්‍රයේ සියලුම නම් අවසන් වූ විට සහ කිසියම් මනාප සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයකු නොමැති විට 2007 අංක 16 පනතට අනුව නිශ්චිත කාලයක් තුළ පුරප්පාඩුව පිරවීම සඳහා නාමයෝජනා කරන ලෙස පක්ෂ ලේකම්වරයාට/ කණ්ඩායම් නායකයාට දැනුම් දිය යුතු වුවද කිසියම් විදියකින් නිශ්චිත කාලසීමාව තුළ නාමයෝජනාවක් වීමට අපොහොසත් වන පක්ෂ, කණ්ඩායම් සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව එම පනත මගින් ප්‍රතිපාදන සලසා නැත. එබඳු අවස්ථාවක නැවත එම පුරප්පාඩුව පිරවීම අක්‍රිය තත්ත්වයට පත්වනු ඇත.

408. එසේ වුවද කේවල ඡන්ද ක්‍රමය මත කොට්ඨාසයක පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීම සඳහා පුරප්පාඩු වූ කොට්ඨාසය සඳහා පමණක් අතුරු මැතිවරණයක් පැවැත්වීමේ පැහැදිලි ක්‍රියාමාර්ගයක් 1978 ට පෙර බලාත්මකව තිබූ හා 1971 තෙක් ක්‍රියාත්මක වූ ඡන්ද විමසීම් නීතිය තුළ පෙන්වා දී තිබිණ.

මනාප සහිත සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමයට එරෙහිව ඉදිරිපත් කර ඇති කරුණු

409. සෑම ඡන්දයකටම හිමිවිය යුතු සමාන වටිනාකම ලැබෙන ඡන්ද ක්‍රමයක් ලෙස සමානුපාතික නියෝජනය ක්‍රමය හැඳින්විය හැකි අතර 1979 දී හඳුන්වා දුන් පක්ෂයෙන්/කණ්ඩායමෙන් නම් කරන ප්‍රමුඛතා නම් ලැයිස්තුවක් හරහා අපේක්ෂකයන් පත් කර ගැනීමේ සමානුපාතික නියෝජන ක්‍රමය වෙනුවට පක්ෂය හෝ කණ්ඩායම් නායකයා විසින් නම් කරන අපේක්ෂකයන් අතුරින් තමා කැමති අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා ඡන්දදායකයාට ස්වකීය කැමැත්ත ප්‍රකාශ කළ හැකි මනාප සහිත සමානුපාතික නියෝජන ක්‍රමය 1987 වර්ෂයේ හඳුන්වා දෙන ලද්දේ ඡන්දදායකයන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතිය වඩාත් තහවුරු කිරීමේ අභිලාෂයෙනි. පක්ෂයෙන්/ කණ්ඩායමෙන් ඉදිරිපත් කරන ප්‍රමුඛතා නම් ලැයිස්තුවක් හරහා නියෝජිතයන් තෝරා ගැනීමට වඩා ඡන්දදායකයා තමා කැමති අපේක්ෂකයෙකු තෝරා ගැනීමට අවකාශ ලබා දීම බෙහෙවින් ප්‍රජාතන්ත්‍රවාදී පියවරකි. එසේ වුවත් එකී යහපත් ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාමාර්ගය පිළිබඳව නිසි අවබෝධයක් නොතිබීම නිසා හා නිසි ලෙස භාවිතා නොකිරීම නිසා සමස්ත සමානුපාත ක්‍රමයටම එරෙහිව ජනතා මතයක් ගොඩනැගෙමින් පවතී. තවද අපේක්ෂකයන් අතර මනාප සඳහා වූ තරගය සහ ජයග්‍රහණය සඳහා කවර හෝ අයුරකින් මනාප රැස් කරගත යුතුය යනුවෙන් අපේක්ෂකයන් තුළ ඇති ආකල්පය යන හේතු නිසා මේ ක්‍රමය පිළිබඳව බලවත් අප්‍රසාදයක් ඇතිවී තිබේ. එබැවින් පෙර පැවති කේවල ක්‍රමය වඩාත් යහපත් බවත් සමානුපාතය අත්හැර කේවල ඡන්ද ක්‍රමයට යා යුතු බවටත් මතවාදයක් ප්‍රචලිත වෙමින් පවතී.

එනමුත් කළ යුතුව ඇත්තේ 2012 අංක 22 දරන පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් හඳුන්වා දී ඇති කේවල ක්‍රමයේ හා සමානුපාත ක්‍රමයේ සිද්ධාන්ත ඇතුලත් මිශ්‍ර ඡන්ද විමසීම් ක්‍රමය වඩාත් සංවර්ධනය කිරීම හෙවත් සෑම ඡන්දයකම නිසි වටිනාකම ලැබෙන සමානුපාත ක්‍රමයද භාවිතා කරමින් ඒ ඒ නිශ්චිත ප්‍රදේශ නියෝජනය සඳහා නියෝජිතයන් පත් කර ගැනීමේ යෝජනා ඇසුරෙන් වඩාත් සුදුසු ඡන්ද ක්‍රමයක් භාවිතා කිරීම වේ.

2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ විධිවිධාන යටතේ ඡන්ද විමසීම් පැවැත්වීමේදී ඒ ඒ පළාත් පාලන ආයතනවල විසිරී ජීවත්වන්නා වූ සංඛ්‍යාත්මක සුළුතර ජන කණ්ඩායම්වලට ද ඡන්ද විමසීමකදී පුළුල් මහජන සහයෝගයක් නොමැති වුවද යම් ජන ප්‍රසාදයක් ඇති පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වලට ද ස්වකීය නියෝජිතයන් තේරී පත්කර ගැනීමේදී ඇති වන අපහසුතාව නැතහොත් නොහැකියාව සම්බන්ධයෙන් ඉදිරිපත්වන කරුණු නුදුරු අනාගතයේදී සලකා බැලීමට සිදුවනු ඇත.

එමෙන්ම කොට්ඨාස ක්‍රමය යටතේ තේරීපත්වන අපේක්ෂකයන්ගේ තනතුරුවල පුරප්පාඩුවක් ඇති වුවහොත් මෙයට පෙර පැවති ආකාරයෙන් අතුරු ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මෙම පනතේ විධිවිධාන නොමැති අතර පුරප්පාඩුව සඳහා තැනැත්තෙකු නම් කිරීම පක්ෂ ලේකම්වරයාට නැතහොත් කණ්ඩායම් නායකයාට පවරා තිබීම පාලන බලයේ පදනම ජනතා කැමැත්ත මත විය යුතු ය යන ජාත්‍යන්තර සම්මුතියට පටහැනි බවට ඉදිරිපත් කරන මතය ප්‍රතික්ෂේප කිරීම අපහසුය.

410. මනාප සහිත සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය යටතේ කිසියම් අපේක්ෂකයෙකුට මනාප ඡන්දය ප්‍රකාශ කිරීමට අවශ්‍ය නම් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අනිවාර්යයෙන් ඔහු තරග කරන පක්ෂයටද ඡන්දය දිය යුතුය. එමෙන්ම අදාළ අපේක්ෂකයින් කිසිවෙකුට හෝ කැමති නොවූවත් පක්ෂයට ඇති කැමැත්ත මත ඡන්දය ප්‍රකාශ කිරීමට පෙළඹේ. එම ඡන්දයෙන් එක් එක් පක්ෂය/ කණ්ඩායම යටතේ තේරී පත් වන සහික සංඛ්‍යාව තීරණය වන අතර එමගින් ඡන්දදායකයා අකමැති අපේක්ෂකයින්ටද තේරීපත්වීමට අවස්ථාව හිමිවේ.

411. පක්ෂයකින් ඉදිරිපත් වීමට අකමැති නමුත් ස්වාධීනව ඉදිරිපත් වී නියෝජිතයකු ලෙස තේරී පත්වීමට කැමැත්ත දක්වන එමෙන්ම ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රසාදය දිනා ගත් පුද්ගලයකුට ඊට අවස්ථාවක් නොමැති වීම මත ප්‍රජාතන්ත්‍රවාදය සීමා වී ඇත. සභාවට සේවයක් කිරීමට කැමති උගත්, බුද්ධිමත් පිරිසට ඊට අවකාශ නොමැති වීම බලවත් අඩුපාඩුවකි. විශේෂයෙන් ගම් මට්ටමේ පිළිගත් ප්‍රභූ පුද්ගලයින් කණ්ඩායම් වශයෙන් තරග කිරීමට කැමැත්තක් නැත. ඒ හේතුවෙන් ප්‍රදේශයට හිතකාමී සේවය කිරීමට කැමති එසේ සේවය කිරීමට හැකියාව සහිත පුද්ගලයින් පළාත් පාලනයෙන් ඉවත් වීමේ ප්‍රවණතාවක් දක්නට ඇත.

412. සම්පූර්ණ සභා බල ප්‍රදේශය ඡන්ද විමසීම් ප්‍රදේශය ද වන බැවින් ප්‍රචාරක කටයුතු මුළු සභා බල ප්‍රදේශය තුළටම ව්‍යාප්ත කළ යුතු වනු ඇත. එබැවින් ඇති වන මනාප තරගය මත මැතිවරණ කාලය තුළදී කලකෝළහල බහුලවීම හේතුවෙන් සාමකාමී බවට තර්ජන ඇති වේ. සමහර අපේක්ෂකයින් මැර බලය යොදා ගැනීම මත ජීවිත හානි පවා සිදු වේ. එබඳු අවස්ථාවල නිලධාරීන් මැතිවරණ රාජකාරියෙහි යෙදීමට පවා අකමැත්තක් දැක් වූ අතර මෑත අතීතයේ මැතිවරණ රාජකාරී සඳහා නිලධාරීන් යොදා ගැනීමේදී මැතිවරණ රාජකාරිය රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය රාජකාරියක් බව පෙන්වා මැතිවරණ රාජකාරියට නොපැමිණීම තනතුර අහිමිවීමට හේතුවක් වන බවට දැඩි ලෙස අවවාද කිරීමට පවා සිදුවිය. 1991 සිට 2002 දක්වා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලදී මේ තත්ත්වය බෙහෙවින් දක්නට ලැබිණ.

413. ඡන්ද පොළ නියෝජිතයින් හා ගණන් කිරීමේ නියෝජිතයින් පත් කිරීම පක්ෂ නායකත්වයට හා ස්වාධීන කණ්ඩායම් නායකයාට පැවරී ඇති බැවින් අපේක්ෂකයින්ට ඡන්ද පොළ පිළිබඳව හෝ ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිළිබඳව හෝ තමාගේ නියෝජිතයකු පත් කිරීමට අවකාශ නොමැති වීම නිසා ප්‍රතිඵල විශ්වාස නොකරන තත්ත්වයට පත්ව ඇත. එහෙත් කේවල ක්‍රමයේ දී තමාගේ ඡන්ද පොළෙහි තමාගේ නියෝජිතයකු පත් කිරීමට අවකාශ තිබිණ.

414. වැඩිම මනාප ලබා ගත් තැනැත්තා පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා ලෙස පත් කෙරෙන සම්ප්‍රදායක් බොහෝ පක්ෂ විසින් ක්‍රියාත්මක කරන බැවින් එම තනතුරු ලබා ගැනීම සඳහා ඇති වන තරගය සාමයට මෙන්ම පක්ෂ විනය ට ද මහත් බාධාවකි. එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර පවා විවිධ මතභේද හා කුලල් කා ගැනීම් දක්නට ඇත. ඊට අමතරව හොර ඡන්ද දැමීම් හා මැර බලයෙන් ඡන්ද පෙට්ටි පිරවීමට ගත් උත්සාහය ද මෙහිලා සඳහන් කළ යුතුය. 2002 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී මේ තත්ත්වය බෙහෙවින් දක්නට ලැබිණ.

415. සම්පූර්ණ බල ප්‍රදේශය සඳහාම තරග කරන බැවින් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා දැරීමට සිදු වන වියදම අධිකය. එබැවින් ආර්ථික වශයෙන් සාමාන්‍ය පුද්ගලයෙකුට මේ සඳහා ඉදිරිපත්වීම අසීරුය. ඒ නිසාද ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපයට හානි වී ඇත.

416. ප්‍රචාරක කටයුතු සඳහා අවශ්‍ය මුදල් බාහිර පාර්ශ්වයන්ගෙන් ලබා ගැනීමට පෙළඹීම නිසා බලයට පත් වූ පසු එම පාර්ශ්වයන්ට බැඳීම් ඇති වීමෙන් වංචා, දූෂණ සහ අයථා ක්‍රියා ඉදිරියේ නිශ්ශබ්ද වීමට සිදුවන අවස්ථා එමටය. එමෙන්ම තමා නියෝජනය කරන පළාත් පාලන ආයතනයට සේවයක් කිරීම පසෙක තබා ඡන්ද විමසීම සඳහා වැයකළ මුදල් රැස්කර ගැනීමේ අයථා ක්‍රම කෙරෙහි පෙළඹීම දක්නට ඇත.

417. ඡන්ද ගණන් කිරීම මධ්‍යගතව සිදු කිරීම නිසාත්, මනාප ගණන් කිරීමේ සංකීර්ණ ස්වරූපය නිසාත්, වියදම් අධික වෙමෙන්ම දැඩි වෙහෙසකර කාර්යයක් බවට පත් වී ඇත. ඒ සඳහා අවශ්‍ය නිලධාරීන්, ගණන් කිරීමේ මධ්‍යස්ථාන, විදුලිය, සුභ සාධන සේවා, ප්‍රවාහන කටයුතු ආදී වශයෙන් සංවිධානය සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදු වේ.

418. මධ්‍යගත ගණන් කිරීමේදී ඡන්ද පෙට්ටි එම මධ්‍යස්ථාන වෙත රැගෙන යාමත්, ගණන් කිරීමේ සංකීර්ණ බවත්, ගණන් කිරීම සියලුම අපේක්ෂකයින්ගේ නිරීක්ෂණයෙන් බැහැරව සිදු වන බැවිනුත් ගණන් කිරීම හා මැතිවරණ ප්‍රතිඵල පිළිබඳව අපේක්ෂකයින්ගේ විශ්වාසය අඩු වී ඇත.

419. වැඩිම මනාප ලබා ගත් පුද්ගලයා නගරාධිපති/ සභාපති වශයෙන් පත් නොකර පක්ෂ ලේකම්වරයාට අවශ්‍ය පුද්ගලයකු නගරාධිපති හෝ සභාපති වශයෙන් පත් කිරීම තුළින් පක්ෂයේ අධිකාරී බලය ඉහළ ගොස් ඇති අතර මනාප සංඛ්‍යාව තුළම නගරාධිපති/ සභාපති තනතුර තීරණය කළ නොහැකි බැවින් සහිකයින්ගේ ඡන්දයෙන් නගරාධිපති/ සභාපති තෝරා පත්කර ගැනීම යෝග්‍ය බවට ප්‍රකාශිත අදහස් සලකා බැලීම සුදුසු ය.

420. මෙම ඡන්ද ක්‍රමය මත අපේක්ෂකයින් අතර ප්‍රතිපත්තිවලට වඩා පෞද්ගලිකත්වය ඉස්මතුවීමක් දක්නට ඇත. මැතිවරණ වේදිකාව පවා තමා විසින් ඉටු කිරීමට අපේක්ෂා කරන සේවය පිළිබඳ විග්‍රහයකට වඩා පෞද්ගලිකව එකිනෙකා විවේචනය කරන ස්වරූපයට පත්ව ඇත.පෞද්ගලිකව තමාගේ හැකියාව, ධන බලය, මැර බලය පෙන්වීමටත් එසේ නැත්නම් තමා කිසියම් ආකාරයකින් ලබා ඇති ජනප්‍රියතාව මතින් ජයග්‍රහණය කිරීමටත් පෙළඹී ඇත. මේ සඳහා එක් එක් අපේක්ෂකයන් විසින් විවිධ උපක්‍රම යොදා ගනු දක්නට ලැබුණි.

421. ප්‍රචාරක කටයුතු සිදු කිරීමේ දී අපේක්ෂකයන්ට ඇති වන අපහසුතාව සහ පෝස්ටර් ඇලවීම සඳහා සහ වෙනත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කිරීමට සිදුවන මුදල් ප්‍රමාණය සලකා බලා පෝස්ටර් ඇලවීමට සුදුසු ස්ථාන වෙන්කර දීමට සහ රැස්වීම් තැබීමට සුදුසු ස්ථාන එක් එක් පක්ෂවලට වෙන් කර දීම සඳහා ද සුදුසු වැඩ පිළිවෙලක් යෙදීම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් රැස්වීම් භූමි වෙන් කර දීම ඒ සඳහා පත් කළ කමිටුවක් මගින් සිදු කිරීම වඩාත් උචිතය.

422. එමෙන්ම ඡන්දදායකයාත්, සහිකයාත් අතර දැඩි දුරස්ථතාවක් ඇතිවී ඇත. ඊට හේතුව කේවල ක්‍රමයේදී තමාගේ ගම් ප්‍රදේශය තුළින් බිහිවන නායකත්වයක් සහාව තුළ දක්නට තිබූ නමුත් සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ සහිකයා ජය ගන්නේ මුළු සභා බල ප්‍රදේශයේම ඡන්දවලිනි. එබැවින් ඡන්දදායකයා සහ සහිකයා අතර දැන හැඳුනුම්කම දුරස්ථ වේ. ඡන්දදාකයකයාට තමාගේ දුක් ගැනවිලි සහ අපේක්ෂාවන් ඉදිරිපත් කිරීමට නියෝජිතයකු නොමැති වේ. ඒ තත්ත්වය තුළින් සහිකයාට ද මතුවන ප්‍රශ්න වලින් මඟ හැර යාමට අවකාශ සැලසී ඇත.

423. ස්වකීය ගම් ප්‍රදේශයට හෝ වීදිය නියෝජනය කිරීම සඳහා නිශ්චිත නියෝජිතයකු නොමැති වීම, මනාප රැස්කර ගැනීම සඳහා අපේක්ෂකයන් අතර ඇති වූ තරඟය, පළාත්පාලන ආයතන බල ප්‍රදේශය තුළම ප්‍රචාරන කටයුතුවල නිරත වීමට සිදුවීම නිසා හා මනාප පොරය නිසා බොහොමයක් අපේක්ෂකයන්ට විශාල මුදලක් ප්‍රචාරන කටයුතු සඳහා වැය කිරීමට සිදුවීම හා ඒ සඳහා වත්කම් ප්‍රමාණවත් නොවීම නාමයෝජනා පත්‍රයේ නම සඳහන් සියලු අපේක්ෂකයන් ජයග්‍රහණය ලැබීමේ ඒකාන්ත අදිටනින් තරඟ කරන නමුත් කුමන තත්ත්වයන් යටතේ වුවද (නිතරඟයෙන් පැමිණියේ වුවද) අපේක්ෂකයන් කිහිපදෙනෙකුම අනිවාර්යයයෙන් පරාජිතයන් වන බැවින්, ජයපතා තරඟ වැදුනු එම අපේක්ෂකයන් හා ඔවුන්ගේ සහායකයන් මනාප ප්‍රතිඵලය කෙරෙහි විශ්වාසය කඩ කර ගැනීම යනාදී හේතු නිසා මනාප සහිත සමානුපාතික ඡන්ද ක්‍රමය කෙරෙහි විශාල අප්‍රසාදයක් ඇති වී තිබේ. එයට විසදුමක් ලෙස හදුන්වාදෙන කේවල ක්‍රමය යටතේ වී වී කොට්ඨාශවලට නියෝජිතයන් තෝරාගැනීමටත් පරාජිත අපේක්ෂකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව මත පදනම්ව සමානුපාතික නියෝජනය යටතේ යම් නියෝජිතයන් සංඛ්‍යාවක් තෝරා ගැනීමෙන් යෝජිත නව ඡන්ද විමසීම් ක්‍රමවේදය පවත්නා ක්‍රමයට වඩා වඩාත් යහපත් ක්‍රමයක් වනු ඇතැයි ව්‍යවස්ථා සම්පාදකයන්ගේ මතය බැවින් ඉදිරි ඡන්ද විමසීම්වලදී එම නව ඡන්ද ක්‍රමය භාවිතා වනු ඇත.

XVIII වැනි කොටස

ඇගයීම

424. 2011 වර්ෂයේදී අදියර දෙකක් යටතේ පැවැත්වීමට තීරණය කරන ලද මෙම ඡන්ද විමසීම නාමයෝජනා 452 ක් ප්‍රතික්ෂේප වීමේ හේතුව මත අදියර තුනක් යටතේ පැවැත්වීමට සිදු විය. ඒ අනුව 2011.03.17 දින පළාත් පාලන ආයතන 234 ක් වෙනුවෙන්ද 2011.07.23 වැනි දින පළාත් පාලන ආයතන 65 ක් වෙනුවෙන්ද, 2011.10.08 වැනි දින පළාත් පාලන ආයතන 23 ක් වෙනුවෙන්ද වශයෙන් පළාත් පාලන ආයතන 322 ක් සම්බන්ධයෙන් ඡන්ද විමසීම පවත්වන ලදී. ඒ වන විට ධුර කාලය අවසන්ව නොමැතිවීම නිසා මඩකළපුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 9 ක සහ වවුනියා නගර සභාව, යාපනය මහ නගර සභාව යන පළාත් පාලන ආයතන 11 ක් සහ බිම් බෝම්බ ඉවත් කිරීම අවසන් නොවීම නිසා නැවත පදිංචි කිරීම් අවසන් කළ නොහැකි වූ පුදුකුඩ්ඉරුප්පු හා මුහුදුබඩපත්තු යන පළාත් පාලන ආයතන 2 ක ද ඡන්ද විමසීම කල් තැබීමට සිදුවිය.

425. මෙම වාර්තාව අවසන් කරන අවස්ථාව වන විට මඩකළපුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 9 ක සහ වවුනියා නගර සභාව හා යාපනය මහ නගර සභාව යන පළාත් පාලන ආයතනවල ධුර කාලය අවසන් වීමෙන් පසුව විශේෂ කොමසාරිස්වරුන් යටතට පත් කර ඇත. නැවත පදිංචි කිරීම් අවසන්ව නොමැති බැවින් ඡන්ද විමසීම කල් තබන ලද පුදුකුඩ්ඉරුප්පු හා මුහුදුබඩපත්තු යන ප්‍රාදේශීය සභා දෙකෙහි ඡන්ද විමසීම 2012 මාර්තු මස 24 වැනි දින පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර තිබියදී ඊට විරෙහිව අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් වූ පෙත්සම් දෙකක් හේතුවෙන් ඡන්ද විමසීම පැවැත්වීම වාරණයකට යටත් කිරීම නිසා ඡන්ද විමසීම පැවැත්විය නොහැකි විය. මේ දක්වාත් අදාළ නඩු විභාග කිරීම අවසන්ව නැත.

426. කෙසේ වෙතත් පළාත් පාලන ආයතන 322 ක් සම්බන්ධයෙන් පවත්වන ලද මෙම ඡන්ද විමසීම අවලංගු කිරීමට තරම් සිද්ධි නොමැතිව පැවැත්වීමට හැකි වීම පිළිබඳව සතුටු විය හැකි නමුත් ඡන්ද විමසීම පූර්ණ වශයෙන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් වශයෙන් පැවැත්වීමට නොහැකි වූ බවට සමහර දේශපාලන ක්‍රියාකාරීන්, නිරීක්ෂණ සංවිධාන හා උනන්දුවක් දක්වන පාර්ශ්ව විසින් කරනු ලබන ප්‍රකාශ පිළිබඳව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. එකී විවේචන හා චෝදනා ඡන්ද විමසීම් නීති සංශෝධනයේ දී සලකා බැලීම අවශ්‍යය. රාජ්‍ය දේපළ අනිසි පරිහරණය, රාජ්‍ය මාධ්‍යවල පක්ෂපාතීත්වය නීති විරෝධී ප්‍රචාරක කටයුතු හා සමහර පොලිස් නිලධාරීන්ගේ මන්දෝත්සාහීබව හා එවැනි පොලිස් නිලධාරීන් මෙන්ම සමහර රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යම් යම් බලපෑම් මත ස්වෛච්ඡාවෙන් හෝ නීතිය ක්‍රියාත්මක කිරීමට පසුබටවීම ඡන්ද විමසීම සම්බන්ධයෙන් එල්ල වූ චෝදනාවලට පදනම වී තිබේ.

427. කෙසේ වෙතත් මේ තත්ත්වයන් යම් දුරකට හෝ මැඩ පවත්වා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන්, අතිරේක ලේකම්වරුන් ඇතුළු ඔවුන්ගේ කාර්ය මණ්ඩලයටද දිස්ත්‍රික් මට්ටමේදී දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිලධාරීන් ඇතුළු නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සහතික කිරීමෙහිලා ඉමහත් කැපවීමෙන් කටයුතු කළ සියලුම රාජ්‍ය නිලධාරීන්ට හා සේවකයින්ටද මගේ කෘතඥතාව පළ කරමි.

428. ඡන්ද විමසීමකදී දිස්ත්‍රික් ලේකම්වරයා ඇතුළු කාර්ය මණ්ඩලය සමග සමීප සම්බන්ධතාවයෙන් කටයුතු කරන නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයා ඇතුළු කාර්ය මණ්ඩලය වෙත පැවරෙන කාර්ය භාරය අති විශාලය. යම් යම් බාධක හමුවේ වුවද ඡන්ද විමසීමේ අදියර තුනට අදාළව විශාල මෙහෙවරක් ඉටු කළ දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය ඇතුළු සමස්ථ රාජ්‍ය සේවය වෙතම මගේ කෘතඥතාවය හිමි වේ.

429. දීප ව්‍යාප්ත ඡන්ද විමසීමකදී ඡන්ද පොළ නිලධාරීන්, ඡන්දදායකයින්, අපේක්ෂකයින්, ඡන්ද මධ්‍යස්ථාන හා ඡන්ද විමසීමට අදාළ සියලුම ආරක්ෂක අයිතමයන් කෙරේ ආරක්ෂක ආවරණය සැලසීමෙන් ඡන්ද විමසීමේ හා ගණන් කිරීමේ කටයුතු ගැටළුවකින් තොරව අවසන් කර ගැනීමට ශ්‍රී ලංකා පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය හා විශේෂිත ආරක්ෂක සේවා සැපයීමෙන් දායක-වූ ත්‍රිවිධ හමුදාව වෙත බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

430. ඡන්ද විමසීමකදී රජයේ මුද්‍රණාලයාධිපතිවරයා ඇතුළු මුද්‍රණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය මැතිවරණ දෙපාර්තමේන්තුව සමග දැඩි බැඳීමකින් කටයුතු කළ යුතු වනු ඇත. නාමයෝජනා දැන්වීම පළ කිරීමට සති දෙක තුනකට පෙර ආරම්භ වන මුද්‍රණ කටයුතු නාම යෝජනාවලින් පසුව ඡන්ද පත්‍රිකා, ගෘහ දැන්වීම් හා ඡන්ද විමසීමේ දැන්වීම් කඩිනමින් මුද්‍රණය කර දීමෙනුත් එකිනෙකට වෙනස් ඡන්ද පත්‍රිකා වර්ග 322 ක් නියමිත වේලාවට මුද්‍රණය කර දීමෙන් හා නිරවුල්ව දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදා හැරීමෙන්ද අදියර තුනටම අවශ්‍ය සියලුම මුද්‍රණ කටයුතු කඩිනමින් හා ප්‍රශස්ත ලෙස ඉටු කර දීමෙන් මුද්‍රණ දෙපාර්තමේන්තුව දැක්වූ කාර්යක්ෂමතාව මම අතිශයින් අගය කරමි. තැපැල් ඡන්ද අයදුම්පතින් ආරම්භ කර රක්ෂණ පැකට්ටු ආපසු ලැබීම දක්වා තැපැල් ඡන්ද සම්බන්ධ කටයුතු හා සියලුම ඡන්දහිමියන් වෙත ව්‍යවස්ථාපිතව යැවිය යුතු නිල ඡන්ද දැන්වීම්පත් බෙදා හැරීම 180,000 ක් පමණවූ විශාල නිලධාරී පිරිසකගේ පත්වීම් ලිපි කඩිනමින් බෙදා හැරීම වැනි ඉතා හදිසිවූත්, වැදගත්වූත්, අත්‍යවශ්‍යවූත් රාජකාරී සංවිධානාත්මකව

මෙහෙය වූ තැපැල්පතිවරයා ඇතුළු තැපැල් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය වෙතද මගේ කෘතඥතාව හිමි විය යුතුය.

431. ඡන්ද විමසීමට අදාළව නිලධාරීන් සහ බඩු බාහිරාදිය ඡන්ද මධ්‍යස්ථාන කරා රැගෙන යාම හා ආපසු ගණන් කිරීමේ මධ්‍යස්ථාන කරා රැගෙන ඒම මෙන්ම ඡන්ද රාජකාරී කටයුතු සඳහා නිලධාරීන්ට අවැසි ප්‍රවාහන පහසුකම් සලසා දුන් ශ්‍රී ලංකා දුම්රිය සේවය, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, පෞද්ගලික බස්රථ සංගමය සහ අත්‍යවශ්‍ය සේවා රැසක් ඉටු කර දීමෙන් දායක වූ ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම්, බණිජ තෙල් නීතිගත සංස්ථාව යන ආයතනවල සහ රජයේ කර්මාන්ත ශාලාවෙහි සියලුම නිලධාරීන් හා සේවකයින් වෙත මගේ කෘතඥතාව පළ කරමි.

432. ඡන්ද මධ්‍යස්ථානවලින් වැඩි කොටසක් රජයේ විද්‍යාල ගොඩනැගිලි වූ අතර බෞද්ධ හා වෙනත් පූජනීය ස්ථාන හා පොදු ගොඩනැගිලි රාශියක් යොදා ගැනීමේදී නොපැකිල අවශ්‍ය සහය ලබා දීමෙන් කටයුතු කළ විහාරාධිපතීන් වහන්සේලා, අනෙකුත් පූජකතුමන්, විදුහල්පතිවරුන් සහ අනෙකුත් ස්ථාන භාරකරුවන් හා තාවකාලික ගොඩනැගිලි ඉදි කිරීමට ඉඩම් ලබා දීමෙන් සහය දැක්වූ පෞද්ගලික ඉඩම් හිමියන් වෙතද මගේ ස්තූතිය පිරිනමමි.

433. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සකස් කරනු ලබන මැතිවරණ ප්‍රතිඵල මැතිවරණ මහලේකම් කාර්යාලයේදී නැවත පරීක්ෂා කිරීම සහ වගුගත කිරීම සඳහා සහය දැක්වූ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු සියලුම නිලධාරීන් සහ ඡන්ද විමසීමේ පළමු අදියරේදී අනුමත ප්‍රතිඵලය මාධ්‍ය ආයතන වෙත මුද්‍රා හැරීම සඳහා අනුග්‍රහය දැක්වූ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයනාංශයේ සියලුම නිලධාරීන් වෙතද දෙවැනි, තුන්වැනි අදියරවලදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හරහා ප්‍රතිඵල මාධ්‍ය ආයතන වෙත නිකුත් කිරීමට අනුග්‍රහය දැක්වූ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා ඇතුළු කාර්ය මණ්ඩලය මෙන්ම ඒ සඳහා අවශ්‍ය විද්‍යුත් සන්නිවේදන පහසුකම් සලසා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් හි නිලධාරීන් දැක් වූ සහාය ද බෙහෙවින් අගය කරමි.

434. ඡන්ද විමසීමට අදාළව ඡන්දදායකයින්, අපේක්ෂකයින් හා දේශපාලන බලධාරීන් දැනුවත් කිරීමේලා මැතිවරණ දෙපාර්තමේන්තුව සමග සමීප සම්බන්ධතාවකින් කටයුතු කළ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඇතුළු සියලුම රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන ප්‍රධානීන් සහ සියලුම මාධ්‍යවේදීන් ඡන්ද විමසීමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දැක්වූ සහයෝගය සම්බන්ධයෙන් එම ආයතනවල ප්‍රධානීන් ඇතුළු සියලුම නිලධාරීන් වෙත ස්තූතිය පළ කරමි.

435. නිදහස් හා සාධාරණ මැතිවරණයක් අපේක්ෂා කරන සිවිල් සමාජයන්ද, මැතිවරණ නිරීක්ෂණ කාර්යයෙහි යෙදුන PAFFREL හා CMEV සංවිධාන ඇතුළු සියලුම නිරීක්ෂණ සංවිධනවලින්ද ඡන්ද විමසීම් කටයුතු නිදහස් හා සාධාරණ අන්දමින් පවත්වා ගැනීම සඳහා ලබා දුන් ක්‍රියාකාරී දායකත්වය මනා පිටු බලයක් වූ බව නොරහසකි. එහෙයින් එම සියලුම සංවිධාන මේ මොහොතේ දී කෘතවේදීව සිහිපත් කරමි.

436. මැතිවරණය නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ලබා දුන්නේ අතිවිශාල දායකත්වයකි. අවසන් වශයෙන් නාමයෝජනා දිනයේ සිට මෙම කටයුත්තට දායකවූ දේශපාලන පක්ෂ නායකයින් හා ලේකම්වරුන්, ඡන්ද අපේක්ෂකයින් හා ඡන්දය ප්‍රකාශ කළ සියලුම ඡන්දදායකයින් ඡන්ද විමසීමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දැක්වූ සහයෝගය අගය කරන අතර නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා ඇපකැපවී කටයුතු කළ ඒ සියලුදෙනා වෙත නැවතත් මගේ ස්තූතිය පළ කරමි.

437. මැතිවරණ මහලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සියලුම නිලධාරීන් හා සියලුම සේවකයින් දිවා රෑ නොබලා සියලු දුක් ගැහැට විඳ ගනිමින් මහත් කැපවීමෙන් යුතුව කටයුතු නොකරන්නට මෙම ඡන්ද විමසීමේ කටයුතු මෙතරම් සාර්ථක ලෙස නිම කිරීම සිහිනයක් වනු ඇත. එපමණක් නොව දෙපාර්තමේන්තුවේ සෑම කටයුත්තකදීම අනුපමය කාර්යභාරයක් ඉටු කරමින් කැපවීමෙන් කටයුතු කරන මැතිවරණ වෘතියවේදීන්ගේ සහායද මෙම ඡන්ද විමසීමේ කටයුතු සාර්ථක කර ගැනීමෙහිලා මහත් පිටුවහලක් වූ බව සඳහන් කළ යුතුය.

XIX වැනි කොටස

සමාප්තිය

438. පළාත් පාලන ආයතන 335 කින් 322ක් සම්බන්ධයෙන් අදියර තුනකදී ඡන්ද විමසීම පවත්වා අවසන් කළ 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පවත්වනු ලැබූ අවසන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වශයෙන් හැඳින්විය හැකිය. 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත අනුව ඉදිරි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම කොට්ඨාස පදනම මත පැවැත්විය යුතු වන බැවිනි. 2011 පැවැති මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අදියර තුනක් යටතේ වුවද උතුරු හා නැගෙනහිර පළාත්ද සමග පැවැත්වීමට හැකි වීම විශේෂත්වයකි.

439. මෙම ඡන්ද විමසීමේ ප්‍රතිඵලය අභියෝගයට ලක් කරමින් ඊට එරෙහිව පෙත්සම් 28 ක් ඉදිරිපත් වූ අතර එයින් 26 කින්ම ඉල්ලා සිටියේ මනාප නැවත ගණන් කරන ලෙසයි. කෙසේ වෙතත් එයින් පෙනී යන්නේ එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර ඇති මනාප පොරයේ උච්චතම අවස්ථාව බවයි. පෙත්සම් දෙකකට අදාළ නඩු තීන්දු මෙතෙක් ලැබී නැත. ලබාදී ඇති තීන්දු අනුව අදාළ පෙත්සම් සියල්ලක් නිශ්ප්‍රභා කර තිබීමද විශේෂත්වයකි.

440. 2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් මූලික කටයුතු ආරම්භයත් සමගම මෙම වාර්තාව සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම සිදු කරනු ලැබූ අතර 2012 හා 2013 යන වර්ෂවල පළාත් සභා ඡන්ද විමසීම් හේතුවෙන් වාර්තාව සකස් කිරීම පමාවිය. ප්‍රතිපත්තියක් වශයෙන් පෙත්සම් විභාග අවසන් වනතුරු වාර්තා නිකුත් නොකිරීම ප්‍රමාදයට තවත් හේතුවකි. අනිත් අතට මෙම ඡන්ද විමසීම මැතිවරණ කොමසාරිස්වරුන් දෙදෙනෙකු යටතේ සිදු කරනු ලැබීමද සැලකිය යුතු කරුණකි.

441. මනාප ගණන් කිරීමේ අරමුණ වන්නේ හිමි කර ගත් සභිකධුර සංඛ්‍යාව සඳහා සුදුසු අපේක්ෂකයින් තෝරා පත් කර ගැනීම බැවින් කිසියම් සභිකධුර සංඛ්‍යාවක් ලබා ගත් පක්ෂ සහ කණ්ඩායම්වල අපේක්ෂකයින්ගේ පමණක් මනාප ගණන් කිරීමට එවකට මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගනු ලැබූ තීරණය අනුව අදාළ පක්ෂ හා කණ්ඩායම්වල පමණක් මනාප ගණන් කිරීම සිදු කරන ලදී.

442. ඒ අනුව පළාත් පාලන ආයතන 322 ක් සඳහා වෙන වෙනම ඡන්ද විමසීමක් වශයෙන් එක් එක් පක්ෂය ස්වාධීන කණ්ඩායම ලබාගත් ඡන්ද සහ එක් එක් අපේක්ෂකයා ලබාගත් මනාප සංඛ්‍යාව පිළිබඳව විග්‍රහයක් ද මෙම වාර්තාවට ඇතුළත් කර ඇත. ඒ අනුව මෙම වාර්තාවේ පිටු සංඛ්‍යාව තරමක් විශාල බැවින් වෙළුම් දෙකක් වශයෙන් පිළියෙල කර ඇත. පළමුවැනි වෙළුමට වාර්තාව, පරිශිෂ්ඨ, සටහන්, උපලේඛන සහ ඡන්ද විමසීම් කටයුතු පිළිබඳව විග්‍රහ කෙරෙන සටහන් ඇතුළත් කර ඇති අතර ගණන් කිරීම හා ප්‍රතිඵල පිළිබඳ සංඛ්‍යාත්මක සටහන් දෙවැනි වෙළුමට ඇතුළත් කර ඇත. ඡන්ද විමසීම පිළිබඳ අධ්‍යයනයක් කරන අයකුට මෙම වාර්තාව බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත යන්න මාගේ විශ්වාසයයි. ඉදිරි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත අනුව කේවල ක්‍රමය හා සමානුපාතික ක්‍රමය යන ක්‍රම දෙකෙහි සංකලනයකින් සිදු කිරීමට නියමිත බැවින් සෘජුවම මෙහි සඳහන් කරුණු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා පාදක කරගත නොහැකි වුවත් මෙහි සඳහන් නිරීක්ෂණ හා නිර්දේශවලින් ගෙන හැරපා ඇති කරුණු පිළිබඳව ඡන්ද බලය හා ඡන්ද විමසීම් පිළිබඳව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සහ මේ පිළිබඳව යම් අධ්‍යයනයක යෙදෙන තැනැත්තන්ගේ අවධානය යොමුවනු ඇතැයි අපේක්ෂා කරමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්
මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රජගිරිය
2014.12.31

◇◇◇◇◇◇

2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් [සංශෝධන] පනත මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත [262 වන අධිකාරය] සංශෝධනය කිරීම

සංක්ෂිප්ත සටහන්

01. 2012 නොවැම්බර් මස 15 වැනි දින සහතික කරන ලද මෙම සංශෝධන පනත මගින් කොට්ඨාස පදනම මත ඡන්ද විමසීම් පැවැත්වීමත් කේවල ක්‍රමය මත සහ සමානුපාතික පදනම මත සභිකයින් තෝරා පත්කර ගැනීමත් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව ඉදිරි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් මෙම සංශෝධනයන්ට යටත්ව සිදුකළ යුතුව ඇත.

02. කොට්ඨාස පදනම මත ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා එක් එක් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් නිශ්චිතව කොට්ඨාස සංඛ්‍යාවකට බෙදා වෙන් කළ යුතු අතර බෙදා වෙන් කළ යුතු කොට්ඨාස සංඛ්‍යාව විෂයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ඇත. කොට්ඨාස සීමා නිර්ණය කිරීම ජාතික සීමා නිර්ණය කමිටුව සහ දිස්ත්‍රික් සීමා නිර්ණය කමිටුව විසින් ඉටුකරනු ඇත. දිස්ත්‍රික් කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා ජාතික කමිටුව විසින් සලකා බැලිය යුතු නිර්ණායකයන්ට අනුකූලද යන්න සොයා බලා ජාතික කමිටුව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලබන අතර අමාත්‍යවරයා විසින් එම නිර්දේශ සම්බන්ධ වාර්තාව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ඇත.

03. ඒ අනුව එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා බෙදා වෙන්කළ යුතු කොට්ඨාස සංඛ්‍යාව එම කොට්ඨාසවල මායිම්, නම්, අංක ආදිය ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබිය යුතුය. එහෙත් සංශෝධන පනතේ 3 ඈ(1) වගන්තිය අනුව ජනාධිපතිවරයා විසින් ප්‍රසිද්ධ කරනු ලබන එකී කොට්ඨාස සීමා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් නැවත සංශෝධනය කිරීමටත් එම අළුත් මායිම්, නම් අංක හෝ අක්ෂර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකිරීමෙන් ක්‍රියාත්මක කිරීමටත් අවකාශ සලසා ඇත. මෙමගින් දිස්ත්‍රික් කමිටුව ජාතික කමිටුව සහ ජනාධිපතිවරයා ඉක්මවා යාමේ බලයක් විෂයභාර ඇමතිවරයාට සලසාදීම උචිත ද යන්න නැවත සලකා බැලිය යුතු තත්ත්වයකි.

04. මෙම වෙනස් කිරීම සිදු කළ ඉක්බිතිවම මේ ආඥාපනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් එකී වෙනස්කම් බල පැවැත්විය යුතු යැයි 3 ඈ (2)(1) උප වගන්තියේ දක්වා තිබීමත් 9 වැනි වගන්තිය අනුව එම පරිපාලන සීමා වෙනස් කරනු ලැබූ පළාත් පාලන ආයතන හෝ කොට්ඨාසය සහ ඊට අදාළව 12 වන වගන්තියේ විධි විධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය. ඒ අනුව ඡන්දහිමි නාම ලේඛන, ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම්, ඡන්ද මධ්‍යස්ථාන තීරණය කිරීම් ආදිය සංශෝධනය කළ යුතු වනු ඇත. ඡන්ද විමසීමක් සඳහා සිදුකරනු ලබන මූලික සංවිධාන කටයුතුවලදී මෙසේ සිදුකරනු ලබන හදිසි වෙනස් කිරීම් මත නාමලේඛන සකස් කිරීම හා ඡන්ද කොට්ඨාස ඡන්ද මධ්‍යස්ථාන වෙනස් කිරීම් අසීරුවනු ඇත.

ඡන්දහිමි නාමලේඛනය

05. සංශෝධන පනත අනුව ඡන්ද විමසීම් ප්‍රදේශය වශයෙන් සැලකිල්ල යොමු කර ඇත්තේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බැවින් එක් එක් කොට්ඨාසයක් අනුව ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම අවශ්‍ය නොවේ. ඒ අනුව 10 - 19 දක්වා වගන්ති ඇතුළත් කළ යුතුද යන්න නැවත සලකා බැලිය යුතුය.

නාමයෝජනා

06. නාමයෝජනා සකස් කිරීමේදී එක් එක් පළාත් පාලන ආයතනයක් සඳහා එක් නාමයෝජනා පත්‍රයක් සකස් කළ යුතු අතර එක් එක් කොට්ඨාසය සඳහා යෝජිත අපේක්ෂකයාගේ නම අංක 1 සිට අනුපිළිවෙලින් දැක්වෙන කොට්ඨාස අංක අතුරින් නියමිත කොට්ඨාස අංක ඉදිරියේ සටහන් කළ යුතුය.

07. ඉන් අනතුරුව කොට්ඨාස අනුව තෝරා පත් කර ගතයුතු සභික සංඛ්‍යාවෙන් 30% කට සමාන වූ අමතර තැනැත්තන් සංඛ්‍යාවකගේ නම් ඇතුළත් කළ යුතුය. මෙම 30% ප්‍රතිශතය සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් විය යුතුය. එක් එක් පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් නාම යෝජනා කළ යුතුවූ අමතර තැනැත්තන්ගේ නම් සංඛ්‍යාව කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නියම කළ යුතුයි යනුවෙන් පනතට සංශෝධනයක් ඇතුළත් කිරීම උචිතය. එසේ නොවුවහොත් මෙම අමතර අපේක්ෂක සංඛ්‍යාවෙහි විෂමතාව මත නාමයෝජනා භාර ගැනීමේ අවස්ථාව ගැටළු සහගත වනු ඇත.

තරුණ අපේක්ෂක සංඛ්‍යාව

08. 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් නාමයෝජනා කළ යුතු අපේක්ෂක සංඛ්‍යාවෙන් 40% තරුණ අපේක්ෂකයින් ඇතුළත් කිරීම අනිවාර්යය කර ඇත. එසේ නොවීම නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේපවීමට පවා හේතුවක් විය. එහෙත් මෙම සංශෝධන පනත මගින් නාමයෝජනා පත්‍රයේ

සඳහන් නම් අතුරින් 25% ක් කාන්තාවන් සහ තරුණයන්ගෙන් සමන්විත විය හැකි යැයි දක්වා ඇත. එසේ නොවීම නාමයෝජනාව ප්‍රතික්ෂේපවීමට හේතුවක් කර නොමැත. නාමයෝජනාවෙහි නම් ඇතුළත් කිරීම කොට්ඨාස පදනමින් සිදු කරන්නක් බැවින් සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමයේදී මෙන් තරුණ හා කාන්තා අපේක්ෂක සංඛ්‍යාව 25% ඇතුළත් කිරීම තරමක් අසීරු කරුණකි.

09. කෙසේ වෙතත් මේ පිළිබඳව නැවතත් සලකා බැලිය යුතු අතර අමතර තැනැත්තන් වශයෙන් නාමයෝජනා පත්‍රයට ඇතුළත් කළ යුතු 30% තරුණ හා කාන්තා නියෝජනයට වෙන්කර තැබීම උචිත යැයි යෝජනා කරමි. එහෙත් තරුණ හා කාන්තා යන දෙපාර්ශ්වය සඳහාම ඇත්තේ 30% බැවින් එක් එක් පළාත් පාලන ආයතනය සඳහා නම් කළ යුතු අමතර තැනැත්තන් සංඛ්‍යාව දක්වන ගැසට් නිවේදනයේ කාන්තාවන් සහ තරුණයන් කවර සංඛ්‍යාවක් බැගින් ඇතුළත් කළ යුතුද යන්න සඳහන් කිරීම අත්‍යවශ්‍යය.

තැපැල් ඡන්ද

10. කේවල ක්‍රමය යටතේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පැවති අවධියේ එක දිනකට ඡන්ද විමසීම් පවත්වා ඇත්තේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක පළාත් පාලන ආයතන කිහිපයක් සඳහා පමණි. එහෙත් සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමය ආරම්භයත් සමග ජාතික මැතිවරණ ස්වරූපයෙන් දීප ව්‍යාප්තව මෙම ඡන්ද විමසීම් පැවැත්වීමට උත්සාහගනු ලැබීමත් සමග තැපැල් ඡන්ද ක්‍රමයද හඳුන්වා දෙන ලදී. ඒ අනුව තැපැල් ඡන්ද සඳහා වන ඡන්ද විමසීම ඡන්ද විමසීම් දිනට දින 10 කට පමණ පෙර එක් එක් සහතික කිරීමේ නිලධාරි කාර්යාලයේදී සිදු කරනු ලැබූ අතර ඡන්දය සලකුණු කළ ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂණ පැකට්ටු අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත තැපැල් මගින් බෙදා හැරීමත් තේරීම්භාර නිලධාරී විසින් තම පරිපාලන දිස්ත්‍රික්කයට අයත් එක් එක් පළාත් පාලන ආයතනය වෙනුවෙන් වෙන වෙනම තැපැල් ඡන්ද පෙට්ටිවලට අදාළ තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂිත පැකට්ටු බහාලීමට සැලැස්වීමත් සිදු කෙරිණ. තැපැල් ඡන්ද ගණන් කිරීමද ඡන්ද විමසීම් දිනයේ පස්වරුවේ සාමාන්‍ය ඡන්ද පත්‍රිකා ගණන් කිරීම ආරම්භ කිරීමට පෙරාතුව වෙනම ගණන් කිරීමේ මධ්‍යස්ථානයකදී ගණන් කරන ලදී. ප්‍රතිඵල සැකසීම් ශාලාවේදී එක් එක් සාමාන්‍ය ගණන් කිරීමේ ශාලාවේ ප්‍රතිඵලය අතරට තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලාවේ ප්‍රතිඵලයද එක් කර එක් එක් පළාත් පාලන ආයතනයේ ඡන්ද හා මනාප ප්‍රතිඵලය සකස් කරන ලදී.

11. එහෙත් ඉහත සඳහන් සංශෝධන පනත අනුව ඡන්ද ගණන් කිරීමද ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ඡන්ද පොළේදීම සිදු කළ යුතු අතර තැපැල් ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කළ යුත්තේ කවර ආකාරයකින්ද යන්න දක්වා නැත.

12. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතට 1987 අංක 24 දරන සංශෝධන පනතින් ඇතුළත් කරන ලද තැපෑලෙන් ඡන්දයදීම සම්බන්ධයෙන් වූ 39 (ආ) වගන්තිය මෙම සංශෝධන පනතින් ඉවත් කර නොමැති බැවින් තවදුරටත් තැපැල් ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කළ යුතුය. එහෙත් සාමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ගණන් කිරීම මධ්‍යගතව සිදු කිරීමත් නව සංශෝධන යටතේ ඡන්ද පොළේ ගණන් කිරීම සිදු කිරීමත් මත තැපැල් ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කිරීම අසීරු කටයුත්තකි. තැපැල් ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ නම් දැනට අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ ඔස්සේ ඡන්ද පත්‍රිකා සහතික කිරීමේ නිලධාරීන් වෙත යවා සාමාන්‍ය ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත දිනට සතියකට පෙර අදාළ තැපැල් ඡන්ද පැකට්ටු නියමිත තේරීම්භාර නිලධාරීන් වෙත ගෙන්වා ගත යුතුය. සහතික කිරීමේ නිලධාරීන් විසින් තේරීම්භාර නිලධාරී වෙත රක්ෂණ පැකට්ටු චිවීම සඳහා භාවිතා කරනු ලබන, (A) කවරයේ පළාත් පාලන ආයතනය, කොට්ඨාස අංකය සහ නියමිත ඡන්ද පොළේ නම පැහැදිලිව සටහන් කර තැබීම පූර්ව අවශ්‍යතාවයකි.

13. චී අනුව තේරීම්භාර නිලධාරීන් වෙත ලැබෙන රක්ෂණ පැකට්ටු එක් එක් පළාත් පාලන ආයතනය අනුව මුද්‍රා තබා සකස් කළ තැපැල් ඡන්ද පෙට්ටියට බහාලිය යුතු අතර ඡන්ද විමසීමට තෙදිනකට පෙර එක් එක් පළාත් පාලන ආයතනය වෙනුවෙන් ලැබුණු තැපැල් ඡන්ද පැකට්ටු වෙන වෙනම ඡන්ද මධ්‍යස්ථාන අනුව වෙන් කර ලැයිස්තු ගතකර ගත යුතුය. ඡන්ද මධ්‍යස්ථාන අනුව වෙන්කර ගත යුත්තේ ඇතැම් කොට්ඨාසවලට ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක් ඇතුළත් වියහැකි බැවිනි. අනතුරුව එක් එක් ඡන්ද මධ්‍යස්ථානයට නියමිත තැපැල් ඡන්ද පැකට්ටු සංඛ්‍යාව විශේෂ කවරයක බහා මුද්‍රා තබා ඡන්ද විමසීමට පෙර දින ඡන්ද පත්‍රිකා ඡන්ද පෙට්ටි ඇතුළු ඡන්ද පොළ බඩු බාහිරාදිය නිකුත් කරන අවස්ථාවේදී අදාළ ඡන්ද පොළට නියමිත තැපැල් ඡන්ද පැකට්ටු සහිත විශේෂ කවරයද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත භාරදිය යුතුය.

14. එහෙත් මෙම ක්‍රියා පිළිවෙළ අනුගමනය කිරීමේදී ඡන්ද පත්‍රිකාවල ආරක්ෂාව පිළිබඳ යම් සැකයක් ඇතිවීම වැළැක්විය නොහැකි අතර ඡන්දයේ රහස්‍යතාවක් නොමැති බවට මතයක් ද දේශපාලන අංශ අතර මෙන්ම මහජනයා අතර ගොඩනැගීමට ඉඩ ඇත. විශේෂයෙන් එක් ඡන්ද පොළකට තැපැල් ඡන්ද දෙක තුනක් පමණක් ඇතිවිට එම ඡන්දහිමියන්ගේ ඡන්දයේ රහස්‍යතාව පිළිබඳ ගැටළු මතු විය හැකිය.

15. තැපැල් ඡන්ද ක්‍රමය වෙනුවට පූර්ව ඡන්දය දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දියහැකි නමුත් ඡන්ද පොළේදී ගණන් කිරීම සිදු කිරීම හා ඡන්ද විමසීම අවසානයේ ඡන්ද පොළේදීම ප්‍රතිඵල ප්‍රකාශ කිරීම සඳහා ක්‍රමවේදයක් සකසා ගැනීම අසීරුය.

16. අත්‍යාවශ්‍ය සේවාවන්හි නිරත විශාල නිලධාරී සංඛ්‍යාවක් ජන්ද විමසීමට අදාළ නොයෙකුත් රාජකාරිවල නිරත කර විය යුතු බැවින් එම නිලධාරීන්ට කවර හෝ ක්‍රමයක් මත ජන්දය ප්‍රකාශ කිරීමට අවකාශ සලසා දිය යුතුය. එබැවින් අතීත තැපැල් ජන්ද ක්‍රමය හෝ වෙනත් විකල්ප ක්‍රමයකින් බැහැරව ජන්ද විමසීම් පැවැත්වීම අසීරුය.

ජන්ද ගණන් කිරීම

17. සංශෝධන පනතේ 39 වැනි වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59 (ආ) වගන්තිය ප්‍රතියෝජනය කර ඇත. ඒ අනුව එක් එක් ජන්ද පොළක ජන්ද විමසීම අවසන් කළ පසු ජන්ද ගණන් කිරීම ජන්දපොළෙහිදීම සිදු කළ යුතුය. ජන්දපොළේ ජන්ද ස්ථානාධිපතිවරයා ගණන් කිරීමේ නිලධරයා වශයෙන් කටයුතු කළ යුතු අතර ජන්දපොළෙහි කාර්යය මණ්ඩලය ගණන් කිරීමේ කාර්යය මණ්ඩලය වශයෙන් කටයුතු කළයුතුය.

18. ජන්ද විමසීම ප.ව.4.00 ට අවසන් වීමෙන් පසුව අදාළ ලිපි කටයුතු අවසන් කර ජන්ද ගණන් කිරීම ආරම්භ කළයුතු බැවින් ගණන් කිරීම ආරම්භ කරන විට ප.ව.4.15 - 4.20 පමණ විය හැකිය. ගණන් කිරීමේදී සාමාන්‍ය පරිදි ජන්ද පත්‍රිකා ගිණුම් සමග සැසඳීමෙන් අනතුරුව තරග කළ පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අනුව ජන්ද පත්‍රිකා තේරීම සිදුකළ යුතුය. එක් එක් පක්ෂය ස්වාධීන කණ්ඩායම යටතේ ලැබී ඇති ජන්ද පත්‍රිකා සංඛ්‍යාව ගණනය කර ප්‍රතිඵල ලේඛනය සකස් කිරීම සඳහා ආසන්න වශයෙන් පැය 1 ක පමණ කාලයක් මිඩංගු විය හැකිය.

19. එහෙත් 59 අ (4) වැනි උප වගන්තිය අනුව යම් ජන්ද පොළක ගණන් කිරීමේ නිලධරයකු වශයෙන් යම් තැනැත්තකු කටයුතු කිරීම සම්බන්ධයෙන් බලයලත් නියෝජිතයින් විරෝධතාවන් ඉදිරිපත් කරනු ලබන විට මැතිවරණ කොමසාරිස්වරයා විසින් අවස්ථානුගත කරුණු වශයෙන් සෑහීමට පත්වීමෙන් පසු පළමුව සඳහන් තැනැත්තා වෙනුවට ගණන් කිරීමේ නිලධරයකු ලෙස කටයුතු කිරීම සඳහා වෙනත් යම් ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයකු පත් කරනු ලැබිය හැකිය. මෙම තත්ත්වය ප්‍රායෝගික නොවේ.

20. එමෙන්ම 59 ආ (1) වගන්තිය අනුව ජන්ද විමසීම පැවැත්වෙන අතරතුර හෝ ඉන්පසුව ජන්දපොළෙහි ඇතිවන සිද්ධි හෝ බාධාවන් හි ප්‍රතිඵලයක් වශයෙන් හෝ වෙනත් යම් ආරක්ෂක හේතු මත එම ජන්දපොළේදී ජන්ද ගණන් කිරීම නොකළ යුතු බව ජන්ද ස්ථානාධිපතිවරයාගේ මතය වන විට ඒ බව කලාපහාර සහකාර තේරීම්භාර නිලධාරී වෙත දැනුම්දිය යුතු අතර කලාපහාර සහකාර තේරීම්භාර නිලධාරී විසින් අලුත් ස්ථානය තීරණය කළ යුතුය. එම ස්ථානය පිළිබඳවත්, ගණන් කිරීම ආරම්භ කිරීමට නියමිත වේලාව පිළිබඳවත්, එම ස්ථානයේ ගණන් කිරීමේ නියෝජිතයින් දැනුවත් කළ යුතුය.

21. මෙම ක්‍රියා පිළිවෙල අනුගමනය කිරීමද ප්‍රායෝගික වශයෙන් ගැටළු සහගතය. කලාපහාර සහකාර තේරීම් භාර නිලධාරී ගෙන්වා ගැනීම, සුදුසු ස්ථානයක් තීරණය කිරීම, ජන්ද පෙට්ටිය සහ නිලධාරීන් එම ස්ථානයට රැගෙන යාම සඳහා ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම, ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අවශ්‍ය ආලෝකය සපයා ගැනීම ආදී ගැටළු රැසකට ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයාට මුහුණදීමට සිදුවනු ඇත.

22. කොට්ඨාස බෙදා වෙන් කිරීමේදී ජන්ද කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස යන නිර්ණායකයන් දෙකම සැලකිල්ලට ගනු ලබන අතර ගම් මට්ටමේ පරිපාලන ඒකකය වශයෙන් ග්‍රාම නිලධාරී කොට්ඨාසය පදනම්කර ගැනීම සංවර්ධන කාර්යයන් සඳහා වඩාත් උචිත වනු ඇත. ඒ අනුව කොට්ඨාසයක් ජන්ද මධ්‍යස්ථාන එකකට වැඩි අවස්ථා බෙහෙවින් දක්නට ලැබේ. ඒ අනුව එක් එක් ජන්ද පොළේ ගණන් කිරීම සිදුකර කොට්ඨාස අනුව ප්‍රතිඵලය සකස් කිරීම සඳහා කොට්ඨාසය තුළ කවර හෝ එක් මධ්‍යස්ථානයකට පැමිණිය යුතු වනු ඇත. ඒ සඳහා ජන්ද මධ්‍යස්ථාන දෙක අතුරින් වඩාත් පහසුකම් සහිත මධ්‍යස්ථානය තෝරාගත හැකිය. එබඳු තත්ත්වයක් පිළිබඳව සංශෝධන පනතේ සඳහන් නොවේ.

23. ජන්ද පොළේ ජන්ද ගණන් කිරීම දැනට පවත්නා දේශපාලන සංස්කෘතිය අනුව කෙතරම් දුරට ආරක්ෂාකාරී ද යන්න විශේෂයෙන් සලකා බැලිය යුතුය. ජන්ද මධ්‍යස්ථානය ගණන් කිරීමේ මධ්‍යස්ථානයක්ද වන බැවින් ජන්ද පොළට සැපයූ ආරක්ෂාවට වැඩි ආරක්ෂාවක් ගණන් කිරීම් සඳහා යෙදවීම අසීරු වනු ඇත. ඊට අමතරව ඉහත සඳහන් පරිදි ගණන් කිරීම සඳහා වෙනත් නිලධරයෙකුට පැවරීම, ගණන් කිරීමේ ස්ථානය වෙනස් කර ගැනීම ආදී වශයෙන් ජන්ද විමසීම අවසන් වීමත් ජන්ද ගණන් කිරීම ආරම්භයත් අතර ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයාට ගැටළු කිහිපයකට මුහුණ දීමට සිදුවිය හැකිය. මෙවන් තත්ත්වයක් දිස්ත්‍රික්කය පුරා විවිධ ජන්ද මධ්‍යස්ථානවල සිදුවිය හැකි බැවින් ආරක්ෂාව සැලසීම පිළිබඳවද ගැටළුකාරී තත්ත්වයක් මතුවිය හැකිය. අනෙක් අතට ජන්ද පොළේ ගණන් කිරීම අවසන් කළත් ප්‍රතිඵල ප්‍රකාශයෙන් පසු ඊළඟ පියවර වනම් සමානුපාතික තෝරා ගැනීම තේරීම්භාර නිලධාරී කාර්යාලයේදී හෝ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයට මධ්‍යගත ස්ථානයකදී සිදුකළ යුතුය. ඒ අනුව ජන්ද ගණන් කිරීම එක් එක් පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටි වඩාත් පහසුකම් සහිත මධ්‍යස්ථානයක සිදුකිරීමට වුවද අවශ්‍ය ප්‍රතිපාදන සලසා දෙන්නේ නම් උචිතය.

24. ජන්ද පොළ කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සැලසීමක් සිදු නොවන නිසාත්, ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරුන් ප්‍රවාහනයට වැඩි වශයෙන් මධ්‍යම ගමනාගමන මණ්ඩල බස්රථ සහ පුද්ගලික බස්රථ යොදා ගන්නා නිසාත්, ජන්ද පොළවල ගණන් කිරීම විවිධ කාල

පරාසයන් තුළ අවසන් වන නිසාත්, ඉහත කී ප්‍රවාහන පහසුකම් සැලසීමද අසීරු වනු ඇත.

25. එමෙන්ම ඡන්ද විමසීම සඳහා ඡන්ද පොළ නිලධාරීන් පත් කිරීමේදී කාන්තාවන් තමාගේ ඡන්දය ලියාපදිංචි ඡන්ද පොළ හැර ආසන්නතම ඡන්ද පොළකට පත්කළ යුතුවන නිසාත් ඡන්ද පොළකට පත් කරන නිලධාරීන් අතුරින් විශාල සංඛ්‍යාවක් කාන්තාවන් වන නිසාත් ඡන්ද විමසීම සිදුකළ නිලධාරීන්ම ගණන් කිරීම සඳහාද යොදා ගැනීම නොයෙකුත් මත භේදවලට හේතු විය හැකිය. විය එතරම් උචිත නොවන බවද මගේ හැඟීමයි.

ප්‍රතිඵල ප්‍රකාශය

26. කොට්ඨාසයේ ඡන්ද සංඛ්‍යාවෙන් වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් පිළිගත් පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අයත් අපේක්ෂකයාගේ නම එම කොට්ඨාසය සඳහා තේරී පත් වූ සභිකයා වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු අතර එක් එක් පක්ෂය හා ස්වාධීන කණ්ඩායම යටතේ තරග කළ අනිකුත් අපේක්ෂකයින් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ප්‍රකාශයට පත් කළ යුතුය. මෙය කොට්ඨාසයට ඇත්තේ එක් ඡන්ද පොළක් නම් එම ඡන්දපොළේදී ද නැතහොත් කොට්ඨාසය සඳහා තෝරාගත් මධ්‍යස්ථානයේදී ද සිදුකළ යුතුවේ.

27. බහු සභික කොට්ඨාසයකදී වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් පක්ෂයේ අපේක්ෂකයන් පළමුවැනි දෙවැනි සභිකයින් වශයෙන් පත් කළ යුතු යැයි පනතේ සඳහන් වේ. නිතරග ඡන්ද විමසීමකදී බහු සභික කොට්ඨාසයක් සඳහා සභිකයින් තේරීමේදී අදාළ කොට්ඨාසය වෙනුවෙන් නම් කර ඇති අපේක්ෂකයන් පිළිවෙලින් පළමු හා දෙවැනි සභිකයා වශයෙන් පත් කළ යුතු වනු ඇත.

සමානුපාතිකව තෝරා පත් කර ගත යුතු සභිකයින්

28. මෙම සභිකධුර සඳහා තෝරා ගත යුත්තේ නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් කිසියම් කොට්ඨාසයක් නියෝජනය නොකරන අමතර තැනැත්තන් අතුරිනි. මෙම තෝරාගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල තරමක් සංකීර්ණය. ඒ සඳහා පහත සඳහන් පියවර අනුගමනය කළ යුතුය.

පළමු පියවර

පරාජිත අපේක්ෂකයින් ලැබූ ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම

I. පළමුව අදාළ පළාත් පාලන ආයතනය සඳහා පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් යටතේ තරග කළ සියලුම අපේක්ෂකයින් ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම.

II. අනතුරුව එම මුළු ඡන්ද සංඛ්‍යාවෙන් එක් එක් කොට්ඨාසය සඳහා සභිකයකු වශයෙන් තේරී පත්වූ සියලුම අපේක්ෂකයින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව සහ එක් එක් කොට්ඨාසය තුළ දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 1/20 කට අඩුවෙන් ඡන්ද ලබාගත් අපේක්ෂකයින් විසින් ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාව අඩු කිරීම.

III. එමගින් තරගකර තේරීපත් නොවූ එහෙත් 1/20 ට වැඩියෙන් ඡන්ද ලබාගත් අවශේෂ අපේක්ෂකයින් වශයෙන් පනතේ හඳුන්වන පරාජිත අපේක්ෂකයින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම.

දෙවන පියවර

සමානුපාතිකව තෝරාපත් කරගත යුතු සභික සංඛ්‍යාව නිශ්චය කිරීම

I. එකී පළාත් පාලන ආයතනයේ එක් එක් කොට්ඨාසයක් යටතේ තරගකර කොට්ඨාසයේ දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 1/20 ට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් එහෙත් සභිකධුර හිමි නොවූ අපේක්ෂකයින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව, සියලුම කොට්ඨාස සඳහා තේරීපත් වූ අපේක්ෂකයින් ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් ගණනය කළයුතුය.

II. එම ප්‍රතිශතය 30% ඉක්මවන්නේ නම් කොට්ඨාස සඳහා තේරී පත්වන සමස්ථ සභික සංඛ්‍යාවෙන් 30% ක් වනම් සම්පූර්ණ අමතර අපේක්ෂකයන් සංඛ්‍යාව ද ප්‍රතිශතය 30% ට අඩු අවස්ථාවන්හිදී එක් එක් කොට්ඨාස සඳහා තේරී පත්වන සමස්ත සභිකධුර සංඛ්‍යාවෙන් අදාළ ප්‍රතිශතයද තෝරාපත් කරගත යුතුවේ. එම සංඛ්‍යාව ගණනය කිරීමේදී පූර්ණ සංඛ්‍යාව මිස භාග සංඛ්‍යාව ගණන් නොගත යුතුය.

III. අනතුරුව පළාත් පාලන ආයතනය සඳහා තරග කර තේරීපත් නොවූ එහෙත් 1/20 ට වැඩියෙන් ඡන්ද ලබාගත් සියලුම පරාජිත අපේක්ෂකයින්ගේ ඡන්ද සංඛ්‍යාවේ එකතුව තෝරා පත්කර ගනු ලැබීමට හිමිකම් ලැබූ සභික සංඛ්‍යාවෙන් බෙදීමෙන් සමානුපාතිකව එක් සභිකධුරයක් සඳහා ලබාගත යුතු ඡන්ද සංඛ්‍යාව ලැබේ. එම සංඛ්‍යාව තීරක අංකය වශයෙන් පනතේ හඳුන්වා දී ඇත.

IV. අනතුරුව එක් එක් පක්ෂයේ කණ්ඩායමේ පරාජිත අපේක්ෂකයින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව වෙන වෙනම තීරක අංකයෙන් බෙදීමෙන් එක් එක් පක්ෂයට, ස්වාධීන කණ්ඩායමට හිමිවන සභිකධුර සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. මෙම සංඛ්‍යාව තීරණය කිරීමේදී පළමුව පූර්ණ සංඛ්‍යාව අනුව ගණනය කළ යුතු අතර තවදුරටත් සභිකධුර සංඛ්‍යාවේ ඌනයක් වේ නම් තීරක අංකයෙන් බෙදීමෙන් ලැබුණු භාග සංඛ්‍යාවන් අතුරින් ඉහළම අගය ඇති භාග සංඛ්‍යාව මත ඉතිරි සභිකධුර සංඛ්‍යාව වෙන්කර දිය යුතුය.

තෙවන පියවර

අමතර තැනැත්තන් අතුරින් තෝරාපත් කරගත යුතු අපේක්ෂකයින් තීරණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම

I. ඉහත සඳහන් පරිදි එක් එක් පක්ෂය ස්වාධීන කණ්ඩායම යටතේ නාමයෝජනා කළ අමතර තැනැත්තන් අතුරින් තෝරා පත්කර ගතයුතු සහික සංඛ්‍යාව තීරණය කළ පසු තේරීම්භාර නිලධාරී විසින් එම සංඛ්‍යාව පක්ෂයේ ලේකම් වෙත හෝ ස්වාධීන කණ්ඩායමක් නම් එහි නායක වෙත දැනුම් දී එම සංඛ්‍යාව සඳහා පත්කළ යුතු අමතර තැනැත්තන් කවුරුන්ද යන්න විමසා සිටිය යුතුය. තේරීම්භාර නිලධාරීන් විසින් එම නම් ප්‍රකාශයට පත්කළ යුතුය.

II. අනතුරුව 65 වගන්තිය යටතේ එක් එක් කොට්ඨාසය සඳහා තෝරාගත් අපේක්ෂකයින් සහ 65 අ වගන්තිය යටතේ තෝරාගත් අමතර අපේක්ෂකයින් ගේ නම් ඇතුළත් දැන්වීමක් ප්‍රකාශයට පත් කළයුතු අතර මැතිවරණ කොමසාරිස්වරයා වෙතද වාර්තා කළ යුතුය.

III. ප්‍රතිඵලය පිළිබඳ වාර්තාව ලැබුණු පසු මැතිවරණ කොමසාරිස්වරයා විසින් තෝරා පත්කර ගනු ලැබූ අපේක්ෂකයින්ගේ නම් වහා ගැසට් පත්‍රයේ පළකළ යුතුය.

පරිශිෂ්ඨ

ගැසට් නිවේදන - ගැසට් අංක 1633/9 (2009.12.23)

මහා නගර සභා ආඥාපනත

10 (2) (ආ) වගන්තිය යටතේ නියමය

(252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙම නියමයෙන් මෙහි උපලේඛනයේ නිරූපිත එක් එක් මහා නගර සභාවේ සභිකයින්ගේ ධුර කාලය අවසන් වන දිනය 2011 මාර්තු මස 31 වැනි දින දක්වා දීර්ඝ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2009 දෙසැම්බර් මස 22 වන දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

1. කොළඹ මහා නගර සභාව
2. දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව
3. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව
4. මොරටුව මහා නගර සභාව
5. මීගමුව මහා නගර සභාව
6. ගම්පහ මහා නගර සභාව
7. කුරුණෑගල මහා නගර සභාව
8. මහනුවර මහා නගර සභාව
9. මාතලේ මහා නගර සභාව
10. නුවරඑළිය මහා නගර සභාව
11. බදුල්ල මහා නගර සභාව
12. ගාල්ල මහා නගර සභාව
13. මාතර මහා නගර සභාව
14. රත්නපුර මහා නගර සභාව
15. අනුරාධපුර මහා නගර සභාව
16. කල්මුනේ මහා නගර සභාව

නගර සභා ආඥාපනත

10 (2) (ආ) වගන්තිය යටතේ නියමය

(252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥාපනතේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙම නියමයෙන් මෙහි උපලේඛනයේ නිරූපිත එක් එක් නගර සභාවේ සභිකයින්ගේ ධුර කාලය අවසන් වන දිනය 2011 මාර්තු මස 31 වැනි දින දක්වා දීර්ඝ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2009 දෙසැම්බර් මස 22 වන දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

1. කොළොන්නාව නගර සභාව
2. සීතාවකපුර නගර සභාව
3. මහරගම නගර සභාව
4. බොරලැස්ගමුව නගර සභාව
5. කැස්බෑව නගර සභාව
6. වත්තල මාබෝලේ නගර සභාව
7. පෑලියගොඩ නගර සභාව
8. කටුනායක සීදුව නගර සභාව
9. මිනුවන්ගොඩ නගර සභාව
10. ජා- ඇල නගර සභාව
11. හොරණ නගර සභාව
12. කළුතර නගර සභාව
13. බේරුවල නගර සභාව
14. කුලියාපිටිය නගර සභාව
15. පුත්තලම නගර සභාව
16. හලාවත නගර සභාව
17. වත්තේගම නගර සභාව
18. කඩුගන්නාව නගර සභාව
19. ගම්පොල නගර සභාව
20. නාවලපිටිය නගර සභාව
21. හැටන් - දික්ඔය නගර සභාව
22. තලවකැලේ - ලිඳුල නගර සභාව
23. බණ්ඩාරවෙල නගර සභාව
24. හපුතලේ නගර සභාව
25. අම්බලන්ගොඩ නගර සභාව
26. හික්කඩුව නගර සභාව
27. වැලිගම නගර සභාව
28. හම්බන්තොට නගර සභාව
29. තංගල්ල නගර සභාව
30. බලංගොඩ නගර සභාව
31. ඇඹිලිපිටිය නගර සභාව
32. කෑගල්ල නගර සභාව
33. කාත්තන්කුඩි නගර සභාව
34. අම්පාර නගර සභාව
35. ත්‍රිකුණාමලය නගර සභාව
36. කින්නියා නගර සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

5 (2) (ආ) වගන්තිය යටතේ නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙම නියමයෙන් මෙහි උපලේඛනයේ නිරූපිත එක් එක් ප්‍රාදේශීය සභාවේ සභිකයින්ගේ ධුර කාලය අවසන් වන දිනය 2011 මාර්තු මස 31 වන දින දක්වා දීර්ඝ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2009 දෙසැම්බර් මස 22 වන දින,
කොළඹ,

උපලේඛනය

1. කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව
2. කඩුවෙල ප්‍රාදේශීය සභාව
3. සීතාවක ප්‍රාදේශීය සභාව
4. හෝමාගම ප්‍රාදේශීය සභාව
5. මහර ප්‍රාදේශීය සභාව
6. කළුතර ප්‍රාදේශීය සභාව
7. අගලවත්ත ප්‍රාදේශීය සභාව
8. පාලින්දනුවර ප්‍රාදේශීය සභාව
9. මදුරාවල ප්‍රාදේශීය සභාව
10. බුලත්සිංහල ප්‍රාදේශීය සභාව
11. යටිනුවර ප්‍රාදේශීය සභාව
12. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව
13. අඹගමුව ප්‍රාදේශීය සභාව
14. බදුල්ල ප්‍රාදේශීය සභාව
15. හාලිඇල ප්‍රාදේශීය සභාව
16. මොණරාගල ප්‍රාදේශීය සභාව
17. බුත්තල ප්‍රාදේශීය සභාව
18. කරන්දෙනිය ප්‍රාදේශීය සභාව
19. හබරාදුව ප්‍රාදේශීය සභාව
20. වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව
21. ඉමදුව ප්‍රාදේශීය සභාව
22. කොටපොල ප්‍රාදේශීය සභාව
23. හක්මන ප්‍රාදේශීය සභාව
24. අකුරැස්ස ප්‍රාදේශීය සභාව
25. කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව
26. කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව
27. පිටබැද්දර ප්‍රාදේශීය සභාව
28. අතුරලිය ප්‍රාදේශීය සභාව
29. හම්බන්තොට ප්‍රාදේශීය සභාව
30. සූරියවැව ප්‍රාදේශීය සභාව
31. රත්නපුර ප්‍රාදේශීය සභාව
32. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව
33. ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව
34. ගොඩකවෙල ප්‍රාදේශීය සභාව
35. කහවත්ත ප්‍රාදේශීය සභාව
36. ගලිගමුව ප්‍රාදේශීය සභාව
37. යටියන්තොට ප්‍රාදේශීය සභාව
38. බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව
39. හොරොව්පතාන ප්‍රාදේශීය සභාව
40. මිහින්තලේ ප්‍රාදේශීය සභාව
41. තිරප්පනේ ප්‍රාදේශීය සභාව
42. දිඹුලාගල ප්‍රාදේශීය සභාව
43. වැලිකන්ද ප්‍රාදේශීය සභාව
44. පුතුකුඩියිරිප්පු ප්‍රාදේශීය සභාව
45. දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව
46. දමන ප්‍රාදේශීය සභාව
47. උහන ප්‍රාදේශීය සභාව
48. මහඔය ප්‍රාදේශීය සභාව
49. නාමල්ඔය ප්‍රාදේශීය සභාව
50. පදියතලාව ප්‍රාදේශීය සභාව
51. සමන්තුරේ ප්‍රාදේශීය සභාව
52. තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව
53. කාරෙයිතිවු ප්‍රාදේශීය සභාව
54. ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව
55. ලාහුගල ප්‍රාදේශීය සභාව
56. සේරුවිල ප්‍රාදේශීය සභාව
57. කන්තලේ ප්‍රාදේශීය සභාව
58. මොරවැව ප්‍රාදේශීය සභාව
59. ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව
60. පදවිසිරිපුර ප්‍රාදේශීය සභාව
61. ත්‍රිකුණාමලය නගර සහ කඩවත් සතර ප්‍රාදේශීය සභාව
62. කුච්චවේලි ප්‍රාදේශීය සභාව
63. තඹලගමුව ප්‍රාදේශීය සභාව
64. මුත්තූර් ප්‍රාදේශීය සභාව
65. කින්නියා ප්‍රාදේශීය සභාව
66. වේරුගල් ප්‍රාදේශීය සභාව
67. වත්තල ප්‍රාදේශීය සභාව
68. කටාන ප්‍රාදේශීය සභාව
69. දිවුලපිටිය ප්‍රාදේශීය සභාව
70. මීරිගම ප්‍රාදේශීය සභාව
71. මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව
72. අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
73. ගම්පහ ප්‍රාදේශීය සභාව
74. ජා- ඇල ප්‍රාදේශීය සභාව
75. දොම්පේ ප්‍රාදේශීය සභාව
76. කැළණිය ප්‍රාදේශීය සභාව
77. බියගම ප්‍රාදේශීය සභාව
78. පානදුර ප්‍රාදේශීය සභාව

79. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව
80. හොරණ ප්‍රාදේශීය සභාව
81. මතුගම ප්‍රාදේශීය සභාව
82. දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව
83. බේරුවල ප්‍රාදේශීය සභාව
84. වලල්ලාවිට ප්‍රාදේශීය සභාව
85. ගල්ගමුව ප්‍රාදේශීය සභාව
86. ගිරිබාව ප්‍රාදේශීය සභාව
87. පොල්පිතිගම ප්‍රාදේශීය සභාව
88. නිකවැරටිය ප්‍රාදේශීය සභාව
89. මහව ප්‍රාදේශීය සභාව
90. ඉඹිබාගමුව ප්‍රාදේශීය සභාව
91. වාරියපොල ප්‍රාදේශීය සභාව
92. පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව
93. බිංගිරිය ප්‍රාදේශීය සභාව
94. පන්නල ප්‍රාදේශීය
95. කුලියාපිටිය ප්‍රාදේශීය සභාව
96. අලව්ව ප්‍රාදේශීය සභාව
97. පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව
98. කුරුණෑගල ප්‍රාදේශීය සභාව
99. මාවතගම ප්‍රාදේශීය සභාව
100. රිදීගම ප්‍රාදේශීය සභාව
101. උඩුබද්දාව ප්‍රාදේශීය සභාව
102. කල්පිටිය ප්‍රාදේශීය සභාව
103. පුත්තලම ප්‍රාදේශීය සභාව
104. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව
105. වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව
106. නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව
107. ආණමඩුව ප්‍රාදේශීය සභාව
108. කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව
109. නවගත්තේගම ප්‍රාදේශීය සභාව
110. හලාවත ප්‍රාදේශීය සභාව
111. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව
112. තුම්පනේ ප්‍රාදේශීය සභාව
113. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව
114. අකුරණ ප්‍රාදේශීය සභාව
115. පූජාපිටිය ප්‍රාදේශීය සභාව
116. පාතදුම්බර ප්‍රාදේශීය සභාව
117. පන්විල ප්‍රාදේශීය සභාව
118. උඩදුම්බර ප්‍රාදේශීය සභාව
119. මිනිපේ ප්‍රාදේශීය සභාව
120. මැදදුම්බර ප්‍රාදේශීය සභාව
121. කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව
122. කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව
123. උඩුනුවර ප්‍රාදේශීය සභාව
124. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
125. නුවරවැලිය ප්‍රාදේශීය සභාව
126. කොත්මලේ ප්‍රාදේශීය සභාව
127. හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව
128. වලපනේ ප්‍රාදේශීය සභාව
129. දඹුල්ල ප්‍රාදේශීය සභාව
130. පල්ලෙපොල ප්‍රාදේශීය සභාව
131. ගලේවෙල ප්‍රාදේශීය සභාව
132. අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව
133. ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාව
134. නාවුල ප්‍රාදේශීය සභාව
135. විල්ගමුව ප්‍රාදේශීය සභාව
136. මාතලේ ප්‍රාදේශීය සභාව
137. යටවත්ත ප්‍රාදේශීය සභාව
138. රත්තොට ප්‍රාදේශීය සභාව
139. උකුවෙල ප්‍රාදේශීය සභාව
140. මහියංගනය ප්‍රාදේශීය සභාව
141. රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව
142. සොරණාතොට ප්‍රාදේශීය සභාව
143. මීගහකිවුල ප්‍රාදේශීය සභාව
144. කන්දෙකැටිය ප්‍රාදේශීය සභාව
145. පස්සර ප්‍රාදේශීය සභාව
146. උඟව පරණගම ප්‍රාදේශීය සභාව
147. වැලිමඩ ප්‍රාදේශීය සභාව
148. බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව
149. ඇල්ල ප්‍රාදේශීය සභාව
150. හපුතලේ ප්‍රාදේශීය සභාව
151. හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව
152. බිබිල ප්‍රාදේශීය සභාව
153. මැදගම ප්‍රාදේශීය සභාව
154. මඩුල්ල ප්‍රාදේශීය සභාව
155. සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව
156. බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව
157. කතරගම ප්‍රාදේශීය සභාව
158. වැල්ලවාය ප්‍රාදේශීය සභාව
159. තණමල්විල ප්‍රාදේශීය සභාව
160. බලපිටිය ප්‍රාදේශීය සභාව
161. අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව
162. බෙන්තොට ප්‍රාදේශීය සභාව
163. නෙළුව ප්‍රාදේශීය සභාව
164. තවලම ප්‍රාදේශීය සභාව
165. නාගොඩ ප්‍රාදේශීය සභාව
166. නියාගම ප්‍රාදේශීය සභාව
167. බද්දේගම ප්‍රාදේශීය සභාව
168. යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව
169. හික්කඩුව ප්‍රාදේශීය සභාව
170. අක්මීමන ප්‍රාදේශීය සභාව
171. බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය සභාව
172. මුලටියන ප්‍රාදේශීය සභාව
173. පස්ගොඩ ප්‍රාදේශීය සභාව
174. මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

175. තිහගොඩ ප්‍රාදේශීය සභාව
176. දෙවිනුවර ප්‍රාදේශීය සභාව
177. දික්වැල්ල ප්‍රාදේශීය සභාව
178. මාතර ප්‍රාදේශීය සභාව
179. වැලිගම ප්‍රාදේශීය සභාව
180. වීරකැටිය ප්‍රාදේශීය සභාව
181. කටුවන ප්‍රාදේශීය සභාව
182. බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව
183. තංගල්ල ප්‍රාදේශීය සභාව
184. අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාව
185. අම්බලන්තොට ප්‍රාදේශීය සභාව
186. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව
187. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
188. ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව
189. කුරුවිට ප්‍රාදේශීය සභාව
190. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
191. වැලිගෙපොල ප්‍රාදේශීය සභාව
192. නිවිතිගල ප්‍රාදේශීය සභාව
193. අයගම ප්‍රාදේශීය සභාව
194. කලවාන ප්‍රාදේශීය සභාව
195. වරකාපොල ප්‍රාදේශීය සභාව
196. කොළොන්න ප්‍රාදේශීය සභාව
197. කෑගල්ල ප්‍රාදේශීය සභාව
198. රඹුක්කන ප්‍රාදේශීය සභාව
199. මාවනැල්ල ප්‍රාදේශීය සභාව
200. අරණායක ප්‍රාදේශීය සභාව
201. රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව
202. දැරණියගල ප්‍රාදේශීය සභාව
203. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව
204. මැදවච්චිය ප්‍රාදේශීය සභාව
205. රඹෑව ප්‍රාදේශීය සභාව
206. කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව
207. පදවිය ප්‍රාදේශීය සභාව
208. කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව
209. ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාව
210. තලාව ප්‍රාදේශීය සභාව
211. නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව
212. මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව
213. නොච්චියාගම ප්‍රාදේශීය සභාව
214. රාජාංගනය ප්‍රාදේශීය සභාව
215. ගල්නෑව ප්‍රාදේශීය සභාව
216. ඉපලෝගම ප්‍රාදේශීය සභාව
217. කැකිරාව ප්‍රාදේශීය සභාව
218. පලාගල ප්‍රාදේශීය සභාව
219. තමන්කඩුව ප්‍රාදේශීය සභාව
220. ඇළහැර ප්‍රාදේශීය සභාව
221. ලංකාපුර ප්‍රාදේශීය සභාව
222. මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව
223. හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව
224. කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව
225. පාතහේවාහැට ප්‍රාදේශීය සභාව
226. ඇල්පිටිය ප්‍රාදේශීය සභාව
227. බලංගොඩ ප්‍රාදේශීය සභාව
228. කෝරළේපත්තු බටහිර ප්‍රාදේශීය සභාව
229. චිරාචුර් නගර ප්‍රාදේශීය සභාව
230. අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව
231. පොතුවිල් ප්‍රාදේශීය සභාව
232. අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභාව
233. නින්දවුර් ප්‍රාදේශීය සභාව
234. නවිතාන්වේලි ප්‍රාදේශීය සභාව

ගැසට් නිවේදන - ගැසට් අංක 1687/24 (2011.01.05)

පළාත් පාළන ආයතන ජන්ද විමසීමේ ආඥාපනත (262 අධිකාරය)

පළාත් පාලන ආයතන ජන්ද විමසීමේ ආඥාපනතේ 4 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් කර තිබෙන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිළිවෙලින්, එහි II වැනි තීරයෙහි හා III තීරයෙහි අනුරූප සටහන්වල සඳහන් තේරීම්භාර නිලධාරීන් හා සහකාර තේරීම්භාර නිලධාරීන් මෙයින් පත් කරමි.

දයානන්ද දිශානායක,
මැතිවරණ කොමසාරිස්.

2011 ජනවාරි මස 05 වැනි දින,
රාජගිරිය,
සරණ මාවත,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරය පරිපාලන දිස්ත්‍රික්කය	II වැනි තීරය තේරීම් භාර නිලධාරයා	III වැනි තීරය සහකාර තේරීම් භාර නිලධාරයා
කොළඹ	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය	නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස් කොළඹ
ගම්පහ	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් ගම්පහ
කළුතර	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති කළුතර පරිපාලන දිස්ත්‍රික්කය	ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස් කළුතර
මහනුවර	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් මහනුවර
මාතලේ	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති මාතලේ පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් මාතලේ
නුවරඑළිය	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් නුවරඑළිය
ගාල්ල	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය	ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස් ගාල්ල
මාතර	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති මාතර පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් මාතර
හම්බන්තොට	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් හම්බන්තොට
යාපනය	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති යාපනය පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් යාපනය
කිළිනොච්චිය	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති කිළිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් කිළිනොච්චිය
වවුනියාව	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් වවුනියාව
මුලතිව්	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් වවුනියාව
මඩකළපුව	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති මඩකළපුව පරිපාලන දිස්ත්‍රික්කය	අතිරේක/සහකාර මැතිවරණ කොමසාරිස් මඩකළපුව

උපලේඛනය (සම්බන්ධිතයි)

I වැනි තීරය පරිපාලන දිස්ත්‍රික්කය	II වැනි තීරය තේරීම් භාර නිලධාරයා	III වැනි තීරය සහකාර තේරීම් භාර නිලධාරයා
අම්පාර	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් අම්පාර
ත්‍රිකුණාමලය	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් ත්‍රිකුණාමලය
කුරුණෑගල	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් කුරුණෑගල
පුත්තලම	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය	ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස් පුත්තලම
අනුරාධපුරය	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති අනුරාධපුරය පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් අනුරාධපුරය
පොළොන්නරුව	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් පොළොන්නරුව
බදුල්ල	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් බදුල්ල
මොනරාගල	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති මොනරාගල පරිපාලන දිස්ත්‍රික්කය	සහකාර මැතිවරණ කොමසාරිස් මොනරාගල
රත්නපුර	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය	ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස් රත්නපුර
කෑගල්ල	දිස්ත්‍රික් ලේකම්/ දිසාපති කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය	ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස් කෑගල්ල

පිළිගත් දේශපාලන පක්ෂවල නම්, අනුමත කරන ලද ලකුණු සහ ඒ එක් එක් පක්ෂයේ ලේකම්ගේ නම, ලිපිනය සහ දුරකථන අංකය දැක්වෙන ලැයිස්තුව

දේශපාලන පක්ෂයේ නම		අනුමත ලකුණ	ලේකම්වරයාගේ නම	දුරකථන අංකය	ෆැක්ස් අංකය	ලේකම්වරයාගේ ලිපිනය
1	අඛිල ඉලංකෙයි තමිල් කොංග්‍රස්	බයිසිකලය	ජී. ජී. පොන්නම්බලම් මහතා	2581677, 25555690		15, රැජින පාර, කොල්ලුපිටිය, කොළඹ 03.
2	අඛිල ඉලඞ්කෙ ද්‍රවිඩ එක්සත් පෙරමුණ	දොඩම් ගෙඩිය	ආචාර්ය කේ. විග්නේෂ්වරන්	2581182		871/45ඒ , මරදාන පාර, කෙළඹ 10.
3	අඛිල ඉලංගයි මුස්ලිම් කාන්ග්‍රස්	මොණරා	වයි. එල්. එස්. හම්ඩි මහතා	2737963, 0777315329		556, ගාළු පාර, කොළඹ 03.
4	අපේ ජාතික පෙරමුණ	දුරකථනය	රුවන් ඒග්. ගුරුගේ මහතා			194/ඒ, ශ්‍රී ජයවර්ධන පුර මාවත, වැලිකඩ, රාජගිරිය
5	ඉලංකෙයි තමිල් අරසු කච්චි	ගෙය	මාවයි එස්. සේනාධිරාජා මහතා	0212223576		30, මාවින් පාර, යාපනය.
6	ඊලවීර් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ	නඟුල	රාජනාදන් ප්‍රභාහරන් මහතා			කෙලින් වීදිය, කාරතිවී 7.
7	ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය	වීණාව	ඩග්ලස් දේවානන්ද මහතා	2584961,2503467		121, උද්‍යාන පාර, කොළඹ 05.
8	ඊලාම් ජනතා විප්ලවවාදී විමුක්ති පෙරමුණ	මල	කේ.ප්‍රේමචන්ද්‍රන් මහතා	2685826		85/9, පොකුණ පාර, හැඳල, වත්තල.
9	ඊලාම් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විමුක්ති පෙරමුණ	ගවයා	**			315, නුවර පාර, කිළිනොච්චිය.
10	එක්සත් ජනතා නිදහස් සංධානය	බුලත් කොළය	ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත් මහතා	2683673, 0722427500		301, ටී. ඩී ජයා මාවත, කොළඹ 10.
11	එක්සත් ජාතික පක්ෂය	අලියා	තිස්ස අත්තනායක මහතා	2865375-80	2865380	ලසිරිකොතල 400, කෝට්ටේ පාර, පිටකෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර.
12	එක්සත් ජාතික විකල්ප පෙරමුණ	ගේට්ටුව	අසෝක සෝමරත්න මහතා	2864710	2863290	274/1, කඩුවෙල පාර, කොස්වත්ත, බත්තරමුල්ල.
13	එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ	හාවා	දිමුතු බණ්ඩාර අභයකෝන් මහතා	071 8296166		අංක 51, පිළියන්දල පාර, මහරගම.
14	එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය	පතු යුගලය	ඉසෙඩ්. ඒ. නම්මර් අහමඩ් මහතා	2865830, 0777668260	2672322	107, රේල්වේ ඇවනිව්, කිරුළපන, කොළඹ 05.
15	එක්සත් ලංකා පොදුජන පක්ෂය	කෝප්පය	සුනිල් ඩබ්ලිව්. ජිනසේන මහතා	2867069		100/16, කුරුඳුවත්ත පාර හරහා, නාවල පාර, රාජගිරිය.
16	එක්සත් ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ	මාළුවා	එස්. සතාසිවම් මහතා	052 22428	05223326	17, බිලූමිපිල්ඩි පාර, නුවරඑළිය.
17	එක්සත් ලංකා මහා සභාව	උල්පත් පෑන	ආචාර්ය නාත් අමරකෝන් මහතා	5054885, 5554948, 0712521475	2686835	අංක 12, ටෙම්පල්ලර් පාර, ගල්කිස්ස.
18	එක්සත් සමාජවාදී පක්ෂය	තිරෝද රථය	සිරිතුංග ජයසූරිය මහතා	011 510289	0112504647	53/6, ටී. ඩී දාබරේ මාවත, නාරාහේන්පිට, කොළඹ 05.
19	ඔක්කොම වැසියෝ ඔක්කොම රජවරු සංවිධානය	කැටය	එම්. බී. තැමිණිමුල්ල මහතා	0812234137		3/1, සංඝමිත්ත මාවත, මහනුවර.
20	කඳුරට ජනතා පෙරමුණ	උදැල්ල	ඒ.ලෝරන්ස් මහතා	0512222793, 0514920300	051 2222793	279, ෆෑට්හිල් බසාර්, හැටන්.
21	ජනතා විමුක්ති පෙරමුණ	සීනුව	එම්.ටී. සිල්වා මහතා	2345594	0112786050	464/20, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.
22	ජනනායක තමිළ් තේසිය කූට්ටනි	පිත්තල පහන	වේලායුදම් නල්ලනාදර් මහතා	011 2586289	0112586289	16, හේග් පාර, බම්බලපිටිය, කොළඹ 04.
23	ජන විමුක්ති සහයෝගී පෙරමුණ	ලන්තෑරුම	ආචාර්ය කමල් කරුණාදාස	0412223500	0412223500	27/3, කමිල් පෙදෙස, නුවේ, මාතර.
24	ජන සෙත පෙරමුණ	ට්‍රැක්ටරය	පූජ්‍ය බත්තරමුල්ලේ සීලරතන හිමි	011 2889988		185/ බී, දේවාල පාර, තලංගම දකුණ, කොස්වත්ත, බත්තරමුල්ල.
25	ජාතික කොංග්‍රසය	අශ්වයා	ඒ. එල්.එම් අතාවුල්ලා මහතා	071 4322333		1684/19, ද සේරම් පෙදෙස, රාජගිරිය.
26	ජාතික ජනතා පක්ෂය	විදුලි බුබුල	මුදිත කරුණාමුනි මහතා	2854921		428/5, සුනේත්‍රාදේවි පාර, පැපිලියාන, නුගේගොඩ.
27	ජාතික නිදහස් පෙරමුණ	පංචායුධය	ප්‍රියන්පිත් විතාරණ මහතා			21/1,අශෝක මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල.
28	ජාතික සංවර්ධන පෙරමුණ	පොල්ගෙඩිය	*	081 2412136		සුරසිරි පෙදෙස, මිරුඇතලාව.
29	ජාතික සමගි පෙරමුණ	පරවියා	එම්. අයි. එම් රෆීක් මහතා	2424187		සාම මන්දිරය, 53, වෝක්ෂෝල් පටුමග, කොළඹ 02.
30	ජාතික හෙළ උරුමය	හක්ගෙඩිය	චම්පික රණවක මහතා	2368821, 2501412, 2507636	2369820,2507636	1047/3ඒ, ඩෙන්සිල් කොඩිබකඩුව මාවත, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.
31	තමිළ් මක්කල් විඩුදලෛප් පුලිකල්	බෝට්ටුව	ඒ. සී. කයිලේස්වරරාසා මහතා	011 4949845, 0112768705-6		39, කෝච්චන්ටන් පාර, මඩකළපුව.
32	දේශප්‍රේමී ජාතික පෙරමුණ	කොඩිය	පියසිරි විජේනායක මහතා	033 2231255, 0712192192	0332231255	3/7, සෙන්ට්‍රා පාර්ක්, ගම්පහ පාර, යක්කල.
33	දේශ විමුක්ති ජනතා පක්ෂය	වී කරල	ඩී. කලන්සූරිය මහතා	2338812, 2508821		152/1*1/2 බැද්දගාන නිවාස සංකීර්ණය, දූව පාර, බැද්දගාන.
34	ද්‍රවිඩ ඊලාම් විමුක්ති සංවිධානය	ප්‍රදීපාගාරය	එන්. ඉන්ද්‍රකුමාර් මහතා	0242222977,2585620	0242222977	56, වෛරවර්ව කෝවිල් පාර, වෛරවපුලියන්කුලම්, වවුනියාව.

දේශපාලන පක්ෂයේ නම		අනුමත ලකුණ	ලේකම්වරයාගේ නම	දුරකථන අංකය	ෆැක්ස් අංකය	ලේකම්වරයාගේ ලිපිනය
35	ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ	ඉර	කේ.කේ.කනගරාජා මහතා	011*2552372	011764213	5/3 ඒ, විජයබා මාවත, කළුබෝවිල, දෙහිවල.
36	නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ	හංසයා	ශාමිලා පෙරේරා මිය	0777784010		9/6, ජයන්ති මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
37	නව සමසමාජ පක්ෂය	මේසය	ආචාර්ය කේ. ඩබ්. එම් වික්‍රමබාහු බී කරුණාරත්න	2324053		17, බැරෑක්ක පටුමග, කොළඹ 02.
38	නව සිහළ උරුමය	දුන්න සහ ඊතලය	සරත් මහමේන්ද්‍ර මහතා	0114933750,0777517314		50, කැටවලමුල්ල පටුමග, කොළඹ 09.
39	පත්මනාභා ඊළාම් ජනතා විප්ලවීය විමුක්ති පෙරමුණ	ඉටිපන්දම	ටී. ශ්‍රීදරන් මහතා	011 2505372, 0112552840		15 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05.
40	පුරවැසි පෙරමුණ	බසය	ජෙයරත්නම් ශ්‍රී රංගා මහතා	0777310726		325 2/1 , තිම්බිරිගස්යාය පාර, ටොරින්ටන් ඇවනිව්, කොළඹ 07.
41	පොදුජන එක්සත් පෙරමුණ	පුටුව	ඩී. මු. ජයරත්න මහතා	2868917	2868915	301, 3 වන මහල ටී.බී.ජයාමාවත කොළඹ 10.
42	ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ	රාජාලියා	ආර්.එම්. ආරියවංශ මහතා	0112645566,0113164278	011645566	60, පළමු වන පටුමග, රවතාවත්ත, මොරටුව.
43	ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ	ඉණිමග	නල්ලයියා කුමාරගුරුපරන් මහතා	2473511,2473512,2390664	2435961	72, බන්ගසාල විදිය , කොළඹ 11.
44	ප්‍රජාතන්ත්‍රවාදී ජනතා විමුක්ති පෙරමුණ	නැංගුරම	එස්. සතානන්දන් මහතා	2586289		16, හේග් පාර, බම්බලපිටිය, කොළඹ 04.
45	ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය	කුසලානය	එච්. එම්. විජිත හේරත් මහතා	0114375290,0114375463	011 393550	3/1, රාජකීය මාවත, කොළඹ 07.
46	ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ	ඔරලෝසුව	වාසුදේව නානායක්කාර මහතා	2672586	2682505	49*1/1, විහයාලංකාර මාවත, කොළඹ 10.
47	මහජන එක්සත් පෙරමුණ	කරත්ත රෝදය	ඩී. එම් කරුණාතිලක දිසානායක මහතා	2872318	2872318	10/4, ලේක් රෝඩ්, මහරගම
48	මුස්ලිම් ජාතික සන්ධානය	තරාදිය	එස්. එස්. එම්. අස්සාමී මහතා	2722588		04/ඒ, ශ්‍රීමල් ඇවනියු, දෙහිවල.
49	මුස්ලිම් විමුක්ති පෙරමුණ	සමනලයා	එම්.අයි.කාදර් මහතා	0777791770,0773312010,0773629717		ල දාරුස් ෂහදාල ඒ-ජ් 03 , ශාන්ත ජේම්ස් මහල්නිවාස සංකීර්ණය, මෝදර , කොළඹ 15.
50	රුහුණු ජනතා පක්ෂය	මෝටර් කාරය	අරුණ ද සොයිසා මහතා	091 5627512		7/21, ඌරවත්ත, අම්බලන්ගොඩ.
1. 2011.07.23 වැනි දින පළාත් පාලන ආයතන 65 ක් සම්බන්ධයෙන් ඡන්ද විමසීම පවත්වනු ලබන අතර, ඒ සියලුම පළාත් පාලන ආයතනවලට අදාළ තැපැල් ඡන්ද සලකුණු කිරීම ඒ ඒ සහතික කිරීමේ නිලධාරී කාර්යාලයේදී 2011.07.12 වැනි දින සිදු කරනු ලැබේ.

2. එක් එක් සහතික කිරීමේ නිලධාරී විසින් තමාට අදාළ තැපැල් ඡන්ද හිමියන් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා පැමිණිය යුතු දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් වෙත වහා දැනුම් දිය යුතුය.

3. තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා පැමිණෙන ඡන්ද හිමියන් විසින් තමාගේ ජාතික හැඳුනුම්පත හෝ මැතිවරණ කටයුතු සඳහා වලංගු හැඳුනුම්පත් අතුරින් එකක් අනිවාර්යයෙන් රැගෙන ආ යුතුය. තැපැල් ඡන්ද සඳහා පමණක කාර්යාල හැඳුනුම්පත ද පිළිගනු ලැබේ.

4. වලංගු හැඳුනුම්පතක් මගින් තැපැල් ඡන්ද දායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගන්නා තෙක් සහතික කිරීමේ නිලධාරී විසින් D කවරය විවෘත නොකළ යුතුය. D කවරයේ අදාළ තැපැල් ඡන්ද දායකයාගේ නම සටහන් කර ඇත.

5. තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන ස්ථානයේ කටයුතු නිරීක්ෂණය සඳහා තරග කරනු ලබන පක්ෂවල ලේකම්වරුන්, බලයලත් නියෝජිතයින් සහ ස්වාධීන කණ්ඩායම් නායකයින් විසින් එක් නියෝජිතයකු බැගින් පත් කරනු ලැබිය හැකිය. එම පත්වීම් ලිපි පරීක්ෂා කර අදාළ නියෝජිතයින් භාර ගන්නා මෙන්, සියලුම සහතික කිරීමේ නිලධාරීන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. PAFFREL සහ CMEV නිරීක්ෂණ ආයතන දෙක වෙනුවෙන් ද එක් එක් සහතික කිරීමේ නිලධාරී කාර්යාලයක් සඳහා නිරීක්ෂකයකු බැගින් පත් කිරීම මවිසින් අනුමත කර ඇත.

7. තැපැල් ඡන්ද සලකුණු කිරීම් නිරීක්ෂණය සඳහා තේරීම්භාර නිලධාරී විසින් ද විශේෂ නිරීක්ෂකයින් පත් කරනු ලැබේ.

8. සහතික කිරීමේ නිලධාරී විසින් ඡන්දදායකයාට රහස්‍ය ලෙස ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුතු අතර ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව යොඳින් නවාගෙන විත් තමා ඉදිරි පිටදී B කවරයට බහාලීමට උපදෙස් දිය යුතුය.

9. ඡන්ද පත්‍රිකාව බහාලූ B කවරය සහතික කිරීමේ නිලධාරී විසින් හොඳින් අලවා මුද්‍රා තබා එම B කවරයට පිටතින් තමා විසින් අත්සන් කර සහතික කරන ලද අනන්‍යතා ප්‍රකාශය ක්ලිප් එකකින් ඇමිණිය යුතුය. මෙය අනිවාර්ය අවශ්‍යතාවකි. අනතුරුව අනන්‍යතා ප්‍රකාශය අමුණන ලද B කවරය A කවරය තුළට බහා අලවා මුද්‍රා තැබිය යුතුය.

10. තැපැල් ඡන්ද සලකුණු කිරීම පෙ.ව 8.30 ට පෙර ආරම්භ නොකළ යුතුය. එමෙන්ම තැපැල් ඡන්ද අඩංගු පැකට්ටු තැපැල් කාර්යාල වෙත භාරදීම සඳහා ප්‍රමාණවත් කාලයක් ඇතිව සලකුණු කිරීම අවසන් කළ යුතුය. කිසිම හේතුවක් නිසා තැපැල් ඡන්ද පැකට්ටුවක් තැපැල් පෙට්ටියට නොදැමිය යුතුය.

11. සලකුණු කළ ඡන්ද පත්‍රිකාව වෙනත් අයකුට පෙන්වීම හෝ පෙන්වීමට අනුබලදීම බරපතල වරදකි.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.07.08

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (2 අදියර)
තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් සහ තැපැල් ඡන්ද හිමියන් වෙත කරනු ලබන දැනුම් දීම

1. 2011.07.23 වැනි දින පළාත් පාලන ආයතන 65 ක් සම්බන්ධයෙන් ඡන්ද විමසීම පවත්වනු ලබන අතර, ඒ සියලුම පළාත් පාලන ආයතනවලට අදාළ තැපැල් ඡන්ද සලකුණු කිරීම ඒ ඒ සහතික කිරීමේ නිලධාරී කාර්යාලයේදී 2011.07.12 වැනි දින සිදු කරනු ලැබේ.

2. එක් එක් සහතික කිරීමේ නිලධාරී විසින් තමාට අදාළ තැපැල් ඡන්ද හිමියන් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා පැමිණිය යුතු දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් වෙත වහා දැනුම් දිය යුතුය.

3. තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා පැමිණෙන ඡන්ද හිමියන් විසින් තමාගේ ජාතික හැඳුනුම්පත හෝ මැතිවරණ කටයුතු සඳහා වලංගු හැඳුනුම්පත් අතුරින් එකක් අනිවාර්යයෙන් රැගෙන ආ යුතුය. තැපැල් ඡන්ද සඳහා පමණක කාර්යාල හැඳුනුම්පත ද පිළිගනු ලැබේ.

4. වලංගු හැඳුනුම්පතක් මගින් තැපැල් ඡන්ද දායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගන්නා තෙක් සහතික කිරීමේ නිලධාරී විසින් D කවරය විවෘත නොකළ යුතුය. D කවරයේ අදාළ තැපැල් ඡන්ද දායකයාගේ නම සටහන් කර ඇත.

5. තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන ස්ථානයේ කටයුතු නිරීක්ෂණය සඳහා තරග කරනු ලබන පක්ෂවල ලේකම්වරුන්, බලයලත් නියෝජිතයින් සහ ස්වාධීන කණ්ඩායම් නායකයින් විසින් එක් නියෝජිතයකු බැගින් පත් කරනු ලැබිය හැකිය. එම පත්වීම් ලිපි පරීක්ෂා කර අදාළ නියෝජිතයින් භාර ගන්නා මෙන්, සියලුම සහතික කිරීමේ නිලධාරීන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. PAFFREL සහ CMEV නිරීක්ෂණ ආයතන දෙක වෙනුවෙන් ද එක් එක් සහතික කිරීමේ නිලධාරී කාර්යාලයක් සඳහා නිරීක්ෂකයකු බැගින් පත් කිරීම මවිසින් අනුමත කර ඇත.

7. තැපැල් ඡන්ද සලකුණු කිරීම් නිරීක්ෂණය සඳහා තේරීම්භාර නිලධාරී විසින් ද විශේෂ නිරීක්ෂකයින් පත් කරනු ලැබේ.

8. සහතික කිරීමේ නිලධාරී විසින් ඡන්දදායකයාට රහස්‍ය ලෙස ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුතු අතර ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව යොදින් නවාගෙන විත් තමා ඉදිරි පිටදී B කවරයට බහාලීමට උපදෙස් දිය යුතුය.

9. ඡන්ද පත්‍රිකාව බහාලූ B කවරය සහතික කිරීමේ නිලධාරී විසින් හොඳින් අලවා මුද්‍රා තබා එම B කවරයට පිටතින් තමා විසින් අත්සන් කර සහතික කරන ලද අනන්‍යතා ප්‍රකාශය ක්ලිප් එකකින් ඇමිණිය යුතුය. මෙය අනිවාර්ය අවශ්‍යතාවකි. අනතුරුව අනන්‍යතා ප්‍රකාශය අමුණන ලද B කවරය A කවරය තුළට බහා අලවා මුද්‍රා තැබිය යුතුය.

10. තැපැල් ඡන්ද සලකුණු කිරීම පෙ.ව 8.30 ට පෙර ආරම්භ නොකළ යුතුය. එමෙන්ම තැපැල් ඡන්ද අඩංගු පැකට්ටු තැපැල් කාර්යාල වෙත භාරදීම සඳහා ප්‍රමාණවත් කාලයක් ඇතිව සලකුණු කිරීම අවසන් කළ යුතුය.කිසිම හේතුවක් නිසා තැපැල් ඡන්ද පැකට්ටුවක් තැපැල් පෙට්ටියට නොදැමිය යුතුය.

11. සලකුණු කළ ඡන්ද පත්‍රිකාව වෙනත් අයකුට පෙන්වීම හෝ පෙන්වීමට අනුබලදීම බරපතල වරදකි.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.07.11

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 07

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (3 අදියර)

තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් සහ තැපැල් ඡන්ද හිමියන් වෙත කරනු ලබන දැනුම් දීම

1. පිළිගනු ලැබූ තැපැල් ඡන්ද අයදුම්පත් වලට අදාළ ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම අද දින එනම් 2011.09.21 වැනි දින අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවලදී සිදු කරනු ලැබේ.

2. ඉදිරි දින කිහිපය තුළ අදාළ රක්ෂණ පැකට්ටු සහතික කිරීමේ නිලධාරීන් වෙත ලැබෙන බැවින් ආරක්ෂිතව එම රක්ෂණ පැකට්ටු තමා වෙත ලැබීමේ අවශ්‍යතාව පිළිබඳව දෛනික තැපෑල පිළිබඳව කටයුතු කරන නිලධාරියා දැනුවත් කළ යුතුය.

3. සහතික කිරීමේ නිලධාරීන් වෙත ලැබෙන එක් එක් රක්ෂණ පැකට්ටුව තමා විසින් සහතික කළ තැපැල් ඡන්ද අයදුම්පත් වලට අදාළ පැකට්ටුවක් ද යන්න වහා පරීක්ෂා කර වෙනසක් ඇත්නම් පැකට්ටුව එවා ඇති දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලය වෙත හෝ අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන) වෙත හෝ දුරකථනයෙන් දන්වා උපදෙස් ලබා ගත යුතුය. දුරකථන අංකය 0777464897 වේ.

4. තැපැල් ඡන්ද සලකුණු කිරීම ඒ ඒ සහතික කිරීමේ නිලධාරී කාර්යාලයේදී 2011.09.29 සහ 30 දිනයන්හිදී සිදු කිරීමට නියමිතය.

5. එක් එක් සහතික කිරීමේ නිලධාරී විසින් තමාට අදාළ තැපැල් ඡන්ද හිමියන් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම සඳහා පැමිණිය යුතු දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් වෙත වහා දැනුම් දිය යුතුය.

6. තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා පැමිණෙන ඡන්ද හිමියන් විසින් තමාගේ ජාතික හැඳුනුම්පත හෝ මැතිවරණ කටයුතු සඳහා වලංගු හැඳුනුම්පත් අතුරින් එකක් අනිවාර්යයෙන් රැගෙන ආ යුතුය. තැපැල් ඡන්ද සඳහා පමණක් කාර්යාල හැඳුනුම්පත ද පිළිගනු ලැබේ.

7. වලංගු හැඳුනුම්පතක් මගින් තැපැල් ඡන්ද දායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගන්නා තෙක් සහතික කිරීමේ නිලධාරී විසින් D කවරය විවෘත නොකළ යුතුය. D කවරයේ අදාළ තැපැල් ඡන්ද දායකයාගේ නම සටහන් කර ඇත.

8. තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන ස්ථානයේ කටයුතු නිරීක්ෂණය සඳහා තරග කරනු ලබන පක්ෂ වල ලේකම්වරුන්, බලය ලත් නියෝජිතයින් සහ ස්වාධීන කණ්ඩායම් නායකයින් විසින් එක් නියෝජිතයකු බැගින් පත් කරනු ලැබිය හැකිය. එම පත්වීම් ලිපි පරීක්ෂා කර අදාළ නියෝජිතයින් භාර ගන්නා මෙන්, සියලුම සහකික කිරීමේ නිලධාරීන් වෙත දැනුම් දෙනු ලැබේ.

9. PAFFREL සහ CMEV නිරීක්ෂණ ආයතන දෙක වෙනුවෙන් ද එක් එක් සහතික කිරීමේ නිලධාරී කාර්යාලයක් සඳහා නිරීක්ෂකයකු බැගින් පත් කිරීම මවිසින් අනුමත කර ඇත.

10. තැපැල් ඡන්ද සලකුණු කිරීම් නිරීක්ෂණය සඳහා තේරීම්භාර නිලධාරී විසින් ද විශේෂ නිරීක්ෂකයින් පත් කරනු ලැබේ.

11. සහතික කිරීමේ නිලධාරී විසින් ඡන්දදායකයාට රහස්‍ය ලෙස ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය යුතු අතර ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව හොඳින් නවාගෙන විත් තමා ඉදිරිපිටදී B කවරයට බහාලීමට උපදෙස් දිය යුතුය. සලකුණු කළ ඡන්ද පත්‍රිකාවක් වෙනත් අයකුට පෙන්වීම හෝ පෙන්වීමට අනුබලදීම බරපතල වරදකි.

12. ඡන්ද පත්‍රිකාව බහාලූ B කවරය සහතික කිරීමේ නිලධාරී විසින් හොඳින් අලවා මුද්‍රා තබා එම B කවරයට පිටතින් තමා විසින් අත්සන් කර සහතික කරන ලද අනන්‍යතා ප්‍රකාශය ක්ලිප් එකකින් ඇමිණිය යුතුය. මෙය අනිවාර්ය අවශ්‍යතාවකි. අනතුරුව අනන්‍යතා ප්‍රකාශය අමුණන ලද B කවරය A කවරය තුළට බහා අලවා මුද්‍රා තැබිය යුතුය. මේ සඳහා විශේෂ ආරක්ෂිත ස්ටිකරයක් අදාළ පැකට්ටුවේ බහා එවනු ඇත.

13. තැපැල් ඡන්ද සලකුණු කිරීම කාර්යාල වේලාව තුළ සිදු කළ යුතු අතර සලකුණු කිරීම් අවසන් වූ වහාම සියලුම පැකට්ටු ආසන්න තම තැපැල් කාර්යාලය වෙත භාර දිය යුතුය. තැපැල් පෙට්ටි තුළට නොදැමිය යුතුය.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.09.21

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 06

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011
තැපෑලෙන් ඡන්දය දීම

1. තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2011.01.27 දින බවත් මින් ඉදිරියට දින දීර්ඝ කිරීමක් සිදු නොකරන බවත් නිවේදනය කරමි.
2. ඒ අනුව 2011.01.27 දිනෙන් පසුව ඒ ඒ තේරීම්භාර නිලධාරීන් වෙත තැපැල් මගින් ලැබෙන හෝ අතින් භාර දෙන අයදුම්පත් ප්‍රමාද අයදුම්පත් සේ සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. තැපැල් ඡන්ද හිමියන් වශයෙන් සුදුසුකම් ලබා ඇති ඡන්ද හිමියන් නොපමාව තම තැපැල් ඡන්ද අයදුම්පත තමාගේ ආසන්නතම ප්‍රධානියාගේ සහතිකය ලබාගෙන සහතික කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. මෙවර තැපැල් ඡන්ද අයදුම්පතට ආසන්නතම ආයතන ප්‍රධානියාගේ සහතිකය ඇතුළත් කර ඇත්තේ ව්‍යාජ තැපැල් ඡන්ද අයදුම්පත් ලැබීම වළක්වා ගැනීමේ පියවරක් වශයෙන් බැව් සලකන්න.
4. අයදුම්කරු සහතික කිරීමේ නිලධාරියකු ද වන අවස්ථාවක දී ආසන්නතම ආයතන ප්‍රධානියාගේ සහතිකය සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ.
5. තැපැල් ඡන්ද සහතික කිරීමේ යෙදෙන සහතික කිරීමේ නිලධාරීන් අදාළ කොටස සම්පූර්ණ කර තම අත්සන සහ නිල මුද්‍රාව තැබීමට අමතරව තමාගේ දුරකථන අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය ද අවශ්‍යයෙන්ම අයදුම්පතේ සටහන් කළ යුතුය.
6. ජාතික හැඳුනුම්පතේ අංකය සටහන් කිරීම සඳහා තැපැල් ඡන්ද අයදුම්පතෙහි ස්ථානයක් වෙන්කර නැතත් සහතික කිරීමේ නිලධාරී විසින් තම අත්සනට ඉහළින් හෝ ඒ ආසන්නයේ ඉඩ ඇති ස්ථානයක හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අත්‍යවශ්‍යය. හැඳුනුම්පත් අංකය අවශ්‍ය වන්නේ තැපැල් ඡන්ද හිමියන්ගේ නාමලේඛන පරිගණක ආශ්‍රයෙන් සැකසීම සඳහා බව ද සලකන්න.

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.01.19

දයානන්ද දිශානායක
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 17

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (1 අදියර)
සියලුම සහතික කිරීමේ නිලධාරීන් සහ සියලුම තැපැල් ඡන්ද හිමියන් වෙත කරනු ලබන දැනුම් දීමයි.

ඉහත සඳහන් ඡන්ද විමසීමට අදාළව භාර ගනු ලැබූ නාමයෝජනා පත්‍ර 2,047 ක් අතුරින් නාමයෝජනා 452 ක් ප්‍රතික්ෂේප වූ අතර එයින් පළාත් පාලන ආයතන 64 කට අදාළ නාමයෝජනා සම්බන්ධයෙන් අභියාචනාධිකරණයෙහි පෙත්සම් ගොනු කර ඇත.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව තැපැල් ඡන්ද හිමියන් වෙනුවෙන් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම 2011.02.25 වැනි දින දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලදී සිදු කරන ලද අතර එම ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂණ පැකට්ටු ඉදිරි දින කිහිපය තුළ අදාළ සහතික කිරීමේ නිලධාරීන් වෙත ලැබෙනු ඇත.

අභියාචනාධිකරණයෙහි පෙත්සම් විභාග වෙමින් පවතින ඉහත සඳහන් පළාත් පාලන ආයතන හැටහතරෙහි සහ මුලතිව් දිස්ත්‍රික්කයේ බිම් බෝම්බ ඉවත් කිරීම අවසන් නොවීම හේතුවෙන් නැවත පදිංචි කිරීම් අවසන් නොවූ පළාත් පාලන ආයතන දෙකෙහි තැපැල් ඡන්ද හිමියන් වෙනුවෙන් තැපැල් ඡන්ද නිකුත් කිරීම සිදු නොවූ අතර ඒ වෙනුවෙන් වෙනත් දිනයක් යොදා ගැනීමට ද කාලය ප්‍රමාණවත් නොවූ බැවින් එම පළාත් පාලන ආයතන 66 ට අදාළ ඡන්ද විමසීම කල් තබන ලදී. ඒ අනුව එකී පළාත් පාලන ආයතන 66 හි තැපැල් ඡන්ද හිමියන්ගේ ඡන්ද පත්‍රිකා මේ අවස්ථාවේ දී සහතික කිරීමේ නිලධාරීන් වෙත නොලැබෙන බව විශේෂයෙන් දැනුම් දෙමි.

තැපැල් ඡන්ද හිමියන්ගේ ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම 2011.03.08 සහ 09 දෙදිනට නියම කර ඇත. සියලුම සහතික කිරීමේ නිලධාරීන් 2011.03.08 වැනි දින අනිවාර්යයෙන් තමා විසින් අයදුම්පත් සහතික කළ තැපැල් ඡන්ද හිමියන්ගේ ඡන්ද පත්‍රිකා සලකුණු කිරීමට විධිවිධාන සැලසිය යුතුය. 09 වැනි දින තැපැල් ඡන්ද සලකුණු කිරීම යොදා ගත යුත්තේ එක් දිනක් තුළ අවසන් කළ නොහැකි තරම් තැපැල් ඡන්ද හිමියන් සංඛ්‍යාවක් ඇත්නම් පමණි.

මෙම අවස්ථාව නිරීක්ෂණය සඳහා සහතික කිරීමේ නිලධාරී කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයෙහි පිහිටි පළාත් පාලන ආයතන සඳහා තරග කරනු ලබන සියලුම පක්ෂ සහ කණ්ඩායම්වලින් එක් නියෝජිතයකු බැගින් සහ නිරීක්ෂණ කණ්ඩායම්වලින් එක් නිරීක්ෂකයකු බැගින් පත් කරනු ලැබිය හැකිය. මේ පිළිබඳව අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් පක්ෂ ලේකම්වරුන් ස්වාධීන කණ්ඩායම් නායකයින් සහ අදාළ සහතික කිරීමේ නිලධාරීන් දැනුවත් කරනු ඇත.

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.03.01

දයානන්ද දිශානායක
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 02

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011(2 අදියර)

සියලුම සහතික කිරීමේ නිලධාරීන් සහ සියලුම තැපැල් ඡන්ද හිමියන් වෙත කරනු ලබන දැනුම් දීමයි.

ප්‍රතික්ෂේප වූ නාමයෝජනා සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියා මාර්ගයන්ට අවතීර්ණ වීමේ හේතුව මත පළාත් පාලන ආයතන 65 ක ඡන්ද විමසීම කල් තබන ලදී. එකී පළාත් පාලන ආයතනවලට අදාළ ඡන්ද විමසීම 2011.07.23 වැනි දින පැවැත්වීමට තීරණය කර ඇත.

02. මෙම ඡන්ද විමසීම 2011.05.31 වැනි දින සහතික කරන ලද 2010 ඡන්ද හිමි නාමලේඛනය පදනම් කරගෙන සිදු කළ යුතු බැවින් 2010 ඡන්ද හිමි නාමලේඛනයට අනුරූප වන පරිදි අදාළ තැපැල් ඡන්ද හිමියන්ගේ නාමලේඛනය ද සංශෝධනය කළ යුතු වනු ඇත. තැපැල් ඡන්ද හිමියකු වශයෙන් ඔබගේ නම 2009 වර්ෂයේ ලියාපදිංචිව සිටි ලිපිනයේම 2010 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ද ලියාපදිංචිව ඇත්නම් පමණක් ඔබට තැපැල් ඡන්ද හිමිකම් ලැබෙනු ඇත. එමෙන්ම ඡන්ද හිමියාගේ නමෙහි කිසියම් වෙනසක් ඇති බව පරීක්ෂණවලදී හෙළිවුවහොත් එය ද තැපැල් ඡන්ද අයිතිය අහිමිවීමට හේතුවක් විය හැකිය. කෙසේ වෙතත් මෙම ඡන්ද විමසීම යාපනය සහ කිළිනොච්චි දිස්ත්‍රික්ක හැර අනෙකුත් දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතන එකකට හෝ කිහිපයකට පමණක් සීමාවී ඇති බැවින් ආරක්ෂක අංශ සහ අත්‍යවශ්‍ය සේවා හැර රාජ්‍ය නිලධාරීන් සඳහා තැපැල් ඡන්ද පහසුකම් සැලසිය යුත්තේ මැතිවරණ රාජකාරියේ යොදවන්නේ නම් පමණක් බව ද දිස්ත්‍රික් නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ සහකාර හා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් දැනුවත් කර ඇත.

03. කෙසේ වෙතත් තැපැල් ඡන්ද පහසුකම් අහිමිවන නිලධාරීන් සඳහා 2010 වර්ෂයේ ඡන්ද හිමි නාම ලේඛනයෙහි ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචිව ඇති ලිපිනය අයත් වන ඡන්ද පොළේදී පෞද්ගලිකව ඡන්දය ප්‍රකාශ කිරීමට අවශ්‍ය පහසුකම් සලසනු ලැබේ.

04. 2009 නාමලේඛනය අනුව සුදුසුකම් ලබා තැපැල් ඡන්ද නාමලේඛන ගතව සිටින සෑම තැපැල් ඡන්ද හිමියකු වෙත මෙවර තැපැල් ඡන්ද පහසුකම් ලැබෙන හෝ නොලැබෙන බව පෞද්ගලිකවම දැනුම් දිය යුතු යයිද මවිසින් උපදෙස් දී ඇත.

05. තැපැල් ඡන්ද අයදුම්පත් සහතික කළ සහතික කිරීමේ නිලධාරීන් වෙත ඔහු හෝ ඇය යටතේ මෙවර ඡන්ද විමසීම සඳහා තැපැල් ඡන්ද පහසුකම් හිමිවන ඡන්ද හිමියන්ගේ නාම ලේඛනයක් වහා යවන ලෙස ද අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. ඒ අනුව එම ඡන්ද හිමියන්ට අදාළ තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂණ පැකට්ටු භාර ගැනීම, සුරක්ෂිතව ගබඩා කර තබා ගැනීම, නියමිත දිනයෙහි ඡන්ද හිමියන් ලවා ඡන්ද පත්‍රිකා සලකුණු කරවා අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත යැවීමේ වගකීම සහතික කිරීමේ නිලධාරීන් වෙත පැවරෙනු ඇත.

06. ස්ථාන මාරුවීම විශ්‍රාම යාම හෝ වෙනත් හේතුවක් නිසා අදාළ සහතික කිරීමේ නිලධාරී මේ වන විට එකී සේවා ස්ථානයෙහි සේවයේ නිරතව නොමැති නම් අනුප්‍රාප්තික නිලධරයා සහතික කිරීමේ නිලධාරී වශයෙන් කටයුතු කළ යුතුය. එම අනුප්‍රාප්තික නිලධරයා පිළිබඳ තොරතුරු අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත දැනුම් දිය යුතුය. ඒ සඳහා ආකෘති පත්‍රයක් තේරීම්භාර නිලධාරීන් විසින් එවනු ඇත.

07. තැපැල් ඡන්ද හිමියන් වශයෙන් සුදුසුකම් ලැබූවන් වෙත ඡන්ද පත්‍රිකා අඩංගු පැකට්ටු රක්ෂණ තැපෑලෙන් යැවීම සඳහා 2011.07.01 දින තැපැල් කාර්යාල වෙත භාරදිය යුතු යයි ද තැපැල් ඡන්ද හිමියන් ලවා ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම 2011.07.12 වැනි දින සිදු කළ යුතු යයි ද දින නියම කර ඇති බව ද විශේෂයෙන් නිවේදනය කරමි.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.06.09

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 15

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (1 අදියර)
ඡන්ද පොළේ දී අනන්‍යතාව සනාථ කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ඡන්ද හිමියන් වෙත කෙරෙන විශේෂ දැනුම් දීමයි.

2004 අංක 14 දරන ඡන්ද විමසීම් විශේෂ විධිවිධාන පනතින් සලසා ඇති ප්‍රතිපාදන අනුව වෙනත් යම් නීතියකට පටහැනිව කවර විධිවිධානයන් තිබුණ ද "මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන්පසු ඡන්දදායකයකු වශයෙන් තමා වෙත ඡන්ද පත්‍රිකාවක් භාර දෙනු ලැබීමට ප්‍රථම අදාළ මධ්‍යස්ථානයේ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු වෙත වලංගු අනන්‍යතා ලේඛනයක් පරීක්ෂා කර බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය."

02. අභියාචනාධිකරණයේ අංක 176/2006 නඩුව සම්බන්ධයෙන් ගත් තීරණය අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු බවට තීරණය වී ඇත.

03. ඒ අනුව 2011.03.17 වැනි දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද පොළට යන විට නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවට අමතරව පහත සඳහන් වලංගු අනන්‍යතා ලේඛනවලින් කවර හෝ එක් ලේඛනයක් නොවරදවාම රැගෙන යා යුතුය.

1. ජාතික හැඳුනුම්පත
2. වලංගු ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය
4. රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
5. වැඩිහිටි හැඳුනුම්පත
6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පූජ්‍ය සහ පූජක පක්ෂය වෙනුවෙන් නිකුත් කර ඇති හැඳුනුම්පත
7. මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පසුගිය ඡන්ද විමසීම සඳහා නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත (ග්‍රාම නිලධාරී විසින් නැවත වලංගු කරන ලද)

04. කිසියම් ඡන්ද දායකයකු අත ඉහත සඳහන් හැඳුනුම්පත් අතුරින් කවර හෝ එකක් නොමැති නම් හෝ තමා වෙත ඇති හැඳුනුම්පත කල් ඉකුත් වී ඇත්නම් හෝ කියවිය නොහැකි පරිදි මැකී ඇත්නම් හෝ තමා පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී හමුවී මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් මෙම ඡන්ද විමසීම සඳහා නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පතක් ලබා ගත යුතුය. හැඳුනුම්පත් සඳහා අයදුම්පත් නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ 2011.03.05 දින දක්වා පමණි. එබැවින් තාවකාලික හැඳුනුම්පතක් සකස් කර ගැනීම අවශ්‍ය වන්නේ නම් නොපමාව ඔබගේ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී හමුවන මෙන් උපදෙස් දෙනු ලැබේ.

05. මෙම තාවකාලික හැඳුනුම්පත ලබා දීම සඳහා කිසිඳු මුදලක් අය නොකරන බවත්, ඡන්ද හිමියා සැපයිය යුතු වන්නේ අඟල් 1 ¼ X 1 ප්‍රමාණයේ මෑතක දී ගත් කළු සුදු හෝ වර්ණ ඡායාරූප පිටපත් දෙකක් පමණක් බවත් දන්වනු කැමැත්තෙමි. හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අවශ්‍ය කාඩ්පත් අදාළ ග්‍රාම නිලධාරී වෙත ලබා දී ඇත.

06. ඡන්ද පොළේ දී ඉහත සඳහන් ඡායාරූපය සහිත වලංගු හැඳුනුම්පත් අතුරින් එකක් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පතක් හෝ මගින් ඡන්ද දායකයා තමාගේ අනන්‍යතාව සනාථ නොකළහොත් ඡන්ද පොළෙන් ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු නොලැබේ.

07. කාර්යාල හැඳුනුම්පත, තැපැල් හැඳුනුම්පත, සාමවිනිසුරු හැඳුනුම්පත, ජාතික හැඳුනුම්පත ලබා ගැනීමේ දී නිකුත් කරනු ලබන ඡායාරූපය සහිත කුවිතාන්සිය ආදී වෙනත් ආකාරයේ අනන්‍යතා ලියවිලි කිසිවක් ඡන්ද පොළේ දී අනන්‍යතාව සනාථ කිරීම සඳහා පිළිගනු නොලැබේ.

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.02.19

දයානන්ද දිශානායක
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 08

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (2 අදියර)
නිල ඡන්ද දැන්වීම් පත් සහ වලංගු හැඳුනුම්පත්

2011.07.23 වැනි දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඡන්ද හිමියන් වශයෙන් සුදුසුකම් ලබා ඇති සියලුම ඡන්ද හිමියන් වෙත මේ වන විට නිල ඡන්ද දැන්වීම් පත් බෙදා හැරීම අවසන් කර ඇත. එහෙත් කිසියම් ඡන්ද හිමියෙකුට තමාගේ නිල ඡන්ද දැන්වීම් පත මෙතෙක් ලැබී නොමැති නම් නිල ඡන්ද දැන්වීම් පත නොමැතිව වුවද වලංගු හැඳුනුම්පතක් මගින් ඡන්ද පොළේදී තමාගේ අනන්‍යතාව තහවුරු කර ඡන්ද පත්‍රිකාවක් ලබාගත හැකිය.

02. පිටපත් කිරීමේදී හෝ මුද්‍රණය කිරීමේදී සිදුවී ඇති දෝෂ හේතුවෙන් කිසියම් ඡන්ද හිමියෙකුගේ නිල ඡන්ද දැන්වීම් පතෙහි හා ඡන්ද හිමි නාමලේඛනයේ ඡන්ද හිමියාගේ නමෙහි හෝ හැඳුනුම්පත් අංකයෙහි වෙනසක් දක්නට ඇති අවස්ථාවක වුවද තම අනන්‍යතාව සනාථ කර ඡන්ද පොළෙන් ඡන්ද පත්‍රිකාවක් ලබාගත හැකිය. අවශ්‍ය වුවහොත් පමණක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් ඡන්ද පත්‍රිකාව නිකුත් කිරීමට පෙර ඡන්ද හිමියාගෙන් ප්‍රකාශ පත්‍රයක් අත්සන් කරගනු ලැබේ.

03. ඡන්ද පොළේ දී වලංගු හැඳුනුම්පත් වශයෙන් පහත සඳහන් ලේඛන පිළිගනු ලැබේ.

1 ජාතික හැඳුනුම්පත
2 වලංගු ගමන් බලපත්‍රය
3 වලංගු රියදුරු බලපත්‍රය
4 රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
5 වැඩිහිටි හැඳුනුම්පත
6 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පූජ්‍ය සහ පූජක පක්ෂ වෙනුවෙන් නිකුත් කර ඇති හැඳුනුම්පත
7 මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පසුගිය ඡන්ද විමසීම සඳහා නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත (ග්‍රාම නිලධාරී විසින් නැවත වලංගු කරන ලද)
8 මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් මෙම ඡන්ද විමසීම සඳහා අළුතින් නිකුත් කළ තාවකාලික හැඳුනුම්පත්

04. රජයේ කාර්යාල, රාජ්‍ය සංස්ථා, ව්‍යාවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය බැංකු නිලධාරීන් සඳහා නිකුත් කර ඇති කාර්යාලීය හැඳුනුම්පත් සහ ජාතික හැඳුනුම්පත් අයදුම් කිරීමේදී ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන රිසිට් පත ඡන්ද පොළේ දී ඡන්ද දායකයාගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා හැඳුනුම්පතක් වශයෙන් වලංගු නොවන බවද විශේෂයෙන් දැනුම් දෙනු ලැබේ.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.07.22

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මෙහි පිටපතක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති ගේ ගොනුවට ඇතුළත් කරන්න.

මාධ්‍ය නිවේදන - අංක 11

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (2 අදියර)
කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සියලුම පළාත් පාලන ආයතන සහ මුලතිව් දිස්ත්‍රික්කයේ තුනුක්කායි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි ලියාපදිංචි ඡන්ද හිමියන්ගේ අවධානය සඳහා ඡන්ද පොළේදී අනන්‍යතාව සනාථ කිරීම

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සහ මුලතිව් දිස්ත්‍රික්කයේ තුනුක්කායි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි ඡන්ද හිමියන් වෙනුවෙන් අවතැන්වූවන් ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ පොලිස් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති තාවකාලික හැඳුනුම්පත ද ඡන්ද පොළේදී පිළිගත හැකි වලංගු හැඳුනුම්පතක් වශයෙන් පිළිගැනීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

02. ඒ අනුව ඔබ වෙත වෙනත් කිසිම වලංගු හැඳුනුම්පතක් නොමැති නම් පොලිස් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ඉහත සඳහන් හැඳුනුම්පත ඡන්ද පොළ වෙත රැගෙන යන මෙන් දන්වමි.

03. එම හැඳුනුම්පත ඔබ පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වෙත ඉදිරිපත් කර 2010 ඡන්ද හිමි නාමලේඛනය අනුව ඔබගේ නමට අයත් අනු අංකය සහ ඔබ ඡන්ද හිමියකු වශයෙන් ලියා පදිංචි ඡන්ද කොට්ඨාසයේ අංකය සටහන් කරවාගෙන ඡන්ද පොළ වෙත රැගෙන යන්නේ නම් ඡන්ද පොළෙහි ඇතිවන ප්‍රමාදය වලකාගත හැකිය.

04. ඔබ අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය සඳහා සකස් වූ 2010 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයෙහි ලියාපදිංචි ඡන්දදායකයෙක් නම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව නැතත් වලංගු හැඳුනුම්පතක් මගින් ඔබගේ අනන්‍යතාව සනාථ කිරීමෙන් ඔබට නියමිත ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාවක් ලබාගත හැකිය.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.07.23

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 16

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (1 අදියර)

පළාත් පාලන ආයතන 66 ක ඡන්ද විමසීම කල්තැබීම ගැන මහජනතාවගේ දැනගැනීම පිණිස කරනු ලබන නිවේදනයයි.

2011.03.17 දින පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම සඳහා නාමයෝජනා පත්‍ර 2,047 ක් ඉදිරිපත්ව තිබූ අතර එම නාමයෝජනා පත්‍රවලින් 452 ක් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වැනි අධිකාරය) විධිවිධානවලට අනුකූල නොවන හෙයින් ප්‍රතික්ෂේප කරන ලදී.

මෙම ප්‍රතික්ෂේප කළ නාමයෝජනා පත්‍ර අතුරින් පළාත් පාලන ආයතන 66 ක නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කර ඇත. මෙම පෙත්සම් අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතින අතර අක්මීමන, අකුරැස්ස සහ මොණරාගල ප්‍රාදේශීය සභා තුන සඳහා ඡන්ද විමසීම් ඉදිරි කටයුතු කරගෙන යාම අත්හිටුවීමට 2011.02.18 දින අතුරු තහනම් නියෝග ගරු අභියාචනාධිකරණය විසින් නිකුත් කර ඇත. මේ නිසා මෙම ප්‍රාදේශීය සභාවලට අදාළ ඡන්ද විමසීම සම්බන්ධව කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගත නොහැකිය.

මේ අතර තැපැල් ඡන්ද නිකුත් කිරීම 2011 පෙබරවාරි 25 දින සිදු කිරීමට ද තැපැල් ඡන්ද ලකුණු කිරීම මාර්තු 08 හා 09 වන දිනට ද නියම කර ඇත. පෙබරවාරි 25 වන දින තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් නොකළහොත් නියමිත පරිදි බෙදා හැරීම අඩාල වන අතර නියමිත දිනයන්හි සලකුණු කිරීමට නොහැකි වී මාර්තු 17 දිනට පෙර ආපසු ලබා ගැනීමට නොහැකි වේ. මාර්තු 01 වන දින නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා තැපෑලට භාර දී ඡන්ද හිමියන් වෙත බෙදා හැරීම ද මේ හා සමගාමීව සිදු කළ යුතු හෙයින් තැපැල් ඡන්ද නිකුත් කිරීම කල් දැමීම ප්‍රායෝගික නොවේ. එබැනි පැවති තත්ත්වය යටතේ තේරීම්භාර නිලධාරීන්ට හා මැතිවරණ දෙපාර්තමේන්තුවට අදාළ සභාවන්හි ඡන්ද විමසීම් කල් තැබීම හැර වෙනත් විකල්පයක් නොමැත.

2006 වර්ෂයේ දී පැවැත් වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අංක. CA/365 යටතේ පෙත්සම සහ තවත් සභා කීපයකට පෙත්සම් ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර තිබියදී ඡන්ද විමසීමේ ඉදිරි කටයුතු කර ගෙන ගිය අතර ඡන්ද පත්‍රිකා මුද්‍රණය කර තැපැල් ඡන්ද පත්‍රිකා ද නිකුත් කරන ලදී. ඉන් අනතුරුව ගරු අධිකරණය එම ආයතන සඳහා ඡන්ද විමසීම පැවැත්වීම පිළිබඳව අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලද අතර තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කර අවසන් බව ගරු අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කළ නමුත් ඡන්ද විමසීමට අදාළ කටයුතු අත්හිට වූ බැවින් නිකුත් කර තිබූ තැපැල් ඡන්ද පත්‍රිකා පැකට්ටු සහතික කිරීමේ නිලධාරීන් වෙතින් ආපසු එක්රැස් කිරීමට සිදුවිය. පළාත් පාලන ආයතන 66 ක් සම්බන්ධයෙන් අධිකරණ තීරණය ලැබෙන තෙක් ඡන්ද විමසීම කල්තැබීමට තීරණය නොකළහොත් අවිනිශ්චිතව අධික වැය බරක් මෙන්ම ඡන්ද පත්‍රිකා නැවත ආපසු ගෙන්වා ගැනීමටත් සිදුවීමෙන් විශාල ශ්‍රමයක් ද අපතේ යාම සිදුවේ. එසේම නිකුත් කර ඇති තැපැල් ඡන්ද පත්‍රිකා උපයෝගී කරගෙන නොයෙකුත් චංචා සහගත ක්‍රියාවල යෙදීමට ද අවකාශ ඇත.

මෙම ආයතන 66 හි ඡන්ද විමසීම කල්තැබූ බව හා එයට පාදක වූ කරුණු පිළිබඳව 2011.02.22 දින පැවැත් වූ පක්ෂ ලේකම්වරුන්ගේ සාකච්ඡාවේ දී ද කරුණු පැහැදිලි කරන ලදී.

නාමයෝජනා අවසන් වීමට පෙර මැතිවරණ කොමසාරිස් විසින් සියලුම පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ට ලිඛිත උපදෙස් දී නාමයෝජනා පත්‍ර පිළියෙල කිරීම, භාර දීම සහ ඊට අදාළ නීතිමය ප්‍රතිපාදන පිළිබඳව දැනුවත් කර තිබූ බව 2011.02.22 දින පැවැත් වූ සාකච්ඡාවේ දී වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

එසේ තිබියදී සමහර පක්ෂ ලේකම්වරුන් සහ විවිධ සංවිධාන ප්‍රසිද්ධ වේදිකාවල සහ විවිධ ප්‍රවෘත්ති මාධ්‍යයන් ඔස්සේ නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම හා පළාත් පාලන ආයතන 66 ක ඡන්ද විමසීම කල්තැබීම පදනම් රහිතව විවේචනය කිරීම ඉතාම කණගාටුදායකය. එසේම මේ ආයතනයන්වල ඡන්ද විමසීම කල්තැබීම කිසිදු දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වාසියක් හෝ අවාසියක් ලබාදීමේ අරමුණින් සිදු කර නැති බවත් මැතිවරණ දෙපාර්තමේන්තුව කිසිඳු අවස්ථාවක කිසිඳු කණ්ඩායමකට හෝ පක්ෂයකට විශේෂත්වයක් දක්වා ක්‍රියා නොකරන බවත් මෙයින් අවධාරණය කරනු ලැබේ.

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.02.26

දයානන්ද දිශානායක
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 18

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් - 2011 (1 අදියර)
ඡන්ද විමසීම කල්තැබූ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් තැපැල් ඡන්ද නිකුත් නොකළ බව දැනුම්දීම

පළාත් පාලන ආයතන 301 ක් වෙනුවෙන් 2011.01.20 දින සිට 27 දින මධ්‍යාහ්න 12.00 දක්වා අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් නාමයෝජනා භාරගනු ලැබූ අතර විධිමත්ව ඉදිරිපත් නොවීම හේතුවෙන් නාමයෝජනා 452 ක් ප්‍රතික්ෂේප විය. ප්‍රතික්ෂේප වූ නාමයෝජනා සම්බන්ධයෙන් ගනු ලැබූ අධිකරණ ක්‍රියා මාර්ග හේතුවෙන් පළාත් පාලන ආයතන 64 ක ද බිම්බෝම්බ ඉවත් කිරීමේ කටයුතු මෙතෙක් අවසන් නොවීම නිසා නැවත පදිංචි කිරීම අවසන් නොවූ පළාත් පාලන ආයතන දෙකක ද වශයෙන් පළාත් පාලන ආයතන 66 ක ඡන්ද විමසීම කල් තැබීමට සිදුවිය. එසේ කල් තැබීමට සිදුවූ පළාත් පාලන ආයතන පිළිබඳ නාමලේඛන පහත දක්වා ඇත.

02. මෙම පළාත් පාලන ආයතන වලට අදාළව ඉදිරිපත් වූ තැපැල් ඡන්ද අයදුම්පත් වෙනුවෙන් 2011.02.25 වැනි දින තැපැල් ඡන්ද නිකුත් නොකළ බව මෙයින් නිවේදනය කරමි.

1. අධිකරණ හේතුමත ඡන්ද විමසීම කල්තැබූ පළාත් පාලන ආයතන

කොළඹ	කඩුවෙල මහ නගර සභාව	කිළිනොච්චිය	පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාව
	කැස්බෑව නගර සභාව		කරච්චි ප්‍රාදේශීය සභාව
	හෝමාගම ප්‍රාදේශීය සභාව		පූනාකරී ප්‍රාදේශීය සභාව
ගම්පහ	මිනුවන්ගොඩ නගර සභාව	අම්පාර	කාරෙයිතිව් ප්‍රාදේශීය සභාව
	අත්තනගල්ල ප්‍රාදේශීය සභාව		තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව
කළුතර	අගලවත්ත ප්‍රාදේශීය සභාව	ත්‍රිකුණාමලය	සේරුවිල ප්‍රාදේශීය සභාව
මහනුවර	හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව		කන්තලේ ප්‍රාදේශීය සභාව
	අකුරණ ප්‍රාදේශීය සභාව		ත්‍රිකුණාමල නගරය හා කඩවත් ප්‍රාදේශීය සභාව
	යටිනුවර ප්‍රාදේශීය සභාව		කුච්චවේලි ප්‍රාදේශීය සභාව
මාතලේ	විල්ගමුව ප්‍රාදේශීය සභාව	කුරුණෑගල	ගිරිබාව ප්‍රාදේශීය සභාව
	උකුවෙල ප්‍රාදේශීය සභාව		කුලියාපිටිය ප්‍රාදේශීය සභාව
නුවරඑළිය	තලවකැලේ-ලිඳුල නගර සභාව		පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව
ගාල්ල	ඇල්පිටිය ප්‍රාදේශීය සභාව		මාවතගම ප්‍රාදේශීය සභාව
	බද්දේගම ප්‍රාදේශීය සභාව	පුත්තලම	හලාවත නගර සභාව
	අක්මීමන ප්‍රාදේශීය සභාව		නවත්තේගම ප්‍රාදේශීය සභාව
මාතර	අකුරැස්ස ප්‍රාදේශීය සභාව		හලාවත ප්‍රාදේශීය සභාව
යාපනය	වැල්වට්තුරෙයි නගර සභාව		වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව
	පේදුරු තුඩුව නගර සභාව	අනුරාධපුරය	නුවරගම්පළාත මධ්‍යම ප්‍රාදේශීය සභාව
	චාවකච්චේරිය නගර සභාව		රාජාංගනය ප්‍රාදේශීය සභාව
	කරෙයිනගර් ප්‍රාදේශීය සභාව		ගල්නෑව ප්‍රාදේශීය සභාව
	කයිට්ස් ප්‍රාදේශීය සභාව	පොළොන්නරුව	ඇලහැර ප්‍රාදේශීය සභාව
	ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව		හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව
	වේලනෙයි ප්‍රාදේශීය සභාව		වැලිකන්ද ප්‍රාදේශීය සභාව
	වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව	මොනරාගල	සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව
	වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව		මොනරාගල ප්‍රාදේශීය සභාව
	වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව	රත්නපුර	ඇඹිලිපිටිය නගර සභාව
	වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව		රත්නපුර ප්‍රාදේශීය සභාව
	වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව		බලංගොඩ ප්‍රාදේශීය සභාව
	වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව		වැලිගෙපොල ප්‍රාදේශීය සභාව
	පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව	කෑගල්ල	කෑගල්ල නගර සභාව
	චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව		වරකාපොල ප්‍රාදේශීය සභාව
	නල්ලූර් ප්‍රාදේශීය සභාව		රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2. බිම්බෝම්බ ඉවත් කිරීම අවසන් නොවීම හේතුවෙන් නැවත පදිංචි කිරීම් අවසන් නොවූ පළාත් පාලන ආයතන

මුලතිව්	පුතුකුඩියිරුප්පු ප්‍රාදේශීය සභාව
	මුහුදුබඩ පත්තු ප්‍රාදේශීය සභාව

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.03.01

දයානන්ද දිසානායක
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 14

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (1 අදියර)
සියලුම ඡන්ද අපේක්ෂකයින් සහ සියලුම ඡන්ද දායකයින්ගේ දැනගැනීම සඳහා කරනු ලබන විශේෂ දැනුම් දීමයි.

2011.03.17 වැනි දින පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් කළ නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප වූ සමහර දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වීම පළාත් පාලන ආයතනය සඳහා තරග කරනු ලබන වෙනත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයින් වෙනුවෙන් තමන්ගේ නම් ආදේශ කර ගනිමින් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී ඇති බවට පැමිණිලි ලැබී ඇත.

02. තරග වැදී සිටින කිසියම් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයින් වෙනුවෙන් අදාළ ඡන්ද සලකුණ සහ අපේක්ෂක අංක යටතේ තරග කිරීමට වෙනත් කිසිඳු පුද්ගලයකුට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත යටතේ ප්‍රතිපාදන සලසා නොමැති බවත් කිසියම් අපේක්ෂකයකුගේ නමක් වෙනුවට වෙනත් පුද්ගලයකුගේ නමක් ආදේශ කළ නොහැකි බවත් සියලුම අපේක්ෂකයින් සහ ඡන්ද හිමියන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී ඡන්ද විමසීම අවසන් වූ පසු තරග කරනු ලැබූ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව අනුව සමානුපාතිකව එකී පක්ෂය හෝ කණ්ඩායම විසින් හිමිකම් ලබා ඇති සභික සංඛ්‍යාව වැඩිම මනාප සංඛ්‍යාව ලබාගත් අපේක්ෂකයින් අතුරින් තෝරා පත් කර ගනු ලැබේ. යම් සභිකයකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ වෙනත් හේතුවක් නිසා පුරප්පාඩු සිදු වූ අවස්ථාවක එකී පුරප්පාඩුව සඳහා සුදුසු පුද්ගලයකු තෝරාගනු ලබන්නේ ද එකී පක්ෂය හෝ කණ්ඩායම යටතේ තරග කර කිසියම් මනාප සංඛ්‍යාවක් ලබා ඇති අපේක්ෂකයින් අතුරින් අදාළ පක්ෂ ලේකම්වරයා හෝ කණ්ඩායම් නායක විසින් නිශ්චිතව නම් කරනු ලබන අපේක්ෂකයකු පමණි.

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.02.18

දයානන්ද දිශානායක
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 19

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (1 අදියර)
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් වෙත කරනු ලබන දැනුම් දීමයි.

2011.03.17 වැනි දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව තැපැල් ඡන්ද පත්‍රිකා අදාළ ඡන්ද හිමියන් ලවා සලකුණු කරවා තැපෑලට භාර දීම 2011.03.08 සහ 09 දෙදිනට නියම කර ඇත. එබැවින් අදාළ සහතික කිරීමේ නිලධාරීන් අනිවාර්යයෙන්ම මෙම දින දෙකෙහි එම කාර්යයෙහි නිරත විය යුතුව ඇත. තැපෑලෙන් ඡන්දය දීමේ කාර්යයේදී සහතික කිරීමේ නිලධාරී වෙත විශේෂිත වගකීමක් හා කාර්ය භාරයක් පැවරෙනු ඇත.

02. තැපැල් ඡන්ද සලකුණු කිරීම සිදු කරනු ලබන සහතික කිරීමේ නිලධාරී කාර්යාලයක් සඳහා එක් නියෝජිතයකු බැගින් පත් කර යවන ලෙස අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්, ස්වාධීන කණ්ඩායම් නායකයින් හා අදාළ නිරීක්ෂණ ආයතන වෙත දැනුම් දී ඇත.

03. එබැවින් අනිවාර්යයෙන්ම 2011.03.08 වැනි දින මෙම කාර්යය ආරම්භ කළ යුතු බව සියලුම සහතික කිරීමේ නිලධාරීන් දැනුවත් කර ඇත. 2011.03.09 දිනයෙහි වුව ද ඡන්ද පත්‍රිකා සලකුණු කිරීම යොදා ගැනීමට අවකාශ ඇත්තේ එක් දිනයක ඡන්ද විමසීම් කටයුතු අවසන් කළ නොහැකි තරම් ඡන්ද හිමියන් සංඛ්‍යාවක් ඇත්නම් පමණි. එසේ තිබියදී ඇතැම් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල විශේෂ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා පැවැත්වීමට අදාළ නිලධාරීන් මෙම දින දෙකෙහි කොළඹට කැඳවා ඇති බව වාර්තා වී ඇත.

04. දීප ව්‍යාප්තව දින දෙකක් තුළ මෙම කාර්යය සිදු කරනු ලබන බැවින් හා සලකුණු කළ ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂණ පැකට්ටු දිවයිනේ සියලුම දිස්ත්‍රික්වල තේරීම්භාර නිලධාරීන් වෙත 2011.03.17 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි තැපැල් මගින් යැවිය යුතු බැවින් නියම කර ඇති දිනයන් කිසිසේත් වෙනස් කළ නොහැකි බවත් එබැවින් අදාළ සාකච්ඡා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වෙනත් දිනයක් නියම කර ගත යුතු බවත් විශේෂයෙන් දැනුම් දෙමි.

දයානන්ද දිසානායක
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.03.04

මාධ්‍ය නිවේදන - අංක 09

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (2 අදියර)

අපේක්ෂකයන් වෙනත් පක්ෂවලට එකතුවීම හා අපේක්ෂකත්වයෙන් ඉල්ලා අස්වීම පිළිබඳ පුවත්

2011 ජූලි 23 දින පවත්වනු ලබන ඉහත සඳහන් ඡන්ද විමසීමට තරග කරනු ලබන අපේක්ෂකයන් ස්වකීය පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් ඉවත් වී වෙනත් පක්ෂවලට හෝ කණ්ඩායම්වලට සහාය දක්වන බවට හෝ තරගයෙන් ඉවත් වූ බවට සකස් කළ ව්‍යාජ ප්‍රකාශ ද නැතහොත් බියගැන්වීමෙන් ලබා ගත් ප්‍රකාශ ප්‍රචාරය කිරීමේ උත්සාහයක් ඇති බවට පැමිණිලි ලැබී තිබේ.

එබැවින් කිසියම් අපේක්ෂකයකු පක්ෂයකින් හෝ කණ්ඩායමකින් ඉවත් වී වෙනත් පක්ෂයකට හෝ කණ්ඩායමකට සහාය දෙන බවට හෝ තරගයෙන් ඉවත් වූ බවට නිකුත් කෙරෙන ප්‍රකාශ 2011.07.22 හා 23 දිනයන් නිල මාධ්‍ය හරහා ප්‍රචාරය කිරීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.07.21

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 10

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (3 අදියර)
සියලුම ඡන්ද අපේක්ෂකයින් සහ සියලුම ඡන්ද දායකයින්ගේ දැනගැනීම සඳහා
කරනු ලබන විශේෂ දැනුම්දීමයි

2011.10.08 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී සමහර අපේක්ෂකයින්ගේ අංක යටතේ වෙනත් පුද්ගලයින් තරග කරන බව හඬවමින් ප්‍රචාරක කටයුතු කරන බවට පැමිණිලි මා වෙත ලැබී ඇත. තරග වැදී සිටින කිසියම් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයින් වෙනුවෙන් අදාළ ඡන්ද සලකුණ සහ අපේක්ෂක අංක යටතේ තරග කිරීමට වෙනත් කිසිඳු පුද්ගලයකුට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ ප්‍රතිපාදන සලසා නොමැති බවත් කිසියම් අපේක්ෂකයකුගේ නමක් වෙනුවට වෙනත් පුද්ගලයකුගේ නමක් ආදේශ කළ නොහැකි බවත් සියලුම අපේක්ෂකයින් සහ ඡන්ද හිමියන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී ඡන්ද විමසීම අවසන් වූ පසු තරග කරනු ලැබූ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව අනුව සමානුපාතිකව එකී පක්ෂය හෝ කණ්ඩායම විසින් හිමිකම් ලබා ඇති සභික සංඛ්‍යාව වැඩිම මනාප සංඛ්‍යාව ලබාගත් අපේක්ෂකයින් අතුරින් තෝරා පත් කර ගනු ලැබේ. යම් සභිකයකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ වෙනත් හේතුවක් නිසා පුරප්පාඩු සිදු වූ අවස්ථාවක එකී පුරප්පාඩුව සඳහා සුදුසු පුද්ගලයකු තෝරා ගනු ලබන්නේ එකී පක්ෂය හෝ කණ්ඩායම යටතේ තරග කර කිසියම් මනාප සංඛ්‍යාවක් ලබා ඇති අපේක්ෂකයන් අතුරින් අදාළ පක්ෂ ලේකම්වරයා හෝ කණ්ඩායම් නායක විසින් නිශ්චිතව නම් කරනු ලබන අපේක්ෂකයකුගෙන් පමණි. එබැවින් ඡන්ද විමසීමේ දී ජයග්‍රහණය කරනු ලැබූ අපේක්ෂකයකු වහාම ඉල්ලා අස්වීමෙන් අනතුරුව ඒ වෙනුවට වෙනත් බාහිර පුද්ගලයකු එසැහින් පත් කිරීමට අවකාශ නැති බව අවධාරණය කරනු ලැබේ.

03. ඉල්ලා අස්වීමෙන්/ මියයෑමෙන්/ තනතුරෙන් ඉවත් කිරීමෙන් ඇතිවන පුරප්පාඩු සඳහා නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් සියලුම අපේක්ෂකයින් පත් කරනු ලැබීමෙන් අනතුරුව එනම් අපේක්ෂක ලැයිස්තුව අවසන් වීමෙන් පසුව තවදුරටත් පුරප්පාඩු ඇතිවුවහොත් පමණක් තේරීම්භාර නිලධාරී විසින් 2007 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65(ආ) වගන්තිය අනුව සුදුසුකම් ලබන තැනැත්තකු සභිකයකු වශයෙන් නම් කරන ලෙස අදාළ නාමයෝජනා පත්‍රය භාර දී ඇති දේශපාලන පක්ෂ ලේකම් හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා වෙත දැනුම් දීමෙන් පසු ඔහු/ ඇය විසින් කරනු ලබන නම් කිරීම මත අදාළ පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

04. මෙම ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන කිසිඳු ස්වාධීන කණ්ඩායමක්, කිසියම් පිළිගත් දේශපාලන පක්ෂයක විකල්ප කණ්ඩායමක් ලෙස හෝ එම පක්ෂයේ සැබෑ කණ්ඩායම ලෙස හෝ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් පිළිගෙන නැති බවත්, කිසිම ස්වාධීන කණ්ඩායමක හෝ පිළිගත් දේශපාලන පක්ෂයක හෝ අපේක්ෂකයකුට වෙනත් ස්වාධීන කණ්ඩායමක හෝ පක්ෂයක අපේක්ෂකයකු වෙනුවෙන් ස්වකීය ප්‍රචාරක කාර්යාල ලබාදිය නොහැකි බව ද තවදුරටත් දන්වා සිටිනු ලැබේ.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.09.26

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011
ඡන්දය ප්‍රකාශ කිරීම සහ මනාප ලකුණු කිරීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක්

ඡන්ද පත්‍රිකා ආදර්ශ ආකෘතිය

"අ"පක්ෂය				ලකුණ	
"ආ" පක්ෂය				ලකුණ	
"ඇ" පක්ෂය				ලකුණ	
ස්වාධීන කණ්ඩායම 1				ලකුණ	
ස්වාධීන කණ්ඩායම 2				ලකුණ	
ස්වාධීන කණ්ඩායම 3				ලකුණ	
1			11		
2			12		
3			13		
4			14		
5			15		
6			16		
7			17		
8			18		
9			19		
10			20		

1. **ඉහත දැක්වෙනුයේ ඡන්ද පත්‍රිකාවක ආදර්ශයක් පමණි.**

2. **තරග කරන දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල නම්, ඒවායේ ලකුණු සමඟ ඉහළ කොටසේ දක්වා ඇත. එක් එක් ලාංඡනයක් ඉදිරිපස හිස් කොටුවක් තිබේ. මෙයින් ඕනෑම කොටුවක ඔබේ ඡන්දය ලකුණු කිරීමට හැකිය. ඡන්දයක් ලකුණු කිරීමේදී ඔබ කැමති ලාංඡනය ඉදිරිපස හිස් කොටුවේ කතිරයක් *(X)* සලකුණු කළ යුතුය.**

3. **ඡන්ද පත්‍රිකාවේ පහත ඇති කොටසෙහි එක් එක් අපේක්ෂකයාට වෙන් කරන ලද අංකය ඇතුළත් කොටුවක් හා ඊට දකුණු පසින් හිස් කොටු දෙකක් ඇත. අංකය ඇතුළත් කොටුවෙහි මෙන්ම දකුණු පස ඇති හිස් කොටුවල තුනකට වැඩි නොවන ගණනක් දක්වා, ඔබගේ මනාප සඳහා කතිර *(X)* ලකුණු කිරීමට හැකිය. මනාප තුනම එක් අපේක්ෂකයකුට හෝ මනාප දෙකක් එක් අපේක්ෂකයකුට හා එක් මනාපයක් තවත් අපේක්ෂකයකුට හෝ මනාප තුන අපේක්ෂකයන් තිදෙනෙකු අතරේ බෙදී යන පරිදි හෝ මනාප ලකුණු කළ හැකිය.**

4. **ඡන්දයක් සලකුණු කර නොමැති වීහෙත් මනාප පමණක් සලකුණු කර ඇති ඡන්ද පත්‍රිකාවක් වලංගු නොවේ. එහි කිසිදු වටිනාකමක් නොමැති අතර, එය ප්‍රතික්ෂේප කරනු ඇත. එබැවින්, ප්‍රථමයෙන් ඔබ කැමති පක්ෂයක හෝ කණ්ඩායමක ලකුණ ඉදිරියේ ඇති හිස් කොටුවෙහි කතිරයක් *(X)* සටහන් කර ඡන්දයක් ලකුණු කිරීමත්, ඉන්පසුව ඔබගේ කැමැත්ත පරිදි මනාප ලකුණු කිරීමත් සුදුසු බව සිත්හි තබා ගන්න.**

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.03.04

දයානන්ද දිශානායක
මැතිවරණ කොමසාරිස්

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (3 අදියර)
ඡන්දය ප්‍රකාශ කිරීම සහ මනාප ලකුණු කිරීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක්

ඡන්ද පත්‍රිකා ආදර්ශ ආකෘතිය

"අ"පක්ෂය				ලකුණ	
"ආ" පක්ෂය				ලකුණ	
"ඇ" පක්ෂය				ලකුණ	
ස්වාධීන කණ්ඩායම 1				ලකුණ	
ස්වාධීන කණ්ඩායම 2				ලකුණ	
1			6		
2			7		
3			8		
4			9		
5			10		

1. ඡන්ද පත්‍රිකාවක ආදර්ශයක් ඉහත දක්වා ඇත.

2. ඡන්ද පත්‍රිකාවෙහි ඉහළ කොටසේ තරග කරන දේශපාලන පක්ෂවල නම් හා ස්වාධීන කණ්ඩායම් හඳුනා ගැනීම සඳහා වෙන්කර දී ඇති අංක සහ එම පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සඳහා වෙන් කර දී ඇති ඡන්ද ලකුණු දක්වා ඇත.

3. ඡන්ද පත්‍රිකාවෙහි දැක්වෙන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් අතුරින් ඡන්දදායකයා කැමති පක්ෂයේ නම හෝ ස්වාධීන කණ්ඩායමේ අංකය සහ එම පක්ෂයට හෝ කණ්ඩායමට අයත් ඡන්ද ලකුණ ඉදිරියේ ඇති හිස් කොටුවෙහි කතිර *(X)* සටහනක් යෙදීමෙන් තමාගේ ඡන්දය සලකුණු කළ හැකිය.

4. ඡන්දය සලකුණු කර නොමැති ඡන්ද පත්‍රිකා සහ පක්ෂ හෝ කණ්ඩායම් එකකට වැඩි සංඛ්‍යාවකට ඡන්දය සලකුණු කළ ඡන්ද පත්‍රිකා ගණන් කරන අවස්ථාවේ දී ප්‍රතික්ෂේපිත ඡන්ද පත්‍රිකා වශයෙන් ඉවත් කරනු ලැබේ.

5. ඡන්ද පත්‍රිකාවෙහි පහත කොටසේ අදාළ පළාත් පාලන ආයතනය වෙනුවෙන් තරග කරන අපේක්ෂක සංඛ්‍යාවට සමාන වන සේ අපේක්ෂකයින් හැඳින්වීමේ අංක සටහන් කර ඇත. එම අංකවලින් ඔබ ඡන්දය සලකුණු කළ පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයින් හඳුන්වා දෙනු ලැබේ. අදාළ අපේක්ෂක නාමාවලිය නිල ඡන්ද දැන්වීම් පත සමඟ ඔබ වෙත එවනු ලබන අතර, ඡන්ද පොළෙහි ද එය ප්‍රදර්ශනය කරනු ලැබේ. එම අපේක්ෂකයින් අතුරින් තිදෙනෙකුට හෝ දෙදෙනෙකුට හෝ එක් අයකුට හෝ වන පරිදි උපරිම වශයෙන් මනාප තුනක් කතිර *(X)* සලකුණින් සලකුණු කළ හැකිය.

6. එක් අපේක්ෂකයකු වෙනුවෙන් මනාප තුනම සලකුණු කරන්නේ නම් එම අපේක්ෂකයාගේ හඳුනා ගැනීමේ අංකය සහිත කොටුව තුළ එක් කතිරයක් ද, ඒ ඉදිරියෙන් ඇති ඉතිරි හිස් කොටු දෙකෙහි අනෙක් කතිර දෙක ද, සලකුණු කළ යුතුය. ඒ ආකාරයෙන් එක් අපේක්ෂකයකුට මනාප දෙකක් සහ තවත් අපේක්ෂකයකුට මනාප එකක් ද වශයෙන් නැතහොත් මනාප තුන වෙන වෙනම අපේක්ෂකයින් තිදෙනකුට ද වශයෙන් ඔබගේ කැමැත්ත පරිදි මනාප තුන සලකුණු කළ හැකිය. මනාප තුන අපේක්ෂකයින් තිදෙනෙකු වෙනුවෙන් සලකුණු කරන්නේ නම් වඩාත් කැමති අපේක්ෂකයින් තිදෙනාගේ හඳුනාගැනීමේ අංක දැක්වෙන කොටු තුළ කතිර සලකුණු යෙදිය යුතුය.

7. කිසියම් ඡන්ද පත්‍රිකාවක මනාප තුනකට වැඩි සංඛ්‍යාවක් සලකුණු කර තිබුණහොත් මනාප ගණන් කරන අවස්ථාවේ දී එම ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.09.26

මහින්ද දේශපිය
මැතිවරණ කොමසාරිස්

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011
කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් විසින් විශේෂ ප්‍රවාහන පහසුකම් සඳහා ඉල්ලුම් කිරීම

2002 අංක 01 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරන ලද 82(ඇ) 4(ඈ) වැනි වගන්තිය අනුව, යම්කිසි කායික දුබලතාවයක් නිසා යම් තැනැත්තෙකුට පයින් හෝ ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය සේවය හෝ යම් මහජන ප්‍රවාහන සේවාවක් විසින් සපයනු ලබන ප්‍රවාහන සේවාවක් මගින් ඡන්ද පොළට යාම ඊම කළ නොහැකි නම් තමාට ඡන්ද පොළට යාම ඊම සඳහා ස්වකීය ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත තමා විසින් ම හෝ එසේ නොමැති නම් තමා වෙනුවෙන් අපේක්ෂකයකු නොවන වෙනත් අයකු විසින් හෝ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකිය.

02. මෙම පහසුකම් සඳහා වූ අයදුම් පත්‍ර, ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට දින හතකට පෙර එනම් 2011.07.15 වන දිනට පෙර අදාළ තේරීම්භාර නිලධාරී වෙත ලැබෙන ලෙස ඉදිරිපත් කිරීම නීතිමය අවශ්‍යතාවයක් වන අතර තේරීම්භාර නිලධාරී සෑහීමට පත්වන්නේ නම්, එම තැනැත්තා හට විශේෂ ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහා අවසර පත් නිකුත් කළ හැකිය.

03. අයදුම්පත්‍රය ඉදිරිපත් කරන තැනැත්තා, තමාට පොදු වාහනයකින් හෝ පයින් ඡන්ද පොළට යාම ඊම කිරීමට නොහැකි බව තහවුරු කරමින් ලියාපදිංචි වෛද්‍යවරයකුගෙන් (බටහිර හෝ දේශීය) ලබාගත් වෛද්‍ය සහතිකයක් මගින් සිය අයදුම්පත සනාථ කරන්නේ නම් තීරණයක් ගැනීමේ දී ඒ තේරීම්භාර නිලධාරීට මහත් සේ උපකාරී වනු ඇත. තමා පරීක්ෂා කර බලා සහතිකයක් නිකුත් කරන ලෙසට එබඳු තැනැත්තෙකු ආණ්ඩුවේ වෛද්‍යවරයකුගෙන්, ලියාපදිංචි හෝ සහකාර වෛද්‍ය වෘත්තිකයකුගෙන් හෝ ආයුර්වේද වෛද්‍යවරයකුගෙන් හෝ ඉල්ලා සිටියහොත්, ඔහුට මේ සඳහා වෛද්‍ය සහතිකයක් ගාස්තුවක් නොගෙවා ලබා ගත හැකිය. පෞද්ගලික වෛද්‍යවරුන්ගෙන් (බටහිර හෝ දේශීය) ලබාගන්නා සහතිකවල එම වෛද්‍යවරයාගේ නම සහ ලියාපදිංචි කළ අංකය සඳහන් කළ යුතුය.

04. 2 වන ඡේදයෙහි සඳහන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ මෙම කාර්යය සඳහා මේ සමග ඇති ආදර්ශ අයදුම්පත පරිදි පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍රය ඡන්ද විමසීම් ප්‍රදේශයේ (පළාත් පාලන ආයතනය) තේරීම්භාර නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.07.07

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 **ආදර්ශ අයදුම්පත**
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරය)

82(ඇ) 4 (ඈ) වැනි වගන්තිය යටතේ වාහනයක් පාවිච්චි කිරීම පිණිස ශාරීරික දුර්වලතාවයෙන් යුතු තැනැත්තෙකු විසින් ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍රය

.....සභාවේ තේරීම්භාර නිලධරයා වෙතය,
(පළාත් පාලන ආයතනයේ නම)

1. කායික දුබලතාවයෙන් යුත් අයගේ විස්තර
   අ.සම්පූර්ණ නම-.....
   ආ.තැපැල් ලිපිනය-.....
   ඇ.ඡන්දහිමි නාමලේඛනයේ දැක්වෙන පරිදි පළාත් පාලන ආයතනය, ඡන්ද කොට්ඨාසය සහ අනුක්‍රමික අංකය (දන්නේ නම්)-.....

2. කායික දුබලතාවය පිළිබඳ කෙටි විස්තරයක-.....

3. කායික දුබලතාවයෙන් පෙළෙන්නා වෙනුවෙන් වෙන යම් අයකු විසින් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන්නේ නම් ඔහුගේ නම සහ ලිපිනය

4. මෙම ඉල්ලුම් පත්‍රය සනාථ කිරීම සඳහා, ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකුගේ/ ලියාපදිංචි හෝ සහකාර වෛද්‍ය වෘත්තිකයකුගේ/ ආයුර්වේද වෛද්‍යවරයකුගේ, පෞද්ගලික වෛද්‍යවරයකුගේ වාර්තාවක් මේ සමඟ එවමි.
   වෛද්‍යවරයාගේ නම-.....
   ලියාපදිංචි කළ අංකය-.....

5. ඉහත කී 2 වන ඡේදයේ විස්තර කර ඇති කායික දුබලතාවය නිසා මට/ කායික දුබලතාවයෙන් යුත් ඉහත සඳහන් අයට පයින් හෝ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය මගින් හෝ ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව විසින් හෝ යම්කිසි පොදු ප්‍රවාහන සේවයක් මගින් සැපයෙන ප්‍රවාහන පහසුකම් මගින් ඡන්ද විමසීමට යා නොහැකි බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

6. ඉහත සඳහන් ඡන්ද විමසීමේදී ඡන්දය පාවිච්චි කිරීම සඳහා ඡන්ද පොළ වෙත යාමට සහ ඊමට, මට/ කායික දුබලතාවයෙන් යුතු ඉහත නම සඳහන් අයට යම්කිසි වාහනයක් පාවිච්චි කිරීමට ලිඛිත අවසරයක් දෙන මෙන් මෙයින් ඉල්ලා සිටිමි.

දිනය-.....

.....
කායික දුබලතාවයෙන් යුතු අයගේ/ ඔහු වෙනුවෙන් ඉල්ලුම් කෙරෙන වෙනත් අයකුගේ අත්සන හෝ මහපටැඟිලි සලකුණ

මාධ්‍ය නිවේදන - අංක 05

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (2 අදියර)
අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම

2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 54 (2) වගන්තිය අනුව ඉදිරි ඡන්ද විමසීම්වලදී පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයකට හෝ යම් ශාරීරික අශක්නුතාවයකට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාව සලකුණු කර ගැනීම සඳහා සහායක යකු කැටුව යා හැකි වන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ඇත.

02. එහෙත් එම කැටුව යන සහායකයා වයස 18 සම්පූර්ණ වූවකු විය යුතු අතර එම ඡන්ද විමසීම් සඳහා තරග කරනු ලබන අපේක්ෂකයකු නොවිය යුතුය. එමෙන්ම එම ඡන්ද විමසීමේදී බලය ලත් නියෝජිතයකු හෝ ඡන්ද පොළ නියෝජිතයකු වශයෙන් කටයුතු නොකරන්නකු විය යුතුය. ඊට අමතරව කිසියම් අශක්නුතාවයකට පත් නොවූ අයෙකු ද විය යුතුය.

03. ඉහත සඳහන් පරිදි සහායකයකු කැටුව යාම සඳහා අදාළ පනතේ දස වැනි උපලේඛනය මගින් හඳුන්වා දී ඇති යෝග්‍යතා සහතිකයක් අදාළ ඡන්ද පොළෙහි නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය.

04. මෙම යෝග්‍යතා සහතිකය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉල්ලුම් පත්‍ර ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ග්‍රාම නිලධාරීන් ගෙන් ලබාගත හැකිය. අදාළ යෝග්‍යතා සහතිකයේ ආකෘතියක් මැතිවරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය (www.slelections.gov.lk) වෙත පිවිසීමෙන් ද ලබා ගැනීමට පහසුකම් සළසා ඇත. දෘෂ්‍යාබාධිත හෝ වෙනත් යම් ශාරීරික අශක්නුතාවට පත් පුද්ගලයා ග්‍රාම නිලධාරීගෙන් ඉල්ලුම් පත්‍රයක් ලබාගෙන සම්පූර්ණ කර භාරදී ග්‍රාම නිලධාරීගේ සහතිකය ලබාගත යුතු අතර ඉන් අනතුරුව එම සහතිකය රජයේ වෛද්‍ය නිලධාරියකු වෙත ඉදිරිපත් කළ යුතුය. වෛද්‍ය නිලධාරි විසින් ඡන්ද හිමියා පරීක්ෂා කර එම ආකෘතියෙහි ඡන්දදායකයාගේ යෝග්‍යතාව සටහන් කර සහතික කරනු ලැබේ.

05. අශක්නුතාවට පත් ඡන්දදායකයා විසින් තමාගේ නිල ඡන්ද දැන්වීම්පත, ජාතික හැඳුනුම්පත හෝ ඡන්ද පොළේදී පිළිගනු ලබන යම් හැඳුනුම්පතක් සහ මෙම යෝග්‍යතා සහතිකය රැගෙන සහායකයා ද කැටුව ඡන්ද පොළ වෙත යා යුතුය. ඡන්ද පොළ කාර්ය මණ්ඩලය විසින් ඡන්දදායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඡන්ද පොළේ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය අනුගමනය කර ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලබන අතර, එම ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයා සමග ඡන්දදායකයා ජ්‍යෙෂ්ඨ ඡන්දස්ථානාධිපති වෙත යොමු කරනු ලැබේ. සහායකයා ද තමාගේ ජාතික හැඳුනුම්පත හෝ ඡන්ද පොළේදී පිළිගනු ලබන යම් හැඳුනුම්පතක් රැගෙන යාම අත්‍යවශ්‍යය.

06. ඡන්ද පොළේදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් ඡන්ද දායකයාගේ යෝග්‍යතා සහතිකය ලබා ගනු ලබන අතර, කැටුව ආ පුද්ගලයාගෙන් අදාළ ප්‍රකාශය සටහන් කරවා ගනු ලැබේ. අනතුරුව ඡන්ද පොළ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ද සමග ඡන්ද හිමියා සහ සහායකයා ඡන්ද කුටිය වෙත කැඳවා ගෙන ගොස් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා කාර්ය මණ්ඩල සාමාජිකයා ඉදිරියේ ඡන්ද පත්‍රිකාව සලකුණු කරවා ඡන්ද පෙට්ටියට බහා ලීමට සලස්වනු ලැබේ.

07. ඉහත සඳහන් යෝග්‍යතා සහතිකයක් නොමැතිව ඡන්ද පොළ වෙත සහයකයකු කැටුව යා නොහැක. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව අදාළ යෝග්‍යතා සහතිකය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත රඳවා ගනු ලැබේ.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.07.09

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන - අංක 08

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (3 අදියර)
අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම

2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 54 (2) වගන්තිය අනුව ඉදිරි ඡන්ද විමසීම්වලදී පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයකට හෝ යම් ශාරීරික අශක්නුතාවයකට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාව සලකුණු කර ගැනීම සඳහා සහාය යකු කැටුව යා හැකි වන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ඇත.

02. එහෙත් එම කැටුව යන සහායකයා වයස අවුරුදු 18 සම්පූර්ණ වූවකු විය යුතු අතර එම ඡන්ද විමසීම් සඳහා තරග කරනු ලබන අපේක්ෂකයකු නොවිය යුතුය. එමෙන්ම එම ඡන්ද විමසීමේදී බලය ලත් නියෝජිතයකු හෝ ඡන්ද පොළ නියෝජිතයකු වශයෙන් කටයුතු නොකරන්නකු විය යුතුය. ඊට අමතරව කිසියම් අශක්නුතාවයකට පත් නොවූ අයෙකු ද විය යුතුය.

03. ඉහත සඳහන් පරිදි සහායකයකු කැටුව යාම සඳහා අදාළ පනතේ දස වැනි උපලේඛනය මගින් හඳුන්වා දී ඇති යෝග්‍යතා සහතිකයක් අදාළ ඡන්ද පොළෙහි නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය.

04. මෙම යෝග්‍යතා සහතිකය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉල්ලුම් පත්‍ර ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ග්‍රාම නිලධාරීන් ගෙන් ලබාගත හැකිය. අදාළ යෝග්‍යතා සහතිකයේ ආකෘතියක් මැතිවරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය (www.slelections.gov.lk) වෙත පිවිසීමෙන් ද ලබා ගැනීමට පහසුකම් සළසා ඇත. දෘෂ්‍යාබාධිත හෝ වෙනත් යම් ශාරීරික අශක්නුතාවට පත් පුද්ගලයා ග්‍රාම නිලධාරීගෙන් ඉල්ලුම් පත්‍රයක් ලබාගෙන සම්පූර්ණ කර භාරදී ග්‍රාම නිලධාරීගේ සහතිකය ලබාගත යුතු අතර ඉන් අනතුරුව එම සහතිකය රජයේ වෛද්‍ය නිලධාරියකු වෙත ඉදිරිපත් කළ යුතුය. වෛද්‍ය නිලධාරි විසින් ඡන්ද හිමියා පරීක්ෂා කර එම ආකෘතියෙහි ඡන්දදායකයාගේ යෝග්‍යතාව සටහන් කර සහතික කරනු ලැබේ.

05. අශක්නුතාවට පත් ඡන්දදායකයා විසින් තමාගේ නිල ඡන්ද දැන්වීම්පත, ජාතික හැඳුනුම්පත හෝ ඡන්ද පොළේදී පිළිගනු ලබන යම් හැඳුනුම්පතක් සහ මෙම යෝග්‍යතා සහතිකය රැගෙන සහායකයා ද කැටුව ඡන්ද පොළ වෙත යා යුතුය. ඡන්ද පොළ කාර්ය මණ්ඩලය විසින් ඡන්දදායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඡන්ද පොළේ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය අනුගමනය කර ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලබන අතර, එම ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයා සමග ඡන්දදායකයා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත යොමු කරනු ලැබේ. සහායකයා ද තමාගේ ජාතික හැඳුනුම්පත හෝ ඡන්ද පොළේදී පිළිගනු ලබන යම් හැඳුනුම්පතක් රැගෙන යාම අත්‍යවශ්‍යය.

06. ඡන්ද පොළේදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් ඡන්ද දායකයාගේ යෝග්‍යතා සහතිකය ලබා ගනු ලබන අතර, කැටුව ආ පුද්ගලයාගෙන් අදාළ ප්‍රකාශය සටහන් කරවා ගනු ලැබේ. අනතුරුව ඡන්ද පොළ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ද සමග ඡන්ද හිමියා සහ සහායකයා ඡන්ද කුටිය වෙත කැඳවා ගෙන ගොස් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා කාර්ය මණ්ඩල සාමාජිකයා ඉදිරියේ ඡන්ද පත්‍රිකාව සලකුණු කරවා ඡන්ද පෙට්ටියට බහා ලීමට සලස්වනු ලැබේ.

07. ඉහත සඳහන් යෝග්‍යතා සහතිකයක් නොමැතිව ඡන්ද පොළ වෙත සහයකයකු කැටුව යා නොහැක. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව අදාළ යෝග්‍යතා සහතිකය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත රැඳවා ගනු ලැබේ.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2011.09.21

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (2 අදියර)
සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු දීම

සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකි වනු පිණිස නිවාඩු දීම සම්බන්ධයෙන් අදාළ වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 84 අ වන වගන්තියේ විධිවිධාන සේවා යෝජකයන්ගේ හා සේවා නියුක්තිකයන්ගේ දැන ගැනීම පිණිස මෙහි පහත දක්වනු ලැබේ.

"84 අ(1) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හිමිකම් ඇති අන් කිසි තැනැත්තකුගේ සේවායෝජකයකු වූ යම් තැනැත්තකු විසින්, ඒ අන් තැනැත්තා ඡන්දය දීම පිණිස ලියවිල්ලකින් ඉල්ලීමක් කළ විට, ඒ ඡන්ද විමසීමේදී ඒ අන් තැනැත්තාට ඡන්දය දීම පිණිස සේවායෝජකයා විසින් ප්‍රමාණවත් යයි සලකුණු ලබන (පැය දෙකකට නො අඩු කාලයක) අඛණ්ඩ කාල සීමාවක් සඳහා ඒ අන් තැනැත්තාට පඩි රහිත නොවන නිවාඩු දිය යුතුය.

(2)(1) වන උපවගන්තියෙහි විධිවිධාන කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී රුපියල් පන්සියයක් නො ඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නො ඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය."

10. ඡන්ද පොළේ කාර්ය මණ්ඩලයට පැවරී ඇති රාජකාරි කටයුතු අධීක්ෂණය කිරීමට හා ඡන්ද දායකයන්ගේ පැමිණීම හා පිටවීමට මනා ලෙස පාලනය කිරීම සඳහා වරින් වර තම අසුනින් නැගිට ඡන්ද පොළේ ඔබ මොබ ගමන් කර ක්‍රියාකාරී ලෙස ඡන්ද පොළේ කටයුතු කළ යුතුය. කාර්යාලයක ලිපිකරුවකු මේසයක සිට නිසොල්මනේ සිය ලිපිකරු කාර්යයන් ඉටු කිරීම කරන ආකාරයට ඡන්ද පොළ පාලනය කළ නොහැකි බව සිහි තබා ගත යුතුය. ඡන්ද පොළේ සිදුවන සියලු කටයුතු කෙරෙහි විමසිලිමත් විය යුතු බව මින් අදහස් කෙරේ.

11. ඡන්ද පොළට ඡන්ද විමසීම් කාලය තුළ ඇතුළු විය හැකි පුද්ගලයන් කවුරුන් ද යන්න හා ඔවුන්ගේ වගකීම් මොනවාදැයි ඡන්ද විමසීම් නීතියේ හා මැතිවරණ කොමසාරිස්වරයා හා තේරීම්භාර නිලධාරී විසින් නිකුත් කර ඇති උපදෙස්වල

සඳහන් වේ. ඊට අමතරව බලයක් නොමැතිව ජන්ද පොළට ඇතුළු වන කිසිවකුට වී සඳහා ඉඩ නොදිය යුතුය. එබඳු අනවසර පුද්ගලයින් ඉවත් කිරීමට ආරක්ෂක අංශයේ ද සහාය ලබා ගෙන නොබියව ඔවුන් ජන්ද පොළින් බැහැර කළ යුතුය.

12. 2011 අංක 28 දරන විශේෂ විධිවිධාන පනතින් සලසා ඇති ප්‍රතිපාදන අනුව පූර්ණ දෘෂ්‍යාබාධිත හෝ ජන්ද පත්‍රිකාවක් සලකුණු කළ නොහැකි අන්දමේ කිසියම් ආබාධිත තත්ත්වයක ජන්ද හිමියකුට මෙවර සහායකයකු ද කැටුව ජන්ද පොළට පැමිණිය හැකිය. වී සඳහා ග්‍රාම නිලධාරීගේ නිර්දේශය සහිතව රජයේ වෛද්‍ය නිලධාරියෙකුගේ අනුමැතිය සහිත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. එබඳු පුද්ගලයන් සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරයා ලේඛනගත කර ගත යුතු අතර ජන්ද දායකයා සහ සහායකයා කැටුව ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපති සහ තවත් එක් නිලධාරියෙකු ජන්ද කුටිය වෙත යා යුතුය. සහායකයකු කැටුව නොයන ආබාධිතයෙකුට මෙම ජන්ද විමසීමේ දී පමණක් මීට පෙර මෙන් ජ්‍යෙෂ්ඨ ජන්ද ස්ථානාධිපතිවරුන්ට ජන්ද පොළ නිලධාරියකු සමඟ ජන්ද පත්‍රිකාව සලකුණු කර දිය හැකිය.

13. ජන්ද පොළට පැමිණෙන ජන්ද දායකයා, මැතිවරණ කොමසාරිස්වරයා විසින් නම් කර ඇති හැඳුනුම්පත් අතුරින් එකක් හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් විසින් අනු අත්සන් කරන ලද තාවකාලික හැඳුනුම්පතක් හෝ අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු අතර එමඟින් අනන්‍යතාව තහවුරු කරනු ලබන ජන්ද දායකයනට පමණක් ජන්ද දීමට අවස්ථාව සැලසිය යුතුය. එම අවශ්‍යතාව සපුරනු නොලබන කිසිවකුට ජන්දය පාවිච්චි කිරීමට බලයක් නැත. වලංගු අනන්‍යතා ලියවිල්ලක් නොමැති ජන්දදායකයකු වෙත ජන්ද පොළ නියෝජිතයන් විසින් එම ජන්ද දායකයා නිවැරදි යයි කරනු ලබන ප්‍රකාශ මත ජන්ද පත්‍රිකාවක් නිකුත් නොකළ යුතුය.

14. අනන්‍යතාව සනාථ කිරීම සඳහා නැවත වලංගු කරන ලද පැරණි තාවකාලික හැඳුනුම්පත් රැගෙන එන්නන් පිළිබඳව විශේෂයෙන් පරීක්ෂාකාරී විය යුතුය. එම හැඳුනුපත් රැගෙන ව්‍යාජ පුද්ගලයින් පැමිණීමට ඉඩ ඇත.

15. ජන්දදායකයා වලංගු හැඳුනුම්පතක් ඉදිරිපත් කළ පසු ජන්ද පොළ නිලධාරියා ජන්ද හිමියාගේ වම් අතේ සුලඟිල්ල පරීක්ෂා කළ යුතු අතර, ජන්ද හිමියාගේ සම්පූර්ණ නම විමසිය යුතුය. හැඳුනුම්පතෙහි සඳහන් නම සහ ජායාරූපය අනුව අදාළ පුද්ගලයාගේ අනන්‍යතාව තහවුරු කර ගත යුතුය. අනතුරුව නිල ජන්ද දැන්වීම් පතෙහි සඳහන් නම හා හැඳුනුම්පතෙහි නම සැසඳෙන බවත් අදාළ ජන්ද හිමියා මෙම ජන්ද පොළේ දී මීට පෙර ජන්දය ප්‍රකාශ කර නොමැති බවත් තහවුරු කර ගත යුතුය. මේ පිළිබඳව ජන්ද පොළ නිලධාරීන් දැනුවත් කළ යුතු අතර වී අනුව කටයුතු කරනු ලබන බව සහතික කර ගැනීම සඳහා වරින්වර ජන්ද පොළ නිලධාරීන්ගේ කටයුතු අධීක්ෂණය කළ යුතුය.

16. සාමාන්‍යයෙන් ද්විත්ව ජන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලබන්නේ කිසියම් ජන්දදායකයකු ජන්දය ප්‍රකාශ කිරීමට පැමිණෙන විට ජන්ද පොළෙහි ඇති ජන්ද හිමි නාමලේඛනයේ එම ජන්ද හිමියාගේ නම ඉදිරියේ ජන්දය ප්‍රකාශ කර ඇති බවට සටහන්ව පවත්නා අවස්ථාවක දී ය. ඊට අමතරව කිසියම් ජන්දදායකයකු ජන්දය ප්‍රකාශ කිරීමට පැමිණෙන විට එම ජන්දදායකයාගේ නම ඉදිරියේ රතු පැහැති කතිරයක් සහිතව "තැපැල් ජන්ද හිමියා ජන්ද පොළේ දී ජන්ද පත්‍රිකාවක් නිකුත් නොකළ යුතුය" යන වගන්තිය සඳහන්ව ඇති අවස්ථාවක දී එම ජන්ද හිමියා ජන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටියහොත් ජන්ද හිමියාගේ අනන්‍යතාව සනාථ වේ නම් හා තැපැල් ජන්ද ලේඛනයේ නම සඳහන්ව ඇත්නම් එම ජන්දදායකයා වෙත ද්විත්ව ජන්ද පත්‍රිකාවක් නිකුත් කළ හැකිය. මෙබඳු අවස්ථාවක දී ද්විත්ව ජන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට අවකාශ ඇති බවට අධිකරණය නියෝග කර ඇත.

17. ජන්දහිමි නාමලේඛනයෙහි කිසියම් ජන්දදායකයකුගේ නම ඉදිරියේ A අක්ෂරය යොදා තිබිය දී එම ජන්දදායකයා හෝ ජන්ද දායිකාව ජන්ද පොළට පැමිණිය හොත් විදේශ ගතවූවකු නැවත මෙරටට පැමිණ ඇති බව තහවුරු වේ. එබඳු අවස්ථාවක දී හැඳුනුම්පත අනුව ජන්ද හිමියාගේ අනන්‍යතාව තහවුරු වේ නම් ජන්ද පොළෙන් ජන්ද පත්‍රිකාවක් නිකුත් කිරීම සඳහා අංක 1 ලිපිකරු වෙත යොමු කළ යුතුය. ගමන් බලපත්‍රය ජන්දදායකා විසින් ඉදිරිපත් කළ හොත් මිස ඉල්ලා සිටීම සුදුසු නැත. නාමලේඛනයෙහි අදාළ නම ඉදිරියේ D අක්ෂරය සටහන්ව ඇත්නම් ජන්ද පොළ නියෝජිතයින්ගෙන් විරෝධතාවක් නොමැති නම් හා හැඳුනුම්පත අනුව අනන්‍යතාව සනාථ වේ නම් අංක 1 ලිපිකරු වෙත යොමු කළ යුතුය. අවශ්‍යයයි හැඟේ නම් අදාළ ප්‍රකාශ පත්‍රයක් අත්සන් කරවා ගත යුතුය.

18. සාමාන්‍ය ජන්ද පත්‍රිකාවක් නිකුත් කරන සෑම අවස්ථාවකදීම, එහි උප පත්‍රිකාවේ මතු පිට ජන්ද දායකයාගේ පිළිවෙල අංකය යොදන බවටත් ජන්ද පත්‍රිකාව උප පත්‍රිකාවෙන් වෙන් කිරීමේ පසු උපදෙස් දී ඇති ආකාරයට එහි පසුපිට නිල මුද්‍රාව තබා නිකුත් කරන බවටත් නිසැක විය යුතුය. විශේෂයෙන් ජන්ද පෝලිමේ කටයුතු කරන කාර්ය මණ්ඩලයේ

රාජකාරී වරින්වර මාරු කරනු ලැබීමට නියමිත බැවින් නිලධාරීන්ට මෙම ක්‍රියාවලිය අමතක වන අවස්ථා තිබිය හැකිය. එබැවින් මෙම කටයුත්ත නිවැරදිව ඉටු වන්නේ දැයි නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතුය.

19. ද්විත්ව ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ වගකීම මෙන්ම ඒවායේ භාරකාරීත්වය පැවරෙන්නේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත පමණි. එබැවින් ඡන්ද පොළේ කටයුතු ආරම්භ වූ අවස්ථාවේ සිට අවසාන කිරීම දක්වා ද්විත්ව ඡන්ද පත්‍රිකා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා භාරයේ තිබිය යුතුය. ද්විත්ව ඡන්ද පත්‍රිකා කිසිඳු අවස්ථාවක ඡන්ද පොළ නිලධාරීන් වෙත නිකුත් නොකළ යුතු අතර ඡන්ද හිමියන් වෙත නිකුත් කිරීමේ දී ද අනුගමනය කළ යුතු විශේෂ කාර්ය පටිපාටිය තරයේ පිළිපැදිය යුතුය.

20. ඡන්ද පොළ නියෝජිතයකුට ඡන්ද දායකයකු සම්බන්ධව විරෝධතාවක් පළ කිරීමට ඇත්නම් අංක 1 ලිපිකරු විසින් ඡන්ද දායකයාගේ නම ශබ්ද නගා කියවූ වහාම විරෝධතාව පළ කළ යුතු බවත් ඡන්ද දායකයාගේ වම් අතෙහි සුලඟිල්ලේ නොමැකෙන තීන්තෙන් (උචිත සළකුණෙන්) සළකුණු කිරීමට පෙර විරෝධතාවය දැක්විය යුතු බවත්, ඡන්ද විමසීම ඇරඹීමට පෙර ඡන්ද පොළ නියෝජිතයන්ට දන්වා සිටීම ඉතා වැදගත්ය.

21. විරෝධතාවක් ඉදිරිපත් වූ ඡන්ද දායකයකු වෙනුවෙන් ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර ඡන්ද විමසීම් නීතිය යටතේ ලබා ගත යුතු ප්‍රකාශ මොනවාදැයි යන්න තීරණය කළ යුත්තේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පමණකි. එහෙත් නියෝජිතයකු විසින් යම් ඡන්දදායකයකුගෙන් එබඳු ප්‍රකාශයක් ලබා ගත යුතු බවට දක්වන සෑම අවස්ථාවකදීම අදාළ ප්‍රකාශය ලබා ගැනීමට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා නීතියෙන් බැඳී සිටී.

22. ඡන්ද පොළේ පවත්වාගෙන යනු ලැබීමට, තේරීම්භාර නිලධාරී විසින් නියම කොට ඇති පෝලිම් සංඛ්‍යාව, ඡන්ද විමසීම ආරම්භක අවස්ථාවේ සිට ඡන්ද විමසීම අවසන් කරන අවස්ථාව දක්වාම නොවෙනස්ව පවත්වා ගත යුතුය. එම පෝලිම් සංඛ්‍යාව කිසිඳු හේතුවක් නිසා වෙනස් නොකළ යුතුය.

23. ඡන්ද පොළේ එක් එක් පෝලිමක් වෙනුවෙන් ඡන්ද විමසීම ආරම්භ කරන අවස්ථාවේ භාවිතා කරනු ලැබූ නාම ලේඛන පිටපත නොවෙනස්ව එම පෝලිම වෙනුවෙන් පමණක් ම ඡන්ද විමසීම් අවසානය දක්වාම භාවිතා කළ යුතුය. ඡන්ද දායකයන්ට හෝ ඡන්ද දායිකාවන්ට වෙන් වූ පෝලිමක නාම ලේඛන පිටපතක සලකුණු වන්නේ එම පෝලිමට අදාළ පිරිමි ඡන්ද දායකයින් හෝ ගැහැණු ඡන්ද දායිකාවන්ගේ නම් පමණි.

24. කාන්තාවන් සඳහා වෙනම ඡන්ද පොළක් ද පිරිමින් සඳහා වෙනම ඡන්ද පොළක් ද පවත්වන අවස්ථාවක කාන්තාවන් සඳහා හෝ පිරිමින් සඳහා හෝ පෝලිම් දෙකේ ඡන්ද පොළවල් දෙකක් ඇත්නම් එම පෝලිම් දෙක ඡන්ද පොළට නියමිත ඡන්ද සංඛ්‍යාවෙන් අඩක් එක් ඡන්ද පෝලිමකට අයත් වන පරිදි අනු අංක 1 - 1000, 1001 - 2100 වශයෙන් වෙන් කර ගත හැකිය.

25. ඡන්ද පොළකට අවි ආයුධ රැගෙන ඇතුළු විය හැක්කේ, ඡන්ද විමසීම් දින ඡන්ද පොළවල ආරක්ෂාව සඳහා කටයුතු කරන ආරක්ෂක අංශවල නිලධාරීන්ට පමණකි. වෙනත් කිසිවෙකු එසේ නීති කඩ කරමින් ඡන්ද පොළට ඇතුළු වන්නේ නම්, එය ආරක්ෂක අංශයේ සහාය ද ඇතිව වැළැක්විය යුතුය.

26. ඡන්ද විමසීම පෙ.ව. 7.00 ට ආරම්භ කිරීමටත් ප.ව. 4.00 දක්වා එය නොනවත්වා පවත්වා අවසන් කිරීමටත් නියමිතය. පෙ.ව. 7.00 ට පෝලිමේ පළමු ඡන්දදායකයාගේ අනන්‍යතාවය පරීක්ෂා කරමින් කටයුතු ඇරඹිය යුතුය. අනන්‍යතා ලියවිලි පරීක්ෂාව සඳහා විශේෂ නිලධරයකු යෙදවිය යුතුය. ප.ව. 4.00 දක්වා පමණක් ඡන්ද පත්‍රිකා නිකුත් කළ යුතු අතර ඡන්ද පත්‍රිකා අතැතිව සිටින ඡන්දදායකයන් සියලු දෙනාට ඡන්දය දීමට අවස්ථාව සලසා දිය යුතුය.
27. ඡන්ද විමසීමක් නියමිත වේලාවට ඇරඹීමට හෝ එම කටයුතු අවසන් කිරීමට නියමිත වේලාව දක්වා බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට නොහැකි වන ආකාරයෙන් බාධාවක් ඇති වුණි නම්, එබඳු අවස්ථා පිළිබඳව, සවිස්තර වාර්තා කාර්ය පටිපාටි සංග්‍රහයේ ඇතුළත් කළ යුතුය. ඡන්ද විමසීම් කටයුතු කිසිඳු බාධාවකින් තොරව නියමිත වේලාවට අරඹා එම කටයුතු අවසන් කිරීමට නියමිත වේලාව දක්වා පවත්වාගෙන ගිය ද එම තත්ත්වය වුවද කාර්ය පරිපාටි සංග්‍රහයේ නියමිත කොටස මගින් වාර්තා කර එම වාර්තාව "Z" (ඉසෙඩ් අක්ෂරය) දරන කවරයට බහාලිය යුතුය.

28. ඡන්ද පත්‍රිකා ගිණුම ඉතාමත් නිවැරදිව සැකසීමට පියවර ගත යුතුය. එසේ නොවුවහොත් ඡන්ද ගණන් කිරීමේ අවස්ථාවේ දී බරපතල ගැටළු ඇති විය හැක. ඡන්ද පත්‍රිකා ගිණුමේ පිටපතක් ඡන්ද පොළ නියෝජිතයින් වෙත ද නිකුත් කළ යුතුය. මෙය කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකුට පැවරිය හැකිය. එම ඡන්ද පත්‍රිකා ගිණුමෙහි පිටපත භාර

දිය යුත්තේ පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් ඒ සඳහා කිසියම් නියෝජිතයෙකුට බලය පවරා ඇත්නම් එම බලය පවරා ඇති ඡන්ද පොළ නියෝජිතයන්ට පමණි. බලය පැවරූ නියෝජිතයකු නොමැති නම් නියෝජිතයින් දෙදෙනාගෙන් එක් අයකු වෙත එම පිටපත භාර දිය යුතුය.

29. රාජකාරියේ නියුතු ඕනෑම අවස්ථාවක දී අනපේක්ෂිත ගැටළුවක් ඇති වී නම්, එය දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයා හෝ කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරී වෙත යොමු කොට අවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය. එබඳු අවස්ථා ජර්නලයේ සඳහන් කළ යුතුය.

30. ඡන්ද විමසීම අවසන් වීමෙන් පසු ඡන්ද පෙට්ටියේ කට වසා ස්ටිකර් මගින් පෙට්ටිය මුද්‍රා තැබිය යුතුය. ඡන්ද පොළ නියෝජිතයින්ට ද ඡන්ද පෙට්ටියේ කිසියම් ස්ටිකරයක් ඇලවීමට ඉඩදිය යුතුය. එම ස්ටිකරය පක්ෂවල නම් සලකුණු ආදියෙන් තොර විය යුතුය. අලවන ස්ටිකරයේ ආදර්ශයක් ලබාගත යුතු අතර එම ආදර්ශයන් ද ඡන්ද පෙට්ටිය සමඟ ගණන් කිරීමේ මධ්‍යස්ථානය වෙත භාර දිය යුතුය.

31. ඡන්ද පෙට්ටිය රැගෙන ඒමේදී ආරක්ෂක පියවරක් වශයෙන් සපයා ඇති පොලිතින් බෑගයෙහි බහා සපයා ඇති ආරක්ෂක අගුල යෙදිය යුතුය. ඒ පිළිබඳව වෙනම උපදෙස් පත්‍රිකාවක් යා කර ඇත. ඡන්ද ස්ථානාධිපති ඡන්ද පෙට්ටිය රැගෙන යන වාහනයේ පිටුපසින් එක් ඡන්ද පොළ නියෝජිතයකුට ද ගමන් කිරීමට අවකාශ සලසා ඇති බැවින් ඒ සඳහා බලය පවරා ඇති නියෝජිතට හෝ බලය පැවරීමක් කර නොමැති නම් එක් නියෝජිතයකුට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් අවසර පත්‍රයක් නිකුත් කළ යුතුය. අවශ්‍ය අවසර පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ඔබ වෙත සපයනු ලැබේ.

32. ඡන්ද පොළෙහි බඩු භාරදීම සඳහා නිවේදන පත්‍රය දෙපිටපතකින් යුතුව සම්පූර්ණ කළ යුතු අතර, තේරීම්භාර නිලධාරී විසින් දී ඇති උපදෙස් පරිදි බඩු බාහිරාදිය භාර දිය යුතුය. බඩු බාහිරාදිය භාර දිය යුත්තේ ඡන්ද විමසීම් දිනට පෙර දින බඩු බාහිරාදි භාර ගනු ලැබූ ස්ථානයේ භාර ගැනීම් නිලධාරීන් වෙත බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

මැතිවරණ මහ ලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

ඉතා වැදගත් - පසුගිය වර මෙන්ම මෙවරද ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා භාවිතා කළ යුත්තේ ප්‍රධාන කාර්යාලයෙන් සපයා ඇති දුඹුරු පැහැයෙන් ලියවෙන බෝලතුඩු සහිත පෑන පමණි. වරින්වර ඡන්ද කුටිය පරීක්ෂා කර ඉහත සඳහන් බෝලතුඩු පෑන ඡන්ද කුටිය තුළ ඇති බවට තහවුරු කර ගත යුතුය. පසුගියවර ඇතැම් ඡන්ද පොළවල මෙය ක්‍රියාත්මක නොවූ බවට පැමිණිලි ලැබී ඇත.

මැතිවරණ නිරීක්ෂණ ආයතන කාර්ය මණ්ඩල සහ නිරීක්ෂකයින් වෙත නිකුත් කෙරෙන ආචාර ධර්ම පද්ධතිය

1. මැතිවරණ නිරීක්ෂණ ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ජංගම නිරීක්ෂකයින් සහ ඡන්ද පොළ නිරීක්ෂකයින් වශයෙන් තෝරා ගනු ලබන පුද්ගලයින් පසුගිය වසර 7 ඇතුළත ක්‍රියාකාරී දේශපාලනයේ නිරත නොවූ ඡන්ද විමසීම්වලදී අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වී නැති ඡන්ද හිමියන් වශයෙන් සුදුසුකම් ලබා ඇති මධ්‍යස්ථ පුද්ගලයින් වීම. සියලුම නිලධාරීන් සහ නිරීක්ෂකයින් දිවුරුම් ප්‍රකාශයක්/ ප්‍රතිඥාවක් මගින් ඒ බව තහවුරු කළ යුතු අතර අවශ්‍ය අවස්ථාවක පරීක්ෂා කිරීමට හැකි වන පරිදි එම දිවුරුම් ප්‍රකාශ/ ප්‍රතිඥා නිරීක්ෂණ ආයතන භාරයේ සුරක්ෂිතව තැබිය යුතුය. (ආදර්ශ දිවුරුමෙහි/ ප්‍රතිඥාවෙහි පිටපතක් අමුණා ඇත)

2. මැතිවරණ නිරීක්ෂණ ආයතනයක කිසියම් නිලධාරියකු හෝ කිසියම් නිරීක්ෂකයකු දේශපාලන සම්බන්ධතා මත රජයෙන් හෝ වෙනත් සංවිධානයක් මගින් ලබා දුන් කිසියම් තනතුරක් දරන්නකු හෝ පසු ගිය වර්ෂ 7 ක් ඇතුළත එවැනි තනතුරු දැරූවකු නොවීම.

3. නිරීක්ෂණ ආයතන විසින් දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් සතු ගොඩනැගිලි, වාහන, දුරකථන ආදී පහසුකම් කිසිවක් තම නිරීක්ෂණ ආයතනයේ කටයුතු සඳහා යොදා නොගැනීම.

4. මැතිවරණ නිරීක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හෝ නිලධාරී මණ්ඩලයේ සාමාජිකයන් හෝ නිරීක්ෂකයන් කිසිඳු දේශපාලන පක්ෂයක හෝ දේශපාලන කණ්ඩායමක අරමුණු ඔස්සේ කටයුතු නොකිරීම.

5. මැතිවරණ නිරීක්ෂණ ආයතන මගින් ඡන්ද විමසීමට අදාළව මාධ්‍ය නිවේදන හා වාර්තා නිකුත් කිරීමේ දී කිසියම් පක්ෂයක් හෝ කණ්ඩායමක් නැතහොත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන හෝ අගතියට පත්වන අන්දමේ ප්‍රකාශ නිකුත් නොකිරීම. මධ්‍යස්ථව කටයුතු කිරීම.

6. මැතිවරණ නිරීක්ෂණ ආයතන විසින් මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්යයන් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා දැනුවත් කිරීමෙන් තොරව මාධ්‍ය නිවේදන හා මාධ්‍ය ප්‍රකාශ නිකුත් නොකිරීම.

7. නිරීක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය, නිලධාරීන් සහ සියලුම නිරීක්ෂකයින් නිරීක්ෂණ කාර්යයේලා ඉටු කරනු ලබන සියලු කටයුතුවලදී දැඩි අපක්ෂපාතිත්වයෙන් යුතුව කටයුතු කිරීම අවශ්‍ය වේ. හැසිරීමෙන් මෙන්ම කතා බහෙන් ද ඒ අපක්ෂපාතිත්වය ප්‍රදර්ශනය විය යුතු අතර, අපක්ෂපාතීව කටයුතු කරන බව ඒත්තු යා යුතුය.

8. කිසියම් නිරීක්ෂකයකු පක්ෂග්‍රාහිව කටයුතු කරන බවට යම් පැමිණිල්ලක් ලැබුණහොත් වහාම ඔහු හෝ ඇය එම නිරීක්ෂණ කාර්යයෙන් ඉවත් කර කඩිනමින් අදාළ පැමිණිල්ල විභාග කිරීම අවශ්‍ය වේ.

9. ඡන්ද පොළ නිරීක්ෂණයෙහි යෙදෙන නිරීක්ෂකයා ඡන්ද පොළ කාර්ය මණ්ඩලය, ඡන්ද පොළ නියෝජිතයින් හා ඡන්ද හිමියන් සමඟ අනවශ්‍ය කතා බහට නොයා යුතුය. ඡන්ද විමසීමේ සියලු කටයුතු පිළිබඳ රහස්‍යතාව ආරක්ෂා කිරීමත්, ඡන්ද පොළේ දී ඒ පිළිබඳ ප්‍රකාශ පත්‍රයක් අත්සන් කර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත භාර දීමත් අවශ්‍ය වේ.

10. ජංගම හා ඡන්ද පොළ නිරීක්ෂණයෙහි යෙදෙන නිරීක්ෂකයා පහසුවෙන් හඳුනා ගත හැකි පරිදි නිල ඇඳුමක් හෝ සුදුසු විශේෂිත ඇඳුමකින් සැරසී සිටිය යුතු අතර ඡන්ද විමසීම් නිරීක්ෂණයේ නිරත වන කාලය තුළ මත්පැන් පානයෙන්, දුම්පානයෙන් වැළකී සිටීම අත්‍යවශ්‍ය වේ.

මගේ අංකය:LAE/11/04/(03)
ඔබේ අංකය:
දිනය:2011.08.05

ජනාපති ලේකම්,
අමාත්‍ය මණ්ඩල ලේකම්,
අග්‍රාමාත්‍ය ලේකම්,
සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්,
සියලු පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලු පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,
සියලු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (3 වන අදියර)
රජයට සහ රාජ්‍ය සංස්ථාවලට අයත් දේපළ මැතිවරණ කාල සීමාව තුළ දී භාවිතා කිරීම

1. අංක 1699/35 හා 2011 මාර්තු මස 30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2011 දෙසැම්බර් 31 දින දක්වා නිල කාලය දීර්ඝ කරන ලද පළාත් පාලන ආයතන 23 සඳහා නාමයෝජනා දැන්වීම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 26 වැනි වගන්තිය ප්‍රකාරව අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් 2011.08.04 දින ප්‍රකාශයට පත් කරන ලදී.

2. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 104 ආ (4) (අ) ව්‍යවස්ථාවට අනුකූලව නාමයෝජනා දැන්වීම ප්‍රකාශයට පත් කළ දින සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර අවසන් වන තෙක් වන කාලය "ඡන්ද විමසීම් කාලසීමාවට" අයත් වේ. එම ව්‍යවස්ථාවට අනුව මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළදී, යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරාපත් කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීමේ හෝ වලක්වාලීමේ කාර්යය සඳහා මෙන්ම කිසියම් අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම හෝ වලකාලීම සඳහා හෝ යම් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ කිසියම් අපේක්ෂකයකු විසින් රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපලක් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමසාරිස් සතුව ඇත.

3. තවද එම ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපළ භාරව සිටින සියලුම නිලධාරීහු බැඳී සිටිති. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජය සතු මෝටර් රථ, ජීප් රථ ආදී වාහන සහ හෙලිකොප්ටර් වැනි ගුවන් යානා යොදවා ගන්නා බවට පසුගිය සමහර මැතිවරණ අවස්ථාවලදී මෙම දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබී ඇත. එබැවින් රජයේ වාහන භාරව සිටින සියලු නිලධාරීන් එම වාහන යම් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා නොවන ආකාරයට මැතිවරණ කාලසීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු බව අවධාරණය කරමි. නිලධාරීන්ට වෙන් කර ඇති (assigned vehicles) රජය සතු වාහන සහ කුලියට ලබාගෙන රාජකාරී කටයුතු සඳහා යොදවන වාහන ද මීට ඇතුළත් වන බව සැලකිය යුතුය. මෙම කාලසීමාව තුළදී නිලධාරීන්ට වෙන් කර ඇති (assigned vehicles) වාහන හැර විශේෂයෙන්ම සංචිතවලට අනුයුක්ත වාහන සහ අනිකුත් වාහන සඳහා ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගත යුතු අතර, මෙම ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කර එම වාහන මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට නොයෙදෙන බවට සෑහීමකට පත්විය යුතුය.

4. රජයේ සම්පත් වන කාර්යාල ගොඩනැගිලි, පාසල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද දේශපාලන රැස්වීම්, සාකච්ඡා, ආදියට යොදවා ගැනීම ද නොකළ යුතුය. මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටින පුද්ගලයින්ට රජය සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබා දීම සම්පූර්ණයෙන්ම තහනම් බව ද සැලකිය යුතුය. කිසියම් පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් මුදල් ගෙවා මෙම පහසුකම් වෙන් කර ගන්නා විට එකම පක්ෂයකට හෝ පුද්ගලයකුට දිගින් දිගටම ඒවා ලබා දීමෙන් වැළකිය යුතුය. රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමිවල හා සියලුම ආකාරයේ වාහනවල දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර්, කටවුට් ආදිය ප්‍රදර්ශනය සඳහා භාවිතා කිරීමට ද ඉඩ නොදිය යුතුය. මෙම ඡන්ද විමසීමට අදාළ නොවන පළාත් පාලන ආයතන සතු සේවකයින්, වාහන, ගොඩනැගිලි ආදිය ද ඡන්ද විමසීම් පැවැත්වෙන ආයතනවල දේශපාලන ප්‍රචාරක කටයුතු සඳහා යෙදවීම සිදු නොකළ යුතුය.

5. ඡන්ද විමසීම් කාලය තුළ රජයේ මුදල් වැයකරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ ජංගම සේවාවන්, රජයේ බඩු බාහිර බෙදාදීම්, ප්‍රදර්ශනය, සංදර්ශන, විවෘත කිරීම්, පිළිගැනීම්, සමුදීම්, සැණකෙලි, ක්‍රීඩා තරඟ වැනි උත්සව ද යම් යම් ප්‍රදානයන් සඳහා ලැයිස්තු සකස් කිරීම වැනි කාර්යයන් ද දේශපාලන අංශවලට සම්බන්ධ පුද්ගලයින්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරෙන අතර එම අවස්ථාවලදී මැතිවරණයට අදාළව නොයෙකුත් මතිමතාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශ වීමට ඉඩ ඇත. එබඳු ප්‍රකාශයන් මැතිවරණය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වයට ද අනිසි ලෙස බලපානු ඇත. තවද මෙබඳු උත්සව අවස්ථාවන් සංවිධානය කිරීම පැවරෙන්නේ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල හෝ දිස්ත්‍රික්කවල සේවය කරනු ලබන රජයේ නිලධාරීන් වෙත බැවින් මැතිවරණ සමයේ දී විවිධ මැතිවරණ රාජකාරී පැවරෙන එම නිලධාරීන් මෙබඳු උත්සව සංවිධානය කිරීම ද කිසිසේත් සුදුසු නොවේ. එබැවින් මෙම මැතිවරණ කාලය තුළ එබඳු උත්සව අවස්ථා පැවැත්වීමෙන් වැලකී සිටීම යෝග්‍ය බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

6. 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන බලතල යටතට ගැනෙන කරුණුවලට 17 වැනි සංශෝධනයේ සීමා කිරීම් බල නොපායි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන බඳවා ගැනීම්, පත්වීම් සහ උසස්වීම් ආදිය අනුමත බඳවා ගැනීමේ පරිපාටිවලට අනුකූලව අනුමත ක්‍රමවේද හරහා ඉල්ලුම්පත් කැඳවීම, විභාග හා සම්මුඛ පරීක්ෂණ, ආදිය නිසිලෙස පවත්වා විනිවිද භාවයෙන් යුතුව නියමානුකූලව එකී බඳවා ගැනීම්, පත්වීම් හා උසස් වීම් කරනු ලබන බවට සහතික විය යුතුය. මෙවැනි නව බඳවා ගැනීම්, පත්වීම් හා උසස් වීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා දැනුවත් කර තිබීම, ඡන්ද විමසීම හා සම්බන්ධිත අධිකරණ ක්‍රියාමාර්ගවලදී පිළිතුරු සැපයීමේදී ප්‍රයෝජනවත් වනු ඇත. සාමාන්‍ය ක්‍රියාමාර්ගයෙන් බැහැරව හදිසියෙන් කළ යුතු යම් බඳවා ගැනීමක්, පත්වීමක් හා උසස් වීමක් සිදු කළ යුතු විශේෂ අවස්ථා තිබේ නම් ඒ සඳහා මැතිවරණ කොමසාරිස්වරයා දැනුවත් කර ඔහුගේ එකඟත්වය ඇතිව එම කාර්යයන් සිදු කිරීම ප්‍රඥාගෝචර වේ. මෙම කාලසීමාව තුළදී සිදු කරනු ලබන බඳවා ගැනීම්, පත්වීම්, උසස් වීම්, ස්ථානමාරු කිරීම් ආදිය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි ගැන නීති මඟින් කටයුතු කිරීමේ හැකියාව ගැන ද විශේෂයෙන්ම යම්කිසි පළාත් පාලන ආයතන නියෝජිතයකු තෝරා ගැනීමට බලපෑම් වන ආකාරයේ බඳවා ගැනීම්, පත්වීම් හෝ උසස් වීම් කිසිවක් නොකිරීමට වගබලා ගැනීම පිළිබඳව ද සියලුම නිලධාරීන් සැලකිලිමත් විය යුතුය. මැතිවරණ කොමසාරිස්, වග උත්තරකරු ලෙස නම් කරමින් ඉදිරිපත් කරනු ලබන අධිකරණ ක්‍රියාමාර්ගයන්හි දී ඒ සම්බන්ධයෙන් නියම තත්ත්වය උසාවියට වාර්තා කිරීමට සිදුවනු ඇති හෙයින් නියමිත ක්‍රියා පරිපාටිය අනුගමනය නොකිරීමෙන් වැළකී සිටීම සුදුසු බව සියලුම නිලධාරීන් වෙත දන්වා සිටිනු කැමැත්තෙමි. ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතනවල බල ප්‍රදේශ තුළ රාජකාරියේ නිරත රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ඉහත සඳහන් කාර්යයන් සිදු කිරීම තාවකාලිකව අත්හිටුවීමට යෝග්‍යයයි ද සිතමි.

7. ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ ගුරුවරුන් ඇතුළු රජයේ නිලධාරීන් හෝ රාජ්‍ය සංස්ථා නිලධාරීන් හෝ ඡන්ද විමසීම් කාලසීමාව තුළ එනම් අගෝස්තු මස 04 වැනි දින සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයටපත් කරන තුරු ස්ථාන මාරු කිරීම් විනය හේතු මත හෝ අත්‍යවශ්‍ය කාරණයක් මත ක්‍රියාත්මක කිරීමට සිදුවන්නේ නම් දේශපාලන හේතූන් මත එකී ස්ථාන මාරුවීම් සිදු කරනු ලැබූ බවට පැමිණිලි නොලැබෙන සේ එම ස්ථානමාරු කිරීම සිදු කිරීම සම්බන්ධයෙන් මගේ විරුද්ධත්වයක් නැත. හැකි හැමවිටම එවැනි ස්ථානමාරු ඡන්ද විමසීමෙන් පසුව කිරීමට යොදා ගැනීම වඩා සුදුසු ය.

8. මෙම ඡන්ද විමසීම්වලදී පළාත් පාලන ආයතන නියෝජිතයන් තෝරා පත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපල භාවිතා කිරීම වළක්වාලමින් කර ඇති මෙම තහනම තදින්ම අනුගමනය කරන ලෙස ඔබට උපදෙස් දෙමි. තවද, ඔබ යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා වෙනත් ආයතනවල ප්‍රධානීන්ට ද මේ පිළිබඳව උපදෙස් දෙන ලෙස ද කරුණාවෙන් දන්වමි.

9. මෙම ලිපියේ සඳහන් උපදෙස් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා අමාත්‍යාංශයේ පාලන විෂය භාර අතිරේක ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා හෝ ඊට සමාන තනතුරක් දරන නිලධාරියකු නම් කළ යුතුය. අනිකුත් දෙපාර්තමේන්තු හා ආයතන ද ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු මේ සඳහා යෙදවිය යුතු බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

10. ඡන්ද විමසීමට අදාළ සියලුම නීති බලාත්මත කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට සහාය දැක්වීම අදාළ නීති බලාත්මක කිරීම භාරව සිටිනු සියලුම රජයේ බලධරයන්ගේ කාර්යය විය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) ව්‍යවස්ථාවෙහි කර ඇති සඳහන පිළිබඳව ඔබගේ දැඩි අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

11. මෙම චක්‍රලේඛ ලිපියේ සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරු සහ නියෝජ්‍ය අමාත්‍යවරු සහ අමාත්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීමේ වගකීම ද අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පැවරේ.

12. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණුවලට අමතරව, ඔබේ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ/ ගණන් දීමේ නිලධාරී වශයෙන් ද රජය සතු දේපල අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම ද අදාළ නිලධාරීන්ගේ වගකීමක් බව මෙහි ලා සඳහන් කරමි.

13. පැමිණිලි හා ඡන්ද විමසීමට අදාළ නීති උල්ලංඝනය කිරීම් හා ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුව ද දේශපාලන පක්ෂ හා නිරීක්ෂණ සංවිධාන ද ඇතුළත් වන පැමිණිලි මධ්‍යස්ථානයක් 2011 සැප්තැම්බර් 01 දින සිට 2011 ඔක්තෝම්බර් 31 දින දක්වා මැතිවරණ මහලේකම් කාර්යාලයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපියේ සඳහන් උපදෙස් උල්ලංඝනය කිරීම් පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් එම මධ්‍යස්ථානය වෙත එවලේම දැන්වීමට ක්‍රියා කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිනු ලැබේ. එවිට එම මධ්‍යස්ථානය විසින් අදාළ බලධාරියාගෙන් විමසා නිසි පියවර ගනු ඇත.

14. පසුගිය ඡන්ද විමසීම් පැවැත්වුණු කාලසීමාව තුළ සමහර පළාත් පාලන ආයතන හා පළාත් සභාවල ඉහත සඳහන් ආකාරයේ රජය සතු මානව හා භෞතික දේපළ අයථා ලෙස පරිහරණය කිරීමට ගත් උත්සාහයන් පිළිබඳව පැමිණිලි ලද වහාම ඒවා නැවැත්වීමට හෝ අත්‍යවශ්‍ය යයි සඳහන් කළ ඇතැම් සිද්ධීන් කල් දැමීමට උපදෙස් දීමට සිදු වූ බව ද අවධාරණය කරමි. එවැනි අවස්ථාවල රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරකම්වලට එරෙහිව විරුද්ධ පක්ෂ අපේක්ෂකයන්ගෙන් පමණක් නොව එකම පක්ෂය තුළ අපේක්ෂකයන්ගෙන් පවා පැමිණිලි ලද බව ද සඳහන් කරමි. මෙවැනි තත්ත්වයන් පිළිබඳව දේශපාලන පක්ෂ හා පක්ෂ නිරීක්ෂණ කණ්ඩායම් ද බොහෝ අවස්ථාවල විමසීම් කරන අතර එවැනි කටයුතු ඡන්ද දූෂණ ක්‍රියාවන් සේ සලකා අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමට පවා හේතු වන බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

15. කිසියම් හේතුවක් නිසා කිසිඳු අයුරකින් නොපවත්වා සිටීමට හෝ කල් දැමීමට නොහැකි ඉහත සඳහන් කුමන කාර්යයක් හෝ අනිවාර්යයෙන් ඉටු කිරීමට සිදුවන්නේ නම් ඒ සම්බන්ධයෙන් මාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කරන ලෙස ද කරුණාවෙන් දන්වමි.

16. රාජ්‍ය දේපල අයථා ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සියල්ල දේශපාලන පක්ෂ හා නිරීක්ෂණ සංවිධානවල ඉල්ලීම පරිදි ඒවාට දැනගැනීම සඳහා යැවීමට සිදුවන අතර වැඩිදුර ක්‍රියා කිරීම සඳහා පොලිස්පතිට ද, අල්ලස් හෝ දූෂණ මර්දන කාර්යාංශයට ද, මුදල් කොමිසමට ද, මානව හිමිකම් කොමිසමට ද, විගණකාධිපතිට ද සිදු වී තිබේ. එවැනි අවස්ථාවල එබඳු අයථා පරිහරණයන්ට ඉඩ සැලසූ රාජ්‍ය නිලධාරීන්ට ද ඒ සම්බන්ධයෙන් වගකීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

17. සාධාරණ හා නිදහස් ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ සහාය අත්‍යවශ්‍ය හෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් පරිදි ක්‍රියා කිරීමෙන් ඡන්ද විමසීමට අදාළ නීතිවලට අනුකූලව සාධාරණ හා නිදහස් ඡන්ද විමසීමක් පැවැත්වීමට සහාය වන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පිටපත් -
1.විගණකාධිපති - දැනගැනීම සඳහා
2.අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත සහ
3.අදාළ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත -
දැනගැනීම සඳහා සහ ඔබ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ අදාළ නාගරික කොමසාරිස්වරුන්, නගර සභා සහ ප්‍රාදේශීය සභා ලේකම්වරුන් වෙත මෙම ලිපියේ පිටපතක් යැවීම සඳහා සහ එහි සඳහන් ආකාරයට කටයුතු කරන ලෙස දැන්වීමට

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011 (3 වන අදියර)
විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය සඳහා උපමාන

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනෙන ලද 17 වැනි සංශෝධනය මගින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කරනු පිණිස මැතිවරණ කොමිෂන් සභාව විසින් උචිතයයි සලකනු ලබන උපමාන ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයන් පවත්වාගෙන යන්නෙකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු වෙත කලින් කල නිකුත් කරනු ලැබීමට බලය දී තිබුණි. ඒ අනුව පසුගිය ඡන්ද විමසීම්වලදී සියලු මාධ්‍ය ආයතන වෙත එකී ඡන්ද විමසීමට අදාළ වන පරිදි උපමාන නිකුත් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් අවශ්‍ය පියවර ගන්නා ලදී.

   17 වැනි සංශෝධනයට අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා වෙත නිකුත් කරනු ලබන උපමාන අනුව ක්‍රියා කිරීම සහතික කරනු පිණිස අදාළ සභාපතිවරුන් විසින් සියලු පියවර ගත යුතු විය. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හෝ රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරුන් විසින් එම උපමාන උල්ලංඝනය කරනු ලැබුවහොත් නමින් හෝ නිලයෙන් නිසි බලධරයකු පත් කිරීමට 17 වැනි සංශෝධනයෙන් කොමිෂන් සභාවට බලය පැවරිණ. එබඳු අවස්ථාවක ඡන්ද විමසීම අවසන් වන තෙක් ගුවන් විදුලි සංස්ථාවේ හෝ රූපවාහිනී සංස්ථාවේ කළමනාකරණය පවා නිසි බලධරයා වෙත පැවරීමට කොමිෂන් සභාවට 17 වැනි සංශෝධනයෙන් බලතල පවරා තිබිණ.

2. 18 වැනි සංශෝධන මගින් ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වා ගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවක හෝ ප්‍රකාශකයකු වෙත කලින් කල උපමාන නිකුත් කිරීමට කොමිෂන් සභාවට පැවරී තිබුණු බලය එසේම තිබියදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පමණක් කොමිෂන් සභාවට අවශ්‍ය යයි හැඟෙන අවස්ථාවක නිසි බලධරයකුගේ පාලනයට යටත් කිරීමට දී තිබුණු බලය ඉවත් කර ඇත.

   ඒ අනුව දිවයිනේ සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත උපමාන නිකුත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට හැකියාව ඇති අතර එම මාධ්‍ය ආයතන ප්‍රධානීන් අදාළ උපමාන ක්‍රියාවෙහි යෙදවිය යුතුය. ඒ අනුව කොමිෂන් සභාවත් මාධ්‍ය ආයතනත් අන්‍යෝන්‍ය අවබෝධයකින් යුතුව කටයුතු කළ යුතුය. තව ද රාජ්‍ය මාධ්‍ය පමණක් නිසි බලධරයකුගේ යටතට පත් කිරීමෙන් පෞද්ගලික මාධ්‍යවලට රිසි ලෙස කටයුතු කිරීමට තිබුණු නිදහස 18 වැනි සංශෝධනයෙන් ඉවත් කර ඇත.

3. ඒ අනුව 17 වැනි සංශෝධනය යටතේ නිකුත් කරන ලද උපමානයන් ද සැලකිල්ලට ගෙන 18 වැනි සංශෝධනය යටතේ මෙම ඡන්ද විමසීමට අදාළව සියලුම මාධ්‍ය ආයතන වෙත පහත සඳහන් උපමානයන් නිකුත් කරනු ලැබේ.

   3.1 සියලුම මාධ්‍ය ආයතන ප්‍රවෘත්ති විකාශයේ දී, කාලීන පුවත් ප්‍රචාරයේ දී හා ප්‍රවෘත්ති පළ කිරීමේ දී සමතුලිත හා මධ්‍යස්ථ බවකින් කටයුතු කළ යුතුය.

   3.2 ප්‍රවෘත්තිය පිළිබඳ කතෘ මතයන් ප්‍රකාශ නොකළ යුතුය. කතෘ මතය ප්‍රකාශ කිරීමේ දී බොහෝ විට කිසියම් පක්ෂයකට පක්ෂග්‍රාහී වන සහ ඊට ප්‍රතිවිරුද්ධ පක්ෂයට අගතියක් වන අන්දමේ අදහස් ඉදිරිපත් විය හැකිය.

   3.3 ජනාධිපති හෝ මැති ඇමතිවරුන් විසින් පවත්වනු ලබන ප්‍රවෘත්ති සාකච්ඡා හා ප්‍රසිද්ධ ප්‍රකාශ මගින් ඇතිවන දේශපාලන මතභේද සම්බන්ධයෙන් ඊට ප්‍රතිවිරුද්ධ දේශපාලන කණ්ඩායම්වලට ද අදහස් ප්‍රකාශ කිරීමට සම අවස්ථා සැලසිය යුතුය. මේ පිළිබඳව පුවත්පත් වාර්තා පළ කිරීමේ දී ද ප්‍රතිවිරුද්ධ කණ්ඩායම්වල මතයන්ට ද සමාන සැලකිල්ලක් දැක්විය යුතුය.

   3.4 වාර්තාමය වැඩසටහනක් හෝ විශේෂ වැඩසටහනක් විකාශය කරන විට නිවේදකගේ හා සංස්කාරකගේ නම් සඳහන් කිරීම අවශ්‍යයෙන්ම කළ යුතුය. එමෙන්ම පුවත්පතක පළ කරන විට ද ප්‍රවෘත්ති සංස්කාරකගේ නම් සඳහන් කළ යුතුය.

   3.5 කණ්ඩායම් සාකච්ඡා සඳහා තෝරා ගැනීමේ දී සියලුම පක්ෂ හා කණ්ඩායම් වෙත සාධාරණ ලෙස කටයුතු කළ යුතුය. එබඳු සාකච්ඡා පිළිබඳ පුවත්පත් වාර්තා පළ කිරීමේ දී ද සෑම පක්ෂයක් හා කණ්ඩායමක්ම සමානත්වයෙන් සැලකිය යුතුය.

   3.6 දුරකථනය හරහා පවත්වනු ලබන වැඩ සටහන්වලදී සියලුම අමතන්නන්ට එක හා සමාන අවස්ථා දිය යුතුය. ඔවුන්ගේ මතය කුමක් හෝ වේවා එය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දිය යුතුය. එබඳු වැඩසටහන්වලදී කාර්මික අංශය මෙහෙයවනු ලබන නිලධාරීන් එම වැඩසටහන්වල සමබරතාවය පිළිබඳව වගකිව යුතුය.

3.7 කිසියම් විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු හෝ සේවකයකු දේශපාලන කටයුතුවල ක්‍රියාකාරීව නිරතවේ නම් සමබර විකාශනයට හෝ සමබර පළ කිරීමට හෝ බාධා ඇති වේ. ඒ පිළිබඳව ද එම ආයතනයේ කළමනාකාරීත්වය විශේෂයෙන් සැලකිලිමත් වීම අත්‍යාවශ්‍යය.

3.8 ඡන්ද විමසීම් දිනට පැය 48 කට පෙර එනම් 2011.10.05 මධ්‍යම රාත්‍රියෙන් පසු රැස්වීම් පැවැත්වීම අත්හිටුවිය යුතු අතර සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ද එම නිහඬතාව රැකිය යුතුය.

3.9 ඒ අනුව 2011.10.08 වැනි දින ඡන්ද විමසීම පැවැත්වෙන බැවින් 2011.10.05 මධ්‍යම රාත්‍රියෙන් පසු කිසිම පක්ෂයක් හෝ කිසිම අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන ආකාරයේ දැන්වීම් පළ නොකළ යුතුය. එහෙත් 2011.10.05 දින පැවැත්වූ රැස්වීම්වල වාර්තා පමණක් 2011.10.06 වැනි දින මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීම හෝ පළ කිරීම කළ හැකිය.

3.10 එබැවින් මුදල් ගෙවා පළ කරන ලද දැන්වීම් වශයෙන් හෝ දේශපාලන මුහුණුවරක් ඇති වෙනත් කිසිම වෙළඳ දැන්වීමක් හෝ වාර්තාවක් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් 06, 07 සහ 08 යන දිනයන්හි ප්‍රචාරය කිරීමට/ පළ කිරීමට භාර නොගත යුතුය.

3.11 කිසියම් පක්ෂයක හෝ අපේක්ෂකයකුගේ ජයග්‍රහණය වෙනුවෙන් මෙම ඡන්ද විමසීම සඳහා තරඟ කරන වෙනත් පක්ෂයක හෝ කණ්ඩායමක අපේක්ෂකයින් විසින් වුවද කිසියම් අනුග්‍රහයක් දැක්වීම් වශයෙන් ඉදිරිපත් කරනු ලබන දැන්වීම් හා වැඩසටහන් මුද්‍රණය සඳහා හෝ ප්‍රචාරය සඳහා භාර නොගත යුතුය.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011

ඇස්තමේන්තු මුදල රු. : 2,200,000.00
සත්‍ය වියදම(දළ වශයෙන්) රු. : 2,126,812,337.97
ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව : 13,656,523
එක් ඡන්ද දායකයකු වෙනුවෙන් වියදම රු. : 155.74

1. මැතිවරණය පැවැත්වූ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් කරන ලද ගෙවීම් රු.			764,776,604.08
2. ප්‍රධාන කාර්යාලයෙන් අනෙකුත් කාර්යාලවලට ප්‍රතිපූර්ණය කරන ලද ගෙවීම් රු.			
	කාර්ය මණ්ඩලය	524,086,031.73	
	ඉන්ධන	1,568,745.88	525,654,777.61
3. ප්‍රධාන කාර්යාලයෙන් ගෙවීම් කරන ලද අනිකුත් වියදම් රු.			145,064,243.92
4. අනෙකුත් දෙපාර්තමේන්තුවලට කරන ලද ගෙවීම් රු.			
	පොලිස් දෙපාර්තමේන්තුව	318,200,000.00	
	මුද්‍රණ දෙපාර්තමේන්තුව (ඡන්ද පත්‍රිකා හා අනෙකුත් මුද්‍රණ කටයුතු)	147,013,899.19	
	තැපැල් දෙපාර්තමේන්තුව	209,000,000.00	
	රජයේ කර්මාන්ත ශාලාව	3,511,538.84	677,725,438.03
5. පෞද්ගලික අංශය වෙනුවෙන් කරන ලද ගෙවීම් (මුද්‍රණ කටයුතු) රු.			
ටොෆෑන් ෆෝම්ස් සමාගම (නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා)		1,177,909.89	
ඩිජිස්කෑන් ප්‍රින්ටින් පැකේජින් ලිමිටඩ් (නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා)		12,413,364.44	13,591,274.33
			2,126,812,337.97

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ගෙවීම් කිරීම වෙනුවෙන් එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන් කළ ප්‍රතිපාදන

දිස්ත්‍රික් කාර්යාලය	මුළු වියදම
කොළඹ	65,357,243.85
ගම්පහ	69,956,195.34
කළුතර	43,564,660.19
මහනුවර	38,882,734.63
මාතලේ	22,286,257.08
නුවරඑළිය	20,855,002.42
ගාල්ල	50,346,525.36
මාතර	51,562,356.64
හම්බන්තොට	31,067,851.08
යාපනය	28,152,352.92
වවුනියාව හා මුලතිව්	1,065,518.10
මන්නාරම	4,346,715.90

දිස්ත්‍රික් කාර්යාලය	මුළු වියදම
මඩකළපුව	7,763,502.01
අම්පාර	48,416,473.88
ත්‍රිකුණාමලය	21,720,784.05
කුරුණෑගල	56,396,650.63
පුත්තලම	32,106,907.15
අනුරාධපුර	32,775,567.79
පොළොන්නරුව	19,605,157.26
බදුල්ල	27,653,667.58
මොණරාගල	27,717,473.16
රත්නපුර	36,932,958.75
කෑගල්ල	26,244,048.31
මුළු එකතුව	**764,776,604.08**

කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ගෙවීම් යාපනය දිස්ත්‍රික්කය යටතේ ද, මුලතිව් දිස්ත්‍රික්කයේ ගෙවීම් වවුනියාව දිස්ත්‍රික්කය යටතේ ද, ඇතුළත් කර ඇති බව සලකන්න.

2011 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ සංක්ෂිප්ත සටහනක්

2011.01.06 වැනි දින පළාත් පාලන ආයතන 301 ක් සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම් පළ කරන ලද අතර නාමයෝජනා ප්‍රතික්ෂේප වූ පළාත් පාලන ආයතන 65 කට අදාළ නාමයෝජනා 68 ක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගවලට එළඹීම නිසා එම පළාත් පාලන ආයතන 65 හි සහ බිම් බෝම්බ ඉවත් කිරීම අවසන් නොවීම නිසා නැවත පදිංචි කිරීම අවසන් කළ නොහැකි වූ පළාත් පාලන ආයතන දෙකක ද ඡන්ද විමසීම කල් තබන ලදී. ඒ අනුව පළාත් පාලන ආයතන 234 ක ඡන්ද විමසීම 2011.03.17 වැනි දින පවත්වන ලදී.

නාමයෝජනා දැන්වීම පළ කළ දින සිට ඡන්ද විමසීමට පෙර දින දක්වා මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් 74 ක් සහ ප්‍රචණ්ඩ ක්‍රියා 45 ක් හා වෙනත් සිදුවීම් 01 ක් වශයෙන් පැමිණිලි 120 ක් ලැබිණ. එයින් වැඩිම පැමිණිලි සංඛ්‍යාව ලැබී ඇත්තේ අම්පාර දිස්ත්‍රික්කයෙනි. ගම්පහ, කළුතර, මහනුවර සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවලින් පැමිණිලි 10 කට වැඩි සංඛ්‍යාවක් බැගින් ලැබිණ. නීති විරෝධී ක්‍රියා වැඩිම සංඛ්‍යාව ලැබී ඇත්තේ කළුතර දිස්ත්‍රික්කයෙනි. ඡන්ද විමසීම් දිනයෙහි පැමිණිලි 100 ක් ලැබුණු අතර එයින් 21 ක්ම ලැබුණේ ගම්පහ දිස්ත්‍රික්කයෙනි. මහනුවර දිස්ත්‍රික්කයෙන් 16 ක් ද මාතලේ දිස්ත්‍රික්කයෙන් 13 ක් ද ලැබිණ. ඇතැම් දිස්ත්‍රික්කවලින් පැමිණිලි කිසිවක් ලැබී නැත. වවුනියාව, මඩකලපුව, ත්‍රිකුණාමලය, බදුල්ල සහ කෑගල්ල එම දිස්ත්‍රික්ක වේ. ඡන්ද විමසීමේ දෙවැනි අදියර යටතේ අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් කල් තබන ලද පළාත් පාලන ආයතන 65 ට අදාළ ඡන්ද විමසීම 2011.07.23 වැනි දින පවත්වන ලදී. එම ඡන්ද විමසීම 2011.01.06 දින පළ කරන ලද නාමයෝජනා දැන්වීම යටතේ 2011.02.01 දින පළ කරන ලද ඡන්ද විමසීම් දැන්වීම හා 2011.08.30 දින පළ කරන ලද සංශෝධිත ඡන්ද විමසීම් දැන්වීම අනුව සිදු කරන ලදී.

ඒ අනුව 2011.03.21 දින සිට 2011.07.23 දින දක්වා මෙම පළාත් පාලන ආයතනයන්ට අදාළව ලැබුණු පැමිණිලි මේ යටතට ඇතුළත් කර ඇත. එම පළාත් පාලන ආයතන 65 සම්බන්ධයෙන් නීති උල්ලංඝනය කිරීම් 78 ක් සහ ප්‍රචණ්ඩ ක්‍රියා 16 ක් වශයෙන් පැමිණිලි 94 ක් ලැබිණ. නීති උල්ලංඝනය කිරීම් වැඩියෙන්ම ලැබී ඇත්තේ කිළිනොච්චි සහ පුත්තලම යන දිස්ත්‍රික්කවලිනි. යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රචණ්ඩ ක්‍රියා 9 කට අදාළ පැමිණිලි ලැබුණි.

ඡන්ද විමසීම් දිනයෙහි ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 83 ක් වන අතර එයින් 29 ක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ද 22 ක් කිළිනොච්චි දිස්ත්‍රික්කයෙන් ද විය. වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ඡන්ද විමසීම් දින පෙ.ව. 11.00 - 12.00 ත් අතර ය. පැමිණිලි සංඛ්‍යාව 18 කි.

ඡන්ද විමසීම් තුන්වැනි අදියරට අදාළව නාමයෝජනා භාර ගැනීම 2011 අගෝස්තු 18 දින සිට අගෝස්තු 25 දින මධ්‍යහ්න 12.00 දක්වා සිදු කරන ලද අතර නාමයෝජනා ආරම්භ වූ දිනයේ සිට ඡන්ද විමසීම අවසන් වීම දක්වා මුළු කාල පරිච්ඡේදය තුළ මැතිවරණ මහලේකම් කාර්යාලයේ පැමිණිලි නිරීක්ෂණ මධ්‍යස්ථානය පවත්වාගෙන යන ලදී. ඡන්ද විමසීම 2011 ඔක්තෝම්බර් මස 08 වැනි දින පවත්වන ලද අතර 2011.10.07 දින දක්වා ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 171 කි. එයින් වැඩිම සංඛ්‍යාවක් නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විය. එබඳු පැමිණිලි 146 ක් වාර්තා වූ අතර ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ලැබුණේ පැමිණිලි 25 ක් පමණි. එයින් ද 11 ක් මාතලේ දිස්ත්‍රික්කයෙන් සහ 8 ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා විය.

නීති උල්ලංඝනය කිරීම් හා ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබුණේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. පැමිණිලි සංඛ්‍යාව 76 කි. ඡන්ද විමසීම් දිනයෙහි පැමිණිලි 195 ක් ලැබුණු අතර එයින් ද 102 ක් වාර්තා වූයේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. ගම්පහ 40 ක් ද මාතලේ 19 ක් ද කුරුණෑගල 10 ක් ද වශයෙන් වාර්තා විය.

ඉහත කී පැමිණිලි අතුරින් නීති උල්ලංඝනය කිරීම් යටතේ නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු, ඡන්ද දායකයින් කැඳවා යම් යම් දෑ බෙදා දීම, රජයේ පාසල්වල දේශපාලන රැස්වීම් පැවැත්වීම, රජයේ වාහන මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනීම, නීති විරෝධී ලෙස මැතිවරණ ප්‍රචාරක කාර්යාල ඉදිකිරීම ආදිය දැක්විය හැකි අතර ප්‍රචණ්ඩ ක්‍රියා වශයෙන් පහර දීම්, විහාරස්ථානයට වෙඩි තැබීම්, නියෝජිතයන්ට තර්ජනය කිරීම්, පලවා හැරීම්, කාර්යාල ගිණි තැබීම් ආදිය දැක්විය හැකිය. එකී පැමිණිලි අතුරින් තවත් පාර්ශ්වයකින් එම පැමිණිල්ල සනාථ වන සහ ඡන්ද විමසීම සම්බන්ධයෙන් යම් බලපෑමක් සිදු විය හැකි යයි අදහස් කරන පැමිණිලි හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර පහත දක්වා ඇත.

1. නින්දවූර් ප්‍රාදේශීය සභාවට තරඟ කරන අපේක්ෂකයින් දෙදෙනකු වන අලි සහ බුහාරි යන දෙදෙනාට 2011.02.21 වැනි දින පහර දී ඇති බව එක්සත් ජාතික පක්ෂ ලේකම් තිස්ස අත්තනායක මහතා පැමිණිලි කර ඇත. මේ පිළිබඳව සම්මන්තුර පොලිස් ස්ථානාධිපති වාර්තා කරමින් සැකකරුවන් වන එම්.ඒ.එම්.තාහීර් නොහොත් අස්වර්, ඒ.සී.ඒ.හකීම්, කේ.එච්.සෆාස්, එම්.ඒ.තවුෆික්, ඒ.එම්.ලතීෆ් සහ ඒ.එම්.මුනෆීර් රක්ෂිත බන්ධනාගාර ගත කර ඇප මත මුදාහරින ලද බව වාර්තා කර ඇත.

2. නින්දවූර් ප්‍රාදේශීය සභාවේ බලයලත් නියෝජිත ඩී.ගමගේ මහතා නින්දවූර් ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයින් වන ආර්.නසීර්, අයි.අලි ඒ. බුහාරි යන අයට ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ අපේක්ෂක අෂ්රෆ් විසින් පහර දී ඇති බවත් පැමිණිලි කර ඇත.
මේ පිළිබඳව සැකකරුවන් රක්ෂිත බන්ධනාගාර ගත කර ඇප මත මුදා හරින ලද බව සම්මන්තුර පොලිස් ස්ථානාධිපති වාර්තා කර ඇත.

3. පොතුවිල් ප්‍රාදේශීය සභාවේ අපේක්ෂකයකු නොවන එම්.බී.ඒ.අසීස් මහතා මහජනයා නොමග යවමින් ව්‍යාජ ලෙස මැතිවරණ ප්‍රචාරණ කටයුත්තක යෙදෙන බව ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් අපේක්ෂකයකු විසින් 2011.02.21 වැනි දින පැමිණිලි කර ඇත. මේ පිළිබඳව පොතුවිල් පොලිස් ස්ථානාධිපති අදාළ පෝස්ටර් ඉවත් කරවූ බවත් අදාළ පුද්ගලයාට අවවාද කළ බවත් වාර්තා කර ඇත.

4. අක්කරපත්තු මහ නගර සභා, නාමයෝජනා පත්‍රයෙහි නම සඳහන් නොවන තැනැත්තකු මහජනයා නොමග යවමින් ව්‍යාජ ප්‍රචාරණයක යෙදෙන බව ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ එච්.ටී.එච්.අලි මහතා පැමිණිලි කර ඇත. මේ පිළිබඳව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, අම්පාර පරීක්ෂා කළ බවත් ව්‍යාජ පෝස්ටර් ඉවත් කර වූ බවත් පුද්ගලයාට අවවාද කළ බවත් වාර්තා කර ඇත.

5. කැළණිය ප්‍රාදේශීය සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂක නන්දසේන මහතා විසින් කිරිබත්ගොඩ නගරයේ දී තමාට පහර දී වාහනයට ද අලාභ හානි සිදු කළ බව එක්සත් ජාතික පක්ෂයේ ටී.එම්.පෙරේරා මහතා පැමිණිලි කර ඇත. මේ සම්බන්ධයෙන් සන්ධාන අපේක්ෂක නන්දසේන මහතා අත්අඩංගුවට ගත් බව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, කැළණිය විසින් වාර්තා කර ඇත.

6. කළුතර ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ බලයලත් නියෝජිත විජේමාන්න මහතා එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක එස්.ආරියරත්න මහතා නීති විරෝධී පක්ෂ කාර්යාලයක් පවත්වාගෙන යන බවත් GD-2591, VW-5888, QQ-5565 සහ 206-2578 අංක දරන ත්‍රීවීලර් ඔහුගේ ප්‍රචාරක කටයුතුවලට යොදවා ඇති බවත් පැමිණිලි කර ඇත. අදාළ පක්ෂ කාර්යාලය අනුමත පක්ෂ කාර්යාලයක් බව පොලිස් අධිකාරී, කළුතර වාර්තා කර ඇත.

7. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී වශයෙන් කටයුතු කරන මේජර් කේ.ජයවීර මහතා තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දී අදාළ සිවිල් ආරක්ෂක නිලධාරීන්ට බලපෑම් කරන බව එක්සත් ජාතික පක්ෂ ලේකම් තිස්ස අත්තනායක මහතා පැමිණිලි කර ඇත.
මේ පිළිබඳව අම්පාර සහකාර මැතිවරණ කොමසාරිස් වෙත දැන් වූ පසු සහකාර තේරීම්භාර නිලධාරීවරයකු ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් ඒ ඒ ස්ථානයේ තැපැල් ඡන්ද කටයුතු අධීක්ෂණය සඳහා යැවූ බව වාර්තා කර ඇත.

8. ලාහුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තැපැල් ඡන්ද සලකුණු කිරීමේ මධ්‍යස්ථානවලට පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර විරසේකර ඇතුළු වන බව එක්සත් ජාතික පක්ෂ ලේකම් තිස්ස අත්තනායක මහතා විසින් පැමිණිලි කර ඇත. මේ පිළිබඳව අම්පාර දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයා මන්ත්‍රීවරයාට දුරකථනයෙන් දැනුම් දුන් බවත් මේ වන විට එම ගැටළුව නිරාකරණය කර ඇති බවත් වාර්තා කර ඇත.

9. එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ආර්.සෙනෙවිරත්න මහතා දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගලේවෙල නීති විරෝධී බැනර් හා පෝස්ටර් ප්‍රදර්ශනය කරන බවත් එක්සත් ජනතා නිදහස් සන්ධාන වාහනයකින් අවිගත් පුද්ගලයන් සැරිසරන බවත් වාර්තා වී ඇත. මේ පිළිබඳව පරීක්ෂා කළ බවත් නීති විරෝධී බැනර්, පෝස්ටර් ඉවත් කර වූ බවත් වාර්තා කර ඇත.

10. 2011.03.17 වන දින පස්වරු 1.25 ට පමණ පැෆරල් ආයතනය විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ගලබොඩ කණිෂ්ඨ විද්‍යාලය සහ මල්වැන්න කණිෂ්ඨ විද්‍යාලය අසල විශාල පිරිසක් රැස්වී සිටින බවත් ඡන්ද දායකයන්ට බාධාකාරී බවත් පැමිණිලි කර ඇත. මේ පිළිබඳව ඇල්පිටිය පොලිස් අධිකාරී වාර්තා කර ඇත්තේ රැස්වී සිටින පිරිස විසුරුවා හරිනු ලැබූ බවයි.

11. පදියතලාව ප්‍රාදේශීය සභාවේ පදියතලාව ජාතික පාසල අසල අපේක්ෂකයකුට අදාළ පෝස්ටර් ප්‍රදර්ශනය කරමින් පවතින බව වීල්.එච්.පී.කුමාර මහතා පැමිණිලි කර ඇත.
එම පෝස්ටර් සියල්ල ගලවා ඉවත් කළ බව පදියතලාව පොලිස් ස්ථානාධිපති වාර්තා කර ඇත.

12. බියගම ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක පී.කේ.සී.පනාපිටිය මහතා පහර කෑමට ලක්ව ඇති අතර ඔහුගේ ත්‍රීවීලරයට ද අලාභ හානි සිදු කර ඇත.
මේ බව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත පැමිණිලි කරන ලදුව ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන ඇති බව වාර්තා කර ඇත.

13. ගලේවෙල, දඹුල්ල, පල්ලෙපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල නීති විරෝධී ප්‍රචාරක බැනර්, පෝස්ටර් ආදිය බහුලව ඇති බව එක්සත් ජාතික පක්ෂ බලයලත් නියෝජිත රංජිත් අළුවිහාරේ මහතා පැමිණිලි කර ඇත. සියලුම නීති විරෝධී ප්‍රචාරක කටයුතු ඉවත් කර ඇති බව වාර්තා කර ඇත.

14. මාතලේ ලග්ගල ප්‍රාදේශීය සභාවට අයත් නාඋල ප්‍රදේශයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවන් පිරිසක් එක්සත් ජාතික පක්ෂ ආධාරකරුවන්ට බලපෑම් කරන බවට එක්සත් ජාතික පක්ෂයේ මුහන්දිරම්ගේ මහතා පැමිණිලි කර ඇත.
මේ පිළිබඳව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත වාර්තා කළ අතර එම ප්‍රදේශයට අමතර ආරක්ෂක නිලධාරීන් පිරිසක් යැවූ බව වාර්තා කර ඇත.

15. පොළොන්නරුව දිඹුලාගල ප්‍රාදේශීය සභාවට අයත් මගුල්තෙනිය විද්‍යාලයේ අළුයම 3.00 ට පමණ බෝම්බ පිපිරීමක් සිදු වී ඇති බව ඡන්ද විමසීම් දින පෙරවරු 7.30 ට පැෆරල් සංවිධානයේ නියෝජිතයකු පැමිණිලි කර ඇත.
මේ පිළිබඳව පොළොන්නරුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් පරීක්ෂා කළ බවත් සිද්ධිය සිදුවී ඇත්තේ අළුයම 3.00 ට පමණ බවත් එය ඡන්ද පොළේ කටයුතුවලට බාධාවක් නොවන බවත් දන්වා ඇත.

16. කඩුවෙල මහ නගර සභාවේ අපේක්ෂකයින් වන බුද්ධදාස හා බුද්ධික යන දෙදෙනා කඩුවෙල නගරයේ විශාල පෙළපාලි දෙකක් සූදානම් කර ඇති බව පැමිණිලි කර ඇත.
මේ පිළිබඳව දැන් වූ පසු නුගේගොඩ පොලිස් පරීක්ෂක මේ පිරිස සාමකාමීව විසුරුවාහල බව වාර්තා කර ඇත.

17. ඇඹිලිපිටිය ප්‍රදේශීය සභාවේ අපේක්ෂකයකු වන පූජ්‍ය වේවැල්දූවේ ඥානප්‍රභා හිමියන්ගේ විහාරයට වෙඩි තැබීමක් කර ඇති බව එන්.එස්.වනසිංහ මහතා පැමිණිලි කර ඇත. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වෙන බවත් විහාරස්ථානයට හා ස්වාමීන් වහන්සේට ආරක්ෂාව සලසා ඇති බවත් මාර්ග පරීක්ෂණ ස්ථානයක් පිහිටුවනු ලැබූ බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, රත්නපුර විසින් වාර්තා කර ඇත.

18. අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ජනතා විමුක්ති පෙරමුණ අපේක්ෂක සමන්ත සිරිවර්ධන මහතාට එක්සත් ජනතා නිදහස් සන්ධාන මැර පිරිසක් පිඹුර කණිෂ්ඨ විද්‍යාලය අසල දී පහර දී ඇති බව ජනතා විමුක්ති පෙරමුණ ලේකම් ටිල්වින් සිල්වා මහතා පැමිණිලි කර ඇත.
එම සිද්ධිය ඡන්ද පොළට කිලෝමීටරයක් පමණ දුරින් සිදු වූ සිද්ධියක් බවත් එයින් ඡන්ද විමසීමට බාධාවක් සිදු වී නැති බවත් පහර කෑ අය ද ඡන්ද පොළට පැමිණ ඡන්දය ප්‍රකාශ කර ඇති බවත් වාර්තා කර ඇත.

19. කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වඩ්ඩකච්චි, රාවනාදපුරම්, ක්‍රිෂ්ණපුරම්, බාරතිපුරම්, කෝකවිල් ප්‍රදේශවල හමුදා පිරිස් ගැවසෙන බවත් හමුදා ඇඳුමින් සැරසුන අය නිවෙස්වලට පැමිණ නිල ඡන්ද දැන්වීම් පත් එකතු කළ බවත් සිවඥානම් ශ්‍රීධරන් මහතා පැමිණිලි කර ඇත.
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගනු ලබමින් සිටින බව වාර්තා කර ඇත.

20. කරච්චි ප්‍රාදේශීය සභාවට අයත් සන්දාරි වඩ්ඩිඅම්මාන් වට්ටකච්චි ප්‍රදේශයේ 2011.07.22 දින මුහුණ ආවරණය කරගත් පිරිසක් නිල ඡන්ද දැන්වීම් පත් එකතු කර ඇති බව එක්සත් ජාතික පක්ෂයේ රජීව් සෙනෙවිරත්න මහතා පැමිණිලි කර ඇත.
එම සිද්ධිය සිදු වී ඇති බවත් පුද්ගලයින් හඳුනාගෙන නැති බවත් පරීක්ෂණය පැවැත්වෙන බවත් වාර්තා කර ඇත.

21. කරච්චි පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවට අයත් රාමනාදන්පුරම්, වට්ටකච්චි, මලයාලම්පුරම් හා භාරතිපුරම් පච්චිලයිපල්ලි යන ප්‍රදේශවල ඡන්ද කාඩ්පත් හා හැඳුන්මිපත් පැහැරගනු ලැබූ බව නීතිඥ හරේන් බානගල මහතා පැමිණිලි කර ඇත.
මේ පිළිබඳව පරීක්ෂා කරගෙන යනු ලබන බව වාර්තා කර ඇත.

22. කොළොන්නාව නගර සභාවට අයත් දහම්පුර නිවැසියන්ට පාර්ලිමේන්තු මන්ත්‍රී දුමින්ද සිල්වා තර්ජනය කර ඇති බව එක්සත් ජාතික පක්ෂයේ රජීව් සෙනෙවිරත්න මහතා පැමිණිලි කර ඇත.
ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙන බවත් නුගේගොඩ පොලිස් අධිකාරී වාර්තා කර ඇත.

23. දෙහිවල ගල්කිස්ස සයන්ස් කොලේජ් හි පිහිටි ඡන්ද මධ්‍යස්ථානය අසල 301-8312 වාහනය මත්ද්‍රව්‍ය බෙදා හරිමින් ඡන්ද ප්‍රචාරක කටයුතුවල යෙදෙන බව ශාන්ත හේවගේ මහතා විසින් පැමිණිලි කර ඇත. ගල්කිස්ස මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් එම වාහනය ඉවත් කළ බව වාර්තා කර ඇත.

24. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයට අයත් මට්ටක්කුලිය මහවත්ත ඡන්ද මධ්‍යස්ථානය අසල එක්සත් ජාතික පක්ෂ

ආධාරකරුවන් පත්‍රිකා බෙදමින් කලබලකාරී ලෙස හැසිරෙන බව ශාන්ත හේරත් මහතා පැමිණිලි කර ඇත.
රැස්ව සිටි පිරිස් ඉවත් කළ බවත් ආරක්ෂාව තර කළ බවත් පොලිස් ස්ථානාධිපති මෝදර විසින් දන්වා ඇත.

25. කිරුළපන ලංකා සභා විද්‍යාලයේ ඡන්ද පොළෙන් ඡන්ද දායකයින්ට වක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවන් විසින් අවරහිර කරනු ලබන බව කේ.ඒ.ට්‍රවෝ ප්‍රනාන්දු මහතා පැමිණිලි කර ඇත.
එවැනි සිද්ධියක් වාර්තා වී නැති බව කිරුළපන පොලිස් ස්ථානාධිපති දන්වා ඇත.

26. කොළොන්නාව මහ නගර සභාවට අයත් වදුල්ල ඡන්ද පොළේ දී දුමින්ද සිල්වා ඇතුළු පිරිසක් ඡන්ද දායකයන්ට බාධා කරමින් හැසුරුනු බව කේ.ඒ.ට්‍රවෝ ප්‍රනාන්දු මහතා පැමිණිලි කර ඇත.
ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානාධිපති අදාළ පුද්ගලයින් ඉවත් කර ආරක්ෂාව තර කළ බව වාර්තා කර ඇත.

ඡන්ද විමසීම් අදියර තුනට අදාළව නීති විරෝධී ක්‍රියා සහ ප්‍රචණ්ඩ ක්‍රියා වශයෙන් වක් වක් දිස්ත්‍රික්ක වශයෙන් මැතිවරණ කාර්යාලය වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ සංඛ්‍යා සටහනක් අංක 12 සටහනෙහි දක්වා ඇත.